
දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
தினமின
ශ්‍රී බුධ වෂ් 2564ක් වූ නවම් අව තෙ ළෙස්වක ලත් ගුරු දින | කාණ්ඩය 112 | පත්‍රය 73 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 11 බ්‍රහස්පතින්දා

**කොවිඩ් ව්‍යාප්තිය**




ස්වර්ණභූමියේ අතීතාවලෝකනය
කුමාරම
අද පත්‍රය සමඟ

# ජාතික ආරක්ෂාව බිඳ වැටීම පාස්කු ප්‍රහාරයට හේතු වුණා



ඇමැති සරත් වීරසේකර

## සහරාන්ට ISIS මතය දුන් නවුෆර් කටාර්හිදී අල්ලයි

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

බුද්ධි අංශ මුළුමනින්ම අකර්මණ්‍ය කරමින් හමුදාවේ චිත්ත ධෛර්යය දුර්වල කොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය කිරීම හා ජාතික ආරක්ෂාව බින්දුවටම ඇද දැමීම හේතුවෙන් පාස්කු ප්‍රහාරය පහසුවෙන් දියත් කිරීමට ඝාතකයන්ට අවස්ථාව හිමි වූ බව මහජන ආරක්ෂාව පිළිබඳ ඇමැති, විශ්‍රාමික රියර් අද්මිරාල්, ආචාර්ය සරත් වීරසේකර මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (10) ප්‍රකාශ කළේය. පිට 06



# කෝටි 80ක මත්කුඩු සමඟ යුවළක් දෙනගමදී අත්අඩංගුවට

රක්ෂණ ශ්‍රියන්ත සහ සුභාෂිණී සේනානායක

රුපියල් කෝටි 80කට ආසන්න වටිනාකමින් යුතු හෙරොයින් කිලෝ 75ක් සමග මහා පරිමාණයෙන් මත්ද්‍රව්‍ය ජවාරමේ යෙදෙන සැකකරුවකු සහ සැකකාරියක මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත දෙයියන්දර පොලිස් වසමේ දෙනගම ප්‍රදේශයේදී ඊයේ (10) අත්අඩංගුවට ගෙන තිබේ. පිට 06

## එන්නත ගත් විදේශිකයන්ට නිරෝධායනය අවශ්‍ය නෑ

සුභාෂිණී සේනානායක

කොරෝනා මර්දන එන්නත ගැනීමෙන් අනතුරුව දිවයිනට පැමිණෙන ශ්‍රී ලාංකිකයන් හා සංචාරකයන් නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු නොකිරීමට රජයේ අවධානය යොමු වී තිබේ. පිට 06



## රන්ජන්ගේ නිවාඩු යෝජනාවට ඉඩ නොදෙන්නේ ඇයි?

ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න

රන්ජන් රාමනායක මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට කැඳවන්නැයි මාස ගණනාවක සිට විපක්ෂය ලෙස ඉල්ලීමක් කළත් එය එකහෙළා ප්‍රතික්ෂේප කරන කථානායකවරයා රන්ජන් රාමනායක මහතා වෙනුවෙන් ඉදිරිපත් කරන නිවාඩු යෝජනාව සභාවට ගෙන ඒමට ඉඩ නොදෙන්නේ මන් දැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (10) විමසීය. පිට 06



ශ්‍රී ලංකා ගුවන් හමුදා 70 වැනි සංවත්සරය නිමිත්තෙන් ගුවන් හමුදා ධජ ආශීර්වාද ගැන්වීමේ පූජෝත්සවය ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියසදී ඊයේ (10) පැවැත්වුණු අයුරු.
ඡායාරූපය - අනුරාධපුර අතිරේක අමිල ප්‍රභාත් වනසිංහ

## පාස්කු ප්‍රහාර සමයේ කඩු ගෙන්වීම ගැන විමර්ශන කරන්න

නීතිපතිගෙන් උපදෙස්

සුභාෂිණී සේනානායක සහ රෝෂන් තුෂාර

කඩු, කිනිසි සහ එවැනි වෙනත් ආයුධ මෙරටට ආනයනය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලෙස නීතිපතිවරයා විසින් පොලිස්පතිවරයාට උපදෙස් දී තිබේ. පිට 06

## සජිත්ගෙන් නිවාස ගන්න ගිය පවුල් 7,000ක් ණයකරුවන් වෙලා

අඩෛයිකලනාදන්

උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ



සජිත් ප්‍රේමදාස මහතාගේ නිවාස සංකල්පය අනුව නිවාස ගැනීමට ගිය මන්නාරමේ පවුල් 7,000කට පමණ නිවාස නොලැබී යෑම පමණක් නොව ඔවුන් ණයකරුවන් පිරිසක් වීම රජය වහාම සොයා බලා ඔවුන්ට සහන සලසා දෙන ලෙස දෙමළ ජාතික සන්ධානයේ වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වම් අඩෛයිකලනාදන් මහතා ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කොට තිබේ. පිට 06

## නාමල් උයනේ ප්‍රථම සංස්කෘතික කැණීම අද

පිට 06

## කෝටි 29,250ක මුදල් හුවමාරුවකට චීනයේ අනුමැතිය

පිට 06

## විමල්ගේ ප්‍රකාශයට රිෂාඩ්ගෙන් පැමිණිල්ලක්

පිට 06

## හිටපු නි. ඇමැති සරත්ට එරෙහිව පැවරූ නඩුවේ සාක්ෂි නෑ

CIDයෙන් වාර්තාවක් කැඳවයි

රෝෂන් තුෂාර

හිටපු ධීවර නියෝජ්‍ය ඇමැති සරත් කුමාර ගුණරත්න මහතා ඇතුළු හය දෙනකුට එරෙහිව පැවරූ නඩුව පවරා පවත්වාගෙන යෑමට තරම් සාක්ෂි මෙතෙක් අධිකරණයට ඉදිරිපත් කර නොමැති බවත්, එම සාක්ෂි පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳවන ලෙසත් ජනාධිපති නීතිඥ සම්පත් මෙන්ඩිස් මහතා ඊයේ (10) මහාධිකරණය හමුවේ කරුණු දක්වමින් පැවසීය. පිට 06

## සූරියවැව සත්‍යග්‍රහය අවසන්

සූරියවැව විශේෂ

හම්බන්තොට යෝජිත හවන අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කරන ලෙස ඉල්ලමින් සූරියවැව වල්සපුගල ප්‍රදේශයේ ගොවීන් පිරිසක් විසින් ආරම්භ කළ සත්‍යග්‍රහය දින 53කට පසුව ඊයේ (10) අවසන් කර තිබේ.

## පාස්කු කොමිෂන් වාර්තාවේ 17 වැනි පරිච්ඡේදයේ පුද්ගලයන් ගැන විමර්ශන කරන්න

නීතිපති පොලිස්පතිට ලියයි පිට 06

## වතු කම්කරු වැටුප 1,000ක් කිරීමේ ගැසට්ටුව නිකුත් කරයි

පිට 06

## එන්නත්කරණයෙන් ආණ්ඩුව ජනතාව නොමඟ යවනවා

ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ



කොවිඩ් එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ආණ්ඩුව දිගින් දිගටම මහජනතාව නොමඟ යැවීමට කටයුතු කරන බව එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන මහතා සඳහන් කරයි. පිට 06



## ගුවන් හමුදාවට රාජ්‍ය ආයතන ලක්ෂ 80ක් ණයයි

පිට 06

## හිරුණිකා මහාධිකරණයෙන් සමාව අයදියි

රෝෂන් තුෂාර



නිසි වේලාවට අධිකරණයේ පෙනී නොසිටීමෙන් වරෙන්තු ලද හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීනි හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය මහාධිකරණය ඉදිරියේ ඊයේ (10) සමාව අයැද සිටියාය. පිට 06

## කොවිෂීල්ඩ් එන්නත් ලක්ෂ 5ක් සති 2කින් මෙරටට

ලලිත් වීරතුංග පිට 06

## 20 නීතියට පටහැණි යැයි ගොනු කළ පෙත්සම සලකා බැලීම හෙට

නෙල්කා මැදගෙදර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය සම්මත කර ඇති ආකාරය නීතියට පටහැණි බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා ගොනු කර ඇති පෙත්සමක් සලකා බැලීම සඳහා පංච පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා විසින් නම් කර තිබේ.



# මන්නාරම මාළු වෙළෙඳ සල කොරෝනා නිසා වසයි

**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

කොරෝනා ආසාදිතයන් හතර දෙනෙකු හමු වීම නිසා මන්නාරම මධ්‍යම මාළු වෙළෙඳ සල ඊයේ (10) සිට වසා දැමීමට මන්නාරමේ සෞඛ්‍ය බලධාරීන් තීරණය කොට තිබේ.

මන්නාරමේදී දුම්රියකට පැන සිය දිවි හානි කරගත් පුද්ගලයා කොරෝනා ආසාදිතයකු බව සනාථ වීමත් සමගම ඔහු කටයුතු කළ මන්නාරම මධ්‍යම මාළු වෙළෙඳ සලේ සියලුම දෙනා පීසීආර් පරීක්ෂණවලට ලක් කොට තිබේ.

එම පීසීආර් පරීක්ෂණවලින් මේ වන විට හතර දෙනකු කොරෝනා ආසාදිතයන් බවට හඳුනා ගෙන ඇති නිසා මන්නාරම මධ්‍යම මාළු වෙළෙඳ සැළ වසා දැමීමට සෞඛ්‍ය නිලධාරීන් තීරණය කොට තිබේ.

ඒ අනුව යළි දැනුම් දෙන තුරු මන්නාරමේ සිට කොළඹ ඇතුළු සෙසු පළාත්වලට මාළු රැගෙන යෑමට පැමිණෙන ව්‍යාපාරිකයන්ට මන්නාරමට නොපැමිණෙන ලෙස මන්නාරම එක්සත් ධීවර සංගමය දැනුම් දී තිබේ.

# කොරෝනා නිසා යාපනයේ තිදෙනකු මිය ගිහින්

**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

කොරෝනා ආසාදනය වීම හේතුවෙන් පෙරේදා (9) මියගිය පුද්ගලයන් හතර දෙනාගෙන් එක් කාන්තාවක් යාපනයේ පදිංචිකාරිනියක් වීමත් සමගම කොරෝනා හේතුවෙන් මෙතෙක් යාපනයේ මිය ගිය සංඛ්‍යාව තුනක් දක්වා ඉහළ ගොස් තිබේ.

උතුරු පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ඒ අනුව සඳහන් කළේ යාපනයේ උඩුවිල් ප්‍රදේශයේ වයස අවුරුදු 81ක කාන්තාවක් කොළඹදී මිය ගොස් ඇති බවයි.

මේ අතර පෙරේදා (9) උතුරු පළාතෙන් කොරෝනා ආසාදිතයන් 28 දෙනකු වාර්තා වූ බවත් ඉන් ආසාදිතයන් 13ක් ම මන්නාරම ප්‍රදේශයෙන් වාර්තා වූ බවත් උතුරු පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යලය සඳහන් කළේය.

# ගලේවෙල බීට්ටු වන සංරක්ෂණ නිලධාරීහු දෙදෙනෙක් නිරෝධායනයට

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

කොරෝනා ආසාදිතයකු ගලේවෙල බීට්ටු වන සංරක්ෂණ කාර්යාලයට පැමිණ ආපසු ගොස් ඇති අතර, එම අවස්ථාවේ එහි සිටි නිලධාරීන් දෙදෙනකු සෞඛ්‍ය නිලධාරීන් විසින් මේ මස 19 වැනි දින දක්වා ස්වයං නිරෝධායනයට යොමු කර තිබේ.

මේ නිසා එම කාර්යාලයේ සේවා කටයුතු සඳහා එක් නිලධාරියකු පමණක් යෙදවීමට කළමණාකාරීත්වය පියවර ගෙන තිබේ.

# මස්කෙළිය හින්දු දේවාල රැස්වීමේදී මිය ගිය කථිකයාගේ ආශ්‍රිතයන්ට පීසීආර්



**හැටන් මධ්‍යම විශේෂ**

මස්කෙළිය හින්දු දේවාලයේ පාලක මණ්ඩල රැස්වීමේදී අදහස් පළ කරමින් සිටියදී මිය ගිය කොවිඩ් ආසාදිතයාගේ ආශ්‍රිතයන් 15 දෙනකු පී. සී. ආර්. පරීක්ෂාවන්ට ලක් කිරීමට පියවර ගත් බව මස්කෙළිය මහජන සෞඛ්‍ය පරීක්ෂක නරේන්ද්‍රන් මහතා පවසයි.

මේ පිළිබඳව වැඩිදුරටත් කරුණු දැක්වූ නරේන්ද්‍ර මහතා පවසන ලද්දේ මෙම පුද්ගලයා මස්කෙළිය හින්දු කෝවිල් පාලක මණ්ඩල රැස්වීම අමතමින් සිටියදී හදිසියේ මිය ගොස් ඇති බවත් පසුව මළ සිරුර පරීක්ෂාවට ලක් කිරීමෙන් පසු ඔහු කොවිඩ් ආසාදිතයකු බවට හඳුනාගත් බවත්ය.

එම තත්ත්වයන් මත එදින එම රැස්වීම සඳහා එක්ව සිටි පුද්ගලයන් 62ක් මේ වන විට ස්වයං නිධානයට ලක් කර ඇති බවත් එයින් 15 දෙනකු පී.සී.ආර්. පරීක්ෂාවන්ට ලක් කිරීමට පියවර ගත් බවත් ඉතිරි පිරිසද පී.සී.ආර්. පරීක්ෂාවන්ට ලක් කිරීමට කටයුතු කරන බවත් ඔහු තවදුරටත් පැවසීය.

# හබරාදූව - ලණුමෝදර යුද හමුදා සෙබළකුට කොරෝනා

**එස්. දීයගහගේ**
**දකුණු පළාත් සංවාරක**

හබරාදුව ලණුමෝදර ප්‍රදේශයේ පදිංචි යුද හමුදා සෙබළකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇතැයි හබරාදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

මෙම හමුදා සෙබළා නිවාඩු ලබා ගෙන ලණුමෝදර පිහිටි නිවසට පැමිණ තිබේ. එහිදී තල්පෙ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් මේ පුද්ගලයාට කරන ලද පීසීආර් පරීක්ෂණයේදී කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව පෙරේදා (9) තහවුරු වී ඇත.

මෙම ආසාදිතයා ප්‍රතිකාර සඳහා අම්බලන්ගොඩ පොල්වත්ත රෝහලට ඇතුළත් කර ඇති අතර ආසාදිත සෙබළාගේ බිරිඳ සහ දරු තිදෙනා නිරෝධායනයට යොමු කිරීමට පියවර ගෙන තිබේ.

# දකුණේ කොරෝනා ආසාදිත පිරිස 4,196 දක්වා ඉහළට

**එස්. දීයගහගේ - දකුණු පළාත් සංවාරක**

දකුණු පළාතෙන් පෙරේදා (9) හමු වූ කොරෝනා ආසාදිතයන් 18 දෙනා සමග දකුණේ සමස්ත කොරෝනා ආසාදිතයන්ගේ සංඛ්‍යාව 4,196 දක්වා ඉහළ ගොස් ඇතැයි දකුණු පළාත් කොරෝනා මර්දන මෙහෙයුම් මැදිරියේ සම්බන්ධීකරණ නිලධාරි චාමර මහගමගේ මහතා පැවසීය.

ඒ අනුව පෙරේදා දිනයේදි ගාල්ල දිසාවෙන් ආසාදිතයන් 8 දෙනෙක්ද, මාතර සහ හම්බන්තොට දිසාවලින් ආසාදිතයන් 5 දෙනා බැගින් ආසාදිතයන් 10 දෙනෙක්ද අලුතෙන් හඳුනාගෙන ඇත. මෙම සංඛ්‍යා ලේඛන අනුව ගාල්ල දිසාවේ සමස්ත ආසාදිතයන්ගේ ගණන 2,135ක්ද මාතර දිසාවේ සමස්ත ආසාදිතයන් 1,561ක්ද හම්බන්තොට දිසාවේ සමස්ත ආසාදිතයන් 500 දෙනෙක්ද වෙති.

මේ අතර දකුණු පළාතේ ආසාදිතයන් 3,579 දෙනෙක් සම්පූර්ණ සුවය ලබා ඇතැයිද දකුණේ පවුල් 1,029 ක පුද්ගලයන් 2,650 දෙනෙක් නිරෝධායනයට යොමු කර ඇතැයිද චාමර මහගමගේ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

# හෝම්කමින් දවසේ මනාලයාට කොවිඩ් පොසිටිව්

**ගාල්ල දිසා සමූහ**

මනමාලිය තම නිවසට කැන්දා ගෙන දිනයේදී එම මනමාලයා කොරෝනා ආසාදිතයකු බවට පත්වීමේ සිදුවීමක් අක්මීමන ප්‍රදේශයෙන් වාර්තා වී ඇත.

අක්මීමන ප්‍රාදේශයේ පිහිටි පෞද්ගලික කර්මාන්ත ශලාවක සේවය කරන සේවකයන් 11 දෙනෙකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු කරගෙන ඇති අතර මින් එක් සේවකයකුගේ මංගල උත්සවය අක්මීමන ප්‍රදේශයේ පැවැති අතර එම මනාලයාට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී තිබේ. මේ හේතුවෙන් මංගල උත්සවයට සහභාගි වූ 30 දෙනෙකු නිරෝධායනයට ලක් කිරීමට පියවර ගෙන ඇති බවද ඒ මහතා පවසයි.

මංගල උත්සවය නිරෝධායන නීති රීතිවලට අනුකූලව පවත්වා ඇති බවද ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරයා පවසයි.

මෙකී කර්මාන්ත ශාලාවේ සේවය කරන මනාලයා වන සේවකයා මංගල උත්සවය සඳහා නිවාඩු ලබා ගෙන ඇති අතර ඔහු සේවය කළ ගබඩා අංශයේ සේවකයකුට කොරෝනා වයිරසය ආසාදනය වීම නිසා මනාලයාද පීසීආර් පරීක්ෂණයට ලක් කොට ඇත. ඔහු මනාලිය කැඳවා ගෙන සිය නිවසට පැමිණෙන දින පීසීආර් පරීක්ෂණ ප්‍රතිඵල ලැබී ඇති අතර ඒ අනුව මනාලයාට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇත.

මෙකී පෞද්ගලික කර්මාන්ත ශාලාවේ සේවකයකුගේ දරුවකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති අතර ඉන් පසු එම සේවකයා පීසීආර් පරීක්ෂණයකට ලක් කිරීමෙන් පසු ඔහුටද කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇත. ඉන්පසු මෙකී කර්මාන්ත ශාලාවේ සේවකයන් 17 දෙනකු පීසීආර් පරීක්ෂණවලට ලක් කොට ඇති අතර ඉන් සේවකයන් 11 දෙනෙකුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇති බවද ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරයා පවසයි. කොරෝනා ආසාදිතයන් 11 දෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා අම්බලන්ගොඩ පොල්වත්ත රෝහල වෙත යොමු කොට ඇති බවද ඒ මහතා පවසයි.

එම සේවකයන්ගේ පළමු පෙළ ආශ්‍රිතයන් 46 දෙනෙකු නිවෙස්වල නිරෝධායනයට ලක් කිරීමට පියවර ගෙන ඇති බවද ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# වවුනියාව ඇඟලුම් කම්හලක කොරෝනා ආසාදිතයෝ පහක්

**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

වවුනියාව නගරාසන්නයේ පිහිටි ඇඟලුම් කම්හලෙන් පෙරේදා (9) වන විට කොරෝනා ආසාදිතයන් පස් දෙනෙකු හමු වී තිබේ.

මෙම ඇඟලුම් කම්හලෙන් පළමු කොරෝනා ආසාදිතයා මීට දින හතරකට ඉහතදී හමු වූ අතර ඔහු ඇසුරු කළ තවත් හතර දෙනෙකු කොරෝනා ආසාදිතයන් බවට පත්ව තිබේ. සේවක සේවිකාවන් විශාල පිරිසක් පීසීආර් පරීක්ෂණවලට ලක් කොට ඇති අතර එම වාර්තාවන් සියල්ලම මේ දක්වා ලැබී නොමැත.

# ධීවර ජනතාවට භූමිතෙල් සහනාධාරය සෘජුවම දීමට ඇති හැකියාව සොයා බලන්නැයි

## ධීවර ඇමැතිගෙන් නිලධාරීන් උපදෙස්

**බුද්ධිකා ඉඹුලාන**

ධීවර ජනතාවට භූමිතෙල් සහනාධාරය සෘජුවම දීමට ඇති හැකියාව සොයා බලන්නැයි ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මහතා අමාත්‍යංශ නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

ධීවර කාර්මිකයන්ට හා කෘෂි කාර්මික ක්ෂත්‍රයේ නියැළී සිටින පුද්ගලයන් සඳහා භූමිතෙල් සහනදායී මිලට ලබා දීමට ඇති හැකියාව සොයා බලන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේද සාමාජිකයකු ද වන ඩග්ලස් දේවානන්දා මහතා මේ පිළිබඳව වූ මූලික සාකච්ඡාවක් අමාත්‍යංශ ලේකම් ඉන්දු රත්නායක මහත්මිය සහ ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත මහතා සමඟ පවත්වා ඇති අතර මේ සම්බන්ධයෙන් අවශය තොරතුරු රැස් කරන ලෙස දන්වා ඇත.

පසුගිය පෙබරවාරි 05 වැනි දින කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවෙන් බොර තෙල් සඳහා පනවා තිබූ වරාය හා ගුවන් තොටුපොළ බදු සංශෝධනය කිරීම කෙරෙහි අවධානය පසුගියදා රැස්වූ අනුකමිටුව අවධානය යොමු කර ඇත. රාජ්‍ය බැංකුවලින් තෙල් සංස්ථාව ලබා ගන්නා ණය ඩොලර් වශයෙන් නොව රුපියල් වශයෙන් ලබා ගැනීමට හැකියාවක් පවතින්නේ නම් එහි වාසිය ජනතාවට ලබා දිය හැකි බව කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා මෙහිදී පෙන්වා දී තිබේ.

# නව නිපැයුමක් ලෙස ජංගම සහල් නිෂ්පාදන යන්ත්‍රයක්

**සුභාෂිණී සේනානායක**

නව නිපැයුමක් ලෙසින් ජංගම සහල් නිෂ්පාදන යන්ත්‍රයක් හඳුන්වා දීමට විකුම් සම්පත් දිඹුල්ගස්තැන්න මහතා කටයුතු කර තිබේ.

බත්තරමුල්ල කෘෂිකර්ම අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටි ගොවිජන මන්දිරයේදී හඳුන්වා දුන් මෙම යන්ත්‍රය කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා සහ නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මහත්මියගේ අවධානය සඳහා යොමු විය.

මෙහිදී විකුම් සම්පත් දිඹුල්ගස්තැන්න මහතා විසින් තමා විසින් නිර්මාණය කෙරුණු යන්ත්‍රයේ තාක්ෂණික ක්‍රියාකාරීත්වය සහ එහි ඇති ප්‍රයෝජන පිළිබඳව විග්‍රහයක්ද එම අවස්ථාවේදී සිදු කරන ලදි.

මෙම උපකරණය නිෂ්පාදනය කර ගොවියා අතට පත් කිරීම මඟින් වර්තමානයේ සහල්වල ඇති තරගකාරී මිල ගණන් පහත හෙළා ගොවියාට සාධාරණයක් මෙන්ම පාරිභෝගිකයා වෙතද සාධාරණ මිලකට සහල් දීමට ලැබෙනු ඇති බවට ඒ මහතා එහිදී සඳහන් කළේය.

# කුවේට්හි රඳවා ගෙන සිටින ශ්‍රී ලාංකිකයන් ගෙන්වා ගැනීමට පියවර

**මහින්ද අලුත්ගෙදර**

කුවේට් රැඳවුම් කඳවුරුවල හා තානාපති කාර්යාල ආරක්ෂිත නිවස්නයේ විවිධ හේතූන් මත රඳවා ගෙන සිටි ශ්‍රී ලාංකිකයන් රජයේ මැදිහත් වීමෙන් මෙරටට ගෙන්වා ගැනීමට තීරණය කෙරේ.

ඒ අනුව 100 දෙනෙකුගෙන් සමන්විත පළමු කණ්ඩායම කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළින් ශ්‍රී ලංකාවට පැමිණි අතර කුවේට් ජසීරා ගුවන් සේවයට අයත් J 9551 ගුවන් යානයෙන් මෙරටට පැමිණි එම පිරිස මේ වන විට රජයේ නිරෝධායන මධ්‍යස්ථානවල නිරෝධායනය සඳහා යොමු කර තිබේ.

මෙම පළමු කණ්ඩායමට කුවේට් රාජ්‍යයේ රැඳවුම් ස්ථානවල සිටි ශ්‍රී ලාංකිකයෝ 70ක් තානාපති කාර්යාල ආරක්ෂිත නිවස්නයේ රැඳී සිටි 22 දෙදෙනෙක් හා විවිධ හේතූන් මත දිවයිනට පැමිණීමට අපේක්ෂාවෙන් සිටි 08 දෙනෙක්ද ඇතුළත් වෙති.

ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ, සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහත්වරුන් ජනාධිපතිවරයාගෙන් සහ අගමැතිවරයාගෙන් කළ ඉල්ලීමක ප්‍රතිඵලයක් ලෙස කුවේට්හි අසරණ වී සිටින ශ්‍රී ලාංකිකයන් රජයේ මැදිහත් වීමෙන් ගෙන්වා ගැනීමට තීරණය කෙරිණි.

කුවේටයේ පිටුවහල් කිරීමේ මධ්‍යස්ථානයේ 148 දෙනෙකු අනවසර රැඳවුම් දෙපාර්තුමේන්තුව යටතේ 160 දෙනෙකු හා පොලිස් ස්ථානවල 250 දෙනෙකු වශයෙන් ශ්‍රී ලාංකිකයන් විවිධ හේතූන් මත රඳවා ගෙන ඇති බවට කුවේටයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.

කුවේටයේ සිටින ශ්‍රී ලාංකිකයෝ 6,000 පමණ දිවයිනට පැමිණීමට ලියාපදිංචි වී සිටින අතර ඉන් 3,221 දෙනෙකු මේ වන විට මෙරටට පැමිණ ඇතැයි කුවේට් තානාපති කාර්යාලය පවසයි. මේ වන විට දිවයිනට පැමිණ ඇති විදෙස්ගත ශ්‍රමිකයන් සංඛ්‍යාව 80,000 ඉක්මවන අතර ඉන් බහුතරයක් පැමිණ ඇත්තේ මැදපෙරදිග කලාපයේ රටවලිනි.

## මස්කෙළිය ඕල්ටන් වත්තේ වතු අධිකාරිවරයාට පහර දීම:

# සැකකරුවන් 22කට ඇප

**අසේල කුරුළුවංශ**

මස්කෙළිය ඕල්ටන් වත්තේ වතු අධිකාරිවරයාට සහ සහකාර වතු අධිකාරිවරයාට ඉකුත් මස 17 දින ඔහුගේ නිල නිවසේදි පහර දි තුවාල සිදුකර ගොම දියර වැක්කෙරුවේ යැයි කියන සිද්ධිය සම්බන්ධයෙන් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර තිබු සැකකරුවන් විසි දෙදෙනකු හැටන් දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත් නිමේෂා පටබැඳිගේ මහත්මිය විසින් ඊයේ (10) දැඩි ඇප කොන්දේසි මත මුදා හරිනු ලැබීය.

සැකකරුවන්ට යළිත් අප්‍රේල් මස 28 දින අධිකරණයේ පෙනී සිටින ලෙස මහේත්‍රාත්වරිය නියෝග කළාය.

පහර දුන් බව කියන සිද්ධිය සම්බන්ධයෙන් වතු කම්කරු කාන්තාවන් 08 දෙනෙකු සහ වතු කම්කරුවන් 02 දෙනෙකු මස්කෙළිය පොලිසිය විසින් සැකපිට අත්අඩංගුවට ගනු ලැබීමෙන් පසු ඔවුන් මාර්තු 10 තෙක් රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.පොලිසිය අත්අඩංගුවට ගැනීමට සොයමින් සිටි තවත් සැකකරුවන් 12 දෙනකු, එම නඩුව ඊයේ (10) යළි කැඳවූ අවස්ථාවේ නීතීඥයන් මඟින් අධිකරණයට භාර වී තිබිණි.

මෙහිදී හැටන් දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත් නිමේෂා පටබැඳිගේ මහත්මිය එක් සැකකරුවකුට රුපියල් පහළොස් දහසක මුදල් ඇපයක් සහ රුපියල් ලක්ෂයක ශරීර ඇපයක් මත ඔවුන් මුදා හරිමින් ඔවුන්ට සෑම මසකම අවසන් ඉරු දින පෙව 9.00 ත් 11.00 අතර කාලයේ මස්කෙළිය පොලිසියේ පෙනී සිටින ලෙසද නියෝග කළාය.

සැකකරුවන් වෙනුවෙන් පෙනී සිටීමට වතුකරයේ වෘත්තිය සමිති සහ රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් මගින් නිතිඥයන් ඉදිරිපත් කර තිබිණි. ඕනෑම ඇප කොන්දේසියක් මත සැකකරුවන්ට ඇප ලබා දෙන ලෙස එම නීතිඥවරුන් අධිකරණයෙන් ඉල්ලා සිටියහ.

## මැතිවරණ සඳහා මාධ්‍යවේදීන්ගේ බලපෑම පිළිබඳ

# විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන්ට පුහුණු වැඩමුළුවක්

**අනුර ප්‍රේමලාල් සහ උපාලි කරුණාරත්න**

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් මෙන්ම මාධ්‍ය උපමාන, ඡන්ද විමසීමකදී මාධ්‍යවේදීන් සතු කාර්යභාරය හා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා ජනමාධ්‍යවේදීන්ගේ බලපෑම පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවේදීන් සඳහා පුහුණු වැඩමුළුවක් මෙම 16 දින පෙ.ව 8.30 සිට ප.ව 2.30 දක්වා මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

## ශ්‍රී ලංකා පරිපාලන හා වෘත්තීය ලේකම්වරුන්ගේ සංගමයේ

# මහා සභා රැස්වීම 14 දා

**රුසෙයික් ෆාරුක්**

ශ්‍රී ලංකා පරිපාලන හා වෘත්තීය ලේකම්වරුන්ගේ සංගමයේ 43 වන වාර්ෂික මහා සභා රැස්වීම මේ මස 14 වැනි දින පෙ.ව. 9.30ට කොළඹ හිල්ටන් හෝටලයේදී පැවැත්වේ. වත්මන් සභාපතිවරයාගේ සහ විධායක කමිටුවේ ධුර කාලය අවසන් වන විට, වසර දෙකක කාලයකට සේවය කරන නව සභාපතිවරයකු සහ විධායක කමිටුවක් මේ දිනයේ තෝරා පත් කර ගනු ලැබේ. අභාවප්‍රාප්ත එරික් බී. එම්. ද සිල්වා මහතා විසින් ආරම්භ කරන ලද මේ සංගමය 1978 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

# අද රාත්‍රියේදී පොල්ගොල්ල ජලාශය හිස් කරයි

## ජලාශය පහළ ප්‍රදේශයේ මහවැලි ගඟ පරිහණය නොකරන ලෙස ඉල්ලීමක්

**අසේල කුරුළුවංශ**

පොල්ගොල්ල ජලාශයේ වාර්ෂික පරීක්ෂණ කටයුතුවලට හා මෝසම් වැස්සට ප්‍රථම එහි සිදු කිරීමට නියමිත අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සඳහා අද (11) මධ්‍යම රාත්‍රියේ ජලාශය හිස් කරන බව මහවැලි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජලාශ) වී. ඒ. පුෂ්පකුමාර මහතා පවසයි. ජලාශයේ වාන් දොරටු හිස් කිරීම සහ නඩත්තු කටයුතු සිදු කිරීම 11 දා රාත්‍රී 10.00 සිට පසුදින පෙරවරු 6.00 දක්වා සිදු කරන බවත් එම කාලය තුළ ජලාශය පහළ ප්‍රදේශයේ මහවැලි ගඟ පරිහණය කිරීමෙන් වළකින ලෙසත් පුෂ්පකුමාර මහතා ජනතාව ගෙන් ඉල්ලීමක් කරයි.

# ලෝක කාන්තා දිනය නිමිත්තෙන් දුෂ්කර පාසල්වලට සනීපාරක්ෂක ද්‍රව්‍ය

**සිතාරා සේනානි**

ලෝක කාන්තා දිනය නිමිත්තෙන් දිවයින පුරා දුෂ්කර පාසල් 350කට වසරක් සඳහා අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය සහිත අත්‍යවශ්‍ය සෞඛ්‍ය උපකරණ කට්ටල ලබා දීම බත්තරමුල්ල, සුහුරුපාය ශ්‍රවණාගාරයේදී පෙරේදා (9) සිදු විය.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතාගේ සංකල්පයකට අනුව මේ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර, අදාළ සත්කාරයට ඊවා සන්නාමය සහිත කැපිටල් මහරාජා සමූහ ව්‍යාපාරය දායත්වය ලබා දෙයි.

සනීපාරක්ෂක කට්ටල ලබා දීමට අදාළ ලියකියවිලි විදුහල්පතිවරුන් වෙත සංකේතාත්මකව භාර දීම රාජ්‍ය අමාත්‍යවරය අතින් සිදුවිය.

ලෝක කාන්තා දින සතියේ දෙවැනි දිනය යෙදී තිබූ 9 වැනිදා දිනය දියණිවරුන් වෙනුවෙන් වෙන් කර තිබූ අතර, දියණියන්ගේ සනීපාරක්ෂක අවශතා සපුරමින් සුවපත් දිවියක් උදෙසා ඔවුන්ට උරුම සෙනෙහස තිළිණ කිරීම එම දිනයේ අරමුණ විය.

උත්සවය ඇමැතූ රාජ්‍ය අමාත්‍යවරයා කියා සිටියේ දුෂ්කර පළාත්වල පාසල් දරුවන්ට පවතින ප්‍රධාන ගැටලු දෙකක් තමන් පාසල් නිරීක්ෂණය කිරීමේදී හඳුනා ගත් බවයි. පාසල් දරුවන්ට උදෑසන ආහාරය සැපයීමටට මවුපියන්ට පවතින නොහැකියාව සහ වැඩිවියට පත් දියණිවරුන්ට මසකට දින තුනක් පමණ පාසල් පැමිණීමට නොහැකි තත්ත්වයක් පැවතීම එම ගැටලු බවයි. ඉන් එක් ගැටලුවකට මෙමගින් සෙත සැලසෙන බව කී රාජ්‍ය ඇමැතිවරයා, උදෑසන ආහාරය ලබා දීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමට තමන් උත්සාහ දරන බවද කීවේය.

ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතා මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස එක්වූ අතර රාජ්‍ය නිලධාරීහු පිරිසක්ද එම අවස්ථාවට එක්ව සිටියහ.





# කටුනායක ගුවන් තොටුපොළ කාර්යබහුල වෙයි

## ගුවන් යානා 31ක් මෙහෙයුම් කටයුතුවලට

**මහින්ද අලුත්ගෙදර**

කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කාර්යබහුල ගුවන් තොටුපොළක් බවට පත්වෙමින් ගුවන් යානා 31ක මෙහෙයුම් කටයුතු සිදු කරමින් ගුවන් මගීන් 1,874 දෙනකුට ගුවන් ගමන් පහසුකම් සපයා තිබේ.

ඒ අනුව ඊයේ (10) දින උදෑසන 8.30න් අවසන් වන පැය 24ක කාලය තුළ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විසින් මෙම පහසුකම් සලසා දී තිබෙන බව එම ගුවන් තොටුපොළ පවසයි.

මෙහිදී මගී ගුවන් යානා 14කින් ගුවන් මගීන් 978 දෙනකු මෙම කාල සීමාව තුළ කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබෙන අතර, කටාර් රාජ්‍යයේ දෝහා සිට ගුවන් යානා 02කින් 185 දෙනකු පැමිණ ඇත. මෙසේ පැමිණි ගුවන් මගීන් පිරිස නිරෝධායන ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් සංචාරක හෝටල් වෙත රැගෙන යනු ලැබිණි.

එසේම ගුවන් මගීන් 896 දෙනකු ගුවන් යානා 17කින් විදේශ රටවල් බලා කටුනායක ගුවන් තොටුපොළෙන් පිටත්ව ගොස් තිබේ. ඒ අතර සෞදි අරාබියේ රියාද් වෙත 167 දෙනකු ද එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි වෙත 165 දෙනකු ද සිටි බව ගුවන්තොටුපොළ ප්‍රකාශ කරයි.

මෙම කාල සීමාව තුළ ජර්මනිය, පෝලන්තය, ඕස්ට්‍රේලියාව, ඊජිප්තුව, පිලිපීනය, නෙදර්ලන්තය සහ යුක්‍රේනය යන රටවලින් ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා විදේශිකයන් 72 දෙනකු ද පැමිණ සිටි බව කටුනායක ගුවන් තොටුපොළ කාර්යය භාර නිලධාරීවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# විදෙස් රැකියාවලදී පීඩාවට පත්වූවන් 37 දෙනකු වෙනුවෙන් ලක්ෂ 57ක් වන්දි



**අනුර ප්‍රේමලාල්**

විදේශ රැකියාවල නිරතව සිටියදී සිදු වූ විවිධ කරදර හේතුවෙන් පීඩාවට පත් විගමණික ශ්‍රමිකයන් තිස් දෙනකුට රුපියල් ලක්ෂ 57ක වන්දි පිරිනැමීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේදී පසුගියදා (08) සිදු කෙරුණි.

කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශගත වූ, එහෙත් ලියාපදිංචි කාලය ඉක්මවා සේවයේ යෙදී සිටියදී සිදු වූ මරණයට පත්වීම්, හෘදයාබාධ, රිය අනතුරු, පිළිකා හා කොවිඩ් - 19 රෝගය වැලඳී මියයෑම ආදී හේතු වෙනුවෙන් ශ්‍රමිකයන්ට වන්දි පිරිනැමීම සහ ශ්‍රමිකයා සියදිවි නසා ගැනීම හේතුවෙන් අසරණභාවයට පත් යැපෙන්නන්ට වන්දි පිරිනැමීම ද මෙහිදී සිදු විය.

විදේශ රැකියා සඳහා පිටත්වීමේදී පළමු වසර දෙකකට ලියාපදිංචිය ලබා ගත යුතු අතර, එම කාලය අවසන්ව, නමුත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය අලුත් නොකර තවදුරටත් සේවයේ යෙදී සිටියදී සිදුවන මරණයට පත් වීම හේතුවෙන් පීඩාවට පත් යැපෙන්නන්ගේ දුක්ගැනවිලි සැලකීමට ගෙන මෙම වන්දි පිරිනමා ඇත.

කාර්යාංශය මගින් ලබා දෙන රක්ෂණය මගින් වන්දි මුදල ලියාපදිංචි කාලය ඉක්මවා ලියාපදිංචිය අලුත් නොකර සේවයේ යෙදී සිටීම හේතුවෙන් ඔවුන්ට ඒවා හිමි නොවන අතර, ලියාපදිංචි කාලය තුළ වුවද සියදිවි නසා ගැනීමට ක්‍රියා කරන අය වෙනුවෙන් වන්දි හිමි නොවේ. එවැනි ගණයේ රක්ෂණය මගින් වන්දි හිමි නොවන අය වෙනුවෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විශේෂයෙන් "විගමණික සේවක සුබසාධන අරමුදල" මගින් යැපෙන්නන්ගේ තත්ත්වය සලකා බලා මෙසේ වන්දි පිරිනැමීම සිදු කරයි. ලියාපදිංචි කාලය ඉක්මවා සිටියදී කොවිඩ් - 19 රෝගය හේතුවෙන් මියගිය පුද්ගලයන් දෙදෙනකුගේ ඥාතීන්ට මෙහිදී රුපියල් ලක්ෂ 03 බැගින් වන්දි ලබා දී තිබේ.

# සර්ප දෂ්ටයකින් එක්දරු මව නින්දෙන්ම ජීවිතක්ෂයට

**බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ**

මාස තුනක බිලිඳියක සමග නිවෙසේ නිදා සිටියදී උග්‍ර විෂ සහිත සර්පයකු දෂ්ට කිරීම හේතුවෙන් එක්දරු මවක් ජීවිතක්ෂයට පත්ව තිබේ.

මිහින්තලය, වෙල්ලාරගම ප්‍රදේශයේ පදිංචිව සිටි 30 හැවිරිදි කාන්තාවක් මෙසේ අවාසනාවන්ත ලෙස ජීවිතක්ෂයට පත්ව ඇත. ඇගේ ජීවිතය බේරා ගැනීමට මිහින්තලය රෝහලේ ස්ථානභාර වෛද්‍ය නිලධාරී ජ්‍යෙෂ්ඨ කායික රෝග වෛද්‍ය ඩී.පී.එස්. සිසිර කුමාර මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් උත්සහ දරා ඇතත් උත්සාහය අසාර්ථක වී ඇත.

මරණයට පත්වූ කාන්තාව සිය සැමියා හා බිලිඳිය සමග එකම ඇඳක නිදා සිට ඇති බවත්, රාත්‍රී 9.30ට පමණ ඇය බිලිඳියට කිරි ලබා දී ඇති බවත් පැවැති හදිසි මරණ පරීක්ෂණයෙන් අනාවරණය විය. බිලිඳියට කිරි ලබා දීමෙන් පසුව ඇය නින්දට ගොස් ඇති බවත්, අලුයම 1.30ට පමණ බිලිඳිය නැවත අවදි වීම නිසා මරණකාරියගේ සැමියා දරුවාට කිරි ලබා දෙන ලෙස දන්වමින් ඇය අවදි කිරීමට උත්සාහ කළත් ඇය අවදි නොවීම නිසා කිසියම් රෝගයක් වැලඳී ඇති බව සිතා අලුයම මිහින්තලය රජයේ රෝහලට රැගෙනවිත් තිබේ. රෝහලට රැගෙන එන විටත් ඇය සිහිමුර්ජා වී සිටීම නිසා ඇයගේ ජීවිතය බේරා ගැනීමට වෛද්‍යවරුන් විශාල උත්සාහයක් දරා ඇතත් ඇය ජීවිතක්ෂයට පත්ව තිබේ.

ඇයට උග්‍ර විෂ සහිත කරවලයකු දෂ්ට කරන්නට ඇති බවට වෛද්‍යවරුන් සැක පළ කරයි. මරණකාරිය මැදියම් රාත්‍රියේ වැසිකිළියට ගොස් තිබෙන බවත්, ඒ අවස්ථාවේ කරවලයකු දෂ්ට කරන්නට ඇති බවටත් සැකයක් පවතී. කරවලා දෂ්ට කළ පසුව කිසිදු වේදනාවක් නොදැනෙන නිසා ඇය නින්දෙන්ම මරණයට පත්වන්නට ඇති බවටත්, මියයන්නට පැය හතරකට පමණ ඉහතදී ඇයට සර්පයා දෂ්ට කරන්නට ඇති බවටත් වෛද්‍යවරු සැක පළ කරති.

# කාන්තා දිනයේ මුලතිව්හි පෙළපාළි පැවැත්වූ අතුරුදන්වූවන්ගේ සංගම් සභාපතිනිය පොලිසියට



**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

ජාත්‍යන්තර කාන්තා දිනයේදී මුලතිව් ප්‍රදේශයේ කළු කොඩි දමා රාජ්‍ය විරෝධී පෙළපාලියක් සංවිධානය කිරීමේ චෝදනාව යටතේ අතුරුදන්වූවන්ගේ සංගමයේ සභාපතිනිය බව කියන තැනැත්තියක් මුලතිව් පොලිසිය වෙත කැඳවා පෙරේදා (9) ප්‍රශ්න කොට තිබේ.

යුද සමයේදී අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු සොයා බලන ඥාති සංගමයේ මුලතිව් දිස්ත්‍රික් සභාපතිනිය වශයෙන් පෙනී සිටින මාරියසුරේෂ් ඊස්වරී නමැත්තියට මේ සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති අතර, පොලිසිය ඇයගෙන් ප්‍රශ්න කොට ඇත්තේ කළු කොඩි එසවීම රාජ්‍ය විරෝධී ප්‍රකාශ ඇතුළත් පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම හා කොරෝනා සෞඛ්‍ය නීති රීති කඩ කරමින් විශාල පිරිසක් මුලතිව් නගරයට ඒකරාශී කිරීම සම්බන්ධයෙන්ය.

ඇයගෙන් ලබා ගත් ප්‍රකාශය මේ වන විට පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත යවා ඇති අතර, එම නිලධාරීන්ගෙන් ලැබෙන නිර්දේශ මත ඇය සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කරන බව මුලතිව් පොලිසිය සඳහන් කරයි.

# හාම්පුතුන්ගේ හිරිහැර විඳිමින් විදේශයන්හි සිර වී සිටි 249ක් දිවයිනට

**මහින්ද අලුත්ගෙදර**

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රැකියා සඳහා ගොස් සිටියදී එරට හාම්පුතුන් අතින් විවිධ හිරිහැර, කරදරවලට ලක්වී යළි මෙරටට පැමිණීමට නොහැකිව සිටි ශ්‍රී ලාංකිකයන් 249 දෙනකු ඊයේ (10) මෙරටට පැමිණ තිබේ.

ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ විශේෂ ගුවන් යානයකින් මෙම පිරිස කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබෙන අතර, ශ්‍රී ලංකා රජය විසින් මේ ආකාරයට විදේශගත වී යළි මෙරටට පැමිණීමට නොහැකිව සිටින ශ්‍රී ලාංකිකයන් කණ්ඩායම් වශයෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ වැඩසටහන යටතේ මෙම ශ්‍රී ලාංකිකයන් පිරිස මෙසේ ගෙන්වා ගනු ලැබ ඇතැයි ගුවන් තොටුපොළ පවසයි.

මෙම පිරිස ඊයේ (10) අලුයම 5.25ට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි සිට ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ යූ.එල්.- 1510 දරන විශේෂ ගුවන් යානයෙන් කටුනායකට පැමිණ තිබේ.

ඔවුන් පිරිසෙන් වැඩි දෙනකු, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ගෘහ සේවය සඳහා ගොස් සිටි කාන්තාවන් වන අතර, මෙම පිරිස කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණීමෙන් පසුව නිරෝධායන ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් රජයේ නිරෝධායන මධ්‍යස්ථාන වෙත යොමු කර ඇත.

# අකුණු හා දත සුළං අනතුරු බහුලයි: කාලගුණයෙන් අනතුරු අඟවයි

**උපාලි කරුණාරත්න**

මෙම දිනවල ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළංවලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ජනතාවගෙන් ඉල්ලා සිටී.

එමෙන්ම අන්තර් මෝසම් කාලගුණ තත්ත්වය මෙම මාසය අගදී පමණ ආරම්භ වේ යැයි බලාපොරොත්තු වන බව ද කාර්යයේ නියුතු කාලගුණ විද්‍යාඥ කසුන් පැස්කුවල් මහතා පැවසීය.

නැගෙනහිර සහ ඌව පළාත්වලත් මාතලේ, නුවරඑළිය, පොළොන්නරුව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලත් අද (11) දිනයේ තැනින් තැන වැසි ඇති වේ. සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් සවස 1.00න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන බවත් මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මි.මී 75ක පමණ තරමක තද වැසි ඇතිවිය හැකි බවත් අද දිනය සඳහා කාලගුණ අනාවැකිය නිකුත් කරමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කළේය.

මධ්‍යම, සබරගමුව, ඌව සහ බස්නාහිර පළාත්වල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් ඇති විය හැකිය. මන්නාරම සිට පුත්තලම හරහා මීගමුව දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැකි අතර, මීගමුව සිට ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකි බව ද දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

# හොර නෝට්ටු දී බඩු ගත් දෙදෙනෙක් කැලණියේදී අල්ලයි

**රක්ෂණ ශ්‍රියන්ත**

කැලණිය ප්‍රදේශයේ වෙළෙඳසැලකින් භාණ්ඩ මිල දී ගෙන රුපියල් 5,000ක ව්‍යාජ නෝට්ටුවක් ලබා දුන් සැකකරුවන් දෙදෙනකු පෙරේදා (09) කැලණිය පොලිසිය විසින් අත්අඩංගුවට ගැනිණි.

සැකකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දී වැඩිදුර විමර්ශන සිදු කිරීමට නියමිතය.

# රට පුරා මාල හොරු: අවධානයෙන් ඉන්න

## පොලිසියෙන් ජනතාවට දන්වයි

**රක්ෂණ ශ්‍රියන්ත**



මේ වන විට දිවයින පුරා රන් මාල කඩා ගැනීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ඇති බැවින් ඒ ගැන වඩා සැලකිල්ලෙන් පසුවන ලෙස පොලිසිය අවධාරණය කළේය.

හබරාදූව, කටුනායක, සහ ගෝමරන්කඩවල යන ප්‍රදේශවලින් ඊයේ (10) උදෑසන 6.00න් අවසන් වූ පැය 24 තුළ මෙසේ මාල කැඩීම් රැසක් සිදුව ඇතැයි පොලිසියට වාර්තා වී ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

කටුනායක ප්‍රදේශයේ ස්ථානයකට පැමිණි පිරිසක් තමුන් පොලිස් නිලධාරීන් බව පවසා රන් මාලයක් කොල්ලකා ඇති බව ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

ගෝමරන්කඩවල ප්‍රදේශයේදී එක් පුද්ගලයකු අයිස් පැකට්ටුවක් මිල දී ගන්නා මුවාවෙන් පැමිණ රන් මාලයක් කොල්ල කා පලා ගොස් ඇත.

කොල්ලකරුවන් විවිධ උපක්‍රම මෙම රන් මාල කඩා ගැනීම් සඳහා භාවිත කරන අතර, යතුරු පැදි අලුත්වැඩියා කරන මුවාවෙන් නවතා තබාගෙන සිට මංකොල්ල කෑම, බස් නැවතුම්පොළවලදී මෙන්ම ලිපිනයන් අසන මුවාවෙන් හෝ පොලිස් නිලධාරීන් මුවාවෙන් පැමිණ මෙම කොල්ලකෑම් සිදු කරන බවත්, මේ සඳහා වැඩිපුරම වින්දිතයන් වී ඇත්තේ කාන්තාවන් බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

මේ හේතුවෙන් සෑම විටම මෙම කොල්ලකෑම් වළක්වා ගැනීමට පියවර ගන්නා ලෙස ද දැඩි අවධානයෙන් හා විමසිල්ලෙන් පසුවන ලෙස ද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා අවධාරණය කළේය.

---

පිය රජු අසූ නවයේ බෙලි සිඳපු හැටී
සමහර විට නැතත් පුතුගේ දෙනෙත ගැටී
ලක්බිම පුරා විසිරුණු හැටි කඳුළු කැටී
අනාගතය වෙනුවෙන් දැන ගැනුම වටී!

හිස නැති මළ කඳක වග තුග හිතට ගෙන
ජංගම සේවයෙන් රටටම කියන බණ
අනු දැන හොඳින් ඉතිහාසයේ කරුණු දැන
වීදුරු ගෙවල්වල සුරැකුම සිතනු මැන

රටේමුල්ලේ මුදන්නායක

---

ගනුදෙනු සටහනක් තැබූ මහ පොත පෙරළා
දෙන්නට අවැසි නැත දැන් පොත්වල ලියලා
සමෘද්ධි බැංකුවට සමෘද්ධියක් ලැබිලා
දෙනවලු ඔක්කෝම කොම්පියුටර් කරලා

ගස්මන් ගොනා

---

# අනතුරුදායක ලෙස ත්‍රිවිලයේ තොරොම්බල් එල්ලා 50,000ක් දඩ




• හිරේ ඉන්න යාළුවෙකුට දෙන්න පුළුවන් තෑග්ගක් කියන්නකෝ සර් !

• මෑන් එක්ක සෙල්ෆියක් ගහල, ෆේස්බුක් දාපන් බං !

**අසේල කුරුළුවංශ**

අන්තරාදායක ලෙස ආකෘතිය වෙනස් කරමින් ත්‍රිරෝද රථයක, අමතර උපාංග සවි කර හැටන් නගරයේ ධාවනය කළ ත්‍රිරෝද රථයක් සමග එහි රියැදුරු හැටන් පොලිසියේ රථ වාහන අංශය මගින් හැටන් මහෙස්ත්‍රාත් අධිකරණයට පෙරේදා (09) දින ඉදිරිපත් කළ අවස්ථාවේ සැකකරු වරද පිළිගැනීම නිසා රුපියල් 50,000ක දඩයක් නියම කිරීමට හැටන් දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත් නිමේෂා පටබැඳිගේ මහත්මිය කටයුතු කළාය.

මෙසේ දඩ මුදල් ගෙවන ලෙස නියෝග ලැබුවේ හැටන් ගාමිණීපුර ප්‍රදේශයේ පදිංචි මොහොමඩ් මිෂිරිෆ් නමැති 22 හැවිරිදි පුද්ගලයෙකු ය.

සැකකරු තම ත්‍රිරෝද රථයේ අන්තරාදායක ලෙස ආකෘතිය වෙනස් කර අමතර උපාංග රැසක් සවි කර හැටන් නගරයේ කුලී රථ ධාවනයේ යෙදී ඇති අතර, හැටන් රථ වාහන අංශයේ නිලධාරීන් විසින් එම උපාංග ගලවා ත්‍රිරෝද රථය ධාවනය කරවන ලෙස අවස්ථා කිහිපයකදී උපදෙස් ලබා දුන්න ද ඔහු එය නොතකා ත්‍රිරෝද රථය ධාවනය කර තිබේ. පසුව පොලිසිය සැකකරුට එරෙහිව හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ නෛතික පියවර ගැනීමට පියවර ගෙන ඇත.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මාර්තු 11 බ්‍රහස්පතින්දා

# සතොසේ බැසීම හා නැඟීම

වෙළඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන පෙන්වා දෙන අන්දමට සතොස ආයතනය 2015-2019 කාලය තුළ රුපියල් කෝටි දෙදහසක පාඩුවක් ලබා ඇත. කෝටි දෙදහසක් යනු විශාල මුදලකි. එම කාලයෙහි සතොස ගැන නොයෙක් කයිවාරු අසන්නට ලැබිණි. වරෙක කියැවුණේ රට පුරාම සතොස වෙළෙඳසල් බිහිකොට පාරිභෝගිකයාට සහන දෙන බවය. තව වරෙක කියැවුණේ රාත්‍රියටත් මේ කඩ විවෘත කර තබන බවය. එහෙත් මේ එකකින්වත් වැඩක් නැති බව කෝටි දෙදහසක පාඩුවෙන් පැහැදිලි වෙයි. ඇතැම් සැපයුම්කරුවන්ට මුදල් ගෙවා නැති බව ද වාර්තා වී ඇත. ඒ අනුව සතොස සම්බන්ධයෙන් වෝහාරික විගණනයක් සිදු කළ යුතු යැයි ඇමැතිවරයා තවදුරටත් පෙන්වා දෙයි.

මේ ආයතනය 2014 දක්වාම සාර්ථක මහජන සේවාවක් පවත්වා ගනිමින් ලාභ ලබන තැනෙක පැවැති බව වාර්තාවල සඳහන්ය. කඩාවැටීම සිදු වී ඇත්තේ 2015න් පසුවය. ආයතනයක් පාඩු ලබන්නේ නම් ඒ ගැන විමර්ශනයක් සිදු කොට අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීමට බලධාරීන් පියවර ගත යුතුය. යහපාලන ආණ්ඩුවේ ප්‍රධානීන් එවැන්නක් සිදු කර නැත. සතොස ඉහත කාලය තුළදී අලුත් වෙළෙඳ ස්ථාන ඉදිකර ඇත්තේ ද සොයා බැලීමකින් තොරව බව ඇමැති බන්දුල පෙන්වා දී ඇත. ඒ අනුව වෙළෙඳසල් දෙසිය ගණනක් පාඩු ලබන තත්ත්වයෙන් පවත්වාගෙන ගොස් තිබේ. රාජ්‍ය ආයතනවල පාඩු මකාගන්නේ මහජන මුදලින්ය. දේශපාලකයන් මහජන මුදල් යොදාගත යුත්තේ පෙරළා මහජනයාට ප්‍රතිලාභයක් ඇතිවන අයුරින් මිස අලාභයක් ඇතිවන අයුරින් නොවේ.

සතොස ආයතනය පිහිටුවීමේ මූලික ආධ්‍යාශය දුප්පත් පාරිභෝගිකයාට සහන සැලසීමය. පාරිභෝගිකයා කළුකඩ මුදලාලිගෙන් බේරාගෙන අත්‍යවශ්‍ය භාණ්ඩ සාධාරණ මිලකට අලෙවි කිරීම සතොස මඟින් කරගෙන ගියේය. පසු කලෙක මෙහි සේවාව රට පුරා ව්‍යාප්ත විය. එය සාධාරණ ලාභයක් ද ලබන විශාල මහජන සේවාවක් සහිත දැවැන්ත රාජ්‍ය ආයතනයක් ලෙස පැවැතිණි. 1978න් පසු රටේ ක්‍රියාත්මක වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය තුළ වුව සතොස ශක්තිමත්ව පවත්වාගෙන යා හැකි තත්ත්වයක් තිබිණි. එහෙත් විවිධ ආණ්ඩුවල නොසලකා හැරීම් නිසා සතොස තරගකාරී ආයතනයක් බවට පත් වූයේ නැත. ඒ අතර, යහපාලන ආණ්ඩු සමයේදී ආයතනය බරපතළ කඩාවැටීමකට ලක්වී ඇත. මේ ගැන විමර්ශනයක් සිදු කිරීම ඉතා වැදගත්ය.

ඇමැති බන්දුල පෙන්වා දෙන අන්දමට 2015/2019 කාලය තුළ සතොස ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටලු තුනක් මතු වී ඇත. පළමු ගැටලුව වන්නේ අධික අලාභයක් වාර්තා කිරීමය. පාඩුව රුපියල් කෝටි දෙදහසක් ලෙස සටහන් වී ඇත. දෙවන ගැටලුව වන්නේ සැපයුම්කරුවන් සම්බන්ධ ගෙවීම්ය. එම ගෙවීම්වල ගණන රුපියල් බිලියන අටක් වන අතර, ගෙවීම් සම්බන්ධ විධිමත් වාර්තා නැත. ආයතනයේ ගිණුම් කටයුතුවල විශාල අවුලක් ඇති බව ඇමැතිවරයා පෙන්වා දී ඇත. රාජ්‍ය ආයතනයක ගිණුම් කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු විය යුතුය යන්න පිළිගත් මතයකි. යහපාලන ආණ්ඩුවේ බලධාරීන් විනිවිදභාවය තුට්ටුවකට ගණන් ගෙන නැත. තුන්වන ගැටලුව වන්නේ නුසුදුසු ස්ථානවල වෙළෙඳසල් පිහිටුවීමය. ආයතනයේ පාඩුවට එය ද හේතුවක් වන්නට පුළුවන.

රාජ්‍ය ආයතන පාඩු ලැබීම ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා වී ඇත. මෙහිදී මතුවන හේතු-සාධක කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම වටී. බොහෝ ආයතන පාඩු ලබන්නේ රජයේ ප්‍රතිපත්ති හා සැලසුම්වල ඇති නොගැළපීම් නිසාය. තවත් ආයතනවල නාස්තිය හා දූෂණය ඉහළ මට්ටමක පවතී. ඉහළ කළමනාකාරිත්වයේ දුර්වලතා තවත් ප්‍රධාන හේතුවකි. මේ සියල්ලට වඩා ප්‍රමුඛ වන්නේ ආයතන දේශපාලනීකරණයට ලක්වීමය. දේශපාලන ව්‍යාපෘති සඳහා ආයතන භාවිත කරන විට එම ආයතනවල ක්‍රියාකාරිත්වය ඇන හිටී. යහපාලන ආණ්ඩුවේ ආර්ථික මඟපෙන්වන්නා වූයේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාය. ඔහු දකුණු ආසියාවේ හොඳම ආර්ථිකය ශ්‍රී ලංකාවට අත්කර දෙන බව කියා සිටිය ද සිදු වී ඇත්තේ වෙනත් දෙයකි. සතොසත් ඊට නිදසුනකි.

රාජ්‍ය ආයතනයක් පාඩු ලබන්නේ නම්, පවතින ආණ්ඩුව ඊට වගකිව යුතුය. දිගින් - දිගටම පාඩු ලබන ආයතන ගැන ආණ්ඩුවේ බලධාරීන් සුදුසු පියවර ගත යුතුය. ඒවා නොසලකා හැරීම හැඳින්විය හැක්කේ ජාතික අපරාධයක් හැටියටය. යහපාලන ආණ්ඩුවේ පාලන කාලය 2015 සිට 2019 අග කාර්තුව තෙක් විහිදී යන අතර, සතොස ආයතනය දිගටම පාඩු ලබා ඇත. එකල ආණ්ඩුවේ බලධාරීන් මේ සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුව තිබිණි. එහෙත් එවැන්නක් සිදු වී නැත. වික්‍රමසිංහ මහතාගේ ආර්ථික න්‍යාය වන්නේ පාඩු ලබන ආයතන විකුණා දැමිය යුතුය යන්නය. එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික දර්ශනයට අනුව පෞද්ගලික අංශයට සියල්ල බාර දිය යුතුය. රාජ්‍ය ආයතනවලට වෙළෙඳාම බැරිය යන්න ඔවුන්ගේ ප්‍රමුඛ අදහසකි.

පසුගිය මාස දෙක - තුන තුළ සතොස විශාල වෙනසකට ලක් විය. එහි අලෙවි වාර්තා සියයට එකසිය දෙකකින් පමණ ඉහළ ගියේය. සතොස වාර්තාගත ආදායමක් ලබන්නට ද සමත් විය. ඒ මහජනයාට සාර්ථක සේවාවක් ද සපයමින්ය. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ විසිහතක් සහන මිලකට දීමට සතොස ක්‍රියා කළේය. වෙළෙඳසල් දෙසිය ගණනක් පාඩු ලබන තත්ත්වයේ පසුවන අතර, එය යථා තත්ත්වයට ගැනීමට පියවර යොදා තිබේ. ඇතැම් වෙළෙඳ ස්ථාන වෙනත් තැන්වලට ගෙන යා යුතු බව ද ඇමැති බන්දුල පෙන්වා දී ඇත. ව්‍යාපාර සඳහා සුදුසු ස්ථාන තිබේ. නුසුදුසු ස්ථාන ද තිබේ. තෝරා - බේරාගැනීමකින් යුතුව සුදුසුම ස්ථානවල ඒවා පිහිටුවිය යුතුය. ඇමැති බන්දුලට දැන් එම වගකීම ද පැවරී ඇත.

ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික පරිසරයට අනුව සතොස වැනි ආයතන ශක්තිමත්ව පවත්වාගෙන යා යුතුය. එක අතෙකින් එය පාරිභෝගිකයාට සහනයකි. අනෙක් අතින් එය රජයේ සැපයුම් ජාලයට හා බෙදාහැරීමට පහසුවකි. ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ නිවැරැදි වැටහීමක් ඇති පුද්ගලයන් මේ ආයතනවලට නායකත්වය දීම වඩාත් සුදුසුය.

### දිල්රුගෙ සිහිවී

අමතක වී රැඳී පාසල් පොත් අතර
නිවෙසට ආ මුදල යළි දුන්නා බාර
අග හිඟ මැදත් සිටිනා ගුණ දම් නෑර
යහපත් දරුවන්ට පුදනෙමි ආචාර

# ජන සුව ගොඩනඟන වෑයම



රටක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී එරට ජනතාවගේ නීරෝගීකම ඉතා වටිනා සාධකයකි. අපේ රටේ ඈත අතීතයේ සිටම ජීවත්වූ ජනතාව නිරෝගීකමට උරුමකම් කියූ බව ඉතිහාසයෙන් ඔප්පු කොට ඇත.

විශේෂයෙන් අපේ රට සර්ම කලාපීය රටකි. නිතර හිරු එළිය ලැබීමෙන් බොහෝ රෝගාබාධවලට පවා ලැබුණේ පරාජයකි. තවද මිනිසුන් කය වෙහෙසා වැඩ කළ ජාතියක් නිසා නීරෝගිකමට ලැබුණේ මහගු ඔසුවකි. කුඹුරේ වැඩකොට කය වෙහෙසූ ගොවියා දිවා කාලයේ හිරු එළියෙන් කැකෑරී සවස් යාමයේ ස්නානය කළ ද ඔවුනට හිසෙන් බහින රෝගයකටවත් ඉඩක් තිබුණේ නැත. ඈත කුඹුරු යාය මැදින් එන පුරුෂයා දකින බිරිඳ බාන්වැල් ගැට කැබැල්ලක් කපා කේතලය ලිප මත තබන්නේ නිරෝගීකමට තවත් ඔසුවක් නොමැති බව දන්නා හෙයිනි. මෙවැනි සරල ගැමි ජනජීවිත තුළ නිරෝගීමත් ජනතාවක් බිහි විය.

මහා වැව්, මහා දාගැබ්, කලා නිකේතන දහඩිය මුගුරු හෙළමින් ගොඩනැඟුවේ මෙවන් ජාතියකි. බත් ගසින් කොස් ගසින් කුරහන් කරලින් අල බතලවලින් ඔද තෙද බල අත්කර දුන්නේය. රණකාමීත්වයක් කලාකාමීත්වයක් වීරෝදාර රණවිරුවන් මෙන්ම නිර්මාණශීලි කලාකරුවන් බිහි කළේය. යුග ගණනාවක්ම මේ පිරිපුන් නීරෝගි ජනතාව රටක් සමෘද්ධිමත් කළේය.

චෝල පාණ්ඩ්‍ය, කේරළ පමණක් නොව යුරෝපීය ජාතීන් 3කගේ බලය බිඳීමට හැකි ජාතියක් බව වරින්වර ඉතිහාසය පුරා ඔප්පු කළේය.

නිදහසින් පසුව වුවද ඒ නීරෝගි බව රැකුණේ දේශීය අල, බතල, කුරහන්, මුං ආදී ධාන්‍ය වර්ග හොඳින් අනුභව කිරීම නිසාය. අපිට උරුම ජාතික ක්‍රීඩාවන් තුළින් ද ඒ නීරෝගීකම තවදුරටත් රැක දුන්නේය. මෙවැනි සරල සුන්දර නීරෝගී ජනතාවක් වාසය කළ රටකට දේශීය වෙදකම එකතුවීමෙන් දිගාසිරි අත්කර දුන්නේය. එහෙත් 80 දශකයේ සිට අපේ රටේ බෝ නොවන රෝගවලට භාජනය වන රෝගීන්ගේ සංඛ්‍යාව වැඩිවන්නට වූයේ කිසිවකු නොසිතූ පරිද්දෙනි. මුළු ලෝකයම අධි පරිභෝජනවාදී ආර්ථික රටාවකට හුරුවී තිබීම නිසා ලංකාව වැනි රටවල් ද එහි අනුකාරකයන් බවට පත් වීම නොවැළැක්විය හැකි තත්ත්වයකි. විශේෂයෙන් කෘත්‍රිමව සැකසූ ක්ෂණික ආහාරපානවලට ජනතාව හුරුවීමත් සමඟ දිනෙන් දින බෝ නොවෙන රෝගවලට ගොදුරුවීමේ ප්‍රවණතාවය ඉතා ඉහළ අගයක් ගත්තේය. විශේෂයෙන් විද්යුත් මාධ්‍ය හරහා ඒ ක්ෂණික ආහාරපානවල වෙළෙඳ දැන්වීම් නිතර නිතර ප්‍රචාරය කරමින් බහුජාතික සමාගම්කරුවන්ගේ වෙළෙඳ තරගයේ අවසන් ප්‍රතිඵලය වූයේ ඒවා පරිභෝජනය කළ ජනතාව බෝ නොවන රෝගවලට ගොදුරුවී රෝහල්වල පෝලිම් ඉහළ යෑමයි.

## මරණයට ගෙන යන ආහාර රටාව

ක්ෂණික ආහාර පාන වර්ග, පැණි බීම වර්ග දේශීය වෙළෙඳපොළ ආක්‍රමණය කරද්දී බාල, තරුණ, මහලු සියලු දෙනාම එහි ගොදුරක් බවට පත් විය. අපේ රටේ තිබෙන නිදහස් සෞඛ්‍ය සේවයට අමතරව ගොඩනැඟුණු පෞද්ගලික රෝහල් අයිතිකරුවන් වූ මුදලාලිලාගේ සහ චැනල් සර්විස්කරුවන්ගේ අතමිට සරු කිරීමට මේ තත්ත්වය හේතු විය. ගමේ කොත්තු කඩ, ආප්ප කඩ මෙන්ම කෘත්‍රිම ආහාරපාන අලෙවිසල් වැඩිවෙද්දී ඊට සමගාමීව අලුතින් ෆාමසි ද පෞද්ගලික බෙහෙත් සාප්පු ද ආරම්භ වූයේ හතු පිපෙන්නාසේය.

දියවැඩියාව, අධි රුධිර පීඩනය, හෘදයාබාධ, සාමාන්‍ය උණ, කැස්ස, හෙම්බිරිස්සාව තත්ත්වයට පත් කළේ ඒ නරක ආහාර පුරුදු රටාවය. අධි රුධිර පීඩනය කොලෙස්ටරෝල්, හෘදයාබාධ, දියවැඩියාව එක පැත්තකින් වර්ධනය වෙද්දී තවත් පැත්තකින් වකුගඩු, පිළිකා වැනි තවත් මාරාන්තික රෝගවලට රටේ ජනතාව ගොදුරු වූයේ ඉතා අවාසනාවන්ත අයුරිනි.

ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන ආකාරයට අපේ රටේ වාර්ෂිකව සිදුවෙන මරණ අතුරින් 65% කටම හේතුව බෝ නොවන රෝග බව හෙළි කරයි. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන තවත් කරුණක් වන්නේ වර්තමානයේ බොහෝ ශ්‍රීලාංකිකයන් කෘෂිකාර්මික දිවිපෙවෙතින් නාගරික සංස්කෘතියට යොමුව ඇති බවය. ඒ මගින් සිදුවෙන ආහාර රටාවේ වෙනස ලාංකිකයන් මුහුණදෙන තරබාරු බව, දියවැඩියාව මෙන්ම තවත් බෝ නොවන රෝග රැසකට මුල බව වැඩිදුරටත් පෙන්වා දෙයි.

එහෙත් කෘෂිකාර්මික දිවි පෙවෙතින් ඈත් වීම නාගරීකරණය වීම යන කරුණු ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් පැවසුවත් ඊට හාත්පසින්ම වෙනස් ආකාරයක් වකුගඩු රෝගය හා පිළිකාව වැනි රෝග හා සැසඳීමේදී පැහැදිලි වේ. විශේෂයෙන් වකුගඩු රෝගයට විශාල වශයෙන් ගොදුරුවී ඇත්තේ රජරට ගොවි ජනතාවය. මේ පිළිබඳව පර්යේෂණයක් සිදු කළ ලන්ඩන් ඉම්පීරියල් කොලේජ් විශ්වවිද්‍යාලයේ පර්යේෂක ආචාර්ය කමල් ගම්මන්පිල පවසන පරිදි රසායනික පොහොර භාවිතය මේ රෝගවලට මූලිකව බලපා ඇති බවයි.

ග්ලයිපොසෙට් පළිබෝධ නාශකය පිළිබඳව වසර කීපයක සිට පර්යේෂණ කළ වත්මන් රජයේ අමාත්‍යවරයකු වන මහාචාර්ය චන්න ජයසුමන මේ රෝගය හඳුන්වාදී ඇත්තේ කෘෂිකාර්මික වකුගඩු රෝගය යන නමිනි. පිළිකා රෝගීන් ද දිනෙන් දින ඉහළ යද්දී නැවතත් අපට වසවිසෙන් තොර අපේ පැරණි හෙළයාගේ කෑම වට්ටෝරුවට යෑමට අද සිදුවී ඇත. රසායනික පොහොර පළිබෝධනාශක වර්ග ලංකාවට විකුණන බහුජාතික සමාගම්කරුවන් දිනෙන් දින ඉහළයන බෝ නොවන රෝගවලට අවශ්‍ය ඖෂධ වර්ග ද ඒ රටවල නිෂ්පාදනයකොට මුදල්වලට අපට විකිණීම කෙතරම් ඛේදජනක සිදුවීමක් ද?

නිදහස් සෞඛ්‍ය සේවයක් තිබෙන රටවල් අතුරෙන් ශ්‍රී ලංකාවට ඉහළ ස්ථානයක් හිමි වීම නොරහසකි. ලෝකයේ අවි ආයුධ වෙළෙඳාම හැරුණු කළ තවත් එවැනිම අගයක් ගන්නා වෙළෙඳාමක් ලෙස ඖෂධ වෙළෙඳාම ප්‍රචලිතව ඇත. ශ්‍රී ලංකාවේ දිනෙන් දින ඉහළ යන රෝගීන්ගේ තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී නිදහස් සෞඛ්‍ය සේවය වෙනුවෙන් වැයවන මුදල රුපියල් බිලියන 3000ක් වූ අතර වසරින් වසර 6000ක් 8000ක් දක්වා ඉහළ ගොස් ඇත. බටහිර වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමග මුළු ලෝකයේම ඖෂධ වෙළෙඳාම ජාවාරමක් බවට පත්වී එය අද ඖෂධ මාෆියාවක් දක්වා වර්ධනය වී ඇත. ඒ ඖෂධ මාෆියාවට එරෙහිව සටන් කළ අපේ පුංචි ශ්‍රී ලංකාවෙන් බිහිවූ වෛද්‍ය විද්‍යාවේ ප්‍රාමාණිකයකු වූ මානව හිතවාදී මහාචාර්ය සේනක බිබිලේ මහතා සිය අවසන් හුස්ම පොද වාතලයට මුසු කළේ ඖෂධ ජාවාරම්කරුවන්ට එරෙහිව සටන් කරද්දීය. දුප්පත් මිනිසුන්ට ප්‍රමිතියෙන් ඉහළ ගුණාත්මක බෙහෙත් දීම එතුමාගේ සටන්වල මූලික අරමුණ විය. ඒ අනුව 1971දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ යුගයේ සේනක බිබිලේ ප්‍රතිපත්තියට අනුව යමින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (State Pharmaceuticals of Sri Lanka) ආරම්භ කොට අදට අඩසියවසක් ගතවී ඇත.

**බටහිර වෛද්‍ය විද්‍යාවේ දියුණුවත් සමඟ මුළු ලෝකයේම ඖෂධ වෙළෙඳාම ජාවාරමක් බවට පත්වී එය අද ඖෂධ මාෆියාවක් දක්වා වර්ධනය වී ඇත. ඒ ඖෂධ මාෆියාවට එරෙහිව සටන් කළ අපේ පුංචි ශ්‍රී ලංකාවෙන් බිහිවූ වෛද්‍ය විද්‍යාවේ ප්‍රාමාණිකයකු වූ මානව හිතවාදී මහාචාර්ය සේනක බිබිලේ මහතා සිය අවසන් හුස්ම පොද වාතලයට මුසු කළේ ඖෂධ ජාවාරම්කරුවන්ට එරෙහිව සටන් කරද්දීය. දුප්පත් මිනිසුන්ට ප්‍රමිතියෙන් ඉහළ ගුණාත්මක බෙහෙත් දීම එතුමාගේ සටන්වල මූලික අරමුණ විය**

එහෙත් බෝ නොවන රෝගවලට අවශ්‍ය ඖෂධ වර්ග වෙනත් රටවලින් ආනයනය කිරීම නිසා විශාල මුදල් ප්‍රමාණයක් අපේ රටින් වෙනත් රටවලට ගලායෑම නතර කළ යුතු බව තේරුම්ගත් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා "සෞභාග්‍යයේ දැක්ම" වැඩ පිළිවෙළ හරහා "අලුත් රටට අලුත් බෙහෙත්" යන සංකල්පයෙන් අපේ රටේම බෙහෙත් නිෂ්පාදනය කිරීම ආරම්භ කළේ රටට ආදරය කරන ජන නායකයකු වශයෙනි.

අසල්වැසි ඉන්දියාව, බංග්ලාදේශය, නේපාලය, පාකිස්තානය ඇතුළු කලාපීය රටවල් බෙහෙත්වලින් ස්වයංපෝෂිත වෙද්දී 2019 වසර වන විට ශ්‍රී ලංකාව සිටියේ ඊට බොහෝමයක් පසුපසිනි. 2012දී මහින්ද රාජපක්ෂ යුගයේදී බිලියන 2.2ක් වියදම්කොට රත්මලානේ SPMC ආයතනය නවීකරණය කළේ ද අපේ රටට අවශ්‍ය බෙහෙත් අපේ රටේම නිෂ්පාදනය කිරීමේ බලාපොරොත්තුවෙනි.

2015දී බලයට පත්වූ යහපාලන ආණ්ඩුව රුපියල් 2ක බෙහෙත් පෙත්තක් වෙනුවෙන් 137ක් ගෙවා ඇති බව විගණන වාර්තාවලින් හෙළි විය. මේ අනුව ඖෂධ ආනයනය කිරීම යනු තනිකරම මාෆියාවකි. තනිකරම කොමිස් කුට්ටි ලැබෙන මහා පරිමාණයේ ජාවාරමකි. මේ තත්ත්වය යටතේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ක්‍රියාවට නංවමින් "අලුත් රටට අලුත් බෙහෙත්" සංකල්පය යටතේ වසරක කාලයක් ඇතුළත 15%ක් පැවැති බෙහෙත් නිෂ්පාදන ක්‍රියාවලිය 26%ක් දක්වා වර්ධනය කර ගැනීමට ලැබීම ඉතාම සාධනීය වර්ධනයක් සේම අපේ රටේ සමස්ත ජනතාවම ලැබූ තවත් ජයග්‍රහණයකි.

## නව ඔසු කම්හල් - නව ඔසු සල්

යහපාලන සමයේදී බෙහෙත් වර්ග 800කින් 300 කට අධික බෙහෙත් වර්ග ප්‍රමාණයක් කෘත්‍රිම හිඟයක් මවා හදිසි මිලදී ගැනීමක් සිදු කළේය. ඒ නාස්තිකාර ක්‍රමයට දැන් තිත තබා ඇත. එමගින් ඉතිරි වූ මුදල බිලියන 1කට වැඩිය.

රත්මලානේ SPMC ආයතනය තුළ හෝමෝන නිෂ්පාදනය සඳහා නව පර්යන්තයක් ද මෙම කාල සීමාවේම ආරම්භකොට ඇත.

ජනාධිපති කාර්යසාධක බළකායේ ප්‍රධානී හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ යෝජනාවකට අනුව හම්බන්තොට ප්‍රදේශයේ ඖෂධ ප්‍රතිඅපනයනය සඳහා නව කර්මාන්ත ශාලාවක් මේ මොහොත වන විට ඉදිකරමින් ඇත. මේ සියල්ල අවසානයේ පසුගිය වසර තුළ පමණක් බිලියන 6.2 (6,200,000)ක ඉතිරියක් රටට ලබාදීමට සමත් වීම අගය කළ යුත්තකි.

ටෙන්ඩර් ක්‍රමය ක්‍රමවත් කිරීම මගින් ද විශාල ලාභයක් ලැබීමට වත්මන් රජය සමත් වී ඇත. රාජ්‍ය ඔසුසල් ප්‍රමාණය ද 45 සිට 100 දක්වා මේ වන විට වැඩිකොට ඇත. විශේෂයෙන් හොරණ, මිල්ලෑව ප්‍රදේශයේ අක්කර 65ක ඉඩමක වසර දෙකක් තුළ රජයේ ඖෂධ කර්මාන්තශාලා 5ක් ඇතිකොට බිලියන 5ක් දක්වා නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට පියවර ගත්තේ කොරෝනා අභියෝගය ද නොතකා බව අමතක නොකළ යුත්තකි.

විකලාංග උපකරණ සඳහා ද කර්මාන්තශාලාවක් එම පරිශ්‍රමයේම ඉදිකිරීමට කටයුතු කරගෙන යනු ලබයි. මේ වන විට පහත සඳහන් ඖෂධ වර්ග නිෂ්පාදනය කොට මහජන මුදල් රටට ඉතිරි කර දීමට සමත්ව ඇත. එනම් Cup to Pril tap (12.5 mg) 2020 වසරේ මෙරට නිෂ්පාදනය කිරීමෙන් ඉතිරි කරන ලද මුදල රුපියල් මිලියන 35කි.

Ferrous Fumarate Tap. (91.2 mg) 2020 වසරේ මෙරට නිෂ්පාදනය කිරීමෙන් ඉතිරි කරන ලද මුදල රුපියල් බිලියන 49කි. (Ferrous Fumarate Tab (182.4 mg) 2020 වසරේ මෙරට නිෂ්පාදනය කිරීමෙන් ඉතිරි කරන ලද මුදල රුපියල් මිලියන 68කි.

Ferrous Fumarate Tab Maternal (182. 4 mg) 2020 වසරේ මෙරට නිෂ්පාදනය කිරීමෙන් ඉතිරි කරන ලද මුදල රුපියල් මිලියන 103කි.

අපේ රටේ ජීවත්වෙන දුප්පත් ජනතාව රෝගීන් බවට පත්කොට නිදහස් සෞඛ්‍ය සේවාවක් තිබෙන රටක මහජන මුදල් කාබාසිනියා කළ ඊනියා ඖෂධ ජාවාරම්කරුවන්ට තිත තබමින් අපේ රටේම දේශීය නිෂ්පාදනය කරන නැවුම් බෙහෙත් පෙත්තකින් කායික වේදනාව දුරුකර ගැනීමට ලැබීම ඉතා උතුම් ක්‍රියාවකි.

වර්තමාන ආණ්ඩුව නිහඬව ඉටුකරන මෙවැනි සත්කාරක ක්‍රියාවන් පිළිබඳව වැඩි වැඩියෙන් කතා කළ යුත්තේ මහජනතාවට ඉටුවන අමිල මෙහෙවර සැලකිල්ලට ගනිමිනි.

කොවිඩ් වසංගතයක් පවතින රටක කර්මාන්ත ශාලා ඉදිකරමින් බෙහෙත් නිෂ්පානය කිරීම හෙට දිනයේ ජීවත්වෙන නිරෝගී ජනතාව වෙනුවෙන් ඉටුකරන ලද මහඟු පින්කමකි.

**මහින්ද ආරියවංශ**





# පුහුණු ශ්‍රමිකයන් බිහි කරන වෘත්තීය අධ්‍යාපනය

ආචාර්ය **කේ.ඒ. ලලිතධීර**
අධ්‍යක්ෂ-මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව

පුද්ගලයකු තුළ දැනුම කුසලතා හා ආකල්ප වෘත්තීයක් කිරීමට හැකිවන පරිදි සංවර්ධනය කිරීම නිපුනතා සංවර්ධනය ලෙස සරලව දැක්විය හැකිය. ශ්‍රම බළකාය නිපුණත්වයෙන් පරිපූර්ණවීම වේගවත් ආර්ථික සංවර්ධයට අත්‍යවශ්‍ය සාධකයක් වන අතර එය ප්‍රධාන මානව ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස මින්සර් සහ බෙකර් වැනි ශ්‍රම ආර්ථික විද්‍යාඥයින් පෙන්වා දී ඇත. වත්මන් රජයේ ජනපතිතුමන් ඉදිරිපත් කර ඇති සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ නුපුහුණු ශ්‍රම බළකාය 2022 වන විට 20% දක්වාත් 2030 වන විට එය 10% දක්වාත් අඩු කළ යුතුය යන ඉලක්ක නියම කිරීම සහ නිපුණතා දශකය ප්‍රකාශයට පත් කර ඇත්තේ පුහුණු ශ්‍රමයේ වටිනාකම මැනවින් අවබෝධ කර ගෙන ඇති බැවිනි.

පුහුණු ශ්‍රමය පිළිබඳ ව කතා කිරීමේ දී ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ අවධානය යොමු කළ යුතු වන අතර වර්තමානයේ ශ්‍රම වෙළෙඳපොළ අර්බුද රාශියකට මුහුණ දී ඇත. ඒ අතර ප්‍රධාන ගැටලුවක් වනුයේ වර්ෂයකට පාසල් පද්ධතියට එකතු වන සංඛ්‍යාව 350,000 පමණ වන අතර ඉන් සරසවි අධ්‍යාපන වරම් ලැබෙනුයේ 30000කට පමණි (8.5%). ඉතිරි කොටසින් වෘත්තීය පුහුණු පද්ධතියට වාර්ෂිකව 160000 ක් පමණ ඇතුළු වුවත් ඉන් පාඨමාලා හදාරා NVQ සහතික පත්‍ර ලැබනුයේ වර්ෂයකට 70000 (2018) කට ආසන්න සංඛ්‍යාවකි. තවත් කොටසක් උසස් අධ්‍යාපනය සඳහා දේශීය හා විදේශීය පෞද්ගලික ආයතන වෙත යොමු වූ පසු 150,000කට අධික සංඛ්‍යාවක් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස ශ්‍රම වෙළෙඳපොළට එකතුවේ. එමෙන්ම රටේ ශ්‍රම බළකායෙන් 350,000 ක් පමණ සංඛ්‍යාවක් නිශ්චිත රැකියාවක් නොමැතිව පසුවේ.

මෙලෙස විරැකියාවක් පවතිද්දී කර්මාන්ත හා සේවා පවත්වාගෙන යෑමට අවශ්‍ය පුහුණු ශ්‍රමිකයින්ගේ විශාල හිඟයක් ද පැවතීම විශේෂ අවධානයට ලක්විය යුතු ගැටලුවකි. ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, නිෂ්පාදන කර්මාන්ත හා හෝටල් සහ සංචාරක ඇතුළු ක්ෂේත්‍රවල මේ හිඟය දැකිය හැකිය. කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව මෙය තරමක් වෙනස් වුවද දිගුකාලීනව පුහුණු ශ්‍රම හිඟතාව පිළිබඳ ගැටලුවකට මුහුණපා ඇත. මේ හේතුවෙන් පෞද්ගලික අංශය විදේශීය ශ්‍රමිකයින් මෙරටට ගෙන්වා ගැනීමට උත්සාහ දරන අතර දැනටමත් ලක්ෂ දෙකකට ආසන්න සංඛ්‍යාවක් අවිධිමත් ලෙස පැමිණි විදේශීය ශ්‍රමිකයින් විවිධ රැකියාවල යෙදෙන බවට අනුමාන කරති.

## නුපුහුණු ශ්‍රමය

රටේ සමස්ත ජනගහනය 2018 දී දෙකෝටි දොළොස් ලක්ෂයක් වන අතර ඉන් වැඩ කළ හැකි වයසේ සිටිනුයේ 16,196,232 ක් පමණි. ඉන් 50%ක් ම ආර්ථික වශයෙන් අක්‍රිය ජන සංඛ්‍යාවක් වන අතර ශ්‍රම බළකාය සංඛ්‍යාව 8,387,759 ක් පමණි. ඉන් 2,100,656 ක් නුපුහුණු ශ්‍රමිකයින් වීම ද සංවර්ධන ඉලක්ක කරා යාමට මහත් බාධාවක් ලෙස දැක්විය හැකිය.

මේ අතර ලක්ෂ 10ක පමණ පිරිසක් (සේවා නියුක්තිකයිනගෙන් 14%ක් පමණ) ත්‍රීරෝද රථ රැකියාවල නිරතවේ. මොවුන් යම් අධ්‍යාපන මට්ටමක් ලැබූවන් වන අතර එය ඌන සේවා නියුක්තියක් ලෙසද දැක්විය හැකිය. අනෙක් අතට කාන්තාවන් ශ්‍රම බළකායෙන් ඈත් වීම දිගු කාලයක සිට පවතින ගැටලුවකි. මේ හේතුව මත කාන්තා ශ්‍රම බළකා සහභාගිත්වය 36% මට්ටමේ දිගු කාලයක් පවතී. තව ද විදේශ රැකියා සඳහා ගොස් නැවත පැමිණෙන විශාල සංඛ්‍යාවක් දේශීය කර්මාන්ත හා සේවා අංශවලට ඵලදායී ලෙස සම්බන්ධ නොවීම ද ප්‍රධාන ගැටලුවක්ව පවතී.

නිපුනතා දශකය අර්ථවත් කරමින් අභියෝග ජය ගැනීමට නුපුහුණු ශ්‍රමිකයින්ගේ ප්‍රතිශතය10% දක්වා පහත දැමීමට හඳුනාගත යුතු ප්‍රධාන ඉලක්ක කණ්ඩායම් තුනක් වන අතර අධ්‍යාපන අංශ හතරක් වේ. ඒ අනුව ඉලක්ක කාණ්ඩ

දැනටමත් විවිධ රැකියාවල නියුතු නුපුහුණු ශ්‍රමිකයින්, (මෙය සංඛ්‍යාත්මකව 1,835,000 ක් පමණ වේ) පුහුණුවක් නොමැතිව රැකියා අපේක්ෂාවෙන් සිටින සංඛ්‍යාව, (සංඛ්‍යාත්මකව 265000 ක් පමණ වේ) අධ්‍යාපන පද්ධතියට වාර්ෂිකව අලුතින් ඇතුළුවන සංඛ්‍යාව (350,000 ක් පමණ) ලෙස දැක්විය හැකි අතර අධ්‍යාපන අංශ හතර පාසල් පද්ධතිය (13 වසරක අනිවාර්ය අධ්‍යාපනය, තාක්ෂණ විෂයයන්) උසස් අධ්‍යාපන ආයතන පද්ධතිය (විශ්වවිද්‍යාල ඇතුළත් උසස් අධ්‍යාපන ආයතනවල වෘත්තීය ඉලක්කගත පාඨමාලා)

කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව (නිපුණතා සංවර්ධන අමාත්‍යංශය යටතේ ඇති රාජ්‍ය හා පෞද්ගලික පුහුණු ආයතන උදා. (VTA, NAITA, DTET, NYSC, CGTTI )

වෘත්තීය සංවර්ධන ආයතන (CIMA, CMA, Chartered institute, AAT, CPM, NIBM Etc.) ලෙස වෙන් කර දැක්විය හැකිය. මේ අංශ හතර මගින් රටේ නිපුන ශ්‍රම බළකාය වර්ධනය කිරීම සඳහා වඩාත් ආකර්ෂණීය උපාය මාර්ග හඳුනා ගැනීම නිපුණතා දශකය වඩාත් අර්ථවත් කිරීම සඳහා වැදගත්වනු ඇත. ආයතන වෙන් වශයෙන් නොව ඒ සඳහා පළමුව එම ක්ෂේත්‍රවල ඉහළ කළමනාකරණයේ පද්ධති චින්තනයක් පැවතිය යුතුය.

## පාසල් අධ්‍යාපනය

නිපුණ ශ්‍රම හමුදාවක් බිහි කිරීමේ දී පාසැල් අධ්‍යාපනය සම්බන්ධ ගැටලු රාශියක් මතු සඳහන් කරන ලදී. එම ගැටලුවලට විසඳුම් ලබාදීමෙන් මේ අරමුණ කරා යාමට අවස්ථාව ලැබෙනු ඇත. ඒ අනුව වෙනස්වන නව ආර්ථික හා තාක්ෂණික තත්ත්වයන්ට ගැළපෙන ලෙස අධ්‍යාපන පද්ධති යාවත්කාලීන කිරීම, නිපුණතාවයෙන් පිරි ශ්‍රම බළකායකට අවශ්‍ය පදනම සැකසීම සහ මෘදු කුසලතා වර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීම

පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කරවීම

ගණිතය, විද්‍යාව, ඉංග්‍රිසි සහ තාක්ෂණ විෂයයන් උගැන්වීමට ප්‍රමාණවත් දක්ෂ ගුරුවරුන්ගේ පුහුණු කිරීම දහතුන් වසරක අනිවාර්ය අධ්‍යාපනය පාසල් 212 කට පමණක් සීමා නොවී ව්‍යාප්ත කිරීම පාසල් අධ්‍යාපනය වෘත්තීය අධ්‍යාපනය සමඟ පවතින සම්බන්ධතාව ශක්තිමත් කිරීම හා වෘත්තීය පුහුණු ආයතන හැකිතාක් සම්බන්ධකර ගැනීම උසස් හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය නිපුණ ශ්‍රම බළකාය අර්ථවත් ලෙස වර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කරගන්නා සංඛ්‍යාව 19% සිට 30%ක් දක්වා වර්ධනය කිරීම ඉතා වැදගත් වේ. එය වර්ධනය කළ යුත්තේ සාම්ප්‍රදායික පාඨමාලා සඳහා නොව නූතන සහ අනාගත ආකර්ෂණීය ක්ෂේත්‍ර සඳහා වේ.

මේ සඳහා පවතින භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවෙන් උපයෝජනය කිරීම, නව පාඨමාලා ආරම්භ කිරීම, කලා අංශ වැනි ක්ෂේත්‍ර සීමා කිරීම මෙන්ම දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳපොළේ නව ප්‍රවණතා හඳුනාගැනීම ද ඉතා වැදගත් වේ. තව ද විදේශීය ශිෂ්‍යයින් ද ආකර්ෂණය කළ හැකි වන ආකාරයට විශ්වවිද්‍යාල පද්ධතියේ ගුණාත්මක භාවය දියුණු කිරීම මෙන්ම ආසියාවේ උසස් අධ්‍යාපන කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමට අවශ්‍ය උපායමාර්ග දියුණු කළ යුතුය.

වෘත්තීය අධ්‍යාපන ආයතන සඳහා නියාමන ආයතනයක් අවශ්‍ය වන අතර දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳපොළේ මේ වන විට අතිරික්තව පවතින මානව සම්පත් සංවර්ධන අංශ වෙනුවට හිඟ හා නව කෂේත්‍ර සඳහා සැපයුම වැඩි කිරීම ද වැදගත්වනු ඇත.

## නව ප්‍රවණතා

ලෝකයේ ශ්‍රම වෙළෙඳපොළ නිරන්තරයෙන් වෙනස්වෙමින් පවතියි. ඒ අනුව නව රැකියා නිර්මාණය වීම සහ ඇතැම් රැකියා ඉවත්ව යෑමද විශේෂ ලක්ෂණයකි. උදාහරණ ලෙස පරිගණක ක්‍රියාකරු, ගිණුම් සහකාර, පොත් තබන්නා ඇතුළු වෘත්තීන් කිහිපයක් ශ්‍රම වෙළෙඳපොළෙන් ඉවත් වෙමින් පවතියි. තවද තාක්ෂණයේ දියුණුවත් සමග කර්මාන්ත හා ආශ්‍රිතව කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligent) භාවිතය වඩාත් ජනප්‍රිය වෙමින් පවතියි. සූර්ය බල විදුලි ජනනය සුළං විදුලි ජනනය සහ සෞඛ්‍ය ක්ෂෙත්‍රවල රැකියා සඳහා ඉල්ලුම වේගයෙන් වර්ධනය වන බව ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂණ මගින් පෙන්වා දී ඇත. (Bureau of labour statistics, Employment projections 2016-2026). තව ද අප රටේ වඩාත් ජනප්‍රිය සාමාන්‍ය වෛද්‍යවරයෙක් සහ ඉංජිනේරුවරයකු මාසයක දී උපයන වැටුප මෙන් හත් අට ගුණයක වැටුපක් ජර්මන් කාර්මික විද්‍යාලය හෝ ඇතැම් පෞද්ගලික හෙද පාඨමාලා හැදෑරුවන් විදේශ රැකියා මගින් උපයා ගනී. විදේශ දියුණු රටවල ඉහළ ඉල්ලුමක් සහිත ක්ෂේත්‍රවල රැකියා සඳහා පුහුණුව ලැබූවන්ට එම වාසි අත්කර ගැනීමට හැකිවීම විශේෂත්වක් ලෙස දැක්විය හැකිය.

## විවිධාංගිකරණය

අප රටේ කාර්මික අධ්‍යාපන හා පුහුණු පද්ධතිය අනෙකුත් ආසියානු රටවල් සමඟ සැසඳීමේ දී පසුගිය දශක දෙක තුළ සැලකිය යුතු මට්ටමකට ඉදිරියට පැමිණ ඇත. විශේෂයෙන් ආයතනික රාමුව පුළුල්වීම සහ NVQ පද්ධතිය හඳුන්වාදීම හා ප්‍රමිතීන් දියුණු කිරීම සහ පාඨමාලා විවිධාංගිකරණය කිරීම ඒ අතර කැපී පෙනේ. කෙසේ වෙතත් ආසන්නයේ පවතින සිංගප්පූරුව, මැලේසියාව, කොරියාව සහ අනෙකුත් දියුණු රටවල් සමඟ සැසඳීමේ දී මෙරට කාර්මික අධ්‍යාපන හා පුහුණුව සම්බන්ධව තව දුරටත් බොහෝ දේ කළ යුතුව ඇත. උදාහරණ ලෙස සිංගප්පූරුව 1960 දශකයේ පැවති ශ්‍රම සූක්ෂ්ම ආර්ථිකයේ සිට මේ දක්වා අවධීන් හයකට අනුව වෘත්තීය පුහුණුව යාවත්කාලීන කර ඇත. එය අප රටට ද හොඳ ආර්ශයක් වන අතර පුහුණු ශ්‍රම බල ගැටලුවට තිර සාර විඳුමක් ලබාදීම සඳහා පහත සඳහන් යෝජනා ඉතා වැදගත්වනු ඇතැයි සිතමි.

සමාජය තුළ ආකල්පමය වෙනසක් ඇති කරවීම සඳහා සුදුසු ක්‍රමෝපායන් යෙදීම

මේ තුළින් වඩු බාස්, මේසන් බාස් ආකල්පය ඉවත් විය යුතු අතර මෙය වෘත්තියේ නම වෙනස් කිරීම මගින් පමණක් සිදු කළ නොහැක. බොහෝ දියුණු රටවල වෘත්තීන් අතර පිළිගැනීමේ විෂමතාව අඩු මට්ටමක පවතී. සාමාන්‍ය සමාජයේ සියලු දෙනා එක හා සමානව පිළිගනී.

## සාපේක්ෂ වාසි

අප රටේ අධ්‍යාපන මට්ටම ඉහළ යෑමත් සමඟ කාර්මික ශිල්පීන් සහ කම්කරු වෘත්තීන්වල නියැළීමට මැලිකමක් දක්වයි. එහෙත් කාර්යාල, වෙළෙඳ, සෞඛ්‍ය හා සේවා අංශ මෙන්ම ඉංජිනේරු, වෛද්‍ය, හෙද යනාදී වෘත්තීන්වල නියැලීමට ඔවුන් වැඩි කැමැත්තක් හා උනන්දුවක් දක්වති. ඉහළ වැටුප් ලබන එවැනි වෘත්තීන් සඳහා ශ්‍රමිකයන් අපනයනය කිරීම සහ ඉදිකිරීම් හා ව්‍යාපාරික කර්මාන්ත සඳහා පුහුණු නුපුහුණු ශ්‍රමිකයන් ආනයනය කිරීමත් ආර්ථික වශයෙන් ලාබදායී වනු ඇත. ඒ සඳහා දේශීය ශ්‍රමිකයින් හිඟ ක්ෂේත්‍ර හඳුනාගැනීම, වෘත්තීය බලපත්‍ර ලබාදීම සහ විධිමත් ලෙස තොරතුරු පවත්වාගෙන යෑම ඇතුළු කාර්යයන් සඳහා නියාමනයක් අවශ්‍ය වේ.

වෘත්තීය පුහුණු වැඩසටහන් අනාගත ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුමට ගැළපෙන ලෙස යාවත්කාලීන කිරීම සහ නව පාඨමාලා හඳුනාගැනීම අනාගත ශ්‍රම වෙළෙඳපොළේ ඉවත්වන රැකියා වෙනුවට අලුතින් නිර්මාණයවන රැකියා හඳුනාගැනීම උදාහරණ ලෙස සූර්ය බලශක්ති, සෞඛ්‍ය හා උපස්ථායක සේවා සහ ස්වයං බුද්ධි භාවිතය(Artificial Intelligent) සමඟ ඇතිවන නව රැකියා සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම. වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා මෘදු කුසලතා මොඩියුල එක් කිරීම.

ඒ මගින් ඉංග්‍රිසි භාෂාව, පරිගණක, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ වැඩ ලෝකයට ගැළපෙන ආකල්පමය වෙනසක් ඇති කිරීම වැදගත් වේ. මේ සඳහා දැනටමත් අවධානය යොමු වී ඇතත් එය පාසල් අධ්‍යාපනයේ සිටම ආරම්භ වී වෘත්තීය පුහුණුව සමඟ වැඩි දියුණුවිය යුතුය.

## NVQ සුදුසුකම්

මේ සම්බන්ධව මැලේසියාවේ රිගිට් 1200 ක අවම වැටුපක් නියම කර ඇති අතර එය නිපුණ ශ්‍රම බළකාය වර්ධනය කිරීමට දිරිගැන්වීක් වනු ඇත. අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව අතර සම්බන්ධතාව වඩාත් ශක්තිමත් කිරීම සඳහා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අතිෂයින්ම වැදගත් වේ. එහෙත් වසර 13 අධ්‍යාපන කාලය අනිවාර්ය කිරීමට වඩා නිපුනතාවක් ලබා ගැනීම අනිවාර්යය කිරීම වැදගත් වේ. ඒ ඒ ක්ෂේත්‍රවල නිපුනතාවයේ ස්වරූපය අනුව සිසුන් රැඳී සිටිය යුතු කාලය වෙනස් විය හැක. තව ද පාසැල් 212ක පමණක් සීමා වූ මේ වැඩසටහන ධනාත්මක සංශෝධන සහිතව සියලුම ද්විතියික පාසල් තුළ ව්‍යාප්ත කළ යුතු අතර වර්තමාන හා අනාගත ශ්‍රම ඉල්ලුම අනුව නව විෂයමාලා හඳුන්වා දීම, ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා දැනට පවතින වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කළ හැකිය.

තවද නිපුනතා දශකය අර්ථවත් කිරීමට ප්‍රධාන අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන මෙන්ම අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නියාමන ආයතන සියල්ල පද්ධති චින්තනයකින් ක්‍රියා කිරීම ඉතා වැදගත්වේ. ඒක පුද්ගල ආදායම ඩොලර් 12000 සීමාව පසුකර යෑමට අත්‍යවශ්‍ය සාධකය මේ මානව ප්‍රාග්ධන ආයෝජනයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වේ. ඇතැම් දියුණු රටවල අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන සියල්ල ඇතුළත් කර මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කර ඇති අතර අප රටේ ද වර්තමානයේ අදාල සියලු අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන එකම අමාත්‍යාංශයකට සම්බන්ධ කිරීම වඩාත් කාර්යක්ෂම නිපුනතා පිරි ශ්‍රම හමුදාවක් නිර්මාණය කිරීමට මහත් පිටුවහලක් වනු නොඅනුමාය.




තර්ක Eye

## බදු ප්‍රතිපත්ති

පසුගිය යහපාලන රජයට ශ්‍රී ලංකාවේ එවකට පැවති බදු ක්‍රමය සංශෝධනය කිරීමට අවශ්‍ය විය. ඒ සඳහා එම රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් උපදෙස් ලබා ගත්තේය. එම ආයතනය විසින් ඒ සඳහා විශේෂඥ පිරිසකගේ සහාය ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ නිලධාරීන් සමග එකතු වී 2017 වසරේ දී බදු පනතක් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පසු හෙළි වුණේ 2015 වසරේ දී ඝානාවේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ බදු පනතේ කාබන් කොපියක් බවයි. ඝානාව විසින් සම්මත කරගත් නීතියක් ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අවශ්‍ය නැත. ඝානා රජය විසින් සම්මත කරගත් පනත ඒ අයුරින් ම තමන් විසින් ද ඉදිරිපත් කර ඇති බව, යහපාලන රජයට දැන ගැනීමට ලැබුණේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර එය ප්‍රසිද්ධියට පත් වූ පසුවයි.

යහපාලන රජයට කිසිවක් කරගත නොහැකි විය. ඝානාවේ පනත අමු අමුවේ ම ශ්‍රී ලංකාවේ ද බදු නීතිය බවට පත් කළේය. 2017 බදු පනතින් මසකට රුපියල් පනස්දහට වැඩිය ආදායමක් ලබන සියලු දෙනා ම බදු ගෙවිය යුතු බවට නියම කළේය. රුපියල් පනස් දහ ගණන් හැදීමේ දී රජයේ සහ පුද්ගලික අංශයේ සේවය කරන සියලු ම දෙනා විසින් ලබන ඉන්ධන දීමනා, දූරකථන දීමනා, ප්‍රවාහන දීමනා ආදී සියල්ල එයට ඇතුළත් කළ යුතු විය. උදහරණයක් ලෙස රජයේ ආයතනයක් විසින් තම සේවකයන්ට කාර්යාල ප්‍රවාහන සේවයක් පවත්වා ගෙන යන්නේ නම් එය එම සේවකයාට ලැබෙන ආදායමක් ලෙස සලකා ගණන් සැදිය යුතුය. එම පනත යටතේ බොහෝ දෙනෙකුට උපයන විට බදු ගෙවීමට සිදුවිය. ඊට අමතරව විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල් පමණක් නොව රක්ෂණ වාරික ආදිය සඳහා ද දූරකථන ගාස්තු සඳහා ද බදු ගෙවන්නට සිදුවිය. ළමා ඉතුරුම්වල පොලිය වෙනුවෙන් ද ඉතුරුම් පොලිය වෙනුවෙන් ද බදු ගෙවන්නට මහජනතාවට සිදු විය.

බදු ක්‍රමයේ සංශෝධන ඇති කරන බව ගෝඨාභය රාජපක්ෂ මහතා සෞභාග්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ජනාධිපතිවරණයට පෙර ප්‍රතිඥා දුන්නේය. බලයට පත්වීමෙන් පසු 2017 පනතේ එන බදු සංශෝධනය කර සහන රැසක් ලබා දුන්නේය. රජයේ සහ පුද්ගලික අංශයේ සේවකයින්ගෙන් අය කළ උපයන විට ගෙවීමේ බද්ද අහෝසි කළේය. ඉතුරුම් සඳහා ගෙවිය යුතු බදු සංශෝධනය කළේය. දූරකථන, ණය වාරික, රක්ෂණ වාරික ආදිය සඳහා අය කළ බදු අහෝසි කිරීමට හෝ අඩු කිරීමට කටයුතු කළේය. ඒ ආකාරයට ම පුද්ගලික අංශයේ ව්‍යාපාර ආයතනවලට පනවා තිබූ අධික බදු සංශෝධනය කර ඒවාට ද බදු සහන ලබා දුන්නේය.

රටක බදු අඩු කිරීම එම රටේ ආර්ථික සංවර්ධනය සඳහා හේතු වේ. බදු අඩු කළ විට මහජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව වැඩි වේ. එවිට ආර්ථිකය තුළ භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම වැඩි වේ. ඒ හේතුවෙන් භාණ්ඩ සැපයුම ද වැඩි වේ. ආර්ථිකය තුළ නිෂ්පාදනය වැඩි වී ජාතික ආදායම ඉහළ යයි. ව්‍යාපාරික ආයතනවල බදු අඩු කළ විට එම ආයතනවල ලාභය ඉහළ ගොස් ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම හේතුවෙන් රටේ ආයෝජන ප්‍රමාණය ඉහළ යනු ඇත. මහජනතාවගේ මිල දී ගැනීමේ හැකියාව වැඩි වී භාණ්ඩ ඉල්ලුම වැඩිවන විට එම ඉල්ලුමට සරිලන අයුරින් රටේ නිෂ්පාදනය වැඩි කිරීමට එමගින් අවස්ථාව සැලසේ.

බදු අඩු කිරීමේ ප්‍රතිපත්තියට එළඹෙන රජයකට දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු වේ. පළමුවැන්න එමගින් රජයට ලැබෙන ආදායම අඩු වී යාමයි. දෙවැන්න ඒ වෙනුවට එම ආදායම ලැබෙන විකල්ප මාර්ග ඇති කරගත යුතු වීමයි. රට සාමාන්‍ය තත්ත්වයක පවතින විට බදු අඩු කිරීම මගින් ඇති වන සැපයුම ඉහළ යෑම හේතුවෙන් රජයට ලැබෙන බදු ප්‍රමාණය ද ඉහළ යයි. රජය බදු අඩු කරනවාත් සමඟ ම කෝවිඩ් වසංගතය ආරම්භ විය. බදු අඩු කිරීම මගින් රටේ සාමාන්‍ය තත්ත්වයක දී ලැබෙන ප්‍රතිඵල ලබාගත හැකි වේ යැයි අපේක්ෂා කළ නොහැකිය. මහජනතාවට රැකියාවල යෙදීමට හෝ ව්‍යාපාරික ආයතනවලට නිෂ්පාදන කටයුතුවල යෙදීමට හෝ නොහැකි තත්ත්වයක් කොරෝනා නිසා ඇති විය. නිෂ්පාදනය බිඳ වැටුණි. රජයේ ආදායම් අඩු විය. බදු අඩු කිරීම නිසා හිතනවාටත් වඩා රජයේ ආදායම අඩු වී තිබේ.

එසේ වුව ද රජය ඒ ආකාරයට ම බදු අඩු කිරීම නිසා කෝවිඩ් හමුවේ රටට මුහුණ දීමට සිදු ව තිබූ මහා ආර්ථික ව්‍යසනයකින් වැළකී සිටීමට හැකි විය. කෝවිඩ් හමුවේ ප්‍රබල රටවල පවා ව්‍යාපාරික ආයතන දහස් ගණනින් වැසී ගොස් අති විශාල සේවක සංඛ්‍යාවකට රැකියා අහිමි විය. එවැනි තත්ත්වයකට ශ්‍රී ලංකාව මුහුණ දුන්නේ නැත. දුෂ්කරතා මධ්‍යයේ වුවද පුද්ගලික අංශය විසින් සේවක වැටුප් ගෙවන තත්ත්වයක් ඇති කිරීමට රජයට හැකි විය.එයට හේතු වූයේ රජය විසින් බදු අඩු කිරීම නිසා එම ආයතන විසින් මූල්‍යමය වශයෙන් ශක්තිමත් වීමය. ඒවායේ නිෂ්පාදන පිරිවැය අඩු වීමය. එවැනි තත්ත්වයක් තුළ ඒවා වසා දැමීමකින් හෝ සේවක කප්පාදුවකින් තොරව පවත්වාගෙන යෑමට හැකිවීය. කොටින් ම රජයේ බදු අඩු කිරීමේ ප්‍රතිපත්තිය නොවන්නට අද මේ රටේ ආයතන විශාල ප්‍රමාණයක් වැසී ගොස්ය. ලක්ෂ සංඛ්‍යාත පිරිසකට රැකියා අහිමි වී ගොස්ය. 2020 වසරේ රටේ ආර්ථිකය ඍණ මට්ටමකට පත්විය. ඇමරිකාව, බටහිර යුරෝපා රටවල් සහ ජපානය වැනි රටවල ද ආර්ථිකයන් ඍණ මට්ටමකට පත්විය. එහෙත් එම රටවලට සිදු වූ ආකාරයට ආයතන වසා දැමීමක් හෝ සේවකයන් මහා පරිමාණයෙන් ඉවත් කිරීමක් සිදු නොවූයේ බදු අඩු කිරීමේ රජයේ ප්‍රතිපත්තියට පිං සිදුවන්නටය.

2019 අප්‍රේල් 1 ද සිට 2020 මාර්තු 31 දක්වා වූ බදු වර්ෂය සඳහා අවසන් බදු ගෙවීමට නියමිතව තිබුණේ 2020 නොවැම්බර් 30 දය. එහෙත් රජය ඒ සඳහා මේ වසරේ පෙබරවාරි 28 දක්වා කල් ලබා දුන්නේය. 2021 වසර සඳහා බදු ගෙවීමට ද ඒ ආකාරයෙන් ම කාලය දිගුකර සහන ලබා දී ඇත. බදු ආදායම් පමණක් නොව අනෙකුත් ආදායම් ද අඩු වී ඇති මොහොතක එවැනි සහන ලබාදීමට කටයුතු කිරීම ප්‍රශංසනීයය.

කෙසේ වුව ද ගැටලුව ඇත්තේ එවැනි සහන ලබා දී තිබියදීත් බදු ගෙවිය යුතු පිරිස් නිසි පරිදි බදු ගෙවන්නේ ද යන්නය. 2017 නව බදු පනත පැනවීමට පෙර ශ්‍රී ලංකාවේ ආදායම් බදු ගෙවන්නන්ගේ ප්‍රමාණය 6,94000ක් විය. එම පනත මගින් රජයේ සහ පුද්ගලික අංශයේ විශාල පිරිසක් උපයන විට බදු ගෙවීම සඳහා ඇතුළත් කිරීම නිසා බදු ගෙවන්නන්ගේ ප්‍රමාණය ඉහළ ගිය නමුදු බදු ගෙවිය යුතු බොහෝ පිරිසක් බදු නොගෙවන බව පැහැදිලිය.


රටේ මුළු ජන සංඛ්‍යාව මිලියන 21කි. එයින් බදු ගෙවන්නේ මිලියනකටත් අඩු පිරිසකි. එය රටේ මුළු ජන සංඛ්‍යාවෙන් සියයට 5කට ආසන්න පිරිසකි. ඉඩ කඩම්, යාන වාහන සහ විශාල ආදායම් මාර්ග ඇති බොහෝ දෙනෙකු බදු නොගෙවති. එනිසා බදු ගෙවන සියයට 5ක පිරිසේ බදු මුදලින් රට නඩත්තු කිරීමට සිදු ව ඇත. වක්‍ර බදු හේතුවෙන් රටේ ඉතා ම දුගී පිරිසට පවා බදු ගෙවීමට සිදු ව ඇත්තේ බදු ගෙවිය යුතු පිරිස බදු නොගෙවීම නිසාය.

ශ්‍රී ලංකාවේ බදු ක්‍රමයේ ප්‍රධාන දුර්වලතා කිහිපයක් ඇත. බදු නොගෙවීම, බදු අඩුවෙන් ගෙවීම සහ බදු වංචා කිරීමය. එසේ බදු පැහැර හැරීම සහ බදු වංචා කිරීම සිර දඬුවම් ලැබිය හැකි වරදකි. අද තාක්ෂණයේ දියුණුව නිසාත් රටේ මුදල් ගනුදෙනු බොහෝමයක් පරිගණක ආශ්‍රයෙන් සිදුවන නිසාත් විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේ නම් බදු පැහැර හැරීම සහ බදු වංචා අවම මට්ටමකට ගෙන ඒමට හැකි වනු ඇත. 2020 වසරේ රට ඍණ ආර්ථික වර්ධනයක් වාර්තා කළ ද ඉතා ඉක්මනින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට හැකි වී තිබේ. මේ සතියේ මුදල් රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතා ප්‍රකාශ කළේ 2021 පළමු කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5ක මට්ටමකට පත් වේ යැයි අපේක්ෂා කරන බවයි. කෝවිඩ්වලට පෙර තිබූ ආර්ථික තත්ත්වය යළි ළඟා කරගැනීම සඳහා බොහෝ රටවල් විශාල අරගලයක යෙදී සිටින අවස්ථාවක ශ්‍රී ලංකාවට එවැනි තත්ත්වයක් ඇති කරගැනීමට හැකි වීම සතුටුදායක තත්ත්වයකි.

බදු අඩු කිරීම යනු රජයකට අනුගමනය කළ හැකි ඉතා දුෂ්කර මූල්‍ය ප්‍රතිපත්තියකි. එහෙත් බදු අඩු කළ විට රටේ සමස්ත ඉල්ලුම වැඩි වී නිෂ්පාදනය වැඩි වී ආර්ථික වර්ධනය ඉහළ මට්ටමකට පත් වේ. මෙම රජය එම දුෂ්කර තීරණ ගනු ලැබුවේ කෝවිඩ් වසංගතයට පෙරය. එහෙත් කෝවිඩ් වසංගතයට ඔරොත්තු දීම සඳහා ප්‍රබල ආධාරකයක් වූයේත් අනෙක් රටවල් මුහුණ දුන් ආකාරයේ බරපතළ ආර්ථික අර්බුදයකට රට මුහුණ නොදුන්නේත් එම ප්‍රතිපත්තිය හේතුවෙනි. 2021 වසරේ මුල් කාර්තුව තුළ ආර්ථිකය සියයට 3.5ක වර්ධනයක් අත්කර ගැනීම තුළ එම ප්‍රතිපත්තියේ සාර්ථකත්වය පැහැදිලි වේ. බදු ගෙවිය යුතු සියලු දෙනා බදු ගෙවන තත්ත්වයකට පත්කර ගැනීම පිළිබඳව ඊළඟට රජය පියවර ගන්නේ නම් එම ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවස්ථාව සැලසෙනු ඇත.

මහාචාර්ය
**සුනන්ද මද්දුමබණ්ඩාර**

# ජනතාවගේ ආරක්ෂාවට රජය ගන්නා ක්‍රියාමාර්ග ගැන දැනුම්වත් කිරීම මගේ යුතුකමක්



## ඇමැති සරත් වීරසේකර

**ස්වර්ණා විජේකෝන් සහ සන්ධ්‍යා කරුණාරත්න**

මහජන ආරක්ෂක අමාත්‍යාංශය වශයෙන් පාස්කු දා ප්‍රහාරයට ලක්ව මිය ගිය අපේ අහිංසක සහෝදර ජනතාව වෙනුවෙන් එම සාහසිකයන්ට සහ එය සැලසුම් කළ අපරාධකරුවන්ට නීති ප්‍රකාරව උපරිම දඬුවම් දීමට අප ගන්නා ක්‍රියාමාර්ග, එහි ප්‍රගතිය වගේම අපේ ජනතාවගේ ඉදිරි ආරක්ෂාවට වර්තමාන රජය ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව දැනුම්වත් කිරීම තමාගේ යුතුකමක් සේ සලකන බව මහජන ආරක්ෂාව පිළිබඳ ඇමැති, විශ්‍රාමික රියර් අද්මිරාල්, ආචාර්ය සරත් වීරසේකර මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (10) ප්‍රකාශ කළේය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ පාස්කු දා ප්‍රහාරය සම්බන්ධ විමර්ශන පිළිබඳ විශේෂ ප්‍රකාශයක් සිදු කරමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය:

"පාස්කු දා ප්‍රහාරයට අදාළව මෙරටදී පුද්ගලයන් 676 දෙනකු අත්අඩංගුවට ගෙන තිබෙනවා. එයින් 202 දෙනකු බන්ධනාගාර ගත කර තිබෙනවා. 66 දෙනකුගෙන් රඳවාගෙන ප්‍රශ්න කරනවා. මොවුන්ගෙන් 408ක් මෙරට නීතිය යටතේ ඇප පිට නිදහස්ව සිටියත් ඔවුන් සම්බන්ධයෙන් ද අඛණ්ඩව විමර්ශන සිදු කෙරෙනවා.

ප්‍රහාරයෙන් පසු හිටපු ජනාධිපතිවරයා ප්‍රහාරයට සම්බන්ධ ප්‍රධාන සංවිධාන 03ක් තහනම් කිරීමට කටයුතු කර තිබුණා. නැෂනල් තව්හිඩ් ජමාද්, ජමාතේ මිල්ලාතේ ඉබ්‍රාහීම්, විල්ලයාත් අස් සේලානි ඒ සංවිධාන තුනයි.

පසුගිය රජය 2019 මැයි මස 22 වැනිදා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කළා. ඉන්පසු ජාතික ආරක්ෂාව සම්බන්ධ ආංශික අධීක්ෂණ පාර්ලිමේන්තු කාරක සභාව පිහිටෙවුවා. ඊට පසු පාස්කු දා ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීමට 2019 සැප්තැම්බර් මස 21 වැනි දින ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටවනු ලැබුවා.

එහෙත් අවාසනාවන්ත ලෙස මේ ප්‍රහාරය වළක්වා ගැනීමට ඉතා පහසුවෙන් හැකියාව තිබුණත් ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගෙන නොතිබූ බව සිදු කරගෙන යන විමර්ශනවලින් පැහැදිලි වෙනවා.

පාස්කු දා ප්‍රහාරයට පෙර සිදුවීම් ගණනාවක් සිදු වුණා. ඒවා නිසි පරිදි විශ්ලේෂණය කළා නම්, සැකකරුවන් අත්අඩංගුවට ගෙන මේ ප්‍රහාරය වළකාලීමට බොහෝ ඉඩ තිබුණා. නමුත් බුද්ධි අංශ සම්පූර්ණයෙන් අකර්මණ්‍ය කර, හමුදාවේ චිත්ත ධෛර්යය බින්දුවට දමා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය කරමින්, ජාතික ආරක්ෂාව බින්දුවටම දමා තිබූ නිසා ඉතා පහසුවෙන් ඝාතකයන්ට මේ ප්‍රහාරය ආරම්භ කිරීමට හැකි වුණා.

පාස්කු දා ප්‍රහාරයට පෙර සිදු වූ විශේෂ සිදුවීම් ලෙස, 2018 පෙබරවාරි මස 06 වැනි දින යහපාලනය සඳහා වන ජාතික පෙරමුණේ සාමාජික අබ්දුල් ෆර්වාඩින් නිවෙසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම, ඊට දින 06කට පසු කාත්තන්කුඩි යහපාලනය සඳහා වන ජාතික පෙරමුණු කාර්යාලයට කාල බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම, ඊට මාස 06කට පසු මඩකලපුව පාලමුණේදී සිදු කළ පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීමකදී සහරාන්ගේ සොයුරු ඉල්වාන් බරපතළ තුවාල ලැබීම, මාස 2 ½ පසු නුවරඑළියේ පුහුණු කඳවුර නිරීක්ෂණය කිරීමට ගොස් නිසි විමර්ශනයක් නොකිරීම, ඊට සති 02කට පසු වවුනතිව් පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ඝාතනය කිරීම, ඊට මාසයකට පසු මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීම, ඊටත් සති 03කට පසු වනාතවිල්ලුව පුපුරණ ද්‍රව්‍ය විශාල තොගයක් සොයා ගැනීම, ඊට මාස 02කට පසු එනම් 2019 මාර්තු මස 08 වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ තොරතුරුකරුවකු වූ තස්ලිම්ට වෙඩි තැබීම, ඊට සති 05කට පසුව එනම් 2019 අප්‍රේල් මස 16 වැනි දින තාලංකුඩාහිදී යතුරු පැදි පුපුරවා අත්හදා බැලීම ආදිය සඳහන් කරන්නට පුළුවන්.

පාස්කු දා ප්‍රහාරය වුණේ ඊට හරියට දින 05කට පසුවයි. එසේ නම් එවකට පැවති රජයේ ජාතික ආරක්ෂාව පිළිබඳව තිබූ මන්දගාමී ආකල්පය, එම කාලයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාස බුද්ධි තොරතුරු සම්බන්ධ නිසි විමර්ශන සිදු නොකිරීම, ඒවා අතර නිසි සම්බන්ධීකරණයක් නොතිබීම යන කරුණු නිසා මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබූ අවස්ථා 08ක් අහිමි වී තිබෙන බව පැහැදිලියි.

වර්තමාන රජය බලයට පත් වූ පසු නැවතත් බුද්ධි අංශ ශක්තිමත් කර ජාතික ආරක්ෂාවට මුල්තැන දුන්නා. බුද්ධි අංශ සහ විමර්ශන අංශ කිසිදු දේශපාලන මැදිහත් වීමකින් තොරව ශක්තිමත් කිරීමට පියවර ගත්තා.

මේ රජය බලයට ආ පසුව පාස්කු දා ප්‍රහාරයට සෘජුව සහ වක්‍රව සම්බන්ධ වූ පුද්ගලයන් 99 දෙනකු මෙරටදී ද, විදේශයන්හි රැඳී සිටි මෙරට පුද්ගලයන් 35 දෙනකු ද අත්අඩංගුවට ගෙන විමර්ශන සිදු කළා.

විදේශ බුද්ධි අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් රාජ්‍ය බුද්ධි සේවාවෙන් විදේශ රටවල් පහකින් ප්‍රහාරය සම්බන්ධව අත්අඩංගුවට ගත් සැකකරුවන් 54න් 50ක් මේ වන විට මෙරටට ගෙන්වා තිබෙනවා. ඉතිරි 04 දෙනා එරට නඩු කටයුතු අවසන් වූ වහාම ගෙන්වනවා. මේ පුද්ගලයන් එම රටවල අන්තවාදය පෝෂණය කරමින් අන්තවාදී ප්‍රචාරණ රැස්වීම් සඳහා මෙරටට මුදල් එවා තිබෙනවා.

මෙරට තොරතුරු සහ විමර්ශනය අනුව ඔවුන්ගේ ප්‍රහාරයට ඇති සම්බන්ධතාව අනුව වර්ගීකරණය කර නඩු පැවරීමට කටයුතු කර තිබෙනවා. ඉදිරියේදී මෙවැනි විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණයට රාජ්‍ය බුද්ධි සේවාවට අදාළ විදේශීය බුද්ධි සේවා සමඟ සම්බන්ධ වීමට නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර තිබෙනවා.

සහරාන් නැමැති ස්වයං ඝාතකයා යටතේ පුහුණු වී ඇති කාන්තා අංශයක් සම්බන්ධයෙන් 2020 මුල් භාගයේදී මෙරට බුද්ධි අංශ තොරතුරු අනාවරණය කර ගත්තා. එසේ පුහුණු වූ කාන්තාවන් 17ක් මරාගෙන මැරෙන ප්‍රහාර සඳහා ප්‍රතිඥා (බයියක්) දී තිබෙනවා. එයින් දැනට පස් දෙනෙක් මිය ගිහින්. තිදෙනෙක්ට චෝදනා ගොනු කර බන්ධනාගාරගත කර තිබෙනවා. හත් දෙනකු අත්අඩංගුවේ තබා විමර්ශන කටයුතු කෙරෙනවා. ඉතිරි දෙදෙනා අත්අඩංගුවට ගැනීමට ඉදිරියේදී කටයුතු කරනවා.

2015 වර්ෂයේදී ලාංකික සමාගමක් විසින් චීනයෙන් කඩු 1440ක් මෙරටට ආනයනය කර තිබෙනවා. 2018 වර්ෂයේදී දෙමටගොඩ ඊබ්‍රාහිම් සහෝදරයන්ගේ මෙහෙයවීම මත ඉහත සමාගමෙන් විවිධ කඩවලට විකුණා ඉතිරි වූ කඩු 300ක් මිලදී ගෙන තිබෙනවා. එම කඩු කොම්පඤ්ඤවීදිය, කාත්තන්කුඩි සහ බේරුවල පුද්ගලයන්ට දී තිබෙනවා.

එසේම මීගමුව, කුරුණෑගල ප්‍රදේශවල කම්හල්වලින් කඩු 27ක් සකස් කරගෙන තිබෙනවා. මේ පිළිබඳව කළ දීර්ඝ විමර්ශනයකින් පසු එයට සම්බන්ධ මෙරට පුද්ගලයන් 35ක් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන දැනට 07කට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර තිබෙනවා. එසේම කඩු මෙරටට ආනයනය කළ ආයතනය විසින් 2015 සිට කඩු මිලදී ගත් පුද්ගලයන් පිළිබඳව අනාවරණය කිරීමට පරීක්ෂණ සිදු කරනවා.

එසේම සහරාන්ගේ ජාලයට අමතරව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් අන්තවාදී සංවිධාන හඳුනාගෙන එහි ප්‍රධාන සාමාජිකයන් අත්අඩංගුවට ගැනීමට ත්‍රස්ත මර්දන සහ බුද්ධි අංශ කටයුතු කර තිබෙනවා. එම සංවිධාන නම් වන්ඌම්මා, හිස්බුත් තාහීර්, මුජීර් හිදීන් අල්ලාහ් සහ සුපර් මුස්ලිම් ආදියයි.

එසේම සහරාන් ඉස්ලාම් රාජ්‍යයක් වෙනුවෙන් මෙරට තරුණයන් ඒකරාශී කිරීමට මැදවච්චිය, මල්වාන, ලේවැල්ල, හම්බන්තොට, නුවරඑළිය, හිඟුල ප්‍රදේශවල පවත්වාගෙන ගිය පුහුණු කඳවුරු 08ක් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත්තා. එම පුහුණු කඳවුරුවලට සම්බන්ධ වූ පුද්ගලයන් ද අත්අඩංගුවට ගැනීමට කටයුතු කර තිබෙනවා.

2018 සිට සහරාන්ගේ සියලු කටයුතු සඳහා අවශ්‍ය මුදල්, වාහන පහසුකම් සියල්ල දී ඇත්තේ දෙමටගොඩ ඊබ්‍රාහිම් සහෝදරයන් වන ඉන්ෂාෆ් සහ ඉල්හාම්. ඔවුන් 2018 සිට පාස්කු දා ප්‍රහාරය දක්වා ලක්ෂ 500කට ආසන්න මුදලක් සිය ව්‍යාපාරවලින් දී තිබෙනවා.

ඊට අමතරව මොවුන් දෙදෙනා ISIS සංවිධානය සමඟ සම්බන්ධ වී සිරියාවේ පුහුණු වන ලාංකික ත්‍රස්තයන්ට යැවීමට 2018 නොවැම්බර් මස රුපියල් ලක්ෂ 45ක් සිරියාවේ ත්‍රස්තවාදීයකු ලෙස මිය ගිය නිලාම් නැමැත්තාගේ පියාට දී තිබෙනවා. ඒ මුදල් ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාසය විසින් සොයාගෙන තිබෙනවා.

ෂැංග්‍රිලා හෝටලයේදී මරාගෙන මැරුණු ඊබ්‍රාහිම් ඉල්හාම් සිය ව්‍යාපාරයෙන් රුපියල් ලක්ෂ 370ක් ගෙන එයින් කොටසක් ප්‍රහාරය සැලසුම් කිරීමට සහ වෙනත් පහසුකම් ගැනීමට සහරාන්ගේ සහෝදරයා වන රිල්වාන්ට දී තිබෙනවා. එයින් ලක්ෂ 50ක් ප්‍රහාරයට දින 05කට පසු සායින්දමරුදු නිවෙසේදී සොයා ගත්තා.

"සේව් ද පර්ල්" රාජ්‍ය නොවන සංවිධානය මෙරට ආරම්භ වී ඇත්තේ 2015 වසරේදී. මරාගෙන මැරෙන ප්‍රහාරවලට සම්බන්ධ වූ ඊබ්‍රාහිම් සහ සහෝදරයන්, ජමීල් සහ දැනට අත්අඩංගුවේ සිටින ජමීල්ගේ සහෝදරයා මේ සංවිධානය සමඟ සක්‍රියව සම්බන්ධ වෙලා තිබෙනවා.

"සේව් ද පර්ල්" සංවිධානය විසින් ආරම්භ කර ඇති අරාබි පාසල්වල කුඩා දරුවන් අන්තවාදී මතවාදයට නැඹුරු කිරීමට උගන්වා තිබෙනවා. පාස්කු දා ප්‍රහාරයට සම්බන්ධ වූ සහරාන් ඇතුළු පුද්ගලයන් මේ විදුහලේ සිසුන්ට දේශන පවත්වා තිබෙනවා. විදුහලේ සිසුන් එය සනාථ කරනවා. ඉල්හාම් ඊබ්‍රාහිම්ගේ මූල්‍ය දායකත්වයෙන් තවත් අරාබි විද්‍යාලයක් ගොඩ නැඟීමට මදුරන්කුලිය ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගෙන තිබෙනවා. ඊට අමතරව 2018 මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීම පිළිබඳව අත්අඩංගුවට ගත් අයට සහරාන් හරහා නීතිමය සහාය දීමට ද මේ සංවිධානය මූලික වෙලා තිබෙනවා.

එසේම පාස්කු දා ප්‍රහාරයට වගකිවයුත්තන් හා එහි මූලික පසුබිම සැකසුණු ආකාරය පිළිබඳව සොයා බැලීමේදී මේ

## පාර්ලිමේන්තුව

**2015දී ලාංකික සමාගමක් චීනයෙන් කඩු 1440ක් ආනයනය කරලා**

**අප හෙළා දකින්නේ යම්කිසි ආගමක් නොව ආගමික අන්තවාදයයි**

**විදේශ බුද්ධි අංශ සේවා සමඟ සම්බන්ධ වීමේ නිශ්චිත ක්‍රමවේදයක්**

**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය වූ නිසා ඝාතකයන්ට ප්‍රහාරය ආරම්භ කිරීමට පහසු වුණා**

**වත්මන් රජය බුද්ධි අංශ ශක්තිමත් කර, ජාතික ආරක්ෂාවට මුල් තැන දුන්නා**

**මෙරට ක්‍රියාත්මක අන්තවාදී සංවිධාන 11ක් නුදුරේදීම තහනම් කරනවා**

**බුර්කාව තහනම් කිරීමට කඩිනම් පියවර**

**මදුසා පාසල් නියාමනයට පියවර**

**ඊබ්‍රාහිම් ඉල්හාම් සිය ව්‍යාපාරයෙන් පාස්කු දා ප්‍රහාරය සැලසුම් කිරීමට සහරාන්ගේ සහෝදරයාට මුදල් දී තිබෙනවා**

ප්‍රහාරය මෙහෙය වූ අය, ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසූ අය, ප්‍රහාරය ආරම්භ කරන්න ISIS මතවාදය ඔස්සේ ප්‍රහාරකයන් අභිප්‍රේරණය වීම, මෙයට සෘජුව වක්‍රව සම්බන්ධ අය සහ එම බාහිර සම්බන්ධතා පිළිබඳ පුළුල් විමර්ශනයක් ඉතාම වැදගත් වෙනවා. එමගින් අදාළ අපරාධකරුවන්ට දඬුවම් දීමට සහ ඉදිරියේදී මෙවැනි ප්‍රහාර වැළැක්වීමට ද හැකි වෙනවා.

ඒ සඳහා මා පහත කරුණු මේ ගරු සභාවට දැනගැනීමට ඉදිරිපත් කරනවා. ඉරාකයේ සිටි අබුබක්කර් අල් බැග්ඩෑඩි විසින් 2014.06.29 වැනි දින සිරියාව සහ ඉරාකය කේන්ද්‍ර කරගෙන ඉස්ලාම් රාජ්‍යයක් ප්‍රකාශයට පත් කරමින් සිරියාවට හෝ ඉරාකයට පැමිණෙන ලෙසටත් සහ ඉස්ලාම් රාජ්‍ය වෙනුවෙන් සටන් කරන ලෙසටත් මුලින් ප්‍රකාශ කර තිබෙනවා.

ISIS නායක බැඩුඩිගේ මේ ප්‍රකාශයෙන් පසු 2015 ජනවාරි මාසයේ කණ්ඩායම් ලෙස මෙරට පුද්ගලයන් 37ක් පමණ සිරියාවට ගොස් IS සංවිධානය සමඟ එක්ව කටයුතු කර තිබෙනවා. මීට අමතරව ඉස්ලාම් රාජ්‍ය හෙවත් IS වෙත කැමැත්ත දක්වන මෙරට පුද්ගලයන් ජමාතේ මිල්ලතේ ඊබ්‍රාහිම් හෙවත් JMI නමින් සංවිධානය වන බව මූලිකව යුද හමුදා බුද්ධි අංශ හා රාජ්‍ය බුද්ධි සේවාව එම වකවානුවේ හඳුනාගෙන තිබුණා.

ඒ අනුව, බුද්ධි සේවාවෙන් තොරතුරුකරුවන් යොදවා තොරතුරු රැස් කර සිරියාවට ගිය කණ්ඩායම, ඔවුන් එරටට ගිය ආකාරය, ඒ සඳහා ඔවුන්ට මුදල් ලැබුණු මාර්ගය සහ ඉන්පසු මෙරට JMH සංවිධානය පිළිබඳවත්, 2015 සිට වාචිකව හා ලිඛිතව ආරක්ෂක මණ්ඩලය හා අනෙකුත් වගකිවයුතු නිලධාරීන් දැනුම්වත් කිරීමට කටයුතු කර තිබුණා. එහිදී ඉදිරියේදී ශ්‍රී ලංකාවට ඇති විය හැකි තර්ජන සහ ඒවා වැළැක්වීමට රජය හා රජයේ අදාළ ආයතන අමාත්‍යාංශ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් වාර්තා කර තිබුණා. මේ පිළිබඳව පාස්කු කොමිෂන් සභා වාර්තාවේ පැහැදිලිවම සඳහන් වෙනවා.

ඒ අනුව, යම් පුද්ගලයකු ආගම පදනම් කර ගත් මතවාදයක් ඔස්සේ ත්‍රස්තවාදියකු බවට පරිවර්තනය වීමේදී පළමුව මූලධර්මවාදයට සහ ආගමික අන්තවාදයට ද, දෙවනුව ප්‍රචණ්ඩත්වයට සහ ත්‍රස්තවාදයට ද ක්‍රම ක්‍රමයෙන් ගමන් කරනවා. පාස්කු ප්‍රහාරකයන් ඉස්ලාම් රාජ්‍ය සංකල්පය පෙරදැරි කරගෙන ත්‍රස්තවාදය දක්වා ගමන් කළ අතර, සමහර පුද්ගලයන් මෙහි විවිධ අවධිවල පසුවන බවට විමර්ශනවලදී හඳුනාගෙන තිබෙනවා.

2015 වසරේදී ඉස්ලාම් රාජ්‍ය මතවාදය සමඟම දැඩි මූලධර්මවාදීව සිට ආගමික අන්තවාදියෙක් බවට පරිවර්තනය වුණා.

2017 වසරේ මුල් කාලයේ පටන් ඔහු ආගමික අන්තවාදයේ සිට ප්‍රචණ්ඩත්වය කරා ගමන් කර තිබෙනවා. මොහුගේ මුල්ම ප්‍රචණ්ඩකාරී සිදුවීම ලෙස 2017.03.10 වැනි දින කාත්තන්කුඩි අලියාර් හන්දියේ වෙනත් මතවාදී පිරිසකට පහරදීම වාර්තාවී තිබෙනවා. මේ සමඟ සහරාන් චරිතය කරලියට පැමිණෙනවා.

මෙලෙස යම් පුද්ගලයකු මූලධර්මවාදියකු, ආගමික අන්තවාදියෙකු ලෙස ප්‍රචණ්ඩත්වය දක්වා පරිවර්තනය වීමේදී ඔහු එම කාලයේ ඇසුරු කරන්නන් සහ සංවිධාන ක්‍රියා කරන ආකාරය විශ්ලේෂණය කිරීම ඉතා වැදගත් වෙනවා.

මෙහිදී වසර ගණනාවක් කටාර් රාජ්‍යයේ සිටි මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් නැමැති දැනට අත්අඩංගුවේ පසුවන පුද්ගලයා 2016 සිට සහරාන් සමඟ සමීපව කටයුතු කිරීම සම්බන්ධව විමර්ශනය කර තිබෙනවා. ඒ අනුව අබුබක්කර් අල් බැග්ඩෑඩිගේ මතවාදයට සහරාන් සම්බන්ධ කිරීමට නවුෆර් සැලකිය යුතු කාර්යභාර්යක් සිදු කර ඇති බවට විමර්ශනවලදී හඳුනාගෙන තිබෙනවා.

එමෙන්ම මේ නවුෆර් නැමැත්තා සහරාන් සමඟ සම්බන්ධ වෙමින් ප්‍රහාරය දක්වා ඔහුව මතවාදීව මෙහෙයවා ඇති බවට දැනට ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාසයෙන් සිදු කරන ලද විමර්ශනවලදී තොරතුරු අනාවරණය කරගෙන තිබෙනවා.

එහෙයින් මේ ප්‍රහාරය පිටුපස සිටි ප්‍රධානතම මූලධර්මවාදියා මෙන්ම සහරාන්ව මේ ප්‍රචණ්ඩකාරීත්වයට යොමු කළ ප්‍රධානතම පුද්ගලයකු ලෙස නවුෆර් හඳුනාගෙන තිබෙනවා.

ප්‍රහාරයට ප්‍රථම සහරාන් ඇතුළු ඝාතකයන් තමන්ගේ නායකයා අබුබක්කර් අල් බැග්ඩෑඩි බවට ප්‍රතිඥාවක්දී මේ ප්‍රහාරය සිදු කරන්නේ ඉස්ලාම් රාජ්‍යයක් වෙනුවෙන් බවට සපත කර තිබෙනවා. ඒ අනුව අන්තවාදී මතවාද සමඟ පෝෂණය වූ එම ප්‍රහාරකයන් ප්‍රහාරයට දින කිහිපයකට පෙර තමන් මේ ප්‍රහාරය IS සංවිධානයේ අරමුණ වෙනුවෙන් සිදු කරන බවටත්, තම ජීවිතය Caliphate වෙනුවෙන් කැප කරන බවටත් සඳහන් කරමින් කොළඹදී වීඩියෝ පටයක් නිකුත් කිරීමට කටයුතු කර තිබෙනවා.

එමෙන්ම 2019.04.26 වැනි දින සයින්දමරුදු හිදී ආරක්ෂක අංශ විසින් ඔවුන් සිටි ස්ථානය වටලා තිබියදී පවා ඔවුන් පිළිගන්නා ලද මතවාදය වෙනුවෙන් සහ IS සංවිධානයේ අරමුණ වෙනුවෙන් තම ජීවිතය පුද කරන බවට වීඩියෝ පටයක් නිකුත් කරමින් ප්‍රකාශ කර තිබෙනවා.

මේ කරුණු අනුව පෙනී යන්නේ ISIS මතවාදය ඔස්සේ සහරාව ප්‍රචණ්ඩත්වය දක්වා පෝෂණය කිරීමටත්, සහරාන්ගේ අනුගාමිකයන්ද ආගමික ප්‍රචණ්ඩත්වයට පත්වීම දක්වා පෝෂණය කිරීමටත් නවුෆර් සිදු කර ඇති කාර්යභාරය අතිමහත් බවයි.

මීට අමතරව ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාමි සංවිධානයේ හිටපු ප්‍රධානියා වන හජ්ජල් අක්බද ඉස්ලාම් රාජ්‍ය මතවාදයක සිට කටයුතු කර ඇති බවත්, ඔහු ඒ ඔස්සේ පුද්ගලයන් අභිප්‍රේරණය කිරීමේ කටයුතුවල නිරතව සිට ඇති බවත්, ඔහු ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයන් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වූ බවත් අනාවරණය වී තිබෙනවා.

මෙලෙස සහරාන් මතවාදීව නවුෆර් යටතේ පෝෂණය වීමේදී මාලදිවයින් ජාතික ආගමික ත්‍රස්තවාදීන් 04 දෙනකු සහරාන් වෙත සම්බන්ධ කිරීමට ශ්‍රී ලාංකික සම්භවයක් සහිත ඕස්ට්‍රේලියානු පුරවැසියන් දෙදෙනකු වන ලුක්මන් තාලිබ් සහ ඔහුගේ පුත් දුක්මන් තාලිබ් අහමඩ් කටයුතු කර ඇති බව ද සොයාගෙන තිබෙනවා.

තවද, පාස්කු ප්‍රහාරකයන් සහ මාලදිවයින් ත්‍රස්ත සාමාජිකයන් 04 දෙනා 2016 සිට ප්‍රහාරය දක්වා අවස්ථා ගණනාවකදී මෙරටට පැමිණ මරණයට පත්ව ඇති සහ මේ වන විට අත්අඩංගුවේ පසුවන අන්තවාදීන් හමුවී ඇති බව ද, එම සම්බන්ධීකරණ කටයුතු ලුක්මන් තාලිබ් අහමඩ් මෙරටට පැමිණ සිදු කර ඇති බව ද ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසය සහ රාජ්‍ය බුද්ධි සේවාව හඳුනාගෙන තිබෙනවා. මේ ඕස්ට්‍රේලියානු පුරවැසි පියා වන ලුක්මන් තාලිබ් කටාර් රාජ්‍යයේදී අත්අඩංගුවට ගෙන ඇති බවට ද එරට බුද්ධි අංශ වාර්තා කර තිබෙනවා.

එසේ නම් පාස්කු ප්‍රහාරයට අවශ්‍ය පසුබිම සැකසී ඇත්තේ මෙසේයි.

අයි.එස්. සහ එහි නායක බැග්ඩෑඩිගේ අන්තවාදී මතවාදය නවුසර් මවුලවි ඇතුළු කිහිප දෙනෙක් පෝෂණය කිරීම, එම මූලධර්ම මතවාද ඉදිරියට ගෙන යෑම, තරුණ කොටස් නැඹුරු කිරීම සහ අන්තවාදී ක්‍රියාකාරකම්වලදී මතු විය හැකි නෛතික ගැටලු විසඳීමට නෛතික පසුබිමක් ඇති පිරිසක් ඇති කිරීම මේ සඳහා Save the Pearl වැනි සංවිධාන උපකාරී වී තිබෙනවා.

ප්‍රහාරයට අවශ්‍ය සියලුම මුදල්, භෞතික සම්පත් දුල්හාම් ඉන්ෂාෆ් සහෝදරයන් තම ව්‍යාපාරවලින් ද විදෙස් රටවල අන්තවාදී සංවිධාන හා මැද පෙරදිග අයි.එස්. ලැදි කණ්ඩායම් හරහා ද සහරාන්ගේ නායකත්වය යටතේ රිල්වාන් හස්තුන් මිල්හාන් හා සාදික් විසින් ප්‍රහාර සැලසුම් කිරීම පුහුණු කිරීම් සහ ප්‍රහාර දියත් කිරීම, ෆයිරූස් හා ෆස්රුල් විසින් අයි. එස්. මතවාදය ප්‍රචාරණ කටයුතු වීඩියෝ සැකසීම වශයෙනි.

දැනට අත්අඩංගුවේ සිටින විවිධ තරාතිරමේ පුද්ගලයන් හා ස්වයං ඝාතකයන් අතර දුරකතන සම්බන්ධතා හඳුනාගෙන තිබෙන අතර, ඔවුන් වයිබර් වට්ස්ඇප් වැනි මෘදුකාංග හරහා සබඳතා පවත්වා තිබෙනවා. මේ සඳහා විදේශීය බුද්ධි අංශ සමග සම්බන්ධීකරණය වෙනවා. එසේම 2019 මැයි මාසයේ පිහිටුවන ලද ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ පාර්ලිමේන්තු කාරක සභාව විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ඇමැති මණ්ඩලය හරහා සිදු කරනවා.

එසේම ලංකාවේ උපදින සියලු දරුවන්ට අවුරුදු 05 සිට 16 දක්වා රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුව අධ්‍යාපනය දිය යුතු බව අප අවධාරණය කරනවා. ඒ අනුව කටයුතු නොකරන සියලුම පාසල් තහනම් කිරීමට අප කටයුතු කරනවා. අනෙකුත් මදසා පාසල් නියාමනය කිරීමට කටයුතු කරනවා. එසේම වසර ගණනාවක් තිස්සේ ඉතා සාමකාමීව නියමිත ප්‍රමිතීන්ට අනුව ක්‍රියාත්මක වන මදසා පාසල් තිබෙනවා.

වර්තමාන රජය බලයට පත් වූ පසු ප්‍රහාරයට අවශ්‍ය පසුබිම සෘජුව සහ වක්‍රව නිර්මාණය කළ මෙරට ක්‍රියාත්මක වන අන්තවාදී සංවිධාන 11ක් හඳුනා ගනිමින් එම සංවිධාන නුදුරේදීම තහනම් කිරීමට කටයුතු කරනවා.

පසල් ගුරු අත්පොත්වල ඇතුළත්ව ඇති ඉස්ලාම් මූලධර්මවාදය සම්බන්ධ ඉගැන්වීම් ඇතුළත් පොළ පොත් නිවැරදි කිරීමට දැනටමත් පියවර ගෙන තිබෙනවා. මෙහිදී 1 වසර සිට 13 වසර දක්වා ගුරු සහ පෙළ පොත්වල අන්‍යාගම්වලට එරෙහිව නැඟී සිටීම සඳහන් වන අතර, ආගමික සහජීවනයට හානි වන ආකාරයෙන් වහාබ් සහ සලබ් මූලධර්මවාදී ප්‍රතිපත්ති සූක්ෂම ලෙස ඇතුළත්ව තිබෙනවා. ඒවා විෂය නිර්දේශයෙන් ඉවත් කිරීමට දැනටමත් කටයුතු කෙරෙමින් සිටිනවා.

ජාතික ආරක්ෂාවට වර්තමානයේදී සහ ඉදිරියේදී විය හැකි තර්ජන හඳුනාගෙන ඒවා වැළැක්වීමට පියවර ගණනාවක් මේ රජය ගෙන තිබෙනවා. එහි එක් පියවරක් ලෙස බුර්කාව පැළඳීම තහනම් කිරීමට කඩිනමින් කටයුතු කරනවා.

ඒ වගේම ළමා හා කාන්තාවන් වෙනුවෙන් අඩු වයස් විවාහ සහ දික්කසාද පිළිබඳව නීති සමස්ත ජනතාවටම බලපාන පොදු නීතියක් යටතට ගැනීමට අධිකරණ අමාත්‍යාංශය කටයුතු කරනවා.

පාස්කු වැනි ප්‍රහාරවලට යොමු වීමට පෙර පුද්ගලයන් මූලධර්මවාදී අවධියට යොමු වන බවට බුද්ධි අංශවලින් හඳුනාගත් වහාම අන්තවාදී ප්‍රචණ්ඩත්වයට යොමු වීමට පෙර ඔවුන් අනිවාර්ය පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු කිරීමට කටයුතු කරනවා. ඒ වගේම මේ ප්‍රහාරයට සෘජුව සහ වක්‍රව සම්බන්ධ සියලුම පිරිස්වලට උපරිම දඬුවම් දීමට කටයුතු කරනවා.

අවසාන වශයෙන් මේ වන විට පාස්කු දා ප්‍රහාරන් සඳහා නැඹුරු වූ ආකාරය, ප්‍රහාර සිදු කිරීමේ අරමුණ, ප්‍රහාරය මෙහෙය වූයේ කවුද?, එයට මුදල් ලැබුණේ කාගෙන්ද?, එයට අදාළ දේශීය විදේශීය සම්බන්ධතා ආදී ප්‍රශ්නවලට පැහැදිලිව පිළිතුරු ලැබී තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් නීත්‍යනුකූල ක්‍රියාමාර්ග නුදුරු දිනයේ ගන්නවා. කොවිඩ් වසංගතය හමුවේ වුවත් ආරක්ෂක අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය, යුද හමුදාව, රාජ්‍ය බුද්ධි සේවාව, යුද හමුදා බුද්ධි අංශ ඇතුළු අනෙක් බුද්ධි අංශ මේ ප්‍රහාරයට සම්බන්ධ දේශීය, විදේශීය පුද්ගලයන්, සංවිධාන හඳුනා ගනිමින් ඉදිරියේදී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට දැඩි වෙහෙස මහන්සියෙන් කටයුතු කරන බව මා සිහිපත් කරනවා.

මේ සම්බන්ධව ඇතැම් දේශපාලන පසුබිම් ඇති පිරිස් සමාජය නොමඟ යවමින් ජනතාව මුලා කිරීමට වෑයම් කරනවා. එසේ විමර්ශනවලින් සත්‍ය අනාවරණය කිරීමට, යුක්තිය ඉටු කිරීමට බාධා වන අයුරින් ක්‍රියාත්මක වන අය සම්බන්ධයෙන් අප නීති අනුකූලව කටයුතු කරනවා.

අප හෙළා දැකිය යුත්තේ යම්කිසි ආගමක් නොව ආගමික අන්තවාදයයි. මේ ප්‍රහාරය මෙහෙයවා ඇත්තේ වහබ්වාදය මත ගොඩනැගුණු අන්තවාදයයි.

සාමකාමී රටට ආදරය කරන මුස්ලිම් ජනතාව මේ පාස්කු දා ප්‍රහාරය සම්බන්ධ විමර්ශන කටයුතුවලදී අපට සහාය වෙනවා. එය මා ගෞරවයෙන් යුතුව සිහිපත් කරනවා. යුද හමුදාවේ විශේෂ බළකායේ විශිෂ්ට සේවයක් කළ ෂස්ලි ලෆීල් වගේම බුද්ධි බළකායේ අති විශිෂ්ට සේවයක් කළ කර්නල් මුතාලිෆ්, කර්නල් මීඩීන් මුස්ලිම් ජාතික නිලධාරීන් අදටත් අප ගෞරවයෙන් සිහිපත් කරනවා.

අවසාන වශයෙන් පාස්කු දා ප්‍රහාරය සම්බන්ධ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරිපත් කළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලුම කටයුතු සූදානම් කරන බව ප්‍රකාශ කරනවා. එසේම මේ සභාවේ අවධානයට ලක් නොවූ නමුත් විමර්ශන වාර්තාවලින් හෙළි වූ කරුණු අනුව මේ ප්‍රහාරයට සෘජුව හා වක්‍රව සම්බන්ධ සියලු පුද්ගලයන්ට ආයතනඅවලට විරුද්ධව නීති ප්‍රකාරව අප කටයුතු කරනවා.

මේ සම්බන්ධයෙන් මීට වඩා පැහැදිලි කිරීමක් අවශ්‍ය නම්, ඒවා ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. ජාතික ආරක්ෂාවට බාධා නොවන අයුරින් ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට මා බලාපොරොත්තු වෙනවා."

# සාමය, සංහිඳියාව සාක්ෂාත් කර ගැනීමට ශිව දෙවිඳුන්ගේ ආශීර්වාදය ලැබේවා !

## මහා ශිවරාත්‍රී වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරමින් ජනපති කියයි

මහ ශිවරාත්‍රී දින පහන්සිළ හින්දු ජනයාගේ ආධ්‍යාත්මය ආලෝකවත් කරන්නා-සේම, සමස්ත සමාජය පුරා සාමය, සංහිඳියාව සහ සතුට සාක්ෂාත් කර ගැනීමට ශිව දෙවිඳුන්ගේ ආශිර්වාදය ලැබේවා යැයි අද (11) යෙදෙන මහා ශිවරාත්‍රී දිනය නිමි-ත්තෙන් විශේෂ පණිවිඩයක් නිකුත් කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සඳහන් කරයි.

පවතින කොවිඩ් වසංගත තත්ත්වය මේ වනවිට යම් පාලනයකට නතුවී තිබීමෙන් සෞඛ්‍ය නීතිරීතිවල ලිහි-ල්භාවයක් ඇතිකර තිබුණ ද සෞඛ්‍ය උපදෙස් පිළිපදමින් මහා ශිව රාත්‍රී දිනය සමරන ලෙස ජනාධිපතිවරයා සියලු හින්දු භක්තිකයන්ගෙන් විශේෂ ඉල්ලීමක් ද කර තිබේ.

ජනාධිපතිවරයා නිකුත් කළ මහා ශිවරාත්‍රී දින පණිවිඩයේ



මෙසේ දක්වා ඇත.

ශිව දෙවිඳුන්ගේ ආලෝක කදම්භයෙන් මෝහාන්ධකා-රය දුරුකොට, ප්‍රඥා මහිමය අත්කර ගැනීමේ ප්‍රාර්ථනය පෙරදැරිව,ශ්‍රී ලාංකේය සහ ලොවපුරා හින්දු බැතිමත්හු, අනාදිමත් කාලයක සිට මහ ශිව රාත්‍රී දින මහත් භක්ති-යෙන්යුතුව ස්වකීය ආගමික වතාවත් හී නිරත වෙති.

ලොව බලවත්ම දෙවි-ඳුන් ලෙස ඔවුන් පිළිගන්නා ශිව දෙවියන්ගේ ආශිර්වාදය සමාජ, ආර්ථික සහ සෞඛ්‍ය අභිවෘද්ධියටත්, ආධ්‍යාත්මික පෝෂණයටත් ප්‍රබල පිටිවහ-ලක් බව හින්දූන්ගේ විශ්වා-සයයි.

හින්දු සාහිත්‍යයේත්, ජන සමාජයේත් උත්තම දිනයක් බවට පත්ව ඇති මහ ශිව රාත්‍රී දින ඔවුහු නිදිවර්ජි-තව,සංස්කෘතික අගයක් සහිත විවිධවූ කාර්යයන්හි නියැලෙ-මින් ශිවදෙවියන්ට පූජෝපහාර කරති. එමගින් සර්වකාලීන ආශිර්වාදය අපේක්ෂා කරති. සිත තැන්පත්කර ගනිමින් භාවනානුයෝගීව මහා ශිව දෙව් ආවර්ජනය කිරීමෙන් ආත්මය සුවපත් වන බව හින්දු බැතිමත්හු අදහති.

අතීතයේ පටන් ශ්‍රී ලාංකේය හින්දු ලබ්ධිකයන්ගේ මේ විචිත්‍රවත් සංස්කෘතික උළෙල අපේ ජන සමාජයට අමිල වටිනාකමක් එක් කෙළේය. බහුවිධ සාහිත්‍ය කලා සේම, නර්ථනයන් බිහිකිරීමට ද මේ ආගමික චාරිත්‍රය හේතු වී තිබේ.

පසුගිය වසරේ පැතිර ගිය කොවිඩ්ව වසංගතය නිසා සෞඛ්‍ය නීතිරීතිවලට අනුග-තව මහා ශිව රාත්‍රී දින වතාවත් කරන්නට හින්දු බැතිමතුන්ට සිදුවිය.මෙවර යම් ලිහිල් කිරී-මක් ඇතත් සෞඛ්‍ය උපදෙස් පිළිපදමින් මහා ශිව රාත්‍රී දිනය සමරනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.

# ප්‍රතිසන්ධානය මඟින් එක්සත්කම උදා වේවා !

## ශිවරාත්‍රී දිනය වෙනුවෙන් සුබපැතුම් එක් කරමින් අගමැති කියයි

එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ ප්‍රතිසන්ධානය තුළින් එක්සත්කම සඳහා වූ විශිෂ්ට ප්‍රයත්නයට ශිව දෙවියන්ගේ ආශිර්වාදය නිතැතින් හිමි-වනු ඇතැයි තම විශ්වාසය බව අගමැති මහින්ද රාජ-පක්ෂ මහතා ප්‍රකාශ කරයි.

ශිවරාත්‍රී දිනය වෙනුවෙන් සුබපැතුම් පණිවිඩයක් නිකුත් කරමින් මේ බව පව-සන අගමැතිවරයා වැඩිදුර-ටත් මෙසේ සඳහන් කරයි.

ලොව පුරා හින්දු බැති-මතුන් සමඟ එක්වෙමින් මහා ශිව රාත්‍රී දිනය ඉමහත් භක්ත්‍යාදරයෙන් සමරන ශ්‍රී ලාංකේය හින්දු භක්ති-



කයන්ට සුභාශිංසන පළ කරනුයේ ඉමහත් සතුටිනි.

විවිධ ජනවර්ග සමඟ මිත්‍රශීලීව සහ එකමුතුව ජීවත්වීමේ දීර්ඝ සම්ප්‍රදායක් ශ්‍රී ලාංකේය හින්දු භක්ති-කයන්ට ඇත. ඔවුන් සියලු දෙනා දැඩි අධ්‍යාත්මික හැඟීමකින් යුතුව ශිව රාත්‍රී දින උපවාසයේ යෙදී සිටිති.

මහා ශිවරාත්‍රී දින උප-වාසය ඔස්සේ අධ්‍යාත්මික විමුක්තිය උදාවනු ඇතැයි හින්දු භක්තිකයන්ගේ ඉහළ විශ්වාසයයි. හින්දු බැතිම-තුන් මහා ශිව රාත්‍රී දිනයේ මෙසේ නිරාහාරව සිටීම සහ ශුද්ධ වූ චාරිත්‍ර පිළිපැදීම මඟින් අධ්‍යාත්මික ජීවිතය පොහොසත් කරයි.

අද වැනි උතුම් දිනෙක දෙවියන්ගේ අධ්‍යාත්මික ශක්තිය තමන් කෙරෙහි ලැබෙනු ඇතැයි ද හින්දු විශ්වාසයක් පවතියි. එකි-නෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ ප්‍රතිසන්ධා-නය තුළින් එක්සත්කම සඳහා වූ මෙම විශිෂ්ට ප්‍රයත්නයට ශිව දෙවියන්ගේ ආශිර්වාදය නිතැතින් හිමිවනු ඇති බව මාගේ විශ්වාසයයි.

මහා ශිවරාත්‍රී දින දැල්වෙන පහන් ආලෝ-කයෙන් ශ්‍රී ලාංකේය හින්දු භක්තිකයන්ට සෞභාග්‍ය-මත් අනාගතයක් උදාවීම සඳහා වූ සියලු අපේක්ෂාවන් ඉටුවේවා යැයි මාගේ හෘද-යාංගම සුබ පැතුම් පිරිනමමි.

හින්දු භක්තික ඔබ සැමට මහා ශිව රාත්‍රී දිනය අර්ථවත් හා ප්‍රීතිමත් දිනයක් වේවා !

# හින්දු විශ්වකෝෂය අගමැති ප්‍රධානත්වයෙන් එළිදකී





**මහින්ද අලුත්ගෙදර**

සංස්කරණය කරන ලද හින්දු විශ්වකෝෂය අග-මැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් එළිදක්වා තිබේ.

මහා ශිව රාත්‍රී දිනයට සමගාමීව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සම්පූ-ර්ණයෙන් සංස්කරණය කරන ලද වෙළුම් 12 කින් සමන්විත හින්දු විශ්වකෝෂය බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු ඇමැති සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පෙරේදා (9) එළිදැක්විණි.

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්ත-මේන්තුව 1988 දී ආරම්භ කළ හින්දු විශ්වකෝෂය නිර්මාණය කිරීම 2014 දී වෙළුම් දොළහ සම්පූර්ණ කළ අතර අගමැති මහින්ද රාජපක්ෂ මහතා එව-කට පස්වැනි විධායක ජනාධිපතිවරයා ලෙස හින්දු විශ්වකෝෂයේ වෙළුම් දොළහ සම්පූර්ණ කිරීමට අවැසි නායකත්වය දුන්නේය. ඒ අනුව හින්දු විශ්ව-කෝෂයේ 12වැනි වෙළුමේ සංස්කරණ ඇතුළත් නවතම මුද්‍රණය අගමැතිවරයාගේ සුරතින් පළමුව හින්දු පූජකතුමන්ලාට ප්‍රදානය කිරීම සිදු විය.

එහිදී අගමැතිවරයා ,ඇමැති ඩග්ලස් දේවානන්දා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආචාර්ය සුරේන් රාසවන්, අංගජන් රාමනාදන්, එම් රාමේෂ්වරන් සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහත්වරුන්ට ද සංකේතාත්මකව හින්දු විශ්වකෝ-ෂයේ නවතම සංස්කරණය පිරිනැමීය. ශ්‍රී ලංකාවේ හින්දු ආගමික කටයුතු වෙනුවෙන් විෂය භාර ඇමැ-තිවරයා ලෙස අගමැතිවරයා ඉටුකරන සුවිශේෂී කාර්යයභාරය මෙහිදී හින්දු පූජකතුමන්ලාගේ ඇග-යීමට ලක්විය.

මහා ශිව රාත්‍රී දිනය භක්තිමත්ව හා සෞඛ්‍යාර-ක්ෂිතව සැමරීම උදෙසා අගමැතිවරයාගේ උපදෙස් පරිදි තෝරාගත් හින්දු කෝවිල් 50කට රුපියල් 50000 ක් බැගින් මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ සමාරම්භය ද මෙයට සමගාමීව පැවැත්විණි. එහිදී කොළඹ ශ්‍රී කදිර්වේලායුද ස්වාමි කෝවිලේ සභාපති කේ. රගු-නාදන්, වරකපොළ ශ්‍රී භද්‍රකාලි අම්මාන් කෝවිලේ භාරකරු බී.කෝමතී, හොරණ ශ්‍රී මුත්තුමාරි අම්මාන් කෝවිලේ සභාපති ආර්.කනේෂු මහත්ම මහත්මීන්ට අගමැතිවරයාගේ සුරතින් මූල්‍යාධාර චෙක්පත් ප්‍රදා-නය කෙරිණි.

මෙම අවස්ථාවට කොළඹ රාමක්‍රිෂ්ණා මිෂන් සභාපති ස්වාමි අග්‍රසරාත්මානන්ද මහරාජ්, සින්මයා මිෂන් සභාපති ස්වාමි ගුණාදීදානන්ද සරස්තී, අන්තර් ජාතික හින්දු ආගමික සංගමයේ ලේකම් හා අගමැතිවරයාගේ හින්දු කටයුතු සම්බන්ධී-කාරක රාමචන්ද්‍ර කුරුක්කල් බාබු ෂර්මා, ඇමැති ඩග්ලස් දේවානන්දා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ආචාර්ය සුරේන් රාසවන්, අංගජන් රාමනාදන්, එම් රාමේෂ්වරන් සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන, හින්දු ආගමික හා සංස්කෘතික කට-යුතු දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂිකා ශාන්ති නාවුකරෂන්, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ. උමා මහේෂ්වරන්, ආචාර්ය ක.රගුබරන්, හින්දු සංස්කෘතික අරමුදලේ සාමාජික සී.ධනපාල මහත්ම මහත්මීන් ඇතුළු පිරි-සක් එක්ව සිටියහ.

# පුනර්ජනනීය බලශක්තිය සඳහා අවශ්‍ය සහයෝගය ශ්‍රී ලංකාවට දෙනවා

## ශ්‍රී ලංකාවේ තුර්කි තානාපතිනි

ශ්‍රී ලංකාවේ ආර්ථිකය දහනය කරන ඩීසල් බලාගාර වෙනුවට සමස්ත ජාතික විදුලි ජන-නයෙන් 70% ක් හරිත හා පුනර්ජනනීය ප්‍රභ-වයන්ගෙන් නිපදවීම සඳහා කටයුතු කරන බවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහ-තාගේ 'සෞභාග්‍යයේ දැක්ම' මඟින් පැහැදිලි කර තිබීම ගැන තුර්කි රජය ප්‍රශංසාව පළ කරන බවත් පුනර්ජනනීය බලශක්තිය සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට සූදානම් බවත් ශ්‍රී ලංකාවේ තුර්කි තානාපතිනි Demet Sekercioglu මහත්මිය අවධාරණය කරයි.

ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා සමග නිල සාකච්ඡාවකට සහභාගී වෙමින් තුර්කි තානාපතිවරිය මෙම අදහස් පළ කෙළේය.

මෙම නිල සාකච්ඡාව සඳහා විදුලිබල අමා-ත්‍යාංශ ලේකම්, වසන්තා පෙරේරා මහත්මිය ද සහභාගි විය.

දෙරට අතර දීර්ඝ කාලයක් සිට පැවත එන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා මෙන්ම මිත්‍රත්වය වර්ධනය කිරීමේ අරමුණෙන් පැවති මෙම සාකච්ඡාවේ දී ශ්‍රී ලංකාවේ විදුලි ක්ෂේත්‍රයේ අනාගත සැලසුම් සහ සංවර්ධන ක්‍රමෝපා-යන් පිළිබඳ විදුලිබල ඇමැතිවරයා සහ තුර්කි තානාපතිනිය අතර දීර්ඝ වශයෙන් සාකච්ඡා පැවැත් විණි.

මෙම සාකච්ඡාවේ දී කරුණු දක්වමින්, ජාතික විදුලි ජනනයට හරිත හා පුනර්ජ-නනීය බලශක්ති දායකත්වය 70% ක් දක්වා ඉහළ නැංවීමත්, වසර 2025 වනවිට විදුලිබල උත්පාදනයට ඩීසල් දායකත්වය 5% ක් දක්වා පහත හෙළීමත්, වසර 2030 දී එය මුළුමනි-න්නම නවතා දැමීමට සැලසුම් කරන බවත් පැවසූ ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා, ඒ වෙනුවෙන් දැනට පවතින පුනර්ජනනීය මූලා-ශ්‍රයන් සංවර්ධනය කිරීමට හා නව මූලාශ්‍රයන් ගවේෂණය කිරීමටත් සැලසුම් කරමින් සිටින බව පැවසීය.

ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් පුනර්ජනනීය බලශක්තිය වර්ධ-නය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමටත්, මෙරට තුළ නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන් ස්ථාපනය සඳහා තම රටේ රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශ ආයෝ-ජකයන්ගේ අවධානය යොමුකරවීමට අද-හස් කරන බව පැවසූ තුර්කි තානාපතිනිය, ඉදිරි කාලය තුළදී මේ සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කිරීම වෙනුවෙන් පුද්ගලික ආයෝ-ජකයන් ද සම්බන්ධ කර ගැනීමට අදහස් කරන බව වැඩි දුරටත් පැවසිය.

# සතොස පරිගණකගත කිරීමට කටයුතු කරනවා

## ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන

**ස්වර්ණා විජේකෝන්,**
**සන්ධ්‍යා කරුණාරත්න**

ලංකා සතොස ආයතනයේ අලෙවි ජාලය සහ ගබඩා පද්ධ-තිය මාසයක් ඇතුළත පරිගණක ගත කිරීමට කටයුතු කරන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පාර්ලිමේ-න්තුවේදී ඊයේ (10) පැවසීය.



සතොස ජාලය විධිමත් කිරීමේ අරමුණින් පරිගණකගත කිරීම සිදු කරන බවත් බිල්පත් සිදු කිරීමේ පහ-සුව මෙන්ම භාණ්ඩ අන්තර්ගතය ඇතුළු සියළු කටයුතුවලට මෙමගින් පහසුවක් ලැබෙන බවද ඇමැතිවරයා කීය.

ඇමැති බන්දුල ගුණවර්ධන මහතා මේ බව සඳහන් කෙළේ පාර්ලිමේන්තු මන්ත්‍රී බුද්ධික පතිරණ මහතා මතුක-රන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා සඳහන් කෙළේ සතොස ආයතනයට අලෙවි ද්‍රව්‍ය ලබා ගැනීමේදී දේශීය නිෂ්පාදක-යන්ට ප්‍රමුඛතාවය ලබා දීමේ වැඩපි-ළිවෙළක් ආරම්භ කර තිබෙන බවයි.

විශේෂයෙන'ඉදිරි විනිමය ගිවිසු-මක්' මගින් භාණ්ඩ ලබා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් තම අමාත්‍යාංශයෙන් ක්‍රියා-ත්මක කර ඇති බව ද ඇමැතිවරයා මෙහිදී වැඩිදුරටත් සඳහන් කෙළේය.

# බෞද්ධ අන්තවාදයෙන් ඉස්ලාම් අන්තවාදයක් ඇති වුණායැයි කීම විහිළුවක්

## ඇමැති විමල් වීරවංශ



**රුවන්ත නිතුල්ගස්පිටිය**

පාස්කු ප්‍රහාර මාලාව දියත් කළ මිනීමරු ස්වයං ඝාතකයන් ගැන පමණක් නොව ඔවුන් නිර්මාණය වූ පරිසරය හා මතවාදය නිර්මාණය කළ පුද්ගල-යන්, මුදල් පොම්ප කළ අය සහ අපරාධකරුවන් අත්අඩංගුවට ගන්නැයි ජාතික නිදහස් පෙරමුණේ නායක කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවසුවේ කොළඹ සම්බු-ද්ධත්ව ජයන්ති මන්දිරයේ පෙරේදා (09) පැවැති විශේෂ දේශනයක් අමතමිනි.

'ඉස්ලාම් අන්තවාදය ,පාස්කු කොමිසමෙන් ඔබ්බට' යන මැයෙන් පැවති මෙම දේශනය අමතා ඇමැතිවරයා වැඩිදුරටත් මෙසේද පැව-සීය.

පොලිසියට බලපෑම් කර ඔවුන් මුදා ගැනීමට දේශපාලන බලපෑම් කළ දේශපාලන මහමො-ළකරුවන්ට විරුද්ධව අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීමට වැඩි අවධානයක් යොමු කළ යුතුයි .පාස්කු ප්‍රහාරය පිළිබඳව විමර්ශනය කළ ජනාධිපති පරී-ක්ෂණ කොමිසම මඟින් ඥානසාර හිමියන් ඇප නොමැතිව හිරේ දමන ලෙස ස්ථිර නිර්දේශ ඉදිරි-පත් කර තිබුණා. මුස්ලිම් අන්තවාදය පැල කිරීමට පියවර ගත් මුස්ලිම් දේශපාලකයන්ට සහ ප්‍රබල මුස්ලිම් සංවිධානයනවලට නීතිය ක්‍රියාත්මක කිරී-මට නිෂ්චිත නිර්දේශ කිසිවක් ඉදිරිපත් නොකර තිබීමෙන් පාස්කු කොමිසම තුළ සහරාන්ගේ අව-තාර පැවැති බවට බරපතළ සැකයක් මතුව තිබෙ-නවා.

සහරාන් හෂීම් සහ හිටපු ඇමැති රිෂාඩ් බදුරු-දීන්ගේ සහෝදරයකු අතර වූ දුරකථන සංවාදයක් ගැන පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මාධ්‍ය ඔස්සේ ප්‍රකාශ කළා. රිෂාඩ්ගේ මල්ලි සහ සහරාන් අතර වූ ඒ දුරකථන සංවාදයෙන් පස්සේ රිෂාඩ්ගේ මල්ලි රිෂාඩ්ට දුරකථන ඇමතුමක් අරගෙන නැවත සහ-රාන්ට කතා කර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශ-කයා පැවසුවා. ඒත් දැන් සහරාන්ට ඇමතුම් දුන්න අය හොඳ මිනිස්සු වෙලා.

පාස්කු කොමිසමේ නිර්දේශ මඟින් කියලා තියෙනවා ගලබොඩඅත්තේ ඥානසාර හිමියන් නිසා සහරාන් බිහිවුණා කියලා. ලෝක ව්‍යාප්ත ඉස්ලාම් අන්තවාදය මෙරට පැළ කළේ බෞද්ධ සංවිධාන නොවේ. මෙරට තුළ බෞද්ධ අන්තවාද-යක් පැවැතියා නම් කඩු 6000ක් ගෙන තෙක් කිසි-සේත්ම බෞද්ධ අන්තවාදය නිකන් ඉන්නේ නෑ.

ඇප නැතුව හිරේ දැමිය යුතු බව කොමිෂන් සභා වාර්තාවේ ඥානසාර හිමියන් ගැන දන්වා තිබුණත් රිෂාඩ් බදුරුදීන්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා යටතේ නඩු පවරන ලෙස පමණක් දක්වා තිබීම පුදුම සහගතයි.

බෞද්ධ අන්තවාදයෙන් ඉස්ලාම් අන්තවාදයක් ඇති වුණා යැයි කොමිසම කීම විහිළුවක්. මේකෙන් කරලා තියෙන්නේ එදා දෙමළ ඊළාම් ත්‍රස්වාද-යට ජනවාර්ගික ප්‍රශ්නයක් ලෙස සළුපිලි ඇන්ද-වූවා වගේ නැති ලෙඩකට බෙහෙත් වට්ටෝරු ගෙන ඒමක්. මේකෙන් පේනවා විකාර රූපි අද-හසක කොමිසමේ විනිසුරුවන් ඉඳලා තියෙනවා කියලා. ප්‍රහාර මාලාවක් වුණාට පස්සේ සහරාන් ගැන හොයන්න පන්සලට යන්න ඕනෑ නෑ, කඩු ගොඩගහගත්ත පල්ලිවලටයි යන්න ඕනෑ.

මේ කොමිසම කාත්තන්කුඩි ප්‍රදේශයේ අන්ත-වාදය වපුරන්න හිස්බුල්ලා කටයුතු කළා කිව්වත් ඔහු ගැනත් කිසිවක් සඳහන් කරලා නෑ. බුදුන් මස් කෑ බව කියූ අබ්දුල් රාසික්, මාවනැල්ල අන්ත-වාදීන් අහුවෙද්දි ඔවුන් බේරගන්න කටයුතු කළ අසාද් සාලිට මොකද කරන්නේ කියලා නිශ්චිතව කියලා නෑ, නමුත් ඥානසාර හිමියන්ට කරන්න ඕනෑ දේ නිශ්චිතව කියලා තියෙනවා.

මුස්ලිම් කවුන්සිලයේ සභාපති එන්.එම් අමීන් වහාබ්වාදියකු වූ යූෂුප් අල් කොඩාවිගේ ඉගැ-න්වීම් මුස්ලිම් දරුවන්ගේ විශය නිර්දේශයන්ට සහ ගුරු අත්පොත්වලට එකතුකරන්න පියවර ගෙන තියෙනවා. නමුත් වහාබ් ඉගැන්වීම් පැල-කරන්න කටයුතු කළ අමීන්ට කරන්න ඕනෑ දේවල් මේ කොමිසම නිශ්චිතව කියලා නෑ. යූෂුප් අල් කොඩාවිගේ ඉගැන්වීම්වල තියෙනවා වහා-බ්වාදය ව්‍යාප්ත කරන්න ඕනෑ නම් රාජ්‍ය බලය හා භූමිය අත්පත්කර ගන්න ඕනෑ කියලා. සැඟ වී ක්‍රියාත්මක වන හුදකළා අන්තවාදයක් නොවේ ඉස්ලාම් අන්තවාදය, රාජ්‍ය බලය, ජනගහන ප්‍රව-ර්ධනය,භූමිය අත්පත්කර ගැනීම යටතේ වේග-වත්ව සිදුවන දෙයක්. ඒ නිසා මේ කොමිෂන් වාර්තාවෙන් එහාට ගිය විශේෂ වැඩපිළිවෙළක් නිර්මාණය විය යුතුයි. වසර දෙකක් ගියත් අප-රාධ නීතිය ක්‍රියාත්මක නොවීම ගැන සමාජයේ යම් විරෝධයක් නිර්මාණය වී තිබුණත් ජනාධිපති කොමිසම අපරාධ නීතියට විකල්පයක් නොවේ. අපරාධ නීතියට අනුව යුක්තිය පසිඳලිය යුතුයි. අපරාධ නීතිය ක්‍රියාත්මක කිරීම දැනට රහස් පොලිසිය එක්තරා දුරකට සිදු කර තියෙනවා. පාස්කු ප්‍රහාරය පිටුපස සිටින සැබෑ අවතාර, මහ මොළකරුවන්, න්‍යායචාර්යයවරුන් සියල්ල රටට හෙළිදරව් කිරීම සහ අන්තවාදය අවසන් කිරී-මට අවසන් පියවර ගන්නා තෙක් අවධානයෙන් ඉන්න ඕනෑ.

# සෑම පුරවැසියකුටම ඉඩමක අයිතිය දෙන්නැයි ජනපති උපදෙස් දුන්නා

## ඇමැති එස්. එම්. චන්ද්‍රසේන

**රක්ෂණ ශ්‍රියන්ත**

මෙරට ජීවත් වන සෑම පුරවැසියකුටම ජීවත්වීමට ඉඩමක් දෙන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තමන්ට උපදෙස් දී ඇතැයි ඉඩම් ඇමැති එස්. එම්. චන්ද්‍රසේන මහතා පැවැසීය.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, බත්තරමුල්ල, නෙළුම් මාවත පක්ෂ මූලස්ථානයේදී පෙරේදා (09) පැවති විශේෂ මාධ්‍ය සාකච්ඡාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉඩම් අමාත්‍යාංශයේ කටයුතු සඳහා නිරන්තරයෙන්ම අවධානය යොමු කරනවා. මේ රටේ ජීවත්වන සෑම පුරවැසියකුටම තමන්ට අයිති බිම් කොටසක් දෙන්න කියා අපට උපදෙස් දී තිබෙනවා. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශය හැටියට අපි විශාල මෙහෙයුමක් මේ කාල සීමාවේ කරගෙන යනවා. ඒ ඉඩම් අමාත්‍යාංශයට අයිති ආයතන ප්‍රධානීන් කැඳවා මේ වසරේ පමණක් ඉඩම් ඔප්පු එක් ලක්ෂ පනස්දහසක් දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී අපි ඔප්පු 20,000ක් නිකුත් කිරීම ආරම්භ කළා. 2021 දෙසැම්බර් මාසයේ 31 වැනිදා වන විට එක් ලක්ෂ පනස්දහසක ඔප්පු දෙන්න බලාපොරොත්තු වෙනවා. මෙහි පරමාර්ථය තමයි, ඉඩම් නැති අයට නිවෙසක් සාදාගැනීමට ඉඩම් දීම, ව්‍යාපෘති සඳහා ඉඩම් දීම, කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් දීම. ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්තිය අනුව අපේ රටේ වගා කරන්න පුළුවන් සෑම දෙයක්ම වගා කරන්න අවශ්‍ය සහාය සහ වැඩපිළිවෙළ ඒ මහතා සකස් කර දී තිබෙනවා. අපේ දේශීය නිෂ්පාදන දිගටම දුර්වල තත්ත්වයකට පත් වුණා. එම දුර්වලතා මඟහරින්න නම්, මිල ටිකක් වැඩි වුණත් අපේ වගාවන් කරන්න අවශ්‍යයි. ජනතාවත් යම්කිසි මට්ටමකින් මේ පිළිබඳව අවබෝධයක් ගත යුතුයි.

පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්සකුට්ටිආරච්චි, පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ප්‍රිය හේරත් මහත්වරු ද මෙහිදී අදහස් පළ කළහ.



# අපේ පක්ෂය ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය සමඟ කිසිදු සබඳතාවක් නෑ

## ශ්‍රී ලංකා භාරතීය ජනතා පක්ෂයේ සභාපති වේලුසාමි මුත්තුසාමි

**උතුරු පළාත් විශේෂ
රසුල දිල්හාර ගමගේ**

තමන් විසින් පිහිටුවන ලද පක්ෂයේ නම ශ්‍රී ලංකා භාරතීය ජනතා පක්ෂය වුවත් එම පක්ෂයට ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය සමඟ කිසිදු සම්බන්ධතාවක් නැතැයි ශ්‍රී ලංකා භාරතීය ජනතා පක්ෂයේ සභාපති වේලුසාමි මුත්තුසාමි මහතා ඊයේ (10) පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'මගේ පක්ෂය කිසිදු ජාති භේදයක්, ආගම් භේදයක් හෝ වෙනත් කිසිදු භේදයක් නොමැති පක්ෂයක්. ඉන්දියාවේ භාරතීය ජනතා පක්ෂය ඉතාම උග්‍ර ජාතිවාදී පක්ෂයක්. මට එවැනි පක්ෂයක් බිහිකිරීමට කිසිදු අවශ්‍යතාවක් නෑ.

යම් හෙයකින් අපේ පක්ෂය මෙරට ලියාපදිංචි කිරීමට යෑමේදී භාරතීය යන වචනය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් පක්ෂයේ සඳහන් එම නාමය ඉවත් කර ශ්‍රී ලංකා ජනතා පක්ෂය ලෙස පක්ෂය නම් කරනවා.



ශ්‍රී ලංකා භාරතීය ජනතා පක්ෂය ආරම්භ කරමින් එහි ප්‍රතිපත්ති ප්‍රකාශනය යාපනයේදී එළි දැක්වූ අවස්ථාවේ ද මේ සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න කිරීමක් තිබුණා. පක්ෂයේ නාමය හෝ ලාංඡනය එතරම් ප්‍රශ්නයක් කර ගත යුතු නෑ.'



# ගැටලුවලට විසඳුම් දෙමින් දේශීය වෛද්‍ය ක්‍රමය ගොඩනඟනවා

## රාජ්‍ය ඇමැති නීතිඥ සිසිර ජයකොඩි

**මහර සමූහ
ගණිඳු රෝචන සමරතුංග**

පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමයේ පවතින ගැටලුවලට විසඳුම් දෙමින් පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමය ගොඩනඟන බවත් ජනතාව අතර ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින බෝ නොවන රෝග පැතිරීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් දේශීය වෛද්‍ය ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති නීතිඥ සිසිර ජයකොඩි මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති මහර ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා රැස්වීමට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද පැවැසීය.

'මේ වන විට දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය නව පුනර්ජීවනයකට ලක්ව පවතිනවා. කොරෝනා වසංගතය හමුවේ පාරම්පරික දේශීය ඖෂධ යොදා ගනිමින් අවශ්‍ය ප්‍රතිකාර කිරීමට යොමුව තිබෙනවා. මේ දිනවල දේශීය ඖෂධවලට බටහිර වශයෙන් නිල අනුමැතියක් දීමට අමාත්‍යාංශය මැදහත්ව කටයුතු කරනවා. මේ වන විට කොරෝනා වසංගතය හමුවේ මිය යන පිරිසට වඩා සුව වන පිරිස වැඩියි.

ලෝකයට මුලින් නිරෝධායන කටයුතු හඳුන්වා දුන් රට ලෙස ලංකාව හැඳින්වීමට පුළුවන්. මේ වන විට දේශීය වෛද්‍ය සභාවෙන් ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ යටතේ පාරම්පරික වෛද්‍යවරුන් සහ උපාධිධාරී වෛද්‍යවරුන් වශයෙන් ලියාපදිංචි කටයුතු සිදු කරනවා.

යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය මේ වන විට විශ්වවිද්‍යාලයක් බවට පත් කර අපේ දැනුම විදේශ රටවලට ගෙන යෑමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ට විභාග ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරනවා. මේ සඳහා අවශ්‍ය පහසුකම් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් දීමට කටයුතු කරනවා. මීට අමතරව පාරම්පරික දේශීය වෛද්‍යවරුන් නඟාසිටුවා හොර වෛද්‍යවරුන් පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා. මේ වන විට පාරම්පරික දේශීය වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේදී ඒ සඳහා ලිහිල් ප්‍රතිපත්ති අනුගමනය කිරීමට කටයුතු කරනවා.

අද තරුණ පරපුර දේශීය ඖෂධ ශාක පිළිබඳ එතරම් දැනුම්වත්කමක් නෑ. වෙළෙඳසලෙන් දේශීය ඖෂධ ගැනීමේදී අප ගන්නේ නියමිත ශාක කොටස් ද යන්න පිළිබඳව ගැටලුකාරී තත්ත්වයක් පවතිනවා. මේ නිසා දේශීය ඖෂධ වගා කිරීමට අවශ්‍ය ඉඩම් දී ඔසු ගම්මාන ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. මීට අමතරව පාසල් යන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට දේශීය ඖෂධ පිළිබඳ අවශ්‍ය දැනුම දීමට කටයුතු කරනවා.'

මහර ප්‍රාදේශීය ලේකම් ජී. එස්. අයි. විමලසේන, මහර ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභාවේ සභාපති දේශීය වෛද්‍ය ආර්. පී. කේ. රත්නායක මහත්වරුන් ඇතුළු පාරම්පරික දේශීය වෛද්‍යවරු මේ අවස්ථාවට සහභාගි වූහ.

ඡායාරූපය - මහර සමූහ

# සියලු ප්‍රශ්න මැද කාන්තාව කුස්සියේ යුද්ධයට මැදි වෙලා

## මහනුවර දිස්ත්‍රික් නායකා ශාන්තිනී කෝන්ගහගේ

**ශිරෝමි අබයසිංහ සහ
මැද කොළඹ සමූහ**

සියලුම ප්‍රශ්න මැද කාන්තාව කුස්සියේ යුද්ධයට මැදිවී ඇතැයි එක්සත් ජාතික පක්ෂයේ මහනුවර දිස්ත්‍රික් නායිකා ශාන්තිනී කෝන්ගහගේ මහත්මිය සඳහන් කළාය.

ඇය මේ බව සඳහන් කළේ එක්සත් ලක් වනිතා පෙරමුණේ මෙහෙයවීමෙන් සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා (08) පැවති 'අභියෝග ජයග්‍රහණය කිරීම' තේමාව කර ගත් කාන්තා දින සැමරුම් උත්සවයේදීය. කාන්තාවන්ගේ යහපත සඳහා වන යෝජනා හතරක් මේ සැමරුමේදී සම්මත විය.

පළාත් සභා මැතිවරණයේදී මන්ත්‍රී ධුර දීමේදී එයින් 25% ක් කාන්තාවන්ට පළාත් සභා නීතියෙන් වෙන් විය යුතු බවත්, ඉදිරි එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ නැවත ළමා හා කාන්තා කැබිනට් අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමත්, දේශපාලනයේ නියුතු ක්‍රියාකාරී කාන්තාවන්ට දේශපාලන අධ්‍යාපන පුහුණු ආයතනයක් පිහිටුවීමත්, එක්සත් ලක් වනිතා සුබසාධක සංගමයක් පිහිටුවීම සහ ILO ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සී. 190 (වැඩ බිමේ ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී දූෂණ පිටු දැකීම) බලාත්මක කිරීමත් යන යෝජනා මෙලෙස සම්මත විය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ශාන්තිනී කෝන්ගහගේ මහත්මිය මෙසේ ද කීවාය.

'ආර්ථික අභියෝග ජය ගැනීමට ජාතික වශයෙන් කටයුතු කළ යුතුයි. දේශපාලන භේදයකින් තොරව කාන්තාවන් ආර්ථිකයෙන් පීඩාවට පත්ව සිටින මේ මොහොතේ කුඩා ව්‍යාපාරයේ සිට අපනයනකරු දක්වා සියලු ව්‍යාපාර බිඳ වැටිලා. වර්තමාන ආර්ථිකයේ අද මැද පෙරදිග ශ්‍රමිකයන්ගේ ඉරණම අපට විසඳීමට සිදුව



තිබෙනවා. විදෙස් රටවල සේවය කරන ශ්‍රමිකයන් සිය මුදල් වියදම් කර වර්තමාන රජය බලයට පත් කිරීමට දායකත්වය දුන්නත් අද ඔවුන් මහ පාරට වැටිලා. ඉතා අමාරුවෙන් උපයා ගත් මුදල් නිරෝධායනය වීමට හෝටල්වලට පුද කරන්න සිදු වෙලා.

විදෙස් ශ්‍රමිකයන්ගේ දරුවන්ගේ ශිෂ්‍යත්ව අරමුදල නවතා දමා තිබෙනවා. මේ සියලු දේ මැද කුස්සියේ යුද්ධයට කාන්තාව මැදි වෙලා. එයට එරෙහිව අද අපට උද්ඝෝෂණය කිරීමට සිදු වෙලා. බඩු මිල අහස උසට ගිහින්. බන්දුල ඇමැතිවරයා කියන විදියට වෙළෙඳපොළට ගිය විට ගෘහනියට අවශ්‍ය භාණ්ඩ නෑ.

අද කාන්තාවන්ගේ පෞද්ගලික ආරක්ෂාව බරපතළ ලෙස බිඳ වැටිලා. වසර එක හමාරකදී වැඩිම ස්ත්‍රී දූෂණ සහ ළමා අපචාර ඉහළ ගිහින්. පරිසරය විනාශ කිරීමෙන් නැවත කාන්තාව අසරණ තත්ත්වයට පත් වෙලා. සිරගෙයි රැඳවියන් සිරමැදිරිවල ඝාතනය වීමෙන් එම පවුල් අසරණ තත්ත්වයට පත් වෙලා. එම පවුල්වල අනාගතය භාර ගන්නේ කවුද? මේ සියල්ලෙන්ම අසරණ වන්නේ කාන්තාව. උසස්වීම සඳහා ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සුදුසුකම් සහ පළපුරුද්ද අනුව හිමිකමක් ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාවෙන් කටයුතු කළ හැකි විය යුතුයි. අපේ රජයකින් එවැනි බාධා ඉවත් කිරීමට කටයුතු කරනවා.'

# අධිකරණ නියෝගයක් නැතිව පොලිසිය මගෙන් ප්‍රකාශ ගැනීමට පැමිණීම නීති විරෝධීයි

## දෙමළ ජාතික සන්ධානයේ මාධ්‍ය ප්‍රකාශක එම්.ඒ.සුමන්තිරන්

**උතුරු පළාත් විශේෂ
රසුල දිල්හාර ගමගේ**



අධිකරණ නියෝග කිසිවක් නොමැති තමාගෙන් ප්‍රකාශ ගැනීමට පොලිසිය පැමිණීම නීති විරෝධී බවත්, එනිසා ප්‍රකාශ දීමෙන් වැළකී සිටි බවත් දෙමළ ජාතික සන්ධානයේ මාධ්‍ය ප්‍රකාශක එම්. ඒ. සුමන්තිරන් මන්ත්‍රීවරයා ඊයේ (10) පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වමින් මන්ත්‍රීවරයා මෙසේ ද කියා සිටියේය. 'පොතුවිල් සිට පේදුරුතුඩුව දක්වා පසුගිය දිනක ගමන් කළ පෙළපාලිය සම්බන්ධයෙන් අධිකරණ නියෝග කඩ කළ බවට මට කිසිදු චෝදනාවක් නෑ. මේ පිළිබඳව මට දැනුම් නොදී පොලිස් කණ්ඩායම් වරින් වර පැමිණ මගෙන් ප්‍රකාශ ඉල්ලා සිටිනවා. පොලිසිය එසේ කිරීම නීතියට පටහැනි ක්‍රියාවක්. ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්.

මේ සම්බන්ධයෙන් මට පොලිසියට එරෙහිව මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීමට නීතියෙන් ඉඩක් තිබෙනවා. පොලිසිය මෙවැනි අවස්ථාවල අවබෝධයෙන් කටයුතු කළ යුතුයි.'

# ආණ්ඩු බලයේ සිටියදී අමතක වූ ජනතා ප්‍රශ්න විපක්ෂයට ගිය විට මතක් වීම විහිළුවක්

## රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න

**නුවන් කොඩිකාර**

සජිත් ප්‍රේමදාස මහතා ප්‍රමුඛ කණ්ඩායමට ආණ්ඩු බලයේ සිටියදී අමතක වු ජනතා ප්‍රශ්න විපක්ෂයට ගිය විට මතක් වීම විහිළුවක් බව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා සංවර්ධන රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව පැවැසුවේ මහනුවර, හිඳගල හන්දියේ සිට දොළුව හරහා ගම්පොළ දෙසට දිවෙන මාර්ගය කාපට් කිරීමේ අවස්ථාවට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'ජනපති සහ අගමැති ප්‍රමුඛ මැති ඇමැතිවරුන් ගමට ගොස් ජනතා ප්‍රශ්න අසා විසඳුම් දෙද්දී එය අනුකරණය කරමින් විපක්ෂ නායකවරයා ද ජංගම සේවා පවත්වමින් ගම පුරා ඇවිදින්න පටන් අරන්.

ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා බවට පත් කරන්න ඔබ තීන්දු කරන කොට ඔබේ ගමේ සංවර්ධනය



පිළිබඳ වගකීම භාර ගන්නවා කියා එදා මා පොරොන්දු වුණා. ඒ කිවුවා වගේම අද වන විට අපි ඔබේ ගමට ඇවිත් ඔබට තිබෙන ප්‍රශ්න ගැන සාකච්ඡා කර විසඳුම් දෙන්න කටයුතු කරනවා.

පසුගිය කාලයේ පැවති ආණ්ඩු වගේ අපේ ආණ්ඩුව පැළවෙන මුල්ගල් තියන්නේ නෑ. අපට තිබෙන්නේ ජනතාවගේ ඡන්ද ටික පෙට්ටියට දමා ගැනීමේ ප්‍රශ්නයක් නොවෙයි. රට සහ රටේ සංවර්ධනය පිළිබඳ වගකීමක් අපට තිබෙනවා. මේ රටේ ඉරණම වෙනස් කරන්න පුළුවන් එකම නායකයා ගෝඨාභය රාජපක්ෂ මහතා පමණයි. ඒ නිසා තමයි 69 ලක්ෂ ජනතාව ඒ මහතා ජනාධිපති පුටුවේ ඉන්දුවේ. දශක තුනක යුද්ධය අවසන් කළ ඒ මහතා ඉදිරි වසර කිහිපයේ මේ රටේ සංවර්ධන යුද්ධය ජය ගන්නා බව නිසැකයි.'

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා ප්‍රමුඛ මහාමාර්ග රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.

# පරිසරය විනාශ කළොත් අවසානයේ බිහිවෙන්නේ කාන්තාර

## ජවිපෙ මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න

**කලවාන සමූහ - සේන වේරගම**



'මිනිසාට ජීවත්වීමට වඩාත්ම වැදගත් වන්නේ කුමක්ද කියා ඇහැව්වොත් ඔබ කියාවි රැකියාව කියලා. ඒත් මම කියනවා, වනාන්තරේ රැක ගනිමින් පරිසරය රැක ගැනීම ඊට වඩා වටිනවා කියලා. මොකද අප සියලු දෙනා රැකෙන්නේ පරිසරය රැකුණොත් විතරයි. පරිසරය විනාශ කළොත් අවසානයේ බිහිවන්නේ කාන්තාරයක්. අප සියලු දෙනාම විනාශ වෙනවා' යැයි 'ජීවයේ අයිතිය' සංවිධානයේ කැඳවුම්කරු, ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ කලවානේ පැවති 'ඩෝසරයට එරෙහිව පරිසරය වෙත යළි හැරෙන කතා බහක්' නමින් ජවිපෙ සංවිධාන කළ සම්මන්ත්‍රණ මාලාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

වනාන්තරයක් කියන්නේ මහා ජල ගබඩාවක්. මහා ආහාර ගබඩාවක්. ඖෂධ ගබඩාවක්. ඔක්සිජන් ගබඩාවක්. කාබන් විනාශ කරන කම්මලක්. ඉතින්, මේ ආණ්ඩුව ඒ වටිනා වස්තූන් විනාශ කරමින් සිටිනවා. දේශපාලන භේදවලින් තොරව මේ සඳහා විරුද්ධ විය යුතුයි. අපේ රටේම පෙනහැල්ල වගේ තියෙන්නේ සිංහරාජය. දැන් සිංහරාජයත් විනාශ කරන්න පටන් ගෙන.

# ජනතා විශ්වාසය දිනාගෙන එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවනවා

## හිටපු මන්ත්‍රී නාලක කොලොන්නේ

**ඇම්. පී. සරත්
පොළොන්නරුව දිස්ත්‍රික් සමූහ**

එක්සත් ජාතික පක්ෂය යළි ගොඩනඟා ජනතා විශ්වාසය දිනාගෙන එක්සත් ජාතික පක්ෂ රජයක් ළඟදීම පිහිටුවන බව එක්සත් ජාතික පක්ෂයේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක කොලොන්නේ මහතා කීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ පසුගියදා (08) ඒ මහතාගේ නිවෙසේ පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'එක්සත් ජාතික පක්ෂයේ යම් යම් අඩුපාඩු නිසා පාක්ෂිකයන් පක්ෂය අතහැර ගියා. ඒත් මහාමාන්‍ය ඩී. එස්.




සේනානායක මහතා බිහි කළ එක්සත් ජාතික පක්ෂය දියාරු වෙන්න ඉඩ තියන්න බෑ. අප එය ආරක්ෂා කළ යුතුයි. මේ ප්‍රදේශවල ගොවි ජනපද ඇති කර කෘෂිකර්මාන්තය නඟාසිටවූ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මහතාට කළගුණ සලකන අය එක්සත් ජාතික පක්ෂය හැර යන්නේ නෑ. හැර ගිය අය යළිත් එනව. එවිට එක්සත් ජාතික පක්ෂය ශක්තිමත්. එදා සිට මෑතක් වනතුරු මේ පක්ෂය ශක්තිමත් පක්ෂයක්. ඉදිරියේදී පවත්වන සෑම මැතිවරණයකටම එක්සත් ජාතික පක්ෂය තරග කරනවා. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජවර්ධන කියන්නේ දක්ෂ අවංක, මහත්මා ගති ඇති, රටට වැඩක් කළ හැකි නායකයෙක්. අප මෙවර එක්සත් ජාතික පක්ෂය ගොඩනඟන්නේ වැරදි නිවැරදි කරගෙන. පාක්ෂිකයන්ගේ විශ්වාස දිනාගෙන නව මුහුණුවරකින් ඉදිරියට ගෙන යනවා. එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන් ආරක්ෂා කරනවා. ඔවුන්ට ගෞරවය දෙනවා. පසුගිය කාලයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු ප්‍රමාද වුණා. නමුත් දැන් ඉදිරියට ගෙන යනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කය කියන්නේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේම දිස්ත්‍රික්කයක්. නව මුහුණුවරකින් ඉදිරියට යන එක්සත් ජාතික පක්ෂයට ඉදිරියේදී අතිවිශාල ජනතාවක් එක් වෙනවා. මා මේ පක්ෂය හැර ගිය අයටත් ආරාධනා කරනවා, එන්න අප අත්වැල බැඳගමු කියලා.'



# හැරී මේගන් ප්‍රකාශ බකිංහැම් මාලිගය රත් කරයි

ඔප්රා වින්ෆ්‍රේ සමඟ සම්මුඛ සාකච්ඡාවේදී සසෙක්ස්හි ආදිපාදවරයා සහ ආදිපාදවරිය මතු කළ, වර්ගවාදී ගැටලු "සම්බන්ධ කරුණු" "ඉතා බැරෑරුම් ලෙස සලකනු ලැබේ" යනුවෙන් බකිංහැම් මාලිගය පවසයි. නිවේදනයක් නිකුත් කරමින් මාලිගාව පැවසුවේ "මතකයන් වෙනස් විය හැකි" නමුත් කාරණා පෞද්ගලිකව විසඳනු ඇති බවයි. මේගන් ඔප්රාට පවසන්නේ හැරීගෙන් නම් නොකළ පවුලේ සාමාජිකයකුගෙන් විමසා ඇත්තේ ඔවුන්ගේ පුත් ආචීගේ සම කෙතරම් අඳුරු විය හැකිද යන්නයි. මාලිගාව පැවසුවේ සසෙක්ස්වරුන් සැමවිටම පවුලේ සාමාජිකයන්ට බොහෝ සෙයින් ආදරය කරන බවයි. මේ අර්බුදය ගැන ජ්‍යෙෂ්ඨ රාජකීයයන් පැවැත් වූ රැස්වීම්වලින් පසුව බකිංහැම් මාලිගයේ ප්‍රතිචාරය ලැබුණි. නූතන රාජකීය පවුලේ පළමු මිශ්‍ර-වාර්ගික සාමාජිකයා වන මේගන් තම පුතාගේ සමේ පැහැය පිළිබඳව ප්‍රශ්න අසන ලද බව පැවසූ සම්මුඛ සාකච්ඡාවට ප්‍රතිචාර දැක්වීමට මාලිගාව දැඩි පීඩනයකට ලක්ව තිබුණි. හැරී කුමරු පසුව ඔප්රාට පැහැදිලි කළේ මෙම අදහස් ප්‍රකාශ කළේ රැජන හෝ එඩින්බරෝ ආදිපාදවරයා නොවන බවයි.

වෙනත් අවස්ථාවක දී පියර්ස් මෝගන් අයිටීවීහි ගුඩ් මෝර්නින් බ්‍රිටන් ප්‍රසංගයෙන් ඉවත්ව ගොස් ඇත්තේ සසෙක්ස් ආදිපාදවරිය පිළිබඳ ඔහු කළ අදහස් දැක්වීම නිසාය.




# කොවිඩ් නිසා බ්‍රසීලයේ නගර රැසක සෞඛ්‍ය පද්ධති කඩා වැටීමේ අවදානමක



කොවිඩ් -19 රෝගීන් හේතුවෙන් බ්‍රසීලයේ විශාලතම නගර බොහොමයක සෞඛ්‍ය පද්ධති කඩා වැටීමට ආසන්න බව එරට ෆියෝක්‍රුස් ආයතනයේ වාර්තාවක් අනතුරු අඟවයි. රියෝ ද ජැනීරෝහි පිහිටි මේ ආයතනය පැවසුවේ බ්‍රසීලයේ ප්‍රාන්ත 27න් 25ක අගනගරවල පිහිටි දැඩි සත්කාර ඒකකවල (ICU) ඇඳන්වලින් 80% කට වඩා වැඩි ප්‍රමාණයක් පිරී පවතින බවයි. අගහරුවාදා රට තුළ කෝවිඩ් මරණ 1,972ක් වාර්තා වූ අතර, එය නව දෛනික වාර්තාවකි. වසංගතය ආරම්භ වූ දා සිට බ්‍රසීලයේ මරණ 266,000 කට වැඩි සංඛ්‍යාවක් සහ රෝගීන් මිලියන 11ක් වාර්තා වී තිබේ. එක්සත් ජනපදයෙන් පසු ලෝකයේ වැඩිම මරණ සංඛ්‍යාව දෙවන ස්ථානයට පත්ව ඇති අතර, තහවුරු කළ තුන්වන වැඩිම සංඛ්‍යාව එයයි. ෆියෝක්‍රුස්ට අනුව, රියෝ ද ජැනෙයිරෝ, බ්‍රසීලියා සහ සාඕ පවුලෝ ඇතුළු ප්‍රාන්ත අගනගර 15ක දැඩි සත්කාර ඒකක 90% කට වඩා ධාරිතාවකින් පිරී ඇත. නගර දෙකක එනම් පෝටෝ ඇලෙග්‍රේ සහ කැම්පෝ ග්‍රෑන්ඩ්හි දැඩි සත්කාර ඒකකවල ධාරිතාව ඉක්මවා ඇත. "සෞඛ්‍ය පද්ධතිවල අධික බර හා බිඳවැටීම" පවා සංඛ්‍යාලේඛන පෙන්වා දෙන බව එම වාර්තාවේ අනතුරු ඇඟවීය. "කොවිඩ් -19ට එරෙහි සටන 2020 දී අහිමි වූ අතර 2021 මුල් භාගයේදී මෙම ඛේදජනක තත්ත්වය ආපසු හැරවීමට සුළු අවස්ථාවක්වත් නොමැත" යනුවෙන් ෆියෝක්‍රුස් වසංගත රෝග විද්‍යාඥ ජෙසීම් ඔරෙලානා පැවසුවේ AFP ප්‍රවෘත්ති ඒජන්සිය වෙතටය. "අපට කළ හැකි හොඳම දෙය නම් මහා එන්නතෙහි ප්‍රාතිහාර්යය හෝ වසංගතයේ කළමනාකරණයේ විප්ලවීය වෙනසක් අපේක්ෂා කිරීමයි" ඔහු කියයි.

# පෑලියගොඩ

| පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල | කිලෝ ග්‍රෑම් එකක මිල |
|---|---|
| තෝරා (බිලි) | 1000 |
| පරව් ලොකු | 400 |
| පරව් මධ්‍යම | 650 |
| කහපරව් | 500 |
| අංජීලා B | 850 |
| බලයා ලොකු | 280-420 |
| බලයා කුඩා | 280-400 |
| කෙළවල්ලා කුඩා | 550-570 |
| කෙන්දා බොකු සහිත | 460-480 |
| තලපත් ලොකු | 750 |
| කොප්පරා | 880-900 |
| කොස්සා | 550 |
| ඇටිල්සා ලොකු | 500 |
| ඇටිස්සා කුඩා | 600 |
| පීලා ලොකු | 550 |
| අලගොඩුවා ලොකු | 350 |
| ඇටවල්ලා ලොකු | 380 |
| පියාමැස්සා | 250 |
| හුරුල්ලා | 450 |
| සාලයා යක් | 90 |
| සාලයා මට්ට | 150 |
| සප්පරා | 530-550 |
| දැල්ලා බිලි | 600 |
| දැල්ලා කුඩා | 400 |
| ඉස්සා ලොකු (සුදු) | 900 |
| ඉස්සා මධ්‍යම | 850 |
| ඉස්සා කුඩා | 450 |
| සවරා | 800 |
| ලින්නා ලොකු | 230 |
| ලින්නා කුඩා | 200 |
| සුද්දා | 450 |
| මුහුදු කකුළුවා ලොකු | 600 |
| ලෝමැස්සා | 400 |
| ගින්නටි පරව් | 500 |
| කටුවල්ලා | 280 |
| අගයා | 380 |
| සූඩයා | 80 |
| කාරල්ලා | 100 |
| තිලාපියා | 380 |
| පොතුබරි | 140-150 |
| කුම්බලා | 290-350 |
| හැඩැල්ලා | 850-830 |
| සුරාපරව් | 250-350 |
| හාල්මැස්සා | 180 |

| පෑලියගොඩ එළවළු මිල | (කිලෝවක තොග මිල) |
|---|---|
| ගෝවා | 100 |
| බෝංචි | 100 |
| තක්කාලි | 130 |
| ලීක්ස් | 65 |
| කැරට් | 120 |
| වම්බටු | 50 |
| පිපිඤ්ඤා | 50 |
| අමු මිරිස් | 150 |
| මාළු මිරිස් | 200 |
| බණ්ඩක්කා | 65 |
| තළන බටු | 70 |
| දෙහි | 70 අතර |
| වට්ටක්කා | 90 |
| පතෝල | 80 |
| බීට් | 70 |
| දේශීය අර්තාපල් | 100 |
| ලොකු ලූනු | 70 |

| පෑලියගොඩ පලතුරු මිල | (කිලෝවක තොග මිල) |
|---|---|
| අඹ අල්පොන්සෝ | 300-350-400 අතර |
| අඹ කර්තකොළම්බන් (ගෙඩි එකක්) | 90-100-110-120 අතර |
| ගස් ලබු (ගෙඩි එකක්) | 80-90 අතර |
| කෝලිකුට්ටු | 120-140 |
| ඇඹුල් කෙසෙල් | 30-40-50 අතර |
| දොඩම් | 140 |
| කොමඩු | 80-90-100 අතර |
| අන්නාසි | 80-100-120 අතර |
| කිලෝ පේර | 130-140 අතර |
| දොඩම් | 140 |



# අවුන් සාන් සූකී නිදහස් කරන්නැයි ඉල්ලූ මියන්මාරයේ බ්‍රිතාන්‍ය තානාපති ආපසු කැඳවලා

හමුදා කුමන්ත්‍රණයට එරෙහිව කතා කොට බලයෙන් පහ කළ නායක අවුන් සාන් සූකී නිදහස් කරන ලෙස ඉල්ලා සිටීමෙන් පසු මියන්මාරය එක්සත් රාජධානියේ සිය තානාපතිවරයා නැවත කැඳවා තිබේ.

කියව් ස්වාර් මින් බීබීසීයට පවසා තිබුණේ රට මේ වන විටත් බෙදී ඇති අතර, සිවිල් යුද්ධයේ අවදානමට ලක්විය හැකි බවයි. මෑත මැතිවරණයේ දී ඡන්ද ප්‍රකාශ කිරීමේ වංචාවක් සිදුවී ඇති බව පවසමින් මියන්මාරයේ හමුදාව පෙබරවාරි 1දා කුමන්ත්‍රණයකින් රටේ බලය අල්ලා ගත්තේය. එහෙත් සූකී මහත්මියගේ පක්ෂය එනම් ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ජාතික ලීගය (එන්එල්ඩී) මැතිවරණයෙන් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා තිබුණි. මැතිවරණ වංචා පිළිබඳ මිලිටරියේ ප්‍රකාශයන් ජාත්‍යන්තර නිරීක්ෂකයන් විවාදයට ලක් කර ඇති අතර, ඔවුන් කියා සිටියේ කිසිදු අක්‍රමිකතාවක් නිරීක්ෂණය නොකළ බවයි. රජයේ ප්‍රධාන නායකයන් අත්අඩංගුවට ගත්තා. සූකී මහත්මිය අනාවරණය නොකළ ස්ථානයක රඳවා සිටින අතර "බිය සහ අනතුරු ඇඟවීම" ඇති කිරීම සහ නීති විරෝධී ලෙස වෝකි ටෝකි ආනයනය කිරීම ඇතුළු චෝදනා කිහිපයකට මුහුණ දී සිටී. හිටපු හමුදා කර්නල්වරයකු වන තානාපතිවරයා සඳුදා ප්‍රකාශයක් නිකුත් කර තිබුණේ සූකී මහත්මිය නිදහස් කරන ලෙසත් ජනාධිපති වින් මයින්ට් නෙරපා හරින ලෙසත් ය. ඔහුගේ "ධෛර්යය සහ දේශප්‍රේමය" අගය කළ බ්‍රිතාන්‍ය විදේශ ඇමැති ඩොමිනික් රාබ් ඔහුට ප්‍රශංසා කර ඇත. පසුව බීබීසී බුරුම සේවය සමඟ සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් කියෙව් ස්වාර් මින් මහතා කියා සිටියේ විරෝධතාවලදී වැඩි වන හානිය දැකීමෙන් පසුව එම ප්‍රකාශය නිකුත් කිරීමට තීරණය කළ බවයි. "මියන්මාරයේ පුරවැසියන් මිය යනවා දැකීමට මට අවශ්‍ය නැත. සියලු විරෝධතාකරුවන් සහ හමුදා මර්දනය නතර කරන ලෙස මම තර්ක කරමි," ඔහු පැවසීය. "රට දැනටමත් බෙදී ගොස් ඇති අතර සිවිල් යුද්ධයක් ඇති වීමේ අවදානමක් ඇත. මට සාමය අවශ්‍යයි." හෙතෙම පවසා තිබේ.



# බාමියන් බුද්ධ රූප යළි ප්‍රතිනිර්මාණය කරයි

ඇෆ්ගනිස්තානයේ බාමියන් නිම්නයේ ඇති පුරාණ වැලි ගල් බුද්ධ රූප කලක් ලෝකයේ උසම බුදුරූ විය - එහෙත් මීට වසර 20කට පෙර තලේබාන් සංවිධානය ඒවා පුපුරුවා හරින විට ඒවා සදහටම නැති වී ගියේය. එක් අයෙක් අඟහරුවාදා රාත්‍රියේ ත්‍රිමාණ ප්‍රක්ෂේපණයක ස්වරූපයෙන් මේ විචිත්‍රවත් බුද්ධ රූප නැවත ප්‍රතිනිර්මාණය කිරීමට සමත් විය.

2001 මාර්තු මාසයේදී සියවස් ගණනක් පැරණි ප්‍රතිමා විනාශ කිරීම සනිටුහන් කරමින් උත්සවයක් පැවැතවේය. ක්‍රි.ව. 6 සහ 7 වැනි සියවස්වල මුල් භාගයේදී මෙම ප්‍රතිමා කැටයම් කර තිබුණේ බුද්ධාගම කලාපයේ එවකට ප්‍රමුඛ ආගම වූ බැවිනි. "මෙහි සිදු වූ බිහිසුණු අපරාධය කුමක්දැයි ජනතාව අමතක කර දැමීමට අපට අවශ්‍ය නැත," "බුදුන් සමඟ දවසක්" උත්සවයේ සම සංවිධායක සහරා හුසේනි පැවසීය.

# රිය අනතුරකට පත් පොලිස් නිලධාරීන්ට ඔච්චම් කරලා ඕස්ට්‍රේලියානු ජාතිකයා වරද පිළිගනී

පොලිස් නිලධාරීන් අනතුරකට ලක් වූ ස්ථානයේම මිය යමින් සිටියදී ඔවුන්ව රූගත කරමින් සමච්චල් කිරීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු ජාතිකයකු වරද පිළිගෙන තිබේ.

42 හැවිරිදි රිචඩ් පුසේ, මහජන විනීතභාවය මෙන්ම මත්ද්‍රව්‍ය සහ වෙනත් වැරදි සම්බන්ධයෙන් වූ චෝදනාවට වරද පිළිගත්තේය. පසුගිය වසරේ මෙල්බර්න් නිදහස් මාවතක පුසේ සිය මෝටර් රථයේ ගමන් කරමින් සිටියදී වේගයෙන් ධාවනය කිරීම සඳහා නිලධාරීන් හතර දෙනකු ඔහුව ලුහුබැඳ යමින් සිට ඇත. නිලධාරීන් සිවුදෙනා ඔහු අත්අඩංගුවට ගනිමින් සිටියදී, සිව්දෙනා පසුකර ගිය ලොරි රථයක ගැටී තිබේ. ජ්‍යේෂ්ඨ කොස්තාපල්වරුන් වන ලිනට් ටේලර් සහ කෙවින් කිං සහ කොස්තාපල්වරුන් වන ග්ලෙන් හම්ෆ්‍රිස් සහ ජොෂ් ප්‍රෙස්ට්නි එම ස්ථානයේදීම මිය ගියහ. පුසේ මීටර් කිහිපයක් ඈතින් සිටගෙන අනතුරෙන් වැළකී සිටියද පසුව ඔහුගේ දුරකතනය එළියට ගෙන මිනිත්තු තුනකට වැඩි කාලයක් රූගත කිරීම් ආරම්භ කළේය.

උසාවිය මීට පෙර විභාගයට ගත් අවස්ථාවේ දී ලොරි රථයට යටින් සිටි ඔහු ජ්‍යේෂ්ඨ කොස්තාපල් ටේලර්ට නින්දා කළේය. විශේෂඥයන් පැවසුවේ ඔහු ඒ වන විට ජීවතුන් අතර සිටි බවයි. උසාවියකට ඉදිරිපත් කර තිබූ තිබූ කොස්තාපල්වරයාගේ නිල ඇඳුමට සවිකර ඇති කැමරාවේ දර්ශනයට අනුව, "ඔබ එහි යන්න. පුදුම සහගතයි, ඇත්තෙන්ම පුදුම සහගතයි" යනුවෙන් ඔහු පවසන ආකාරය දැක්වේ. ටික වේලාවකට පසු ඔහු මෙල්බර්න් හි නැගෙනහිර නිදහස් මාවතේ පලා ගොස් ඇත.



# වනඅලි රක්ෂිතය ගැසට් කරන්න අම්බලන්තොට විරෝධතාවක්

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

හම්බන්තොට යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කරන ලෙස ඉල්ලමින් සූරියවැව වල්සපුගල ප්‍රදේශයේ ගොවින් පිරිසක් සිදු කරන සත්‍යග්‍රහයට සහය පළ කරමින් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය හා ගොවිසන්විධාන මෙන්ම පරිසර සංවිධාන එක්ව 10 වැනිදා දහවල් අම්බලන්තොට නගරයේ විරෝධතාවක් පැවත්වූහ.




අම්බලන්තොට තවලුවිල සිට පාගමනින් හා සූරියවැව ඇතුළු ප්‍රදේශ කීපයක සිට රථ පෙළපාළිවලින් පැමිණි විරෝධතාකරුවෝ අම්බලන්තොට නගර මධ්‍යයේදී විරෝධතාව පැවැත්වූහ.

මෙම විරෝධතාව සඳහා දහසක පමණ පිරිසක් මෙන්ම සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න, පාහියන්ගල ආනන්ද සාගර හිමි, මෙන්ම ජාතික භික්ෂු සංවිධාන නියෝජනය කරමින් තවත් භික්ෂුන් වහන්සේලා රැසක්, ගොවි නායකයෝ සහභාගී වී සිටියහ.

විරෝධතාව හේතුවෙන් කොළඹ කතරගම මාර්ගය අම්බලන්තොට නගරයෙන් හරස්වීම නිසා පැය එකහමාරක පමණ කාලයක් දැඩි වාහන තදබදයක්ද පැවතිණි.

මේ අතර පොලිසිය අධිකරණ නියෝගයක් ගෙන අදාළ විරෝධතාවේ යෙදුණු පිරිස් විසුරවා හැරීමට කටයුතු කළේය.




# සඳකැන් හසරංග විස්සයි20න් පෙරට

බටහිර ඉන්දීය කොදෙව් පිල සමඟ පැවැති විස්සයි20 තරගාවලියේදී පන්දුවෙන් දස්කම් දැක්වූ ශ්‍රී ලංකා දඟ පන්දු යවන ක්‍රීඩක ලක්ෂාන් සඳකැන් ජගත් විස්සයි20 න්දු යවන්නන් ශ්‍රේණිගත කිරීම්වල 10 වැනි ස්ථානය අත් කර ගැනීමට සමත්ව තිබේ.

මේ සමඟ එම තරගාවලියේ දී තුන් ඉරියව් දස්කම් දැක්වූ වනිඳු හසරංග ද ශ්‍රේණිගත කිරීම්හී 11 වැනි ස්ථානය දක්වා ඉදිරියට පැමිණීම විශේෂත්වයකි.

සඳකැන් තරග දෙකකදී ලකුණු 39කට කඩුලු 6ක් බිඳ දැමීමට සමත් වූ අතර, තරග 3ම ක්‍රීඩා කළ හසරංග ලකුණු 8ක් බිඳ දැම්මේ ලකුණු 42ක් පමණක් දෙමිනි.

29 හැවිරිදි සඳකැන් ප්‍රසාද ලකුණු 639ක් ලබා සිටින අතර, 23 හැවිරිදි හසරංගට ප්‍රසාද ලකුණු 623ක් හිමිව තිබේ. මේ ස්ථාන ඔවුන් දෙදෙනාම අයිසීසී විස්සයි20 ශ්‍රේණිගත කිරීම්හී අත් කර ගත් ඉහළම ස්ථානයන්ය.

## අන්තර් සමාජ විස්සයි20 ක්‍රිකට්

# ලසිත් අබේරත්න තනිවම සීසීසී පිල ගොඩ දමයි

## මලින්දගෙන් විශිෂ්ට පන්දු යැවීමක්

**නිරෝෂාන් ප්‍රියංකර**

මලින්ද පුෂ්පකුමාරගේ විශිෂ්ට පන්දු යැවීම සහ ලසිත් අබේරත්න රැස් කළ සටන්කාමී අර්ධ ශතකය හේතුවෙන් අන්තර් සමාජ විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ 6 වැනි දිනය යටතේ ඊයේ එස්එස්සී ක්‍රීඩාංගණයේ පැවැති තරගයෙන් කැන්ඩි කස්ටම් පිලට එරෙහිව කඩුලු 4ක ජයක් අත් කර ගත් සීසීසී ක්‍රීඩා සමාජය 'ඒ' කාණ්ඩයේ අපරාජිතව පෙරමුණ ගැනීමට සමත් විය. සීසීසී පිල මෙවර තරගාවලියේ සහභාගි වූ සිව්වැනි තරගය මෙය විය.

පළමුව පන්දුවට පහරදීමේ අවස්ථාව කැන්ඩි පිලට දුන් සීසීසී පිල ලකුණු 91කට ඉනිම සීමා කළ අතර, එම ඉලක්කය කඩුලු 6ක් දැවී තිබියදී සපුරා ගත්තේ පන්දු 27ක් ද ඉතිරිව තිබියදීය.

පන්දු 35කදී හතරේ පහර 9ක් සමඟ ලසිත් අබේරත්න ලකුණු 53ක් රැස් කරමින් සීසීසී පිල ජයග්‍රහණය කරා ගෙන ගියේය. කෙසේ වෙතත් සීසීසී පිලේ වෙනත් කිසිදු ක්‍රීඩකයකුට ලකුණු 10 සීමාව පසු කිරීමට නොහැකි වීමද කැපී පෙනෙන සිදු වීමක් විය. පන්දු යැවීමේදී සචිත්‍ර පෙරේරා සහ ලසිත විජේසුන්දර කඩුලු 3 බැගින් බිඳ දැමූහ.


මලින්ද පුෂ්පකුමාර


ලසිත් අබේරත්න

විශ්ව විජේරත්න ලකුණු 36ක් රැස් කරමින් පළමුව පන්දුවට පහර දුන් කැන්ඩි ඉනිමේ වැඩිම ලකුණු ලාභියා වෙද්දී අකීල් ඉන්හාම් ලකුණු 13ක් සහ සහන් වීරසිංහ ලකුණු 16ක් ඉනිමට එක් කළහ. කැන්ඩි අවසන් කඩුලු 6 ලකුණු 23ක් තුළ බිඳ දැමීමට සීසීසී පන්දු යවන්නෝ සමත් වූහ.

විශිෂ්ට පන්දු යැවීමක නිරත වූ මලින්ද පුෂ්පකුමාර කඩුලු 4ක් දවා ගැනීමට සමත් වූ අතර, ඕවර 4ක් යැවූ ඔහු කැන්ඩි පිලට රැස් කිරීමට දුන්නේ ලකුණු 9ක් පමණි. ඔහුට අනගි සහායක් දුන් ළහිරු මධුශංඛ කඩුලු 3ක් බිඳ දැම්මේය.

මේ අතර, ඊයේ පෙරවරුවේ පැවැති සෙසු තරගවලදී ජයග්‍රහණ අත් කර ගැනීමට කෝල්ට්ස්, හලාවත සහ යුද හමුදා ක්‍රීඩා සමාජ සමත් වූහ. එම කණ්ඩායම් හමුවේ පිළිවෙළින් බ්ලූම්ෆීල්ඩ්, පොලීසිය සහ සෙබස්තියනයිට්ස් කණ්ඩායම් පරාජයට පත් වූහ.

මේ තරග වලදී ධනංජය ලක්ෂාන් (කෝල්ට්ස්), තික්ෂිල ද සිල්වා (හලාවත), සමීන් කඳනආරච්චි (සෙබස්තියනයිට්ස්) සමඟ අසේල ගුණරත්න සහ හිමාෂ ලියනගේ (යුද) අර්ධ ශතක රැස් කිරීමට සමත් වූහ.

පුලින තරංග (හලාවත), මලිත් ද සිල්වා (පොලීසිය) සහ සාරංග රාජගුරු (කෝල්ට්ස්) කඩුලු 3 බැගින් බිඳ දමමින් පන්දුවෙන් දස්කම් දැක් වූහ.

ඊයේ පස්වරුවේ බීආර්සී - නුගේගොඩ (එස්එස්සී) සහ සැරසන්ස් - නාවික හමුදා (කටුනායක) තරග පැවැත්වීමට නියමිතව තිබූ අතර, අයහපත් කාලගුණ හේතුවෙන් එම තරග අත්හැර දැමිණි.

බීආර්සී පිල සමඟ තරගයේදී නුගේගොඩ පිල ඕවර 19කට කඩුලු 8ක් දැවී ලකුණු 164ක් රැස් කර තිබූ අතර, නාවික හමුදා පිලට එරෙහිව සැරසන්ස් පිල ඕවර 19කදී කඩුලු 7කට ලකුණු 132ක් රැස් කර තිබිණි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන මේ තරගාවලියේ 7 වැනි දිනය යටතේ අද (11) තරග 4ක් පැවැත්වීමට නියමිතය. 'ඒ' කාණ්ඩයේ බදුරලි - බීආර්සී පෙවරුවේත්, මීගමුව - ගාල්ල ක්‍රිකට් සමාජය පස්වරුවේත් පී සරා ඕවල් පිටියේ දී තරග වදින අතර, පානදුර - ටැමිල් යුනියන් (පෙ.ව.) සහ නාවික හමුදාව - සෙබස්තියනයිට්ස් (ප.ව) එන්සීසී ක්‍රීඩාංගණයේදී 'ඩී' කාණ්ඩයෙන් තරග වැදීමට නියමිතය. 'සී' සහ 'බී' කාණ්ඩවලට අද විවේක දිනයකි.

## ඔලිම්පික් උලෙළට විදෙස් ක්‍රීඩාලෝලීන් නෑ

මෙවර ඔලිම්පික් ක්‍රීඩා උලෙළ සහ පැරාලිම්පික් ක්‍රීඩා උලෙළ නැරඹීමේ අවස්ථාව විදෙස් ක්‍රීඩාලෝලීන්ට ලබා නොදීමට ජපාන රජය තීරණය කර ඇත. කොවිඩ් වසංගතයේ ව්‍යාප්තිය වළක්වා ගැනීමේ අරමුණ මත මේ තීරණයට එළැඹ ඇතැයි වාර්තා වේ.




# පීටර්සන්ට පතාන් පරදී


කෙවින් පීටර්සන්

මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සංවිධාන කරන රෝඩ් සේෆ්ටි වර්ල්ඩ් සීරිස් තරගාවලියේදී කෙවින් පීටර්සන්ගේ සුපිරි පිතිහරඹය හේතුවෙන් සත්කාරක ඉන්දීය ලෙජන්ඩ්ස් පිල පරදවා ලකුණු 6ක තියුණු ජයක් අත් කර ගැනීමට එංගලන්ත ලෙජන්ඩ්ස් කණ්ඩායම සමත් විය.

මේ තරගයෙන් පරාජය වුවද ඉන්දියාව ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණේ පසුවන අතර, තරග දෙකම ජය ගනිමින් එංගලන්තය තෙවැනි ස්ථානයේ පසු වෙයි.

එහි දෙවැනි ස්ථානය ශ්‍රී ලංකාවට හිමිව ඇති අතර, ඊයේ (10) රාත්‍රියේ පැවැත්වීමට නියමිතව තිබූ බංග්ලාදේශ සමඟ තරගයේ ප්‍රතිඵලයෙන් එම ස්ථාන වෙනසක් සිදු වීමට ඉඩ තිබිණි.

රායිපූර්හිදී පැවැත්වෙන තරගාවලියේ 9 වැනි තරගය වූ මෙහිදී එංගලන්ත ලෙජන්ඩ්ස් ක්‍රීඩකයන් ලකුණු 188ක් රැස් කළ අතර, එම ඉලක්කය හඹා ගිය ඉන්දියාවට ඕවර 20 අවසානයේ කඩුලු 7ක් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 182ක් පමණි.

ලකුණු 56කට කඩුලු 5ක් දැවී තිබියදී පිටයට පිවිසි ඉර්ෆාන් පතාන් ඉන්දීය පිල ජයග්‍රහණය කරා ගෙන යෑමට උත්සාහ කළ ද එය අසාර්ථක විය. නොදැවී ලකුණු 61ක් රැස් කළ ඔහු හතරේ පහර 4කින් සහ හයේ පහර 5කින් ඉනිම වර්ණවත් කර ගත් අතර, වැය කළේ පන්දු 34ක් පමණි. පතාන්ට අනගි සහායක් දුන් මන්ප්‍රීට් ගෝනි පන්දු 16කදී නොදැවී ලකුණු 35ක් රැස් කළේය. දෙදෙනා අතර 8 වැනි කඩුල්ලට ලකුණු 63ක සබඳතාවක් ගොඩනැගුණේ පන්දු 27කිනි. කෙසේ වෙතත් මුල් කඩුලු අඩු ලකුණු සංඛ්‍යාවක් තුළ අහිමි වීමෙන් ඉන්දියාවට පරාජය අත් විය.

විරේන්ද්‍ර ෂෙවාග් ලකුණු 6කට හා නායක සචින් තෙන්ඩුල්කාර් ලකුණු 9කට දැවී යෑමත් සමඟ ඉන්දීය පිලට මුල් කඩුලු 3 ලකුණු 17ක් තුළ අහිමි විය. පන්දු යැවීමේදී මොන්ටි පැනේසා කඩුලු 3ක් සහ ජේම්ස් ට්‍රෙඩ්වෙල් කඩුලු 2ක් බිඳ දැම්මේය.

පළමුව පන්දුවට පහර දුන් එංගලන්තයට වේගවත් ආරම්භයක් දීමට නායක කෙවින් පීටර්සන් සමත් වූයේ පන්දු 37කින් ලකුණු 75ක් රැස් කරමිනි. හතරේ පහර 6කින් සහ හයේ පහර 5කින් ඉනිම වර්ණවත් කර ගත් ඔහු දෙවැනි කඩුල්ලට ඩැරන් මැඩ් සමඟ එක්ව ලකුණු 82ක සබඳතාවක් ගොඩනැගුවේ පන්දු 53කිනි. මැඩ් ලකුණු 29කට දැවී ගිය අතර, පන්දු යැවීමේදී යූසුප් පතාන් කඩුලු 3ක් සහ ඉර්ෆාන් පතාන් සහ මුනාෆ් පටෙල් කඩුලු 2 බැගින් දවා ගත්හ. තරගයේ වීරයා සම්මාන පීටර්සන්ට හිමි විය.

මේ තරගාවලිය යටතේ අද (11) එංගලන්ත ලෙජන්ඩ්ස් ක්‍රීඩකයෝ දකුණු අප්‍රිකානු ලෙජන්ඩ්ස් පිල සමඟින් තරග වැදීමට නියමිතව තිබිණි.

## විලියම්සන්ට විවේකයක්




නවසීලන්ත පිලේ නායක කේන් විලියම්සන්ට සංචාරක බංග්ලාදේශ පිලට එරෙහිව මේ මස 20 වැනිදා ආරම්භ වන එක්දින තරගාවලියෙන් ඉවත් වීමට සිදුව තිබේ. පසුගිය වසරේ අවසන් භාගයේදී මස් පිඩු ඉරීමකට ලක් වූ ඔහුගේ වම් උරහිසෙහි තත්ත්වය සුව අතට හැරෙනතුරු විවේක ගැන්වීමට තීරණය වී ඇත.

එම තත්ත්වය තිබියදීම ඔහු ක්‍රීඩා කළ අතර, මෙතෙක් සුව අතට හැරී නොතිබීම නිසා විලියම්සන් විවේක ගැන්වීමට සිදු වූ බව නවසීලන්ත කණ්ඩායමේ වෛද්‍ය ඩේල් ෂැක්ල් තහවුරු කර තිබේ.

## ද. අප්‍රිකාවට අලුත් කප්පිත්තෝ දෙදෙනෙක්

දකුණු අප්‍රිකාවේ සීමිත ඕවර සහ ටෙස්ට් කණ්ඩායම් සඳහා නව නායකයන් දෙදෙනකු පත් කිරීමට දකුණු අප්‍රිකානු ක්‍රිකට් ආයතනය කටයුතු කරයි. ඒ මෙතෙක් නායකයා ලෙස කටයුතු කළ ක්වෙන්ටන් ඩි කොක් වෙනුවටය. ඒ අනුව ටෙස්ට් කණ්ඩායම මෙහෙයවීමේ වගකීම ඩීන් එල්ගාර්ට පැවරී ඇති අතර, එක්දින සහ විස්සයි20 තරගවල නායකත්වය හිමිව ඇත්තේ ටෙම්බා බවුමාටය. බවුමා ටෙස්ට් කණ්ඩායමේ උප නායකයා ලෙස ද කටයුතු කරනු ඇත.

එල්ගාර් ඉදිරි ලෝක ටෙස්ට් ශූරතාවලිය තෙක් කණ්ඩායමේ නායකයා ලෙස කටයුතු කිරීමට නියමිත අතර, බවුමා විසින් මේ වසරේ සහ ලබන වසරේ පැවැත්වෙන විස්සයි20 ලෝක කුසලාන ද්විත්වයේදී සහ 2023 එක්දින ලෝක කුසලානය තෙක් කණ්ඩායමේ නායකයා ලෙස කටයුතු කරනු ඇත. එල්ගාර් මින් පෙර ටෙස්ට් තරග 2කදී දකුණු අප්‍රිකානු පිල මෙහෙයවා තිබේ.

# අවසන් ගමන් යන ඇත් රජු ‘රේවත’

කලා වැවේ මෙන්ම බළලු වැවේ දශක පහකට ආසන්න කාලයක් ආඩම්බරකාරයකු ලෙසත් අහිංසක සතකු ලෙසත් මනමාලයකු ලෙසත් මෙරට සහ විදේශ රටවල ද බොහෝ දෙනාගේ ආදරයට පාත්‍ර වී සිටි "රේවත" නමැති ඇත් රජු විදුලි සැර වැදීමෙන් මිය ගිය පුවත බොහෝ දෙනාට වේදනා ගෙන දෙන්නක් වී තිබිණි.

රේවතට විදුලි සැර වැදී මිය ගිය පුවත ප්‍රචාරය වීමත් සමඟ සමාජ මාධ්‍ය හරහා බොහෝ දෙනා ලබාගත් ඡායාරූප වීඩියෝ දර්ශන විශාල වශයෙන් සැරි සරන්නට විය. යළි කිසිදු භවයක මෙවන් අකල් මරණයක් නොවේවායි යන්න බොහෝ දෙනා ප්‍රාර්ථනා කර තිබුණි. වනාන්තරයෙන් එළියට එන රේවතගේ ඡායාරූප ගැනීමට මෙරට වනජීවී ඡායාරූප ශිල්පීන් ද විශාල වශයෙන් උනන්දුවක් දක්වා තිබීමද විශේෂත්වයකි.

කැකිරාව, මහ කැකිරාව, අලියා වැටුණු වැව ප්‍රදේශයට පසුගියදා රේවත ඇතුළු අලි කණ්ඩායම ගමන් කොට ඇත්තේ අස්වැන්න අවසන් වූ බඩ ඉරිඟු හේනක ආහාර ගැනීම සඳහාය. අස්වනු අවසන් වූ තැන විදුලිය ඇද ඇති බවක් රේවත හෝ එහි ගිය කිසිදු සද්දන්තයකු නොදන්නට ඇත. එහෙත් සිදු වූයේ අනවසරෙන් ඇද තිබූ විදුලි රැහැනට රේවත ජීවිතය බිලි වීම ය.

කලා වැවේ මෙන්ම බළලු වැව ගල්කිරියාගම රක්ෂිතය කහල්ල රක්ෂිතය රේවතගේ නිජබිම විය. අවුරුදු හතළිස් පහක් පනහක් පමණ කාලයක් ජීවත් වූ රේවත ඉතා හැඩි දැඩි ඇතෙකි. රේවත නිතර නිතර රංචු පිටින් කෑම සොයා යෑමට ඇල්මක් දක්වන ඇතෙකි. එපමණක් නොව රේවත කුඩා අලි පැටවුන් සමඟ සෙල්ලම් කිරීමට දැඩි ඇල්මක් දැක්වූ ඇතෙකු වීමද ඡායාරූප ශිල්පීන්ට මෙන්ම රේවත දෙස බලා ඉන්න අයගේ දෑස් පිනවන තවත් දසුනකි.

රේවතට අමතරව කලා වැව බළලු වැව ඉස්මත්තේ තවත් ඇතුන් දහයක් පහළවක් පමණ දෙනා සිටිති. මේ සෑම ඇතකුට ම විවිධාකාර නම් තබා ඇත. කලාවැව ඉස්මත්තේ ජීවිතයෙන් සමුගත් ඇත්තු කිහිප දෙනෙක්ද වෙති. ඒ අතර වළගම්බා හා නීල 2 ගල්ගමුවේ සිට කලා වැවට නිතර පැමිණෙන දළපුට්ටුවා ද දීගජන්තු ඇතාද වෙයි

ඊට අමතරව අතුරුදන් වු රෝසා හා හක්කි ගැනද කතා පුවත් පවතී. නීල දෙක ඇතා තවත් ඇතෙකු සමඟ ඇති වූ ගැටුමකින් මියගිය අතර නිල කලා වැවේ නායකයා ලෙස හඳුනාගෙන තිබිණි. පසුව මිය යෑමත් සමඟ කලා බළලු වැවේ අලි 350 කට පමණ නායකත්වය දෙන්නට ඉදිරිපත්ව සිටියේ රේවත වීමද විශේෂත්වයකි .

මේ ඇතාගේ විශේෂත්වය පිළිබඳ අදහස් දැක්වූ තමන්ගේ නම හෙළි කිරීමට අකමැති වූ කලා වැවේ නිතර වන අලින් සමඟ ගැවසෙන සියලු දෙනා බොහෝ දෙනෙකු හඳුනන වනජීවී දෙපාර්තමේන්තුවට සම්බන්ධ රැකියාවක් කරන මිතුරෙක් අප සමඟ මෙසේ පැවසීය.

"කලා වැවේ ඇත්තු පන්තිය තමයි ලංකාවේ ලස්සනම ඇත්තු ටික. ඒ අතරෙන් වළගම්බා, දීඝජන්තු එක දෙක, ඇසළ, රේවත වගේම මංගල ,දසමහ, දසමහ 2 මෙන්න අලුත්ම ඇත් පැටවා වෙන්නේ සඳරු ."

"මේ හැමෝගෙම කලා වැවේ හිටියා හැබැයි රේවත පුදුමාකාර ලස්සනක් තියෙන්නේ රේවත කැලේ ඉඳලා එළියට එනකොට කබර කන් දෙකත් එක්ක හරිම ලස්සනයි තේජවන්ත මහත සමඟ කොට දළ දෙකක් රේවතට තිබුණා. ඒ නිසා තමයි අනිත් අලින්ට වැඩිය ලස්සන. මෙයා නොදන්න කෙනෙක් නැහැ. බොහෝ දෙනෙක් පින්තූර අරන් තියෙනවා. ඒ ආසන්නයට ගිහිල්ලා වීඩියෝ කරලා තියෙනවා. හැබැයි කරදරයක් කරන්නේ නැහැ. ඒවගේම තමයි එළියට ගිහිල්ලා වගාබිමක් වත් වනසල කියලා ආරංචියක් අපිට නැහැ. එයා පොඩි පැටව් එක්ක තමයි සෙල්ලම් කරන්න කැමති. ඒ වගේම තමන්ගේ වර්ගයා බෝ කරන්නත් හරිම දක්ෂයි.

බොහෝ දෙනෙක් රේවත ආරක්ෂා කළා. අපි දන්න මැති ඇමැතිවරු පවා රේවත බලන්න එනවා. රේවත ගේ ඉරියව් බලන්න දින ගණන් හෝටල් වල නැවතිලා මිනිස්සු ඉන්නවා. කලා වැවේ සුන්දරම ඇතා තමයි රේවත."

සමාජ මාධ්‍ය ඔස්සේ රේවතට ජීවත්ව සිටියදීත් ලැබුණේ ඉහළ ප්‍රතිචාරයක්. මියගිය පසු එය දෙගුණ තෙගුණ වී රේවතගේ ඡායාරූප ඕනෑ තරම් සමාජ මාධ්‍ය හැසිරෙන්නට වූයේ රේවත ට එතරම් ජනතා ප්‍රසාදයක් ඇති බැවිනි.

**කාංචන කුමාර ආරියදාස**





## දියගම වත ගොත

සදා ඓතිහාසිකත්වය වලදමන හා වැළලී යන කළුතර දිස්ත්‍රික්කයේ දියගම නැමැති මනරම්ගම්පියස පිළිබඳව වගකිව යුත්තන්ගේ නෙතකණ විවර වේවා යන පැතුමෙන් අනාගත පරපුර තමන් ජීවත්වන ගම්පියස දෙස හැරී බැලිය යුතුය.

මෙකී ග්‍රාමය තුළ පෘතුගීසීන් විසින් පිහිටුවාගෙන තිබූ ප්‍රධාන කඳවුර වීදිය බණ්ඩාර ඇතුළු සේනාව විසින් සටන් කර දිනූ ගම පසුකාලීනව දියගම ලෙස දෙවියන් උදෙසා පූජා පැවැත්වීම නිසා දිවියගම දියගම වූවා යැයි ද මතයක් තිබේ. ගම්පියස කළු ගඟ, ළිග්ගල් ඇල හා පෘතුගීසී ලන්දේසි කාලයේ කොළඹ ප්‍රදේශයට ගමන් පහසුකම් සලසා ගැනීමට කපන ලද කැප්පු ඇල යන ජල මාර්ගයන්ගෙන් වටව අංක 713 යටතේ තනි ග්‍රාම නිලධාරී වසමක්ව පැවතුණ ද ජනගහන වර්ධන හේතුවෙන් දැනට අංක713 ඒ දොඩම්මුල්ල වශයෙන් ග්‍රාම නිලධාරී වසම් දෙකකට බෙදා වෙන් කොට ඇත. කළුතර දිස්ත්‍රික්කයේ ඓතිහාසිකත්වය පිළිබඳ කථිකාවක් කරන විටෙක දී මේ ගම්පියස මඟහැර කතා කළ නොහැක. ඊට හේතුව බුදුදහම ලක්දිවට වැඩම වූ මිහිඳු සම්ඳුන්ගේ පියා වන ධර්මාශෝක රාජ යුගයෙන් පැවැති බ්‍රාහ්මීය අක්ෂරයන්ගෙන් යුත් සෙල්ලිපිය මේ ගම්පියසට අයත් පැණුගල් තොටේ ගලක සටහන් කර තිබේ. මේ පිළිබඳ අප පැරැණියන් නිර්මාණය කළ සීපදයක් වූයේ,

දියගමත් තිබුණි හොඳ හොඳ වැඩ කරලා
ගොඩ ගලෙත් තිබුණි නාගර කොටලා
ගොඩවෙලෙත් තිබුණි මා වී පැසීලා
ඒවා කරපු අය දැන් ඇත මැරීලා

යනුවෙන් රාත්‍රියේ දී ඔරු පාරු පැදියන්ගේ ගායන නාදයේ මතකයයි. මෙහි සඳහන් ගොඩවෙලයන පහත් බිම් කොටස ද ගම්මානයට අයිති වූවකි. කළුතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික දියගම පිළිබඳ වත ගොත- 2 - මෙතෙක් පුරාවිද්වතකුගේ අවධානය යොමු නොවූ, ඓතිහාසිකත්වය ඉස්මතුවීමට ඉඩනො දී වැළලී යන පූජාගල පිහිටා ඇත්තේ ගම්පියස මධ්‍යයේය. අලියා කන්ද නැමැති භූමියට ඇතුළත් වන වර්ෂ 1550 ත් 1560 ත් කාලවකවානුවේ පෘතුගීසීන් විසින් සිරකරුවකු ලෙස රඳවා සිටි වීදියබණ්ඩාර කුමරු ඔවුන්ගේ අත්අඩංගුවෙන් පලා විත් බොල්ගොඩ ඔස්සේ පැමිණ තිබේ.

ඒ දියගමට යාබද භූමියක් වන අශ්වයන් ගාල් කිරීම නිසා දැනටමත් තේප්පුව නමින් හඳුන්වන භූමියේ ය. අශ්වයන් ගාල් කර එය ආසන්නව කැප්පු ඇළෙන් මෙගොඩට ඇතුන් ගොඩනැංවීම කළ නිසා දැනටත් ඇත්තලගොඩ නමින් හඳුන්වන ස්ථානයක් තිබේ. ඇතුන් ගොඩනංවාගෙන විත් ගාල් කිරීම නිසා අලියාකන්ද නමින්ද එය හඳුන්වයි. මෙම භූමියට ආසන්න උඩහපිටියේ අලියාකන්ද පාමුල පොදු සුසාන භූමියක් පිහිටා ඇත. පෘතුගීසීන් විසින් එකළ ඔවුන්ගේ ආගමික කටයුතු සඳහා ඉදිකර තිබූ පල්ලියට සහ කඳවුරට පහර දී විනාශ කිරීමේ දී ඔවුන් පැර දී දුවන්න පටන්ගත් ගම් සීමාව අදටත් පරදුව නම්වේ. විනාශ කර දමන ලද පල්ලිය තිබූ එම භූමිය පල්ලියවත්ත නමින් ද ජල පහසුකම් ලබාගත් ඇළ පල්ලි ඇළ ලෙසින්ද තවමත් හඳුන්වන

ලබන අතර තම සේනාවට කළුලපවන් රෝගයක් වැළඳීමට පටන් ගත් ස්ථානය කලපුගම විය හැක.

යටවර සහ උඩුවර යනුවෙන් හඳුන්වනු ලබන ග්‍රාමයන්හි යටිවර සහ උඩිවර ලෙසින් ආරක්ෂක මුරකාවල් රැකවල්කොට අඟුරුවාතොට තොටුපළ විනාශ කිරීමෙන් පසු සාම ගිවිසුමක් ඇතිකරගත් පෘතුගීසී න්නැවතත් දියගම තම අණසකට පත්කර ගැනිණ. වේලාපුර කළුතර අගනුවරක් කරගත් වික්‍රමපාණ්ඩව රජ කාල වකවානුවේ ඉන්දීය වඩිගයන් දියගමට පැමිණ රැඳී සිටි භූමිය අදටත් වඩිගවත්ත නමින් හඳුන්වනු ලබන භූමිය විය හැකිය. මුහුදු මට්ටමද සලකුණු වූ දියගම ගොවි, නැකති, කුඹල්, වෙල්ලවාල කුලවලින් යුක්තව අඩු නිවාස සංඛ්‍යාවකින්, සුළු ජනගහනයකින් යුතු විය.

ගමට මුදුන්මල්කඩක් බඳු වූ දියගම ශ්‍රී සුධර්මාකර පුරාණ විහාරයේ ඉන්ද්‍රරතන, ගිරිමානන්ද, ධීරානන්ද යන මහා යතීවරයාණන් වහන්සේලා වැඩ සිටිය දී පන්සලට යාබද වටිනා බිම් කොටස තුළ විහාර ගෙයක් තනවා උග්ගල්බඩ මල් අස්න රජමහා විහාරයට පවරාදීමත් ගමේ දියුණුව වෙනුවෙන් කිසිදු කටයුත්තක් නොකර දියගම සුසාන භූමිය පල්ලියවත්තට යාබඳව විශාල වලව්වක් මෙන් නිවසක් තනාගෙන තමන්ගේ බලතල අනුව නිවසේම ඉඩම් ලේඛනගත කොට තිබේ.

රජයට අයත් අලියාකන්ද භූමියේ ආදි සිරිපා වන්දනාකරුවන්ට ගිමන් හැරීමට සාදා තිබූ පුරාණ අම්බලම කඩාබිඳ සමතලා කොට කඩකාමර දෙකක් හා බේකරියක් ඉදිකිරීම, එවක සිදු වී තිබේ. ආපදාවකට ලක් නොවන පහසුකම් සපුරාගත හැකි ග්‍රාම සේවා වසම් දෙක මධ්‍යයේ පිහිටා ඇති රජය සතු අක්කර 22 ක පමණ බිමෙන් ආපදා කළමනාකරණ හා ප්‍රජා සේවා කටයුතු සඳහා බිම් කොටසක් ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්, දිසා ලේකම්, ප්‍රාදේශීය සභාව, කළුතර දිස්ත්‍රික් සංවර්ධන සහ බලවතුන් දැනුවත් කොට තිබේ. මේ භූමිය දැනට අත්පත් කරගෙන හා කර ගැනීමට උත්සාහ දරන්නන්ගේ මුදල් හා හිතවත්කම් බලවත්කම් ඉල්ලීම යටපත් වන්නට ඇත.

**දියගම පී.පී ජිනරතන**

# රජ ගෙදරටත් සෙත සලසන උණවේරුවේ සේසතේ කතාව





රොහාන් මහතා



නන්දාවතී මිය



රම්‍යලතා මිය



සේසත්ගම පිවිසුම



අනුර මහතා සහ ඔහුගේ පුතු



වැඩමුළුවට සහභාගී වූ පිරිස

සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පන්සියයක් භික්ෂූන් වහන්සේ සමඟ ලක්දිවට වැඩම කරවාගෙන පැමිණි අවස්ථාවේ දහඅට කුලයකට අයත් කලා-කරුවන්ද මෙහි පැමිණි බව ජනප්‍රවාදයේ සඳහන් ය. බෝධීන් වහන්සේට සෙවණ සැලසීම සඳහා අව් අත්තක් අල්ලාගෙන පැමිණි කුල කණ්ඩායමට පැවරුණු වගකීම වූයේ සෑම වසරකම මාල හතක් සහිත අව් අත්තක් නොඑසේ නම් සේසතක් ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කිරීමය. එම පූජාව මහත් වූ බැතියෙන් ඉෂ්ට සිද්ධ කළා වූ කුල පරම්පරාවනට අයත් ශාස්ත්‍රය මැනවින් ප්‍රගුණ කළ පිරිස අද මාතලේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උණවේරුව ගම්මානට පමණක් ශේෂ වී සිටිති.

මාතලේ අලුවිහාරය පසුකර මඳ දුරක් ගොස්, වමට හැරී කිලෝමීටර පහක පමණ දුරක් ගිය පසු හමුවන උණවේරුව ගම්මානය තාමත් ගැමි සුවඳ අපුරුවට වහනය වන ගම්මානයකි. හරිත වර්ණයෙන් ඔපවත් වූ ගම්මානය පුරා දක්නට ලැබෙන්නේ සරුසාර කෙත් වතුය. නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ පාරම්පරික සේසත් කලාව පවත්වාගෙන යන ගම්වැසියන් අතරින් බහුතරය ගොවියෝය. සැමියා කුඹුරට ගිය පසු දරු මල්ලන් සමඟ නිවෙසේ තනිව සේසත් නිර්මාණය කරන කාන්තාවෝ එමඟින් උත්සාහ කරනුයේ තම පවුලට අමතර ආදායමක් එකතු කිරීමටය.

සේසත් පසු පස ඇති කතාව සේසත් තරම් ලස්සන නැත. නෙක රටාවන්ගෙන් හැඩ ගැන්වුණු සේස-තක් නිර්මාණය කිරීමට අවශ්‍යය අමුද්‍රව්‍ය අතර මූලික වන්නේ තලාතු මිනිරන්ය. පොතු මිනිරන් ලෙසින්ද හඳුන්වන මේවා සොයා ගැනීම අසීරු වීම නිසා නිර්මාණකරුවන්ට අද ඒවා මිලට ගැනීමට සිදුව තිබෙන්නේ පෙර ගෙවූ මිලට වඩා තුන් හතර ගුණයක මුදලක් වැය කරමිනි. මාතලේ ඇළහැර තලාගොඩ ප්‍රදේශයෙන් මේ මිණිරන් බහුලව ලැබුණත් එම නිධි සියල්ල මොරගහකන්ද ජලාශය ඉදිකිරීමේදී ජල-යෙන් යට වූ බව සේසත් නිර්මාණකරුවෝ පවසති. මොරගහකන්දට මේ සම්පත යටවන්නට පෙර මිනි-රන් ගොඩගමු යැයි ගම්මුන් පැවසුවත් ඔවුන්ගේ හඬ මොරගහන්ද ජල කඳට යටවෙන්නට හැර බලධාරීහු ඇස්කන් පියා ගත්හ. එහි ප්‍රතිඵලය වූයේ අද මාතලේ පුරා විශාල තලාතු මිනිරන් හිඟයක් ඇති වීමය.

දිනමුතු වල්ලියාගේ සිට මේ කර්මාන්තය පැවත එන බව උණවේරුව ගම්වැසියෝ පවසති. ඔහුගේ ගෝලයකු වූ තෙනා ගුරුන්නාන්සේ අව් අතු නොඑසේ නම් සේසත් නිර්මාණයේ කෙළ පැමිණි-යෙකි. ඔහුගෙන් ශිල්ප උගත් ලොකු කිරියා උණවේ-රුව ගම්මානයට ශිල්පය නිර්ලෝභිව දායාද කළේය. ගම්වැසියන් පවසන ආකාරයට එයද අපූරු කතාවකි. තෙනා ගුරුන්නාන්සේ සේසත් නිර්මාණය කිරීමේ කලාව හැමෝටම කියා නොදුන්නේය. ඔහු සේසත් නිමවා තිබෙන්නේ කිසිවෙකුගේ හෝ ඇස නොගැ-ටෙනසේය. තෙනා ගුරුන්නාන්සේගේ උදව්වට ගිය ලොකු කිරියා නිදා සිටිනවා සේ ඔහුට හඟවමින් තම ගුරු සේසත් නිර්මාණය කරන ආකාරය බලාගෙන සිටියේය. මෙලෙස දිගු කළක් තිස්සේ හොර රහසේ බලා ඉඳ සේසත් නිර්මාණය උගෙන ගත් ඔහු තෙනා ගුරුන්ගේ අභාවයෙන් පසු මේ කලාව උණවේරුවේ ජනතාවට කියා දුන්නේ පුහුණු වැඩමුළුද පවත්වමිනි. මංගල මෙන්ම අවමංගල උත්සව වලදී ද ප්‍රයෝජන-යට ගන්නා සේසත සෞභාග්‍යයේ සංකේතයක් ලෙසද සැලකේ. වෙහෙර විහාරස්ථාන වල සේසත් බහුලව දක්නට ලැබෙන අතර පෙරහර ආදී මංගල්‍යයන් වලදී ඒවා පෙරමුණෙන් රැගෙන යාම ආනාදිමත් කාලයක පටන් පැවැත එන චාරිත්‍රයකි. පැරණි වලව් වලද සේසත් දක්නට ලැබෙන අතර ප්‍රෞඪත්වය හා අධි-කාරීත්වය පෙන්නුම් කිරීමට ඔවුහු ඒවා භාවිත කළහ. මේ ආකාරයෙන් සියවස් ගණනාවක් නොනැසී පරපුරෙන් පරපුරට පැවැත ආ මේ මහා කලාව අද ලෝකයේම සුරැකිව තිබෙන්නේ උණවේ-රුව ගම්මානයේ ය. පවුල් 150ක් පමණ ජීවත් වන මේ ගම්මානයේ ඉන් අඩකට ආසන්න පිරිසක් ජීවිකාව ගෙන යන්නේ මේ කර්මාන්තයෙනි.

සිව් සාළිස් වසරක් සේසත් නිර්මාණයේ යෙද-මින් දෙවරක්ම මෙරට විශිෂ්ටතම සේසත් නිර්මාණ ශිල්පියා ලෙස ජාතික ශිල්ප සභාවේ ස්වර්ණ සම්මාන ලත් සවන්දිරක්කාර ගෙදර අනුර මහතා උණවේරුව සේසත් නිර්මාණකරුවෝ වත්මනේ මුහුණ දී සිටින ගැටලු මෙසේ විස්තර කළේය. “අද අපට තිබෙන ලොකුම ප්‍රශ්නය සේසත් නිර්මාණයට අවශ්‍යය තලාතු මිනිරන් සොයා ගැනීමට නොහැකි වීමයි. මොරග-හකන්ද හැදෙන්න කලින් අපිට ඕන තරම් මිනිරන් ලැබුණා. කිලෝව රුපියල් 50.00ට 60.00ට ගත්තේ. මිනිරන් තිබුණ තැන් ඔක්කොම වතුරට යට වුණා. අපි කිව්වා ජලාශයට වතුර පුරවන්න කලින් මේවා ගොඩගමු කියලා. කවුරුවත් ඒකට ඇහුම්කන් දුන්නේ නැහැ. දැන් ඉල්ලුමට අවශ්‍යය මිනිරන් නැති නිසා කළුකඩ මුදලට තමයි ඒවා ගන්න වෙලා තියෙන්නේ. කිලෝව රුපියල් තුන් හාරසීයක් වෙනවා. ආණ්ඩුවේ රක්ෂිත වල මිනිරන් තියෙනවා. ඒවා ගන්න විදි-හක් නැහැ. කොවිඩ් වසංගතයත් එක්ක තත්ත්වය තවත් දරුණු වුණා. රටේ පෙරහර උත්සව එහෙම පිටින්ම ඇන හිටපු නිසා සේසත් ඉස්සර වගේ අලෙවි වෙන්නේ නැහැ. විදේශිකයෝ එන්නේ නැති එකත් ලොකු ප්‍රශ්නයක්. සේසත හා මිට ගොඩක් වෙලාවට දෙන්නෙක් නිර්මාණය කරන්නේ. අඩි හතක උසින් යුත් සේසත් මිට සපු ලීයෙන් හදා ගන්නේ. ලක්ෂා වලින් ඒකට හැඩදාලා නිම කරන්න ඕන. හපුවිද ගමේ තමයි පාරම්පරික ලාක්ෂා කර්මාන්තකරුවෝ ඉන්නේ. මම මේ දෙකම කරනවා. මගේ පුතා බුද්ධික බාලසූරිය හා දුව කාංචනා මධුෂානි මේ කර්මාන්තය දැන් කර-නවා. පුතා 2018 වසරේදී සේසතක් නිර්මාණය කරලා මම වගේම ජාතික ශිල්ප සභාවේ ස්වර්ණ සම්මානය දිනා ගත්තා. ජනාධිපති මන්දිරයේ තිබෙන්නෙත් මම හදපු සේසත් දෙකක්. මේ පාරම්පරික කලා ශිල්පීන්ට විශ්‍රාම වැටුපක් ලැබෙන වැඩපිළිවෙළක් හදන්න කියලා අපි හැම රජයකින්ම ඉල්ලුවා. ඒ වෙනුවට රක්ෂණ ක්‍රමයක් තමයි දෙන්න ගියේ. ඒකට අපි සල්ලි ගෙවන්න ඕන. ඒකට සල්ලි ගෙවන්න හැමෝම අකමැති වුණා. අන්තිමට ඒ වැඩපිළිවෙළ අසාර්ථක වුණා. අපේ රටේ පාරම්පරික කලාකරුවන් රැක ගන්න නිසි වැඩපිළිවෙළක් නැහැ. කර්මාන්තය ආරක්ෂා වෙන්නේ ශිල්පීන් ආරක්ෂා වුණොත් විතරයි”.

උණවේරුවේ සේසත් කර්මාන්තයේ නිරතව සිටින බහුතරය කාන්තාවෝය. පවුල ආර්ථික බරින් මිරි-කෙද්දී පිරිමි මොකක් හෝ රැකියාවක නිතරව එදා-වේල සරිකර ගන්නට යොමුවද්දී කාන්තාවෝ නෙක රටා මවමින් සේසත් නිර්මාණයේ යෙදෙති. සේසතක් නිර්මාණය කිරීමට අවශ්‍යය වන්නේ පරිසරයෙන් සොයා ගන්නා තල ගොබ, කොකෝ පට්ටා, තලාතු මිනිරන් වැනි අමුද්‍රව්‍යන්ය. අතීතයේ සේසත් නිර්මා-ණය වී තිබුණේ කළු, සුදු වගේ වර්ණ වලිනි. තැඹිලි, රතු හා කහ යන වර්ණ වලින් වුවත් අදවන විට නෙක වර්ණ වලින් එය හැඩ ගැන්වෙයි. සාම්ප්‍රදායික සේස-තක විශ්කම්භය අඟල් 28 කි. එසේ වුවත් ප්‍රදර්ශන සඳහා අඟල් 32,38 හා 40 ප්‍රමාණයේ සේසත්ද නිර්මා-ණය කරන බව ගම්වැසියෝ පවසති.

“සේසත් එක එක ප්‍රමාණයකින් හැදෙන නිසා ඒවාට වැයවන මුදල එකිනෙකට වෙනස්. සාමාන්‍ය සේසත් ජෝඩුවක් රුපියල් 7000.00ක් විතර වෙනවා. මිටත් එක්ක රුපියල් 10000.00ක වගේ මුදල-කට තමයි සේසත් ජෝඩුවක් විකුණන්නේ. විසි තිස් දහස් ගණන් වන ඒවත් තියෙනවා. මිනිරන් කිලෝ දෙකක් විතර එක සේසතට ඕන වෙනවා. තලගොඩ ඉරලා තම්බ ගන්න ඕනෑ. ඒ කරලා කොළේ සුදුපාට වෙනකල් තද අව්වේ වේළ ගන්නවා. ඊට පස්සේ තමයි ඩයි කරන්නේ. පවනේ වේළලා කොළේ ඉරා ගන්නවා. ඒවගෙන් තමයි පටි ගොතන්නේ. සේසත හරිම ලස්සනයි. ඒ වුණාට ඒකේ තියෙන අපේ කඳුළු කාටවත් පේන්නේ නැහැ. අපි පුදුම මහන්සියක් ගන්නේ සේසතක් හදන්න. දින දහයක් විතර මහන්සි වෙනවා. ඒ මහන්සියට හරියන මුදලක් ලැබෙන්නේ නැහැ. සේසත් හදලා එළියේ තියන්න බැහැ. පුස් කනවා. හුළං වදින්නේ නැති වෙන්න අල්මාරියේ දාලා තියන්න ඕනෑ. මේ දවස්වල සේසත් විකුණගන්න බැරි නිසා මාසෙකට එකක් විතර හදන්නේ. ඉස්සර මාසෙට තුන හතර හදනවා. ඕඩර් ආවම පිටින් අරනුත් දෙනවා. මම 2019 අවුරුද්දේ මධ්‍යම පළාත් කාර්මාන්ත ආමාත්‍යාංශය පවත්වපු නිර්මාණ තරඟයෙන් ජයග්‍රහණය කළා. දැන් කර්මා-න්තයක් විදිහට මේක කරන්න අමාරුයි”. රාජ්‍ය අනු-ග්‍රහය මේකට ලැබෙන්න ඕනෑ.ලක්සලට බඩු දැම්මම මාස ගණන් ඉන්න ඕන සල්ලි ගන්න. ඒක අද කාලේ හැටියට අමාරුයි. කේ.ඩී.ජී රම්‍යලතා පැවසුවාය.

උණවේරුව ගම්වැසියන්ගේ නිර්මාණ ජනතාව අතරට ගෙන යෑම පිණිස ප්‍රදර්ශනාගාරයක් ඉදි-කර දීම ක්‍රිසලිස් (Chrysalis) ආයතනය මඟින් සිදුකෙරෙමින් පවතින අතර ඒ සඳහා පර්චස් 15 ක ඉඩමක් නොමිලේ ලබාදී තිබෙන්නේ ගම්වැසියෙකු වන කේ.ඩී.ජී ආරියසේන මහතාය. ඔහු රම්‍යලතාගේ පියාය. ඇති හැකි අය නොවූවද ගම්වැසියන්ගේ යහ-පත වෙනුවෙන් තම වටිනා ඉඩම් කොටස ලබා දීමට ඉදිරිපත් වූ ආරියසේන මෙසේ ප්‍රකාශ කළේය. “මට ලොකු ඉඩකඩම් නැහැ. ගෙදර කොටස අතහැරලා උණවේරුව පාර අයිනේ ඉඩම් කෑල්ල මම මේ ප්‍රදර්ශ-නාගාරය හදන්න දෙන්නම් කිව්වා. අපේ ගමේ අයගේ නිෂ්පාදන එක තැනක දැක බලාගන්න තියෙනවා නම් හොඳයි. කොවිඩ් එන්න කලින් විදේශිකයෝ ඉදහිට ගමට එනවා. දැන්නම් කවුරුවත්ම එන්නේ නැහැ. මේක තව ටික කාලයක් තියේවි.විදේශිකයෝ එන්න ගත්තම අපේ ගමේ හොඳ ප්‍රදර්ශනාගාරයක් හැදිලා තිබුණොත් ඒක අපි හැමෝටම හොඳයි”. හෙතෙම පැවසුවේය.

“ලොකු කිරියා මහත්තයා තමයි මේ ගමට මේ ශිල්පය දුන්නේ. දැන් ගමේ 70% ක් විතර ගොවිතැ-නත් එක්ක මේක කරනවා. සේසත්ම හදලා ජීවත්වන පිරිසකුත් ඉන්නවා. ලාක්ෂා කර්මාන්තය තිබෙන්නේ හපුවිද ගමේ. එතනින් උණවේරුවට මේ කර්මාන්තය ගෙනාවෙත් ලොකු කිරියා ගුරුන්නාන්සේ. හපුවිද පාරම්පරික ලක්ෂා කර්මාන්තයේ නිරත වික්‍රමරත්න මහත්තයා තවත් එක්කෙනෙක් එක්ක ඇවිත් අවුරුදු දෙකක් ලාක්ෂා පුහුණු කළා. ඒක සංවිධානය කළේ කුඩා කර්මාන්තයෙන්. ඉගෙන ගන්නවට දවසකට රුපියල් 2.50 පඩියකුත් දුන්නා. මේක පටන් ගත්තේ 1974 වගේ. මම සම්බන්ධ වුණේ 76 දී. මම ලාක්ෂා කර්මාන්තය පටන් ගත්තේ 83 විතර. සේසත් හදන්න ගත්තේ 88 වගේ. අපි 1997 ජාතික ශිල්ප සභාවෙන් සමිතියක් පිහිටුවා ගත්තා. මම ලේකම් විදිහට 2019 වෙනකල් හිටියා. 2001 දී කර්මාන්ත අමාත්‍යාංශයෙන් සේසත් මඩු 18 ක් දුන්නා. ඊට පස්සේ ශිල්ප සභාවෙන් කුටි 15 ක් දුන්නා. කර්මාන්ත අමාත්‍යාංශය, සංස්කෘ-තික අමාත්‍යාංශය, ජාතික ශිල්ප සභාව මගින් කොළ තම්බන්න, ඩයි කරන්න තඹ මුට්ටු දුන්නා. යතුගාන මැෂින් වගේම මේස දුන්නා. ඇස් කණ්ණාඩිත් දුන්නා. උණවේරුවට එන පාලම හැදුවේ ජනාධිපති මහින්ද මහත්තයාගේ කාලේ.කර්මාන්ත ගම්මානය නිසා එතුමා ගමට පාලමක් දුන්නා”. දිමුතු ශිල්ප සංවර්ධන සමිතියේ ලේකම් ජී.ජී නන්දාවතී මහත්මිය කීවාය.

මෙම වැඩපිළිවෙළ සම්බන්ධව අදහස් දැක්වූ ක්‍රිස-ලිස් ආයතනයේ රොෂාන් ප්‍රසන්න මහතා මෙසේ කීවේය. “පාරම්පරික කර්මාන්ත ආරක්ෂා කරන්න නම් අපි අනිවාර්යයෙන්ම නිර්මාණකරුවන් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ සඳහා ඔවුන්ට අවශ්‍යය පහසු-කම් ලබාදීම වැදගත්. පවතින ආර්ථික වටපිටාව තුළ පාරම්පරික කර්මාන්තකරුවන් මේ ක්ෂේත්‍රයේ රඳවා ගන්න නම් ඔවුන්ට මූලිකව හොඳ ආදාය-මක් අතට ලැබිය යුතුයි. මේ වන විටත් පාරම්පරික සේසත් නිර්මාණකරුවන් රැසක් වෙනත් රැකියාවලට යොමුව තිබෙනවා. සම්ප්‍රදායික සේසතට අමතරව කුඩා ප්‍රමාණයේ සේසත් නිර්මාණය කරන්න අපි මේ අයට යෝජනා කළා. ඊට අමතරව සේසත් වලට යොදා ගන්නා රටා උපයෝගි කරගෙන බෑග් වගේ දේවල් හදන්න උත්සහ කළා. පවතින වෙළෙඳ පොළ ජයගන්න නම් සම්ප්‍රදාය රැකගෙන නව වෙළෙඳ-පොළ අවස්ථා ලබා ගැනීමට ඉවහල් වන නිර්මාණ කළ යුතුයි. නවීන තාක්ෂණය හඳුන්වාදීමත් විදේශි-කයින්ගේ අවධානය ගමට ලබාදීමත් අපේ අරමුණයි. කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂා නොකර ප්‍රදර්ශනාගාර-යක් ගොඩනගලා අවශ්‍යය නව පුහුණුව ලබා දෙන්න අප කටයුතු කර තිබෙනවා”.

මෙරට පාරම්පරික කර්මාන්ත රැසක් ක්‍රමයෙන් අභාවයට යමින් තිබෙන්නේ එම කර්මාන්ත වල නියැලීම මඟින් ආර්ථිකය සරිකර ගැනීමට තරම් ආදායමක් එම පවුල් වලට නොලැබීම නිසාය. සේසත් කර්මාන්තයටද අද අත්ව තිබෙන්නේ මේ ඉරණ-මයි. එම කර්මාන්තයේ දශක දෙක තුනක් නියැළෙ-මින් සිටින පිරිස හැරෙන්නට තරුණ පරපුර අද එම කර්මාන්තයෙන් ඈත්ව වෙනත් රැකියා වලට යොමු වෙමින් සිටිති. සසමිත් තෙරණිය සිරිමා බෝ හාමු-දුරුවන් ලක්දිවට වැඩම කළ දා පටන් පැවැත එන මේ උතුම් කලාව මතු පරපුර වෙත රැක ගැනීමට නම් රාජ්‍ය අනුග්‍රහය එයට ලැබිය යුතුමය.

**අසේල කුරුළුවංශ**
**ඡායාරූප - රුවන් මීගම්මන**

ජනාධිපති මන්දිරයේ තිබෙන්නෙත් මම හදපු සේසත් දෙකක්. මේ පාරම්පරික කලා ශිල්පීන්ට විශ්‍රාම වැටුපක් ලැබෙන වැඩපිළිවෙළක් හදන්න කියලා අපි හැම රජයකින්ම ඉල්ලුවා. ඒ වෙනුවට රක්ෂණ ක්‍රමයක් තමයි දෙන්න ගියේ. ඒකට අපි සල්ලි ගෙවන්න ඕන. ඒකට සල්ලි ගෙවන්න හැමෝම අකමැති වුණා. අන්තිමට ඒ වැඩපිළිවෙළ අසාර්ථක වුණා. අපේ රටේ පාරම්පරික කලාකරුවන් රැක ගන්න නිසි වැඩපිළිවෙළක් නැහැ.



සේසත් නිර්මාණය කරන අයුරු

# දිනමිණ දිසත
දස අත ම එක තැන



සැමියයි බිරියයි කසිප්පු පෙරලා
පිටුව 17



නැගෙනහිර කොළඹට එන්නත්
පිටුව 18



චීන වරායේ තෙල් ටැංකි 4ක යකඩ කපලා
පිටුව 16

අරණායක ප්‍රදීප් කුමාර ධර්මරත්න

# දිප්පිටියේ සභාව ඇතුළේ බාර් එකක්

රාජකාරි කාලය තුළ මත්පැන් පානය කොට නිලධාරීන්ට පරුෂ වචනයෙන් බැණ වැදීම ඇතුළු කරුණු කිහිපයක් මත අරණායක ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සේවකයන් 06 දෙනකු හා රියැදුරන් දෙදෙනකු උස්සාපිටිය උප කාර්යාලය වෙත මාරු කර යැවීමට අරණායක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කටයුතු කර ඇති බව ඊයේ (10) පැවැති මාසික සභා රැස්වීමේදී ආනාවරණය විය.

අරණායක ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම සභාපති නිහාල් සෙනෙවිරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (10) පෙරවරුවේ දිප්පිටිය ප්‍රධාන කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

දිප්පිටිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සෞඛ්‍ය කම්කරුවන් සඳහා ඇති විවේකාගාර තුළ මත්පැන් පානය කරන බවද එසේ මත්පැන් පානය කළ ඇතැම් සේවකයන් සභාවේ නිලධාරීන්ට අසභ්‍ය වචනයෙන් පවා බැණ වදින බවද මත්පැන් පානය කළ ඇතැම් අය සභා කාර්යාල පරිශ්‍රය තුළ පවා විනය විරෝධි ලෙස හැසිරෙමින් කටයුතු කරන කරුණු ආනාවරණය විය. එසේ මාරු කොට යවා ඇති සෞඛ්‍ය සේවකයන් 06 දෙනකු හා රියැදුරන් දෙදෙනා රාජකාරි කාලය තුළ සභා පරිශ්‍රයේදී හා ඉන් පිටතදී මත්පැන් පානය කරමින් කටයුතු කරන බවත් ඇතැම් අවස්ථාවල මත්පැන් පානය කොට සභාවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයට තුළට පැමිණ ඇතැම් නිලධාරීන්ට අසභ්‍ය වචනයෙන් බැණ වදින බවද ඔවුන්ට විරුද්ධව එල්ල වී ඇති චෝදනා වේ.

එහිදී අදහස් දැක්වූ පොදු ජන පෙරමුණේ මන්ත්‍රී දිනේෂ් ගුණරත්න මහතා ප්‍රකාශ කර සිටියේ දිප්පිටිය ප්‍රධාන කාර්යාලයේ සේවයට යොදා ඇති සෞඛ්‍ය කම්කරුවන් හා රියැදුරන් උස්සාපිටිය උප කාර්යාලය වෙත මාරු කර යැවීම පිටුපස දේශපාලන ක්‍රියා මාර්ගයක් ඇති බවයි.

සී. ගමගේ - සොරණාතොට සමූහ

# බදුල්ලේ ඓතිහාසික වැල් බෝධිය හිටි හැටියේ ඉදිරී වැටෙයි



බදුල්ල නගරයේ ඉන්ධන පිරවුම්හල අසල පිහිටි ඓතිහාසික විශාල වැල්බෝධිය ඊයේ (10) පස්වරුවේ මුළුමනින්ම ගැලවී කඩා වැටීමෙන් ඊට යට වීමෙන් යතුරුපැදියක්, මෝටර් රථ දෙකකට, ලොරියකට, ත්‍රිරෝද රථයකට දැඩි ලෙස අලාභහානි වී එක් පුද්ගලයකු බරපතළ තුවාල ලබා බදුල්ල මහ රෝහලට ඇතුළත් කළ බව බදුල්ල පොලීසිය පවසයි.

පැවති වර්ෂාවත් සමඟ එක් වරම මෙම විශාල වැල්බෝධිය කඩා වැටීමෙන් මාර්ගයේ රථවාහන ධාවනය ඇනහිට තිබූ අතර නගරයේ විදුලි රැහැන් පද්ධතිය කඩා වැටීමෙන් නගරයේ විදුලි බලයද ඇනහිට තිබිණ. මෙහි තිබූ බුද්ධ ප්‍රතිමා වහන්සේට අලාභහානි වී නොමැත.



## මහ ශිව රාත්‍රියට පෙර..

යාපනයේ පේදුරුතුඩුව කන්නට්ටි කාලි අම්මාන් කෝවිලේ වාර්ෂික ආශිර්වාද පූජා මංගල්‍යය පෙරේදා (09) සවස උත්සවාකාරයෙන් පැවැත්වුණු අයුරැයි මේ. 6

ඡායාරූපය- රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

මිහිර විජේසේකර - මාරවිල සමූහ

# පරවියන් බෙදා ගන්න බැරුව ගහගෙන අයෙක් මරුට

පුත්තලම පොලිස් වසමට අයත් කඩයාකුලම් ප්‍රදේශයේදී දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමකින් එක් අයකු මරණයට පත්ව තිදෙනකු තුවාල ලබා පුත්තලම මූලික රෝහලට ඇතුළත් කර තිබේ.

ඉකුත්දා (09) රාත්‍රියේ මෙම ගැටුම ඇති වී තිබේ.

මෙම ගැටුමෙන් මරණයට පත්ව ඇත්තේ මොහොමඩ් අස්වාන් නමැති පුත්තලම මුල්ලිපුරම් ප්‍රදේශයේ පදිංචි 35 හැවිරිදි තිදරු පියෙකිය. පරවියන් සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පැවති ආරවුලක් ගැටුමට හේතුවයි.

බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# කුඹුරට ගිය තරුණියගේ පොඩි ඇඟිල්ල පොළගෙක් කාලා

සිය මවගේ කුඹුරු අස්වැන්න නෙළීමට උපකාර කිරීමට පැමිණි දියණියකට කුඹුරේ සැඟවී සිටි විසකුරු පොළගකු දෂ්ට කර තිබේ.

පසුව ඇය අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව පෙරේදා (09) ජීවිතක්ෂයට පත්වී තිබේ. මරණකාරිය අකුරණ ප්‍රදේශයේ පදිංචි 32 හැවිරිදි විවාහක තිදරු මවක් වන අතර ඇය කහටගස්දිලිය, ඊතල්වැටුණුවැව, මහපොතාන ප්‍රදේශයේ පිහිටි සිය මවගේ නිවෙසට මීට දින තුනකට පමණ ඉහතදී පැමිණ ඇති බව අනුරාධපුර නාගරික හදිසි මරණ පරීක්ෂක ජේ.එම්. ජයතිලක මහතා හමුවේ පැවති හදිසි මරණ පරීක්ෂණයේදී අනාවරණය විය.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

# පඩු කරඳ ගහ වෙන තැනක හිටවන්න කිව්වාහම මාව මරණවා කිව්වා



කෘඩියා ශාකය රුපියල් ලක්ෂ 20කටත් අඩු මුදලකින් සංරක්ෂණය කළ හැකියි. මන් මේ ගස ඉවත් කිරීමට ඉදිරිපත් වුණාම මරණ තර්ජනත් ආවා. ප්‍රවීණ උද්‍යාන අලංකරණ ශිල්පී සූරියවැව ජනක ජයලාල් පැවසීය.

ගම්පහ දාරළුව ප්‍රදේශයේ ඇති කෘඩියා සෙලනිකා (පඩු කරඳ) ගස දැනට තිබෙන ස්ථානයෙන් වෙනත් ස්ථානයකට රැගෙන ගොස් රෝපණය කර සංරක්ෂණය කිරීමේ හැකියාව හා තාක්ෂණය තිබියදීත් ඒ සඳහා රුපියල් බිලියන 04ක පමණ මුදලක් වැය කිරීමට සැලසුම් කර තිබීම ජාතික ධනය නිකරුණේ නාස්ති කිරීමක් බව ප්‍රවීණ උද්‍යාන අලංකරණ හා රූඩ් බෝල් කලා ශිල්පී සූරියවැව ජනක ජයලාල් මහතා පැවසීය.

වැඩි දුරටත් අදහස් දැක්වූ ඒ මහතා කියා සිටියේ,

'මෙම දුර්ලභ ශාකය රැක ගැනීම වෙනුවෙන් විශාල පිරිසක් ඉදිරිපත් වීම අගය කළ යුතු කරුණක්. නමුත් එය හේතුවක් කරගෙන ජාතික ධනය නිකරුණේ නාස්ති කිරීමට කටයුතු කරන්නේ නම් එය කිසිසේත් අනුමත කළ නොහැකියි.'

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# ණය ගෙවා ගන්න බැරුව තිදරු මවක් ගෙල වැලලාගෙන

අධික ණය බර ගෙවා ගැනීමට නොහැකිව සිත් තැවුලට පත්ව 42 හැවිරිදි තිදරු මවක් පෙරේදා (09) සිය නිවෙසේ ගෙල වැලලාගෙන සිය දිවි නසාගෙන ඇතැයි තඹුත්තේගම පොලීසිය පවසයි.

මෙසේ සියදිවි හානි කොට ගෙන ඇත්තේ තඹුත්තේගම රෝහල පිටුපස මාර්ගයේ පදිංචිව සිටි වසන්ති චන්ද්‍රිකා (42) නමැති තිදරු මවකි. මෙම කාන්තාවගේ සැමියා මීට වසර කිහිපයකට පෙර ඇය ගෙන් වෙන්ව වෙනත් ප්‍රදේශයක ජීවත්වන බව පොලීසිය කියයි.

කේ.ඩී. දේවප්‍රිය - කතරගම සංචාරක

# කතරගම දේවාල රැසක ශිව පූජාවන් අද

මහා ශිව රාත්‍රිය මුල් කරගෙන අද (11) කතරගම ප්‍රධාන දේවාල රැසක මහා ශිව රාත්‍රිය මුල් කරගෙන දේව පූජාවන් රැසක් පැවැත්වේ. සෙල්ල කතරගම පුරාණ ගණ දේවාලයේ අද රාත්‍රී සිට හෙට (12) පහන් වනතෙක් ශිව දෙවියන්ට සහ ගණ දෙවියන් විෂයේ හී පූජාවන් රැසක් සිදු කිරීමට නියමිතය.

මෙයට අමතරව සෙල්ල කතරගම පුරාණ වල්ලිමතා ගල්ලෙන් විහාරස්ථානයේ ද අද (11) රාත්‍රී සිට විශේෂ පූජාවන් හෙට (12) පහන් වන තෙක් පැවැත්වෙන බව වල්ලිමතා පුරාණ ගල්ලෙන් විහාරයේ විහාරාධිපති ආචාර්ය කුරුකුදෝගම ජිනානන්ද හිමියන් සඳහන් කරන ලදී.

මෙයට අමතරව කතරගම පූජා භූමියේ පිහිටි ශිව කෝවිලේ ද අද (11) රාත්‍රී සිට විශේෂ හේම පූජාවන් ඇතුළු ශිව පූජාවන් පැයෙන් පැය සිදු කිරීමට නියමිතයි.

# ක්ෂුද්‍ර මූල්‍ය ණය අහෝසි කරනු !



ඡායාරූපය -මින්නේරිය සුසිල් කරුණාතිලක

මිහිර විජේසේකර-මාරවිල සමූහ

# චීනවරායේ තෙල් ටැංකි හතරක බඳ කොටස් යකඩවලට කපන් ගිහින්



ත්‍රිකුණාමලය, චිනවරායේ පිහිටි තෙල් ටැංකි සංකර්ණය පිළිබඳව මේ දිනවල වැඩියෙන් කථාබහට ලක්වෙද්දී ඉන් ටැංකි කිහිපයක් යකඩ හොරු විසින් කපාගෙන ගොස් තිබේ.අඟල් දෙකක ඝණකම් තහඩු වලින් තිබු යකඩ හොරු ගෑස් කටර් භාවිතා කර ටැංකි හතරක බඳ කොටස් කපාගෙන විශාල හානියක් කර තිබේ. යටත් විජිත සමයේ බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රිලංකාව යටත් කරගෙන සිටි සමයේ මෙම තෙල්ටැංකි ඉදිකර තිබුණි.ටැංකි ගණන අංකනය කිරිමේදි ටැංකි 101ක් ඇති මුත් අංක 99 මගහැර අංක කර තිබේ. අංක ගත කිරිමේදි 98 වැනි ටැංකියෙන් පසුව 100 නම් කර ඇත්තේ 99 අංකය මගහැරවිම විශේෂත්වයකි.

බ්‍රිත්‍යාන යටත් විජිත සමයේ බ්‍රිත්‍යාන ඉංජිනේරුවන් සිය උපරිම තාක්ෂණය භාවිතා කර 1924දි ඉදිකිරිම් ආරම්භ කර 1930දි ඉදිකිරිම් අවසන් කර ඇති බව වාර්තා වේ. අක්කර 850ක භූමියක් තුළ ඉහළ හා පහළ වශයෙන් කොටස් දෙකකට ත්‍රිකුණාමලය වරායට මුහුණලා මෙම ටැංකි ඉදිකර තිබීම විශේෂත්වයකි. බ්‍රිතාන් අධිරාජ්‍යවාදින් සතුරු රටවලට ප්‍රහාර එල්ල කිරිමේදි යුද නැව් නවතා තැබීමට ත්‍රිකුණාමලය වරාය භාවිතා කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය ඉන්දන තොග ලබාගැනීම හා බෙදාහැරීම සඳහා මෙම ටැංකි ඉදි කරන්නට ඇතැයි සැලකේ.ත්‍රිකුණාමල වරාය යුදමය අතින් වැදගත් ස්ථානයක් ගන්නා අතර යුද නෞකා සඟවා තැබීමට මෙම වරාය භාවිතා කර තිබේ.ත්‍රිකුණාමලය වරායට නෞකාවලින් රැගෙන එන ඉන්දන නෞකා වරායේ සිට නළ පද්ධති මඟින් පොම්පාගාර දෙකක් හරහා ටැංකිවලට ඉන්දන ගබඩා කිරිමට කටයුතු කර තිබේ. මෙම පොම්පාගාර ඉදිකර බ්‍රිතාන්‍ය සමාගම මේ වනවිට වසා දමා තිබුණද පොම්පාගාර තවමත් ක්‍රියාකාරි මට්ටමමේ පැවැතීම විශේෂත්වයකි.මෙම ටැංකියක ධාරිතාව ගත් කල්හි අඩි 45ක උසකින් යුක්ත වන අතර වට අඩි 350කින් සමන්විත වේ. එකවරකට ගබඩා කර හැකි ඉන්දනවල බර මෙට්‍රික් ටොන් 12,000කි.දැනට ඛණිජතෙල් නීතිගත සංස්ථාව සතුව ඇති ටැංකිවල ධාරිතාවයට වඩා කිහිප ගුණයකින් මෙම ටැංකිවල ධාරිතාව වැඩිය. දැනට මෙම ටැංකි ලංකා ඉන්දීය තෙල් සමාගම භාරයේ ඇති අතර පහළ කොටසේ ඇති ටැංකි15ක් පමණක් ලංකා ඉන්දීය තෙල් සමාගම පරිහරණය කරයි.ඉතිරි ටැංකි කැලයට ගොස් ඇති අතර ඉන් ටැංකි කිහිපයක් යකඩ හොරු විසින් කපාගෙන ගොස් තිබේ.අඟල් දෙකක ඝණකම් තහඩුවලින් තිබු ටැංකි හතරක බඳ කොටස් කපාගෙන විශාල හානියක් කර තිබේ.ටැංකි කැලයෙන් වැසි යෑම මෙම ව්‍යසනයට මුල්විය. චිනවරාය පොලීසිය අවස්ථා කිහිපයකදි සැකකරුවන් අත්අඩංගුවට ගෙන නඩු පවරා ඇති අවස්ථාද තිබේ. බ්‍රිතාන්‍ය යටතේ විජිත සමයේ මෙම ටැංකිවල ඩීසල්, පෙට්‍රල්, ගුවන්යානා ඉන්දන ගබඩා කර තිබ් ඇති බව කියයි.1942 පැවති දෙවැනි ලෝක යුද්ධයේදි 1942 අප්‍රේල් 09 දා ජපානය ත්‍රිකුණාමලය වරායට බෝම්බ හෙලද්දි බ්‍රිතාන්‍ය හමුදාව වරායේ සවිකර තිබු ගුවන්යානා නාශක අවියකින් එල්ල කළ ප්‍රහාරයකින් සතුරු ගුවන් යානයක් අංක 91 ටැංකිය මතට කඩා වැටි දින හතක් බුර බුරා ගිනි ගෙන පැවති ටැංකියේ යකඩ තහඩු උණු වී ගිය අයුරු දැනටත් දැකගත හැකිවේ.මීට අමතරව රාජකීය ගුවන් හමුදාවේ යානයක් ටැංකියක් මතට කඩාවැටී විනාශ වී ඇති අතර එම ටැංකියේ පාදම පමණක් ඉතිරිව තිබේ. යකඩ හොරුන්ගෙන් හානි නොවන්නට හා ගුවන් අනතුරුවලින් හානි වු ටැංකි හැර සෙසු ටැංකි අලුත්වැඩියාවකින් පසු ප්‍රයෝජනයට ගත හැකි පරිදි තවමත් මෙම ටැංකි චීනවරායේ විරාජමානව පවති.

ඩබ්ලිව්. විදානපතිරණ ඇඹිලිපිටිය සංචාරක

## කොලොන්නේ අතුරු මාර්ග හතරකට කාපට්

සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන යටතේ දිවයින පුරා මාර්ග කි.මී. 100000ක් කඩිනමින් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතියට අදාළව මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතාගේ මඟපෙන්වීම මත නිවිතිගල ආසනයේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර මහතාගේ යෝජනාවට සහ ඉල්ලීමට අනුව කොළොන්න ආසනයේ අතුරු මාර්ග 04ක් රුපියල් බිලියන 244ක වියදමින් කාපට් යොදා සංවර්ධනය කිරිමේ වැඩසටහන ඉකුත්දා ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රිවරයාගේ දියණිය වු සෙනාලි ජයසේකර මෙනවිය විසින් ආරම්භ කරන ලදි.

මේ යටතේ ලැදියාගල හරහා රංචමඩම පාර, කොළඹගෙආර, කරමැටිආර ලයිට් පාර, ඇඹිලිපිටිය අක්කර 500 පාලම අසළ සිට වරාකැටියආර පාර සහ වීරසිංහපුර ඉහළ මුදුන් පාර සංවර්ධනය කෙරේ. මේ අවස්ථාවට මහා සංඝරත්නය, ප්‍රමුඛ ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රිවරයාගේ පෞද්ගලික ලේකම් ජයසුන්දර, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති සුරන්ත වීරසිංහ ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුද, ප්‍රාදේශීය දේශපාලන ක්‍රියාකාරීන් ද ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

ඩබ්ලර්.සී.ප්‍රනාන්දු මුන්නේශ්වරම සමූහ

## හලාවත රෝහලට යන-එන කතුන්ගේ රන්මාල කැඩූ කුඩු හොරා දැලේ

හලාවත දිස්ත්‍රික් මහ රෝහල තුළදී හා නගරයේ ගමන් ගන්නා කාන්තාවන්ගේ රන් දම්වැල් කඩා ගෙන පලා යෑමේ ජාවාරමක් පවත්වාගෙන ගිය කොල්ලකරුවකු මුගුණුවටවන යෝධ ඇළ ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගත් බව හලාවත කොට්ඨාස නොවිසඳුණු අපරාධ නඩු මෙහෙයුම් ඒකකය කියයි. සැකකරු 23 වැනි වියේ පසුවන අතර ඔහු යෝධ ඇළ ප්‍රදේශයේම පදිංචිකරුවෙකි.

හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබන රෝගින්ගේ දුක සැප විමසීමට පැමිණෙන කාන්තාවන් පසු පස යමින් ඔවුන් තනිවන අවස්ථාවක් බලා ඔවුන්ගේ කරේ ඇති රන් දම්වැල් කඩා ගෙන පලා යෑමට සැකකරු දක්ෂයෙකි. හෙතෙම මේ අයුරින් අවස්ථා හතරකදී රන්මාල කඩාගෙන පලා-ගොස් තිබේ.

හලාවත මහ රෝහල අසල වෙළෙඳසලකට ගොස් බිස්කට් පැකට් එකක් මිලදී ගැනීමේ මුවාවෙන් එහි සිටි කාන්තාවගේ කර පැළඳ සිටි රන් මාලය මොහු විසින් කඩා ගෙන ගිය බවත් එම අවස්ථාවේ දී එම කාන්තාවගේ කෑගැසීම ඇසී සැකකරු අල්ලා ගැනීමට උත්සහ කළ අසල සිටි පස් දෙනෙකුටද සැකකරු පහරදී පලා ගොස් තිබේ.සැකකරු කරාටේ ක්‍රිඩකයකු වන අතර ඔහු කළු පටි ශූරයෙකේ බවට තොරතුරු ලද බවත් කියයි.සැකකරු කොල්ලකෑ රන්මාල විකුණා එම මුදලින් අධික ලෙස හෙරෝයින් මත්කුඩු උරා ඇති බවත් පොලීසිය කියයි. ඔහු විසින් කොල්ල කා ඇති පවුමක බරැති රන්මාලයක් ද සොයා ගෙන ඇති අතර ඔහු විසින් විටින් විට කොල්ල කෑ රන් මාල සොයා පරීක්ෂණයක් ආරම්භ කර ඇත.

හලාවත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් රෝහණ ගමගේ, සහකාර පොලිස් අධිකාරි විජේවර්ධන යන මහත්වරුන්ගේ උපදෙස් මත නොවිසඳුණු අපරාධ නඩු මෙහෙයුම් ඒකකයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක විමල්, උප පොලිස් පරීක්ෂක චන්දන, සැරයන් දිසානායක 41346 කොස්තාපල් ගාමිණි 57870 නුවන් 87136 යන මහත්වරුන් මෙම වැටලීම සිදු කර තිබේ.

ඩබ්ලිව් රෝහණ බුලත්කොහුපිටිය සමූහ

## දැරණියගල මාලිබොඩ වතු සේවකයන්ට නව මහල් නිවාස ව්‍යාපෘතියක්



වතුකරයේ ලැයිම් කාමරවල ජීවත් වන අසරණ පවුල් වෙනුවෙන් නොමිලේ නිවාස ලබාදීමේ වැඩසටහන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි දැරණියගල, මාලිබොඩ තේ වතු යායෙන් පසුගියදා ආරම්භ කෙරිණි. නාගරික සංවර්ධන වෙරළ සංරක්ෂණ අපද්‍රව්‍ය බැහැරලීම සහ පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා, සමාගම් වතු ප්‍රතිසංස්කරණ තේ වතු ආශ්‍රිත බෝග වගා තේ කර්මාන්තශාලා නවීකරණය හා තේ අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය කනක හේරත් යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම වතු නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඇරැඹිණි. බොගවන්තලාව වැවිලි සමාගමට අයත් ඉඩමක මේ නව නිවාස ඒකක ඉදිවේ. මෙම නව නිවාස මහල් දෙකකින් සමන්විත වේ. නිවෙසකට නිවෙසක් දුරස්ව මුහුණලා සිටින ආකාරයට ඉදිවන මෙම නිවාස ඒකකයකට නිවාස අටක් ඇතුළත් වේ. එක් නිවෙසක වර්ග අඩි ප්‍රමාණය 550කි. ඉදි කෙරෙන සෑම නිවෙසක් සඳහාම ජලය, විදුලිය, සහ සනීපාරක්ෂක පහසුකම්වලින් යුක්ත වන අතර එක් නිවෙසකට කාමර දෙකක්, මුළුතැන්ගෙයක් සහ විසිත්ත කාමරයක් ඇතුළත්ය.

මෙම නිවාස ව්‍යාපෘතිය වසරක කාලයක් තුළ අවසන් කිරීමට අපේක්ෂිතය. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 510ක් වැයවේ.

මාතලේ දිස්ත්‍රික් සමූහ

## මාතලේ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවල නුපුහුණු සේවකයන්

මාතලේ දිස්ත්‍රික්කයෙහි පවත්වාගන යනු ලබන පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයන්හි සේවයෙහි යොදවා ඇති බහුතරයක් සේවක සේවිකාවන් නුපුහුණු ශ්‍රමිකයන් වීම නිසා මෙම ස්ථාන වෙත රෝග පරීක්ෂාවන් සඳහා පැමිණෙන රෝගීන්ට මුහුණ පෑමට සිදුව ඇත්තේ මහත් වු ජීවිත අවදානමකටය. මෙම පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයන්ගෙන් වැඩි ප්‍රමාණයක් රජයේ රෝහල් වෙත අනුයුක්ත වෛද්‍යවරුන් විසින් පවත්වාගන යන බැවින් මෙම ස්ථානයන්හි රුධිරය, මූත්‍රා පරීක්ෂාව මෙන්ම ඛන්තු රේඛණ ( E.C.G)ලබාගැනීම සිදුකරන්නේද මෙම නුපුහුණු සේවක පිරිස විසිනි.මේ සම්බන්ධයෙන් රෝහල් නිලධාරින් පවසන්නේ රෝගියකුගේ රුධිර පරීක්ෂාව සඳහා අඩුම වශයෙන් රුධිරය ලබාගත යුත්තේ හෙදියන් විසින් බවයි. කිසිදු විටක රෝහලෙහි හෙදියන් හෝ වෛද්‍යවරයකු නොමැතිව වෙනත් සේවකයකුට රෝගීන්ගේ රුධිරය පරීක්ෂණ කටයුතු වෙනුවෙන් ලබාගත නොහැකි බව වෛද්‍යවරුන්ගේද මතයයි.

එස්. ලොකුකරවිට කරාපිටිය සමූහ



## ගාල්ලේ සමෘද්ධි පවුල් දෙකකට හිසට සෙවණක්

සෞභාග්‍යා නිවාස වැඩසටහන යටතේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩපාතල ග්‍රාම නිලධාරී වසමේ ඉදි කෙරුණු නිවාස දෙකක් ප්‍රතිලාභීන්ට පවරාදීම ප්‍රාදේශීය ලේකම් හිමාලි රත්නවීර මහත්මිය විසින් ලෝක කාන්තා දිනයේදී සිදු කරන ලදී. සමෘද්ධිලාභී එල්.හැරියට් මහත්මියට සහ ඒ.බී.රේණුකා මහත්මියට මෙම නව නිවාස ලබා දෙන ලදී. ගාල්ල නගරාධිපති ප්‍රියන්ත සහබන්දු මහතා, සමෘද්ධි කලමණාකරුවන්,සංවර්ධන නිලධාරීන් සහ සමෘද්ධි සමිති සාමාජිකයන් පිරිසක් ද මෙම අවස්ථාව සහභාගී වී සිටියහ.

දමන සමූහ කේ.ඒ.මෛත්‍රීපාල

## අම්පාර උහන කුමාරිගමට නිතර වන අලි කරදර





අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුමාරිගම බී කොටසේ පදිංචි තිලක් මහතාගේ නිවෙස වනඅලි විනාශ කර තිබේ. කුමාරිගම ගම්වාසීන් කියා සිටින්නේ පසුගිය කන්නයේ සිට වන අලි ප්‍රශ්නයට විසදුම් ලබා දෙන බවට බලධාරීන් පොරොන්දු වූවද මේ දක්වා විසදුම් ලැබී නැති බවයි.දැනටමත් බණ්ඩාරදූව හා තිස්සපුර ප්‍රදේශවල පුද්ගලන් දෙදෙනකුට වන අලි පහර දී එක් අයකු මියගොස් ඇති බවත් ගම්වාසීහු පැවසූහ. මෙම වන අලි ප්‍රශ්නයට අදාළ බලධාරින් අවධානය යොමු කර ඉක්මන් විසඳුමක් ලබා දීමට පියවර ගනු ඇතැයි කුමාරිගම ගම්වාසීහු බලා සිටිති.

දිනමිණ දිසත දස අත ම එක තැන

ජයසේන විජේනායක බදුල්ල දිස්ත්‍රික් සමූහ



## පල්ලේවෙල සුමනජෝතී නාහිමි ආදාහන උත්සවය අද

බදුල්ල මුතියංගණ රාජ මහා විහාරස්ථානයේ හිටපු භාරකාර ධූරන්දර ඌව වෙල්ලස්ස දෙදිසාවේ ප්‍රධාන සංඝනායක මිණිපෙ හඳගනාව 05 කණුව ශ්‍රී සඳගල් විහාරස්ථානයේ විහාරාධිපති ධර්මකීරති ශ්‍රී සුමංගල පල්ලේවෙල සුමන ජෝතී නායක මා හිමිපාණන් වහන්සේ ඉකුත්දා අපවත් වූහ. මහජන ගෞරවය සඳහා හඳගනාව සඳගල් විහාරස්ථානයේ තැන්පත් කර ඇති මා හිමි පාණන්ගේ ශ්‍රී දේහයට අවසන් ගෞරව දැක්වීම සඳහා රජයේ මැති ඇමතිවරු රාජ්‍ය නිලධාරීන් ඇතුළු මහ ජනතාව විශාල පිරිසක් පැමිණියහ. උන් වහන්සේගේ ශ්‍රී දේහය පිළිබඳ ආදාහන කටයුතු අද (11) ප.ව. 2.30 ට හඳගනාව 05 කණුව සමූපාකාර භූමියේ දී සිදු කෙරෙයි.

ලංසගේ සිරිවර්ධන පුත්තලම දිසා විශේෂ





## ආණමඩුව සාහිත්‍ය උත්සවයේ ත්‍යාග ප්‍රදානයදා..

2020 ආණමඩුව ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවයේ ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැත්විණි. මෙහිදී අත් අකුරු , ගද්‍ය පද්‍ය ගායනා සඳහා සහතිකපත් ප්‍රදානය කෙරිණි.ආණමඩුව ප්‍රාදේශිය ලේකම්වරිය ඇතුළු ආරාධිත අමුත්තන් පිරිසක් මේ අවස්ථාවට සහභාගී වූහ.

ඊ.සී.ප්‍රනාන්දු මුන්නේශ්වරම සමූහ





## ඉන්දියාවෙන් මෙරටට ගෙනා මුහුදු කූඩැල්ලෝ අල්ලයි

නීති විරෝධි ලෙසින් ඉන්දියාවේ සිට බෝට්ටු දෙකකින් මෙරටට ගෙන එන ලද රුපියල් ලක්ෂ පනහක් පමණ වටිනා මුහුදු කූඩැල්ලන් තොගයක් තලෙයිමන්නාරම වෙරළ තීරයේ දී පෙරේදා ( 9 දා ) නාවික හමුදාවේ වයඹ තම්බපන්නි කඳවුරේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් බව නාවික හමුදා මාධ්‍ය ඒකකය කියයි.එම මුහුදු කූඩැල්ලන් තොගය කිලෝ 1100ක බරකින් යුතුය.ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර මේ දිනවල සිදු කෙරෙන නීති විරෝධි ජාවාරම් මැඩ පැවැත්වීමට නාවික හමුදාව විසින් මේ දිනවල ක්‍රියාත්මක කර ඇති මෙහෙයුම් අතරතුර නාවික නිලධාරින් තලෙයිමන්නාරම වෙරළාශ්‍රිතව සිදු කෙරෙන සෝදිසි මෙහෙයුමක දී සැක කටයුතු යාත්‍රා දෙකක් නිරීක්ෂණය වී ඇති අතර පසුව එම යාත්‍රා පරීක්ෂා කළ අවස්ථාවේ දි ඒවායෙහි මෙම මුහුදු කූඩැල්ලන් ගෝනිවල අසුරා තිබිය දී සොයා ගත හැකිවු බවත් කියයි.

මෙම බෝට්ටු දෙකෙහි පුද්ගලයන් සිවු දෙනෙකු සිටි අතර ඔවුන් කල්පිටිය හා සීලාවතුර ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

# සැමියයි බිරියයි කසිප්පු පෙරලා නිදන කාමරයේ සිවිලිමේ හංගලා




තිස්සමහාරාම, මහජන හන්දියේ පිහිටි නිවෙසක නිදන කාමරයේ සිවිලිමේ සූක්ෂ්මව සඟවා කසිප්පු විකිණීමේ ජාවාරමක නිරතවූ 26 හැවිරිදි දෙදරු මවක තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් පෙරේදා (09) සවස අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ විහාර මාවත, තිස්සමහාරාම ලිපිනයේ පදිංචි 26 හැවිරිදි දෙදරු මවකි. සැකකාර කාන්තාව කලක් තිස්සේ සිය සැමියා සමඟ එක්ව මේ ජාවාරම කරගෙන ගොස් තිබේ. සැකකාරිය පිළිබඳ තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදු කළ වැටලීමකදී සැකකාරියගේ නිවෙසේ නිදන කාමරයේ සිවිලිම මත සඟවා තිබූ කසිප්පු ස්ප්‍රීතු බෝතල් 80ක් අත්අඩංගුවට ගෙන තිබේ. වැටලීම සිදු කරනා අවස්ථාව වන විට සැමියා නිවෙසේ සිට නැති අතර සැකකාර කාන්තාව පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා සැකකාරිය තිස්සමහාරාම පොලිසියට භාරදී තිබේ.

තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවීන්ද්‍ර අඹේපිටිය, තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නන්දසිරි යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි උප පොලිස් පරීක්ෂක තිලකරත්න, පොලිස් සැරයන්වරුන් වන (19894) උදයංග, (61929) ඉරේෂ්, පොලිස් කොස්තාපල්වරුන් වන (68435) චමින්ද, (82633) ලක්මාල්, (75861) දමිත්, කාන්තා පොලිස් කොස්තාපල් (8709) දිනූෂා යන නිලධාරීහු වැටලීමට එක් වූහ.



සීගිරිය විශේෂ

# යහපාලනය කාලේ මෙරට ඉඩම් මනින්න ඇමෙරිකාවට දෙන්න හදලා

පසුගිය රජය මඟින් මෙරට ඉඩම් ඇමෙරිකානු සමාගමක් සම්බන්ධ කොට මැනුම්ගත කිරීමට සහ සිතියම්ගත කිරීමට ගිය බවත් එය නවතා මේ රජය කොරියානු සමාගමක් සමඟ එම ක්‍රියාවලියම සිදු කිරීම සඳහා අවශ්‍ය පිඹුරුපත් සකසමින් සිටිනා බවටත් රජයේ මිනින්දෝරු සංගමය පෙරේදා (09) දඹුල්ලේදී විශේෂ මාධ්‍ය හමුවක් කැඳවමින් හෙළිදරව් කර සිටියේය.



රජයේ මිනින්දෝරු සංගමයේ සභාපති දුමින්ද බණ්ඩාර උඩුගොඩ මහතා කියා සිටියේ මේ තීරණය ඇතුළු යෝජනා තිස්දෙකක් මේ වන විට රජයට සහ ඉඩම් අමාත්‍යවරයාට දී ඇතත් කිසිදු ප්‍රතිචාරයක් නැති බවය. මිනින්දෝරු සංගමය දින දෙකක් නිවාඩු දමා වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ආරම්භ කොට තිබෙනා බවත් මේ සම්බන්ධයෙන් බලධාරීන් අවධානය යොමු නොකරන්නේ නම් ඉදිරියේදී රටේම මිනින්දෝරු සංගමය දැඩි ක්‍රියාමාර්ගයකට එළඹෙනා බවත් බණ්ඩාර මහතා කියා සිටියේය.

දේශීය මිනින්දෝරුවරුන්ට කිසිදු යටිතල පහසුකමක් නොදී උපරිම සේවාවක් ලබා ගැනීම සඳහා උත්සාහ කරනා බවත් එසේ උත්සාහ කළ ද සේවා තෘප්තිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය පරිසරයක් නැතිව ඉතා සූක්ෂ්ම ලෙස මෙරට මැනුම් කටයුතු කොරියානු සමාගමකට පැවරීමට උත්සාහ කරනා බව ද නිලධාරීහු චෝදනා කර සිටිති.

සී. මහගම - නුවරඑළිය සමූහ

# නුවරඑළියේ 55%කට බොන්න වතුර නෑ

ලංකාවේ වැඩිම ජලපෝෂක ප්‍රමාණයක් සහිත දිස්ත්‍රික්කය වුවද නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් 55%කට තවම පානීය ජලය ලැබෙන්නේ නැති බවත් එය රටේ වැඩිම ජනතාවකට පානීය ජලය නොලැබෙනා දිස්ත්‍රික්කය බවට මේ වන විට පත්ව ඇති බවත් ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත මහතා පැවසීය. අමාත්‍යවරයා එසේ ප්‍රකාශ කර සිටියේ පසුගියදා නුවරඑළිය නව නගර ශාලාවේ පැවති රැස්වීමකට එක් වෙමිනි. නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහ තුළ පවතිනා පානීය ජල ගැටලුවට විසඳුම් දීම සඳහා මේ ජනතා හමුව සංවිධානය කර තිබිණි.

එහිදී වැඩිදුරටත් අමාත්‍යවරයා මෙසේද කියා සිටියහ.

"පසුගිය දවසක මම තඹුත්තේගම ප්‍රදේශයේ රැස්වීමකට ගිහින් කතා කරද්දි කිවුවා හෙට නුවරඑළියට යනවා නුවරඑළියෙ ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳන්න කියලා. තඹුත්තේගම අය හිනා වුණා. එයාලා කිවුවා නුවරඑළියෙ අයට ඕනිතරම් වතුර තියෙනවා. අපිටනෙ බොන්න වතුර නැත්තේ කියලා. ඒත් ඇත්ත ඒක නෙමෙයි. නුවරඑළියෙ බහුතරයක් ජනතාවට බොන වතුර නෑ."

ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංවාරක

# සිහිසුන් වූ මන්ත්‍රීවරිය සහෝදර මන්ත්‍රීවරුන්ගේ කර මතින් රෝහලට



අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීම සභාපති පුෂ්පලාල් කුමාරසිංහ මහතාගේ හා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් පෙරේදා (09) පැවැත්වෙද්දී පෙරවරු එකොළහයි තිහට පමණ මන්ත්‍රීවරියක් හිටිහැටියේම අසනීප වී වැටෙන්නට ගොස් ඇති අතර වහාම ක්‍රියාත්මක වූ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් ඇය වැටෙන්නට නොදී අල්ලාගෙන ඔසවා පුටුවක් මත තබාගෙන ආරක්ෂිතව පඩිපෙළ මතින් පහළට රැගෙන ගොස් තිබේ. මේ දෙස කාර්යාල නිලධාරීන් මෙන්ම පැමිණ සිටි පිරිසද බලා සිටියේ මහත් විමතියෙනි. රැස්වීම්වලදී මෙන්ම දේශපාලන පිටියේ මේ පිරිස් විවිධ වචන හුවමාරුවලින් නොනැවතී ගුටිබැට හුවමාරු පවා සිදුවුවද දේශපාලන මිතුරෝ හෝ හතුරෝ නැති බව සනාථ වන හොඳම අවස්ථාවක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. ඇය විනාඩි කිහිපයක් තුළ එසේ ආරක්ෂිතව රෝහලට ගෙන ගියේ නැති නම් ජීවිතයට අනතුරක් පවා වන්නට හැකියාව තිබූ බව ද වෛද්‍යවරු පැවසූ බව මන්ත්‍රීවරු කියා සිටියහ.

සී. ගමගේ - සොරණාතොට සමූහ

# ලක්ෂ එකහමාරක ගිරවුන් හොරකම් කරලා



බදුල්ල, බදුලුපිටිය ප්‍රදේශයේ නිවෙසක කූඩුවක දමා ඇති කළ රුපියල් ලක්ෂ එකහමාරක් පමණ වටිනා විදේශ රටක ගිරවුන් දෙදෙනකු සොරකම් කළැයි සැකපිට පුද්ගලයකු පෙරේදා (9) අත්අඩංගුවට ගෙන තිබේ. සොරාගත් ගිරවුන් දෙදෙනා කූඩුවක දමා සැකකරුගේ නිවෙසේ සඟවා තිබියදී අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු තිස්හැවිරිදි වියේ පසුවනා අතර ඔහු තදින්ම මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වී සිට ඇත.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# සූරියවැව ප්‍රතිසංස්කරණය අරඹයි



වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ කන්තලේ සූරියවැව ප්‍රතිසංස්කරණය කිරීම ත්‍රිකුණාමල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරල මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරිණි.

මේ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 27ක් වැය කෙරෙනා අතර ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව අක්කරඅඩි 1200ක ජලය ධාරිතාවක් මේ වැවේ රැඳවිය හැකි වේ. මේ තුළින් කුඹුරු අක්කර 350ක් වගා කළ හැකි අතර වැව් 99ක් ප්‍රතිසංස්කරණය කෙරෙනා බව දිසාපති සමන් දර්ශන පාඩිකෝරාල මහතා වැඩිදුරටත් පැවසීය.

මේ අවස්ථාවට ප්‍රාදේශීය ලේකම් එන්. එම්. උපේක්ෂා කුමාරි, වාරිමාර්ග අධ්‍යක්ෂ ඒ. එම්. අබ්දුල් ජබාර් යන මහත්ම මහත්මීහු සහභාගි වී සිටියහ.

සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

# කෝකිලායි මෝයකට අවට අනවසර ඉදිකිරීම්වලට දඩ



කෝකිලායි මෝයකට පෙදෙසෙහි වෙරළ තීරයේ අනවසර ඉදි කිරීම් සම්බන්ධව අධිකරණය හමුවට පමුණුවන ලද පුද්ගලයන් තිදෙනකුට අයකුට 10,000 බැගින් 30,000ක දඩ ගෙවීමට කුච්චවේලි මහෙස්ත්‍රාත් එම්. අන්ෆාර් මහතා නියෝග කරන ලදි.

පුල්මුඩේ පොලිසිය හා එක්ව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කළ වැටලීමකදී අනවසර ඉදි කිරීම් 8ක් හඳුනාගෙන සැකකරුවන් 31 දෙනකු මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත. එයින් තිදෙනකු පසුගියදා අධිකරණය හමුවට පැමිණවීමෙන් අනතුරුව මෙලෙස දඩ නියම කොට අනවසර ඉදි කිරීම් වහා ඉවත් කිරීමට ද මහෙස්ත්‍රාත් වරයා නියෝග කරන ලදි. අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් කෝකිලායි ප්‍රදේශයේ පදිංචිකරුවන්ය.

කෝකිලායි ධීවර සංගම් සභාපති එම්. සලීම් මහතාගේ ද එකඟතාව මත අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට දැනුම් දී තිබුණ ද එම දිනට පෙර ඒවා ඉවත් නොකිරීම හේතුවෙන් මේ නීතිමය ක්‍රියාමාර්ග ගත් බව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීහු පවසා සිටියහ.

ඒ. ටී. එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# බන්ධනාගාර නිලධාරීන්ට කොවිඩ් එන්නත

කොවිඩ් - 19 එන්නත්කරණයේදී ත්‍රිකුණාමලයේ බන්ධනාගාර නිලධාරීන්ට හා වරාය අධිකාරියේ සේවයේ නියුතු වූවන්ට ප්‍රමුඛත්වය දී ඇතැයි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ඩී. ජී. එම්. කොස්තා මහතා පැවසීය.

මුල් වටයේදී ආරක්ෂක අංශ සාමාජිකයන්ට මේ එන්නත්කරණය සිදු කර ඇති අතර මහජනයා හා ගැවසෙනා පොලිස් නිලධාරීන් සඳහා ප්‍රමුඛත්වය දෙමින් මෙය සිදු කළ බව ද අධ්‍යක්ෂවරයා කීය.

මේ වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොවිඩ් - 19 වසංගතය බොහෝ දුරට පාලනය වි ඇති අතර දිනකට ආසාදිතයන් හමු වීම එක්කෙනකුට හෝ දෙදෙනකුට සීමා වී ඇති බව ද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් පවසා සිටියේය.

මෙත්සිරි. බී. හේරත් - මාතලේ අතිරේක

# මාතලේ ඉඩම්වල පත්ඉරු දිරාපත් වෙලා

මාතලේ දිස්ත්‍රික්කයේ ඉඩම්වල පත්ඉරු දිරාපත් වී ඇත්දැයි වහාම සොයා බලනා ලෙස දිසාපති කරුණාසිරි පෙරේරා මහතා නිලධාරීන්ට උපදෙස් දී තිබේ. මාතලේ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී දේවහුව ගොවි සංවිධානයේ සභාපති ඒ. ජී. ගුණදාස මහතා ඉඩම්වල පත්ඉරු දිරාපත් වී ඇතැයි කියනා ප්‍රශ්නය මතු කර තිබුණේය. ඉඩමක ප්‍රශ්නයක් මතු වූ විට එම ඉඩමේ පත්ඉරුවේ ඡායාස්ථ පිටපතක් ගැනීමට ගිය විට පත්ඉරුව දිරාපත් වී ඇති බවට නිලධාරීන් පවසා තිබේ. මේ හේතුවෙන් ගොවීන් අන්ත අසරණ වන බව ඔහු පැවසීය. මේ ප්‍රශ්නයට කඩිනම් විසඳුමක් දෙන ලෙස ද ඔහු දිසාපතිවරයාගෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව පත්ඉරු ප්‍රශනය ගැන වහාම සොයා බලනා ලෙස දිසාපතිවරයා නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

කේ. ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

# වී මෙට්‍රික් ටොන් 2ක් මිල දී ගන්න යයි

තරගකාරී මිලකට වී මිල දී ගැනීමේ රජයේ වැඩසටහන යටතේ මාසයක් වැනි කාලයක් තුළ වී මෙට්‍රික් ටොන් ලක්ෂ 02ක් ගොවි බිම් වෙත ගොස් මිල දී ගන්නා ලෙස කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා අදාළ නිලධාරීන් වෙත උපදෙස් දී තිබේ. මාර්තු 08 වැනිදා සිට අප්‍රේල් 07 වැනිදා දක්වා මාසයක කාලයක් තුළ මෙට්‍රික් ටොන් ලක්ෂ 02ක වී මිල දී ගැනීමේදී දිස්ත්‍රික්ක 06කට ප්‍රමුඛතාව දෙන ලෙසට අමාත්‍යවරයා උපදෙස් දී තිබේ.

අනුරාධපුරය, මඩකළපුව, අම්පාර, පොලොන්නරුව, හම්බන්තොට සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක 06කට එලෙස ප්‍රමුඛතාව ලැබී ඇත. වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරුවන් 60 දෙනකු සහ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් 300ක් මේ වැඩසටහන සඳහා එක්වීමට නියමිතය. ලොරි රථ 60ක් පමණ යොදා ගනිමින් වී මෙට්‍රික් ටොන් 6000ක් දෛනිකව මිල දී ගැනීමට සැලසුම් කර ඇති බවද කෘෂිකර්ම අමාත්‍යාංශය පැවසීය.

ඩබ්ලිව්. සී. බී. ප්‍රනාන්දු - පුත්තලම සමූහ

# මුහුදේ පා වූ පාර්සලයක ගංජා කිලෝ 107ක්

ඉන්දියාවේ සිට මුහුදු මාර්ගයෙන් ගෙන එමින් තිබූ කහ තොගයක් සහ මුහුදේ පාවෙමින් තිබූ කේරළ ගංජා තොගයක් සැකකරුවන් හතරදෙනෙක් සමඟ නාවික හමුදා නිලධාරීන් විසින් පසුගියදා (08) අත්අඩංගුවට ගෙන තිබේ. කල්පිටියට නුදුරින් පිහිටි දූපතක් ආසන්නයේ මුහුදේ පාවෙමින් තිබූ පාර්සලයක් තම භාරයට ගෙන ඇති නාවික හමුදා නිලධාරීන් එම පාර්සලයේ කේරළ ගංජා කිලෝ 107ක් තිබී අත්අඩංගුවට ගෙන ඇති අතර ඉන්දියාවේ සිට බෝට්ටුවකින් ගෙන එමින් තිබී ඇති මේ කේරළ ගංජා තොගය නාවික හමුදා යාත්‍රාව දැක මුහුදට වීසි කර දමා පලා යන්නට ඇතැයි නාවික නිලධාරීහු පවසති.

වැඩිදුර විමර්ශන සඳහා කේරළ ගංජා තොගය කල්පිටිය පොලිසියට භාර දී තිබේ.

මහානාම විතානගේ - මල්වාන සමූහ

# මාල කඩන තරුණයෝ දෙදෙනෙක් මාට්ටු


යතුරුපැදියෙන් ගොස් මහමඟ ගමන් ගන්නා කාන්තාවන්ගේ ගෙල බැඳි රන් මාල මංකොල්ලකෑමේ යෙදුනු තරුණයන් දෙදෙනකු එම යතුරුපැදියත් සමඟ අත්අඩංගුවට ගැනීමට කිරිබත්ගොඩ පොලිසිය පසුගියදා (08) සමත් වී තිබේ.

සැකකරුවන් මංකොල්ලකන ලද රන් මාල හයක් එඬේරමුල්ල හා වත්තල යන ප්‍රදේශවල රන් භාණ්ඩ උකස් ගන්නා ආයතනවලට උකස් කර තිබියදී සොයාගෙන ඇති අතර එසේ සොයාගත් රන් මාල හයේ වටිනාකම රුපියල් ලක්ෂ දහයක් පමණ වේ.

කොට්ඨාස බුද්ධි අංශයේ කිරිබත්ගොඩ පොලිසියේ පො.කො. වික්‍රමසිංහ (75007) හා මහබාගේ පොලිසියේ පො.කො. ලියනගේ (67632) යන නිලධාරීන්ට ලද තොරතුරක් මත එම තරුණයන් යතුරුපැදියෙන් ගමන් කරමින් සිටියදී දලුපිටිය කනත්ත පාර අසලදී සැකපිට අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීම්වලදී මේ මංකොල්ලකෑම් හෙළි කර ගැනීමට හැකි වී තිබේ.

ජී. අයි. ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

# පාරට කුණු දාන්න එපා



වැල්ලවාය කොස්ලන්ද මාර්ගයේ පිහිටි මල්වත්තාවල පුරාණ රාජමහා විහාරස්ථානයට පිටුපසින් ප්‍රධාන මාර්ගය ආසන්නයට කුණු කසළ තොගයක් ගෙනැවිත් දමා ඇතැයි ප්‍රදේශවාසීහු පවසති. බෝතල්, බියර් කෑන් ඇතුළු අපද්‍රව්‍ය තොගයක් මෙසේ මලුවල අසුරා ගෙනැවිත් දමා ඇති අතර සතුන් විසින් ඇද දැමීම හේතුවෙන් ඒවා මාර්ගය අවට විසිරී ගොස් තිබූ අයුරුයි මේ.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

# කඩේ කඩලා 44,000ක බඩු උස්සලා

මොනරාගල පොලිස් වසමේ නක්කල ටැංවත්ත ප්‍රදේශයේ පිහිටි කුඩා වෙළෙඳසලකට පෙරේදා (09) ජනේලයකින් ඇතුළු වූ කිසියම් අයකු වෙළෙඳසලේ තිබූ කිරිපිටි, සහල්, කුකුළු මස් සහ බිස්කට් ඇතුළු රුපියල් හතළිස්හතරදහස් අටසිය විස්සක් පමණ වටිනා භාණ්ඩ සොරාගෙන ගොස් ඇතැයි මොනරාගල පොලිසිය ප්‍රකාශ කළේය. වෙළෙඳසල් හිමියා වෙළෙඳසල වසා නිවෙසට ගොස් පසුදින උදයේ පැමිණ බලන විට වෙළෙඳසලේ ඉදිරිපස දොර විවෘත කර ඇති බව දැක පරීක්ෂා කිරීමේදී කිසියම් අයකු වෙළෙඳසලේ භාණ්ඩ සොරාගෙන ගොස් ඇති බවට අනාවරණය වී ඇත.

අනුරාධපුර මධ්‍යම විශේෂ - බී.එම්. විජේසූරිය

# අනුරපුර තැපැල් කාර්යාලයේ රාත්‍රී ඩියුටිය උඩ බලන් ඉන්න එකද?

හදිසි විදුලි බිඳවැටීමකදී ආයතනයේ කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වා ගෙන යෑමට තැපැල් වෘත්තිය සමිති සිදුකළ ඉල්ලීම්වලින් පසුව අනුරාධපුර ප්‍රධාන තැපැල් කාර්යාලයට ලැබුණු රුපියල් මිලියන දෙකකට ආසන්න වටිනා කමකින් යුතු විදුලි උත්පාදන යන්ත්‍රය ආපදාවට ලක්වී මාස ගණනාවක් ගතවී ඇතත් උතුරු මැද පළාත් නියෝජ්‍ය තැපල්පතිවරයා ඇතුළු කිසිදු උසස් නිලධාරියකුට එය අලුත්වැඩියා කිරීමේ ඕනෑකමක් නැති බව වෘත්තිය සමිති නිලධාරීහු පිරිසක් පැවැසූහ.

හිටපු තැපැල් අමාත්‍ය අබ්දුල් හලීම් මහතාගෙන් තැපැල් වෘත්තිය සමිති සේවකයන් පිරිසක් කළ ඉල්ලීමකට අනුව රුපියල් මිලියන 1.7ක් වටිනා විදුලි උත්පාදන ජෙනරේටරය අනුරාධපුර ප්‍රධාන තැපැල් කාර්යාලයට ලැබී තිබිණි.

රටේ මහජනතාවගේ බදු මුදලින් ලබාදුන් විදුලි උත්පාදන යන්ත්‍රයේ පැවත්ම පිළිබඳ කිසිදු අවධානයක් යොමු නොකළ පළාත් නියෝජ්‍ය තැපල්පතිවරයා එය තැපල් කාර්යාල භූමියේ ඉදිකර තිබෙන ජල ටැංකිය යට සවිකළ බවත් ටැංකියට ජලය පිරී උතුරා යද්දි යන්ත්‍රයට ජලය කාන්දු වන බවත් සේවකයෝ පැවැසූහ.

පසුගියදා (8) රාත්‍රී අනුරාධපුර දිස්ත්‍රික්කයට පැය දෙකකට අධික කාලයක් විදුලිය විසන්ධිවීම නිසා තැපල් කාර්යාලයේ රාත්‍රී වැඩ මුරයේ කටයුතු පැය දෙකක කාලයක් ඇණිහිට තිබූ බව පැවසූ සේවකයන් විදුලි උත්පාදන යන්ත්‍රය අක්‍රියවී වසරකට අධික කාලයක් ගෙවී ඇතත් දෙපාර්තුමේන්තුවේ උන්නතිය පිළිබඳ කිසිදු ඇල්මක් නැති නිලධාරීන්ට එය අලුත්වැඩියා කිරීමටවත් උනන්දුවක් නැති බව ඔවුහු කීහ.

පසුගිය 8දා රාත්‍රියේ පැය දෙකක් විදුලිය නෑ. රාත්‍රී වැඩ මුරයේ නිලධාරීන් විදුලිය එනකම් නිකම්ම උඩ බලාගෙන හිටියා. විදුලි උත්පාදන යන්ත්‍රය අලුත්වැඩියා කරගන්න මේ උසස් නිලධාරීන්ට කිසිම උනන්දුවක් නෑ. සාද පවත්වන්න විනෝද චාරිකා යන්න අනුන්ගේ වැඩ කරන්න හැමදේකටම මේ නිලධාරීන් ටික හරිම දක්ෂයි. එහෙත් ආයතකයක අත්‍යාවශ්‍ය අංගයක් තමයි විදුලි ජනන යන්ත්‍රය. ඒක අලුත්වැඩියා කර ගන්න උනන්දුවක් නෑ.

යන්ත්‍රය හදන්න යනවා රුපියල් 175000ක්. මේ යන්ත්‍රයට හානි වුණේ වතුර ටැංකිය යට ස්ථාපනය කරපු නිසා. අඩුම තරමේ නිකං පඩි ගන්න මේ මිනිස්සුන්ට ඒක වෙන තැනක දැන්වත් ස්ථාපනය කරන්න උවමනාවක් නෑ. තැපෑල මන්දගාමී ආයතනයක් කරලා තියෙන්නේ මේ උසස් නිලධාරීන්. මේවා කිවුවම එක එක අයට බෝලේ පාස් කර කර ඉන්නවා. තැපල් කාර්යාලවල ඉටි පන්දම් පත්තු කරගෙන වැඩ කරන්න බෑ යනුවෙන් සේවකයෝ පැවැසූහ.

මේ සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ තැපැල් ප්‍රධානියකුගෙන් දුරකථනයෙන් කළ විමසීමකදි කියා සිටියේ යන්ත්‍රය කැඩිලා. ඒක හදන්න ඕන කෑලි ගෙන්වන්න අවශ්‍ය කටයුතු සියල්ල කරලා තියෙන්නේ. අපි ඉක්මනින් ඒක අලුත් වැඩියා කරනවා.

සෙනෙවිරත්න කහටපිටිය - බොරලැස්ගමුව සමූහ

## ගල්කිස්ස මහජන ආරක්ෂක කමිටු සභාපතිවරුන්ට හැඳුනුම්පත්



මේ වනවිට මහජන ආරක්ෂක කමිටු සභාපතිවරුන් සදහා විශාල වගකීමක් රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පැවරී තිබෙනවා. පළාත ගැන විශේෂ දැනුමක් ඔබට තියන නිසා සිදුවන දූෂණ ක්‍රියා පිළිබඳ සමාජ තොරතුරු හරිහැටි පොලීසිය වෙත ලබා දිය හැකි වනවා යැයි ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කමල් පුෂ්පකුමාර මහතා පැවැසීය.

ඒ මහතා එසේ පැවසුවේ ගල්කිස්ස පොලිස් කොට්ඨාසයේ පොලිස් ස්ථාන 8ක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති මහජන ආරක්ෂක කමිටු සභාපතිවරුන් සඳහා හැඳුනුම්පත් ප්‍රදානය දෙහිවල සහරාන් උත්සවශාලා පරිශ්‍රයේදී පැවැති සමුළුවේ අදහස් දක්වමිනි. ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද කීය.

මේ ගල්කිස්ස කොට්ඨාසයට තියන ප්‍රධාන අභියෝගයක් තමා මත්ද්‍රව්‍ය ජාවාරම් දිගින් දිගටම සිදුවීම. ඒ සඳහා පොලීසියටවත්, ඔබටවත් තනියෙන් එය මර්දනය කළ නොහැකියි. මහජන ආරක්ෂක කමිටු හරහා ලබාදෙන සත්‍ය තොරතුරු මත පොලීසියට කටයුතු කළ හැකියි. කිසිම විටෙක ඒ තොරතුරු පුද්ගලයකු ඉලක්ක කර පළිගැනීමේ චේතනාවෙන් ද තොරව අවංකවම ගමට සිදුවන යහපත වෙනුවෙන් සිතා ජාතික මෙහෙවරක් සේ සලකා කටයුතු කළ යුතුයි.

මේ ඔබ ලබා දෙන තොරතුරු ගැන හරිහැටි තේරුම් නොගත් නමට පමණක් තනතුරු දරන පොලිස් නිලධාරීන් ද සිටිනවා. ඒත් මා එහෙම නෑ. කිසිවකුගේ මුදලට හෝ අල්ලසට යට වෙලා කිසිදාක මා වැඩ කරන්නේ නෑ.

අද දිනයේ පත්වීම් ලබන මහජන ආරක්ෂක කමිටු සභාපති වරු කෙරේ හොඳ විශ්වාසයකින් යුතුව මේ ලබාදෙන සභාපති තනතුර අකටයුතුකම් සඳහා කිසිම අවස්ථාවක පෞද්ගලික කටයුතු සඳහා භාවිතා නොකර රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් පමණක් සිතා කටයුතු කළ යුතුයි. ඒ සඳහායි ග්‍රාම සේවා වසම් 159ක තෝරාගත් සමාජයේ පිළිගැනීමක් ඇති සභපතිවරුන් 103 දෙනකු සඳහා පත්වීම් ලබාදී ඔබව ඇගයීමටද ලක්කර තිබෙනවා. ඒ ගෞරවය රැක ගැනීම ඔබට භාරයි.

මේ අවස්ථාවට ගල්කිස්ස සහකාර පොලිස් අධිකාරි ප්‍රගති ලක්මිණ, ගල්කිස්ස මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක දිලීප සී. පෙරේරා මහතා මහත්වරුන් ඇතුළු පොලිස් ස්ථානාධිපතිවරු ඇතුළු හැඳුනුම්පත්ලාභීහු සහභාගිවී සිටියහ.

එම්.පී. කුමාර - කොටදෙණියාව සමූහ

## මානිංගමුව සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේට මුල්ගල



බස්නාහිර හා වයඹ දෙපළාත් මායිමේ පන්නල නගරයට නුදුරු කොටදෙණියාව මානිංගමුව මාඔය අසබඩ බිම්කඩක ඉදි කෙරෙන හැට රියන් උසැති සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ සඳහා මුල්ගල තැබීම අත්තංගනේ ශාසනරතන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා ලේඛකාධිකාරී මාහිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නයේ සහභාගිත්වයෙන් පසුගිය දා සිදුවිය.

මාබොදලේ ධම්මපවර හිමියන්ගේ අනුශාසකත්වය යටතේ මේ පිළිම වහන්සේ ඉදිකෙරෙන අතර ඒ සඳහා බිම් කොටස හා මූල්‍ය දායකත්වය ලබාදෙන ව්‍යාපාරික ඩී.එම්. හේමකුමාර මහතා මංගල පස් පිඩැල්ල කැපූ අවස්ථාව මෙහි දැක්වේ. රුපියල් කෝටි එක හමාරක් පමණ මේ සඳහා වැය වෙතැයි අපේක්ෂිතය. මාබොදලේ ධම්මපවර හිමියන් ද මෙහි සිටින අතර දඩගමුව රාජ මහා විහාරාධිපති මැටිකොටුමුල්ලේ පේමරතන, බලගල්ල සරස්වතී මහ පිරිවෙන් කෘත්‍යාධිකාරි නාරාවිල ධම්මධස්සි, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ කාරක සංඝ සභික මාහිමියෝ ඇතුළු මහා සංඝරත්නය ද එක්ව සිටියහ.

නිමල් විජයතුංග - ඇහැලියගොඩ විශේෂ

## ඇහැලියගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති තනතුරට ගල්ලෑල්ලේ ධම්මරතන හිමි



ඇහැලියගොඩ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති තනතුර සඳහා ඇහැලියගොඩ මාහර ඓතිහාසික පුරාණ විහාරාධිපති ශාස්ත්‍රපති ගල්ලෑල්ලේ ධම්මරතන හිමියෝ අභිනවයෙන් පත්වී සිටිති.

උන්වහන්සේ සීතාවක ජාතික පාසලේ නියෝජ්‍ය විදුහල්පති තනතුරද හොබවන අතර අවිස්සාවේල්ල ඇපලපිටිය ජයසුමනාරාමය, වියලගොඩ ශ්‍රී මෙත්තාරාමය සහ අස්ගගුල ශ්‍රී විමලරතන බෞද්ධ මධ්‍යස්ථානයේ ද විහාරාධිපතිත්වය උසුලයි.

ඇහැලියගොඩ ශාසනාරක්ෂක බලමණ්ඩලයේ සභාපති තනතුර හිස්වූයේ එය දීර්ඝ කාලයක් හෙබවූ මාහර විහාරාධිපති අස්ගගුලේ විමලරතන හිමිපාණන් අපවත්වී වදාළ නිසාවෙනි.

බන්දුල අලහකෝන් - බොරැල්ල විශේෂ

## නැගෙනහිර කොළඹ වසම් 5කට කොවිඩ් මර්දන එන්නත





කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී ජනතාව රජය මගින් නොමිලේ ලබාදෙන කොවිඩ් මර්දන එන්නත විද ගැනීමට අදිමදි කළත් අනිකුත් සියලුම ජනයා එන්නත ලබාගන්නා බව නැගෙනහිර කොළඹ කිරුල කොට්ටාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ප්‍රදීප් කොලුගල මහතා පැවැසීය.

මේ වනවිට නැගෙනහිර කොළඹ ග්‍රාමසේවා වසම් 5 තුළ ස්ථාන 13කදී එන්නත් 13500ට වැඩි ප්‍රමාණයක් ජනතාවට ලබාදී ඇති බව ද කොළඹ නාගරික මන්ත්‍රී සංජීව රොෂාන් මහතාගේ ඉල්ලීම මත කිරුල ප්‍රදේශයේ ජනතාවට එන්නත් 1200ක් ලබාදෙන බවද ප්‍රදීප් මහතා පැවැසීය.

පොල්හේන්ගොඩ රත්න අරම විහාරස්ථානයේදී මේ එන්නත් ලබාදීම සිදුකෙරිණි. හිටපු මැති ඇමතිවරු කිහිප දෙනෙක්ම එන්නත ලබාගැනීමට පැමිණ සිටි අතර විදේශිකයෝ ද එන්නතලබාගැනීමට පැමිණ සිටියහ.

සමන් එස්. රත්නායක - යටියන්තොට විශේෂ

## යටියන්තොට නගරයේ සංවර්ධන වැඩ කඩිනමින්





යටියන්තොට නගරයේ මාර්ග හා කානු සකස් කර නගර සංවර්ධනයේ වැඩ කඩිනම් කරන්නැයි කෑගල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති රාජිකා වික්‍රමසිංහ මහත්මිය හා යටියන්තොට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ උප සභාපති ශ්‍රී ලාල් වික්‍රමසිංහ මහතා අදාළ ආයතන වෙත උපදෙස් ලබා දී ඇත.


මාර්ගයේ සංවර්ධන කටයුතු නිරීක්ෂණය සඳහා රාජ්‍ය නිලධාරීන් සමඟ රාජිකා වික්‍රමසිංහ මහත්මිය ඉකුත්දා එම ස්ථාන වෙත පැමිණ ගැටලු සොයා බැලූ අතර මෙහිදී යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතිය පාවිච්චි කළ නගරයේ පැරණි ගොඩනැගිල්ලේ වර්තමාන හිමිකරුවන් සමඟ ද සාකච්ඡා කර නගර සංවර්ධනයේ බාධා ඉවත් කර ගැනීමට කටයුතු කළේය.

මේ පිළිබඳ කළ විමසීමේදී රාජිකා වික්‍රමසිංහ මහත්මිය සඳහන් කළේ පැරණි සමුපකාර ගොඩනැගිල්ලේ හිමිකරුවන් සමඟ සාකච්ඡා කළා. නගර සංවර්ධන කටයුතු සඳහා ඉඩ ලබා ගැනීමට එම ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත් කර ගැනීමට එකඟ වුණා යනුවෙනි.

මේ අවස්ථාවට යටියන්තොට ප්‍රාදේශීය ලේකම් ප්‍රියංගනී පෙතන්ගොඩ, යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති කේ.ඩී. වසන්ත, යටියන්තොට පොලීසියේ ස්ථානාධිපති (ප්‍ර.පො.ප.) එච්.ජී.එස්.පී.කේ.චන්ද්‍රසිරි මහත්ම මහත්මීන් ඇතුළු නිලධාරීහු සහභාගි වූහ.

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

## වලව වම් ඉවුරේ අක්කර 3000ක මුං වගාව විනාශයි







රිදියගම ව්‍යාපාරයට අයත් වලව වම් ඉවුර ප්‍රදේශය යටතේ ඇති මහ ඇළ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ගොවීන්ට නොදන්වා ජලය නිකුත් කිරීම නිසා එම කුඹුරුවල වගා කරන ලද මුං වගාව සම්පූර්ණයෙන් විනාශ වී ඇති බවට ගොවීහු පවසති.

මාස දෙකක පමණ කාලයක් වාරි පද්ධතියට ජලය නිකුත් නොකරන නිසා ඒ අතර කාලය සඳහා ගොවීන්ට මුං වගා කරන ලෙස ගොවිජනසේවා නිලධාරීන්, වාරිමාර්ග නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන් ඒකාබද්ධව ගොවින් දැනුම්වත් කිරීම කළ බව ගොවීහු සඳහන් කරති.

කෙසේ නමුත් එසේ දැනුම්වත්කර සිටියදීත් මේ ආකාරයෙන් ඇළ මාර්ග සඳහා ජලය නිකුත් කිරීම හේතුවෙන් මුං වගා කර ඇති රිදියගම ව්‍යාපාරය යටතේ පවතින කුඹුරු අක්කර 3000 කට අධික ප්‍රමාණයක මුං පැළ තැම්බී විනාශ වී ඇතිබව ගොවි සංවිධාන පෙන්වා දෙති.

වලව වම්ඉවුර සේනානායක ගොවි සංවිධානයේ හිටපු ලේකම් ජේ. ඩබ්ලිව්. ඒ. ධර්මදාස මහතා -

දිසාපති තුමාගේ ප්‍රධානත්වයෙන් ගොවි සංවිධාන 25 ම රැස්කරලා සියලුම අදාළ නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන් පැවැති රැස්වීමකදී තමයි අපිට කිව්වේ යල් කන්නයට වතුර දීම ප්‍රමාද වෙන නිසා ඒ අකාලය තුළ අතිරේක බෝග වගාවක් ලෙස මුං වගා කරන්න කියල ගොවීන් දැනුම්වත් කළා. එහෙම තියෙද්දී තමයි මහ ඇළේ ලබාදී තියෙන්නේ. ඒ නිසා තමයි අද ගොවීන්ට මේ විශාල පාඩුව වෙලා තියෙන්නේ.

වලව සංවිධානයේ හිටපු භාණ්ඩාගරික එන්. ඩබ්ලිව්. සිල්වා මහතා -

මම කුඹුරු අක්කර 7ක පමණ මුං වගා කළා. අපි මේ බීජ මුං ඇට ගත්තේ රුපියල් 700 ,800ක් වැනි වැඩි මුදලක් සඳහා නමුත් වාරිමාර්ග එකෙන් අත්තනොමතික ලෙස ජලය නිකුත් කිරීම නිසා අද මගේ මුං වගාව සම්පූර්ණයෙන් විනාශ වෙලා තියෙන්නේ. එකෙන් මට රුපියල් ලක්ෂ 7ක් පමණ අලාභයක් ද වෙලා තියෙනවා. මම මේ සම්බන්ධයෙන් අම්බලන්තොට පොලීසියටත් පැමිණිල්ලක් කළා.

ගොවීන්ගේ චෝදනා සම්බන්ධයෙන් කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ ඉංජිනේරු ඩී.එම්.ඒ. ඩෙහෙරාගොඩ මහතාගෙන් කළ විමසීමකදී හෙතෙම කියාසිටියේ ඒ ආකාරයෙන් ජලය නිකුත් කිරීමක් අත්තනෝමතික ලෙස සිදුවීඇද්ද යන්න සොයා බැලීමට කටයුතු කරන බවයි.

සේන වේරගම - කලවාන සමූහ

## අයගම ප්‍රාදේශීය සභාවේ ජ.වි.පෙ. නව මන්ත්‍රී එම්.ජී.පී. නිරෝෂණ



අයගම ප්‍රාදේශීය සභාවේ ජ.වි.පෙ. නව මන්ත්‍රීවරයා ලෙස එම්.ජී.පී. නිරෝෂණ මහතා මැතිවරණ කොමිසම මගින් පත්කර ඇත. ඒ මහතා අයගම පිටකන්ද ප්‍රදේශයේ පදිංචි අයෙකි. මීට පෙර පත්කර සිටි ඩී.සී. වික්‍රමනායක මහතා ඉල්ලා අස්වීමෙන් ඇති වූ පුරප්පාඩුව වෙනුවෙන් මොහු පත් කර ඇත.

මන්ත්‍රී ධූර දාසයකින් යුත් අයගම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පැවැත්වූ පසුගිය පළාත් පාලන මැතිවරණය මගින් ජ.වි.පෙ.ට එකම කොට්ඨාසයක් හෝ ජයගැනීමට නොහැකි වූ මුත් සමානුපාතික ක්‍රමයට අනුව එක් නියෝජිතයකු මැතිවරණ කොමිසම මගින් පත්කර තිබිණි.

එම්.ජී.පී. නිරෝෂණ මහතා පාසල් ශිෂ්‍ය අවදියේ සිටම දේශපාලනයට සම්බන්ධව ක්‍රියා කළ අතර සමාජවාදී තරුණ සංගමය මගින් ජ.වි.පෙ.ට සම්බන්ධව පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අයගම ප්‍රාදේශීය සභාවේ අපේක්ෂයෙකු ලෙස ද තරග කළේය.

ඒ මහතා අයගම පිටකන්ද විද්‍යාලයේ හා පල්ලෙකඩ විද්‍යාලවල ආදි ශිෂ්‍යයෙකි.

ආර්. ඤාණදාස - අම්බලන්ගොඩ සමූහ

## කරන්දෙණිය සදහම් සුව අරණ ධර්මායතනයේ චෛත්‍යයට මුල්ගල් තැබීම 18දා...

කරන්දෙණිය නාමිනිගොඩ සදහම් සුව අරණ ධර්මායතනයේ අභිනවයෙන් ඉදිකිරීමට සැලැසුම් කොට තිබෙන සුවරැස් සෑය චෛත්‍යරාජයාණන් වහන්සේගේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පුණ්‍ය කටයුත්ත මේ මස 18 දින උදෑසන 7.30ට යෙදී ඇති සුබ මොහොතින් සිදු කෙරේ.

සදහම් සුවසරණ ධර්මායතනාධිපති රතුපස්කැටියේ විමුක්තරතන ස්වාමීන්වහන්සේගේ ජන්ම දිනයට සමගාමීව මේ පුණ්‍යකර්මය සිදු කෙරේ. දුර්ලබ වූ මහත්ඵල මහානිසංස පුණ්‍යකර්මයට සහභාගී වන මෙන් පින් කැමැති සැමට ඇරියුම් කරන බව නායක ස්වාමීවහන්සේ පැවැසූහ.

ලංකින්ද නානායක්කාර - ඉමදූව සමූහ

## ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 385ක දරුවන්ට පලතුරු පැළ

පරිසර සංවේදී දරු පරපුරක් බිහිකිරීම අරමුණු කරගනිමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය ශෂින්ද්‍ර රාජපක්ෂ මහතාගේ සංකල්පයක් මත දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලද කැකුළු තුරු උදාන වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 385කට පැළ 17385ක් ලබා දීම කඩිනමින් ඉතාමත් සාර්ථකව සිදු කළ බව ගාල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජේ. පොන්නම්පෙරුමආරච්චි මහත්මිය පවසයි.

ඒ මහත්මිය එසේ පවසා සිටියේ ගාල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට පසුගියදා එක්වෙමිනි. මෙහි දී වැඩිදුරටත් අදහස් දැක් වූ ඒ මහත්මිය මෙසේ ද පැවැසුවාය.

2021 වසරේ පළමු වසරට ඇතුළත් වන පාසල් ළමයින්ට පාසල් යන පළමු දිනය සිහිකරමින් සිටුවීමට පලතුරු පැළයක් ලබා දීම සිදු කෙරුණු අතර එහිදී එක් පාසලක් සඳහා එක් පැළයක් බැගින් පාසලේ රෝපණය කිරීම සඳහා ලබා දී තිබෙනවා.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව මගින් ගොවිජන සංවර්ධන කොමසාරිස් යටතේ සිටින ප්‍රාදේශීය නිලධාරීන් හා කෘෂිකර්ම උපදේශක සහකරවරුන් යොදවා පසු විපරම් දිගින් දිගටම සිදු කරන බව ද ගාල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරිය එහිදී වැඩිදුරටත් සඳහන් කරන ලදි.

# විදෙස් රටවල් අත්අඩංගුවට ගෙන ඇති බහුදින ධීවර යාත්‍රා කඩිනමින් නිදහස් කරගැනීමට පියවර

## ඇමැති ඩග්ලස් දේවානන්දා

**බුද්ධිකා ඉඹුලාන**

විදේශ රටවල අත්අඩංගුවේ තිබෙන බහුදින ධීවර යාත්‍රා කඩිනම් නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා පැවසීය.

මෙරට බහුදින ධීවර යාත්‍රා ජාත්‍යන්තර මුහුදට ගොස් එම සීමා උල්ලංඝනය කිරීම් මෙන්ම යාන්ත්‍රික දෝෂ හමුවේ විදේශීය රට-වල ආරක්ෂක අංශ භාරයට පත් වන අතර, එම ධීවර කාර්මිකයන් හා යාත්‍රා කඩිනමින් නිදහස් කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම වගකීමෙන් යුතුව සිදු කරන බව ඇමැතිවරයා කීවේය. මෙම අවධානමට පත් බහු දින ධීවර යාත්‍රා හිමියන් පිරිසක් අමාත්‍යාංශයට පැමිණි අවස්ථාවේදී ඔවුන් හමුවේ ඇමැතිවරයා මේ බැව් ප්‍රකාශ කළේය.



මෙම අවස්ථාවේදී බෝට්ටු හිමිකරුවන් ඇමැතිවරයා හමුවේ කියා සිටියේ තම යාත්‍රා-අත්අඩංගුවට පත්වීම හේතුවෙන් තමන් මුහුණ දෙන ප්‍රශ්න හා ගැටලු පිළිබඳ අවධානය යොමුකර අත්අඩංගුවේ පසුවන ධීවර යාත්‍රා තමන්ට ගෙන්වා දෙන ලෙසයි.

මෙහිදී අදහස් දැක්වූ ඇමැතිවරයා තමන් ධීවර ඇමැතිවරයා ලෙස කටයුතු ආරම්භ කළ දින සිට මේ දක්වා විදේශ රටවලදී අත්අඩංගු-වට පත් ධීවර යාත්‍රා මෙන්ම, හදිසි තත්වයන් තුළ මිය ගිය ධීවර කාර්මිකයන්ගේ මෘතදේහ ලංකාවට ගෙන ඒමට කටයුතු කර තිබෙන බවයි.

පසුගිය දා මාලදිවයින මුහුදු තීරයේදී මිය ගිය ධීවර කාර්මිකයාගේ මෘත දේහය ලංකා-වට ගෙන්වීමට කටයුතු කළ අතර ඒ වෙනු-වෙන් රුපියල් 972847ක මුදලක් ධීවර දෙපා-ර්තමෙන්තුවෙන් විදේශ කටයුතු අමාත්‍යංශය ලබාදීමට කටයුතු කළ බවත් ඉදිරියේදී දැනට විදේශ රටවල අත්අඩංගුවේ පසුවන සියලු ධීවර යාත්‍රා මෙරටට ගෙන්වා දීමට අවශ්‍ය කටයුතු සලසන බවත් ඇමැතිවරයා කීය.

මෙම අවස්ථාවට අමාත්‍යංශ ලේකම් ඉන්දු රත්නායක මහත්මිය ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තුමා ඇතුළු නිලධාරීන් පිරිසක් හා බහුදින ධීවර සංගමයේ නිලධාරීන් පිරිසක් එක්ව සිටියහ.

වසර තුනක් පිට පිට විශිෂ්ට ගුරුවරයා සම්මානය දිනූ

# සරසවියේ 'දර්ශන සිසුවා' හෙවත් අධ්‍යාපනයේ පෙම්වතා

**ප්‍රකට සාහිත්‍යකරුවකු, හිටපු විදුහල්පතිවරයකු වන එම්.ඒ.එම්.ඒ.වාහිඩ් මහතා අභාවප්‍රාප්ත වී මේ මස 11 වැනි දිනට වසරක් සපිරෙයි. මේ සටහන ඒ නිමිත්තෙනි.**

කොළඹ සහිරා විදුහලේ තම අධ්‍යාපන කටයුතු නිම කර ද්විත්ව උපාධිධාරී යන නාමය එම්.ඒ.එම්.ඒ. වාහිඩ් මහතා ලබා ගන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ හා කැලණිය විශ්වවිද්‍යාලයේ BA (HONS) TAMIL උපාධිධාරී සහ දෙමළ මාධ්‍යයේ ඩිප්ලෝමාවක් ද නිම කිරීමෙනි. ඔහු පශ්චාත් උපාධි අධ්‍යනය පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් නිම කරයි. ඔහුව "දර්ශන ශිෂ්‍යයකු" (Philosophy Student) ලෙස හඳුන්වයි.



අධ්‍යාපන කටයුතු නිම කර කොළඹ අල් හික්මා විදුහලේ විදුහල්පති ලෙස සේවය කර ඇත. අවුරුදු 40ක් ගුරු සේවයේ යෙදී ඇති අතර තම අවසන් අවුරුදු 25ම කොළඹ සාන්ත සෙබස්තියන් විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිව සේවය කර ඇත.

වසර 2001, 2002, 2003, වර්ෂයේම "විශිෂ්ට ගුරුවරයා" යන සම්මානය දිනා ගනී. ගාමිණී ෆොන්සේකා මහතා අතින් DOCTORATE පදවිය ලබා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති වූ ජේ. ආර්. ජයවර්ධන මහතා අතින් "විද්‍යා ප්‍රදීප්" යන විශේෂ උපාධිය හිමි කර ගනී. මොහු දමිළ මාධ්‍යයෙන් "කල්වියින් කාදලර්" එනම් "අධ්‍යාපනයට පෙම්වතා" යන නාමයෙන් ද හඳුන්වයි.

මොහු ප්‍රබල කෙටිකතාකරුවෙකු වන අතර මොහුගේ ප්‍රථම කෙටිකතාව වූ "සැකය" මගින් ඉදිරියට පැමිණි පසුව විශිෂ්ට ජයග්‍රහණ 14ක්ම ලබා ගත්තේය. ලෝක කෙටි කතා තරගයෙන් ප්‍රථම ස්ථානය ලබා "කෙටිකතාකරුවා වාහිඩ්" යන ගෞරව නාමයෙන් හඳුන්වයි. ඉන්දියාවේ ඔහුගේ කෙටිකතාවක් වන "බග් ෆ්ලවර්ස්" සගරාවේ ප්‍රකාශයට පත් කර ඇති අතර ඔහුගේ තවත් එක් කෙටිකතාවක් රුසියාවේ පරිවර්තනයට ලක් කර තිබේ.

ඔහු කොළඹ UTIහි ( United Tutorial Institute ) උසස් අධ්‍යාපන ආයතනයේ නිර්මාතෘ වන අතර, දෙමළ අංශය භාරව කටයුතු කර ඇත. BA , G.A.Q පන්තිවල උගන්වා, සිසුන් දහස් ගණනක් උපාධිධාරීන් ලෙස බිහි කර ඇත. ඔහු ලබා ගත් විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස 2014 දී ඔහු අධ්‍යාපනය ලබා දුන් සිසුන් 14 දෙනකුටම යාපන විශ්වවිද්‍යාලයේ එක්වරම විශ්වවිද්‍යාල පිවිසුම හිමිවුණි. ඔහු නිර්මාණය කළ බොහෝ දෙනකු කොළඹ සහිරා විදුහලේ හා වෙනත් දිස්ත්‍රික්කවල උපාධිධාරී ගුරුවරුන් ලෙස සේවය කරති.

අවුරුදු 2012 දී කොළඹ ජෝන් ඩී. සිල්වා මණ්ඩපයේ විශිෂ්ට ලෙස පැවැත් වූ 2012 කලාභූෂණ රාජ්‍ය සම්මාන උළෙලේ "කලාභූෂණ රාජ්‍ය සම්මානය" දිනා ගනී. එම්.ඒ.එම්.ඒ. වාහිඩ් මහතා සාම විනිසුරුවරයකු වන අතර ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයකින් ගෞරව ආචාර්ය උපාධිය ලබා ඇත.

විශේෂ සම්මාන, විශේෂ ජයග්‍රහණ හා අධ්‍යාපනයට හා සාහිත්‍යයට මහඟු සේවයක් කළ එම්. ඒ. එම්. ඒ. වාහිඩ් මහතා 2020 මාර්තු මස 11 වන දින අප අතරින් සදහටම සමුගත්තේය.

**දියණිය,**
**ෆාතිමා නෆ්ලා වාහිඩ්**
BA (SP) MASS MEDIA
**කොළඹ විශ්වවිද්‍යාලය**
**ශ්‍රීපාලි මණ්ඩපය**
**( උපාධි අපේක්ෂක )**

# දේශීය නැවුම් කිරි කර්මාන්තය දියුණු කළ යුතුයි

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංසදයේ සභාපති වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන

විදේශීය කිරිපිටි කර්මාන්තය වසා දැමීම අරමුණු කරගනිමින් දේශීය කිරිපිටි කර්මාන්තයක් බිහි නොකළ යුතු බවත්, ඒ වෙනුවෙන් දේශීයව නැවුම් කිරි කර්මාන්තයක් බිහි කළ යුතු බවත්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංසදයේ සභාපති වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා දිනමිණට අදහස් දක්වමින් පෙරේදා (9) පැවැසීය .

වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද ප්‍රකාශ කළේය.

කිරිපිටි සෞඛ්‍යයට අහිතකරයි කියා විවිධ ප්‍රකාශ විවිධ අයුරින් කාලයක සිට එල්ල වුණා. ඒ සම්බන්ධව මාධ්‍ය ප්‍රචාරයන්ද පළ වුණා. මෙවැනි ප්‍රකාශ සිදු කරන්නේ එක්තරා වෛද්‍ය වෘත්තීය සංගමයක්. පසුගිය අවුරුදු 5ක කාලය ගත්විට මෙවනි ප්‍රකාශ සිදු කෙරෙන්නේ කොහොමද කියා අප නිරීක්ෂණය කර තිබෙනවා. වසරකට වරක් මෙවැනි ප්‍රහාරයක් කිරිපිටි කර්මාන්තයට එල්ල වනවා.

වෛද්‍ය සංගමයක් කියන්නේ එක්තරා ආකාරයක වෘත්තීය සමිතියක්. වෛද්‍ය සංගමයක් යොදාගෙන මෙවැනි මඩ ප්‍රහාර එල්ල කිරීමට යම්කිසි ආකාරයක මුදල් ගෙවීමක් සිදු කරනවා. ඒ මුදල් එම සංගම්වල ප්‍රධානීන්ට ලැබෙන බව ආරංචියි. සදාචාරාත්මක නොවන ආකාරයට වෙළඳපොළ හැසිරවීමට වෘත්තීය භාවිතා කිරීමට එරෙහිව නීති තිබුණද මෙතෙක් මෙලෙස කටයුතු කරන වෘත්තීය සමිතිවලට විරුද්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීමට පැවැති රජයන් අසමත් වී තිබෙනවා. මේ කටයුතුවල හරි වැරැද්ද සම්බන්ධව ජනතාව දැනුවත් කිරීමට හෝ පියවර ගෙන නැහැ. මේ සම්බන්ධව හිටපු රජයන් ක්‍රියාත්මකවීමට අසමත්වීම නිසා මේ මාෆියාව නැවැත්වීමට නොහැකි වී තිබෙනවා.

කිරිපිටි පානය ගැන විවිධ මත ජනතාව අතරට ගෙනගියද කිරිපිටි ශරීරයට අහිතකර බව ඔප්පු කිරීමට ඔවුන් අසමත් වී තිබෙනවා. කිරිපිටි ශරීරයට අහිතකර බව පර්යේෂණ මගින් ඉදිරිපත් කර නැහැ.

දේශීය කිරිපිටි කර්මාන්තය ඇත්තටම නගා සිටුවීමට අවශ්‍යතාවයක් පවතී නම් මෙලෙස සිදුකරන විවිධ ප්‍රචාරයන් දිගටම පැවැතිය යුතුයි. නමුත් මෙම ප්‍රචාරයන් කාලෙන් කාලෙට මතු වනවා. නැවත කතාවක්වත් නැතිව යනවා. ඒ නිසා මේ ප්‍රචාරයන් මුදල්ගෙවා සිදු කරන ක්‍රියාවන් බව පැහැදිලියි.

මෙරටටනැවුම් කිරි කර්මාන්තයක් බිහි කළ යුතුයි. ඒ හරහා ක්‍රමානුකූලව විදේශීය කිරිපිටි ගෙන්වීම නතර කළ හැකියි. දේශීය කිරිපිටි ඉල්ලුමට සරිලන ආකාරයට ලබා දෙන්න බැහැ. ආනයනික කිරි ගෙනැවිත් දේශීය කිරිපිටි පැකට්වල අසුරා විකිණීම සිදු කරනවා. දේශීය කිරිපිටි පැකට්ටුවේ සහ විදේශීය කිරිපිටි පැකැට්ටුවේ මිල අතර වැඩි වෙනසක් නැත්තේ ඒ නිසයි.

නැවුම් කිරි කර්මාන්තය දේශීයව ගොඩගන්න අවශ්‍ය යි. දේශීයව කිරිපිටි කර්මාන්තයක් ගොඩනැඟීමේ කිසිදු හරයක් නැහැ. නැවුම් කිරි කර්මාන්තයක් බිහි කරන්න නම් දේශීය කිරිපිටි කර්මාන්තය සම්පූර්ණයෙන්ම වසා දැමිය යුතුයි. නැවුම් කිරි කර්මාන්තයක් රට තුළ සම්පූර්ණයෙන්ම නගාසිටුවීමත් සමඟ විදේශීය කිරිපිටි කර්මාන්තය නිකන්ම වැහිලා යයි. ඒ නිසා දේශීය වශයෙන් කිරිපිටි කර්මාන්තයක් අවශ්‍ය නැහැ. අවශ්‍ය කරන්නේ නැවුම් කිරි කර්මාන්තයක්.

සමස්තයක් වශයෙන් ගත්විට නැවුම් කිරිවල ගුණාත්මකභාවයක් තිබෙනවා. නමුත් ඇතැම් පුද්ගලයන්ට ආසාත්මිකතාවන් පෙන්වනවා. එහෙත් කැඳ කර්මාන්තයක් බිහි කිරීම හරහා කැඳ දිනපතා පානය කිරීමට සුදුසු යැයි උපකල්පනය කිරීමට බැහැ. දිනපතා පානය කිරීමට කැඳ සුදුසු නැහැ. කැඳ පානය කරන්න අවශ්‍ය වන්නේ පුරුද්දක් ලෙස නොවෙයි. පුද්ගලයන්ගේ අවශ්‍යතාව මතයි. කැඳ නිරෝගී මිනිසුන්ට ඇති කළයුතු පුරුද්දක් නොවෙයි.

ඉදිරි වසර 10දී නැවුම් කිරි කර්මාන්තයක් ස්ථාපිත කිරීමට පියවර ගත යුතු යි. ඒ සඳහා නීති රීති, රෙගුලාසි සම්පාදනය කළ යුතුයි. නැවුම් කිරි කර්මාන්තයක් නංවාලීමට ඉන්දියාවේ අනුගමනය කරන පියවර අනුගමනය කරන්න පුළුවන්. ඒ සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවේ නම් රජයේ මැදිහත්වීම ලබාදීමට පුළුවන්. නමුත් විසඳුම් ලෙස විකල්ප ක්‍රම යෙදවීම භයානකයි. ඒ සඳහා වෘත්තීය සමිති මැදිහත්වීම, උපදෙස් ලබාදීම අනවශ්‍යයි. නැවුම් කිරි කර්මාන්තයක් බිහිකිරීම වෙනුවෙන් වෙනම කාර්ය සාධන බළකායක් පිහිටුවීම නිවරදියි.

# මන්ත්‍රී මධුර බෝට්ටුවකින් පාර්ලිමේන්තු යයි

**නුවන් කොඩිකාර**



පාර්ලිමේන්තුවට බෝට්ටුවෙන් පැමිණීමෙන් තමන්ට ජල මාර්ගයෙන් ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීමට අවස්ථාව හිමි වුණු බව පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මහතා පැවසීය.

පාර්ලිමේන්තුවට බෝට්ටුවෙන් පැමිණීමට තමන් කළ ඉල්ලීමට අනුව ඒ සඳහා කථානායකවරයාගේ අවසරය හිමි වීමෙන් පසු පෙරේදා දින (9) පාර්ලිමේන්තු සැසි වාරයට සහභාගිවීමට පැමිණි මන්ත්‍රීවරයා මාධ්‍ය වෙත අදහස් දක්වමින් එසේ කියා සිටියේය.

මෙය ඉතිහාසයේ පළමු වරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට නිල වශයෙන් ලැබුණ අවසරක් බව පැවැසූ මන්ත්‍රීවරයා ජලය මඟින් ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීම කිරීමට මෙමඟින් බලාපොරොත්තු වන බව ද කීවේය.

ලංකාවේ පළවෙනි වතාවටයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් බෝට්ටුවෙන් පාර්ලිමේන්තුවට ආවේ. මා පසුගිය මංගල සැසිවාරයේ දී පාර්ලිමේන්තුවට ගියේ නිල නොවන විදියටයි. නමුත් සියලු නීතිවලට අනුකූලව ජල මාර්ගයෙන් ගමන් කරන ප්‍රතිපත්තිය අනුව පාර්ලිමේන්තුවට පිටත් වුණා. මා බලාපොරොත්තු වෙන්නේ ජලය මඟින් ප්‍රවාහන කටයුතු ප්‍රවර්ධනය කිරීමයි.

# අමෙරිකානු තානාපති කාර්යාලය කාන්තා දින මහනුවරදී හස්ත කර්මාන්ත අලෙවි පොළක් පවත්වලා

**මහින්ද අලුත්ගෙදර**



ජගත් කාන්තා දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අමෙරිකානු තානාපති කාර්යාලය මහනුවර දී සංවිධානය කළ හස්ත කර්මාන්ත නිපැයුම් අලෙවි පොළ සාර්ථකව අවසන් වී තිබේ.

ජාත්‍යන්තර කාන්තා දිනය අනුස්මරණය කරනු වස් එක්සත් ජනපද රජයේ සහ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෙන් පවත්වන ලද හස්ත කර්මාන්ත නිපැයුම් අලෙවි පොළක් පැවැත් වූ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන් නියෝජනය කරන කාන්තා කණ්ඩායම් සාර්ථක ප්‍රතිඵල අත්කරගෙන ඇත.

ව්‍යවසායිකාවන්, සමාජ නායිකාවන් සහ සාමය ඇති කරන්නන් වශයෙන් සහයෝගිතාවයන් ඇතිකර ගැනීමටත් පෙරමුණ ගැනීමටත් කාන්තාවන්ට ඉඩක් නිර්මාණය කරදීමට උදවු වන්නට ලැබීම ගැන එක්සත් ජනපදය ආඩම්බර වන බව ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) නියෝජ්‍ය මෙහෙවර අධ්‍යක්ෂ (Deputy Mission Director) ඩෙබ්රා මෝසල් මහත්මිය පවසයි.

මෙම මුලපිරීමෙන් ස්ථායිතාවය, සමාජ අන්තර්කරණය සහ එක්සත් ශ්‍රී ලංකාවක් ප්‍රවර්ධනය කරන අතර තමන්ගේ ව්‍යාපාර වර්ධනයකර ගැනීමටත්, තමන්ගේ වෙළෙඳපොළ සම්බන්ධතා ව්‍යාප්ත කරගැනීමටත් යහපරිචයන් බෙදාහදා ගැනීමට එක්ව වැඩ කළ සිංහල, දෙමළ සහ මුස්ලිම් කාන්තා කණ්ඩායම් සිදු කළ සංස්කෘතිකමය අංග මෙම ජාත්‍යන්තර කාන්තා දින සැමරුම වර්ණවත් කළේය.

මෙම වැඩසටහන, සමාජ ඒකාබද්ධතාවය සහ ස්ථායිතාව වැඩි දියුණු කිරීමට ශ්‍රී ලාංකිකයන් මුල් වී දරන වෑයම් ශක්තිමත් කරන්නා වූ බහු වාර්ෂික වැඩසටහනක එක් අංගයක් වශයෙන් USAID තම SCORE ව්‍යාපෘතිය හරහා අරමුදල් සපයන ලද්දකි.

SCORE ව්‍යාපෘතිය යනු, ස්වශක්තිය සඳහා සහය දීමටත්, ස්ථායිතාව ශක්තිමත් කිරීමටත්, ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනයටත් ඇමරිකානු සහ ශ්‍රී ලාංකික ජනතාව අතර ඇති දිර්ඝ කාලීන හවුල්කාරීත්වයේ එක් අංගයකි. 1956 වසරේ සිට මේ වනවිට රුපියල් බිලියන 350කට වැඩි මුළු මුදලක වැඩසටහන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති USAID, සෞඛ්‍ය සම්පන්න, උගත් සහ සේවානියුක්ත ජනතාවක් ප්‍රවර්ධනය කරයි.

# ඕසොන් වියන රැක ගන්න හරිත තාක්ෂණ වැඩසටහනක්

**බුද්ධිකා ඉඹුලාන**

පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ හා ඕසෝන් වියන සුරැකීම් ඒකකය ඕසොන් වියන රැක ගැනීම සඳහා වන හරිත තාක්ෂණය හඳුන්දීමේ දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබේ.

ඒ අනුව දිවයිනේ තාක්ෂණික විද්‍යාල සඳහා වායුසමීකරණ හා ශීතකරණ පාඨමාලා හදාරණ සිසුන්ට උපකාරී වන(Chloro Fluoro Carbon) CFC තොර නව උපකරණ කට්ටල නොමිලයේ ලබා දීම සිදු කෙරේ . මෙම වැඩ සටහන යටතේ ඉදිරි වසර දෙක තුළ රුපියල් මිලියන 200ක CFC තොර නව උපකරණ කට්ටල මෙරට තාක්ෂණික විද්‍යාල වෙත ලබා දීමට වායු සම්පත් කළමනාකරණ හා ඕසෝන් වියන සුරැකීම් ඒකකය කටයුතු යොදා ඇත.

කොළඹ මරදාන තාක්ෂණික විද්‍යාලයට හරිත තාක්ෂණය හඳුන්වාදීම සඳහා වන CFC තොර රුපියල් මිලියන 2ක් වටිනා නව උපකරණ කට්ටල මරදාන තාක්ෂණික විද්‍යාලයට පිරිනමපිරිනැමීම ඊයේ (9) පෙරවරුවේ පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

මෙහිදී අදහස් පළ කළ පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවැසුවේ ඕසොන් වියන රැක ගැනීම සඳහා මොන්ට්‍රියල් සම්මුතියට අනුව වසර 2045 දක්වා ක්‍රියාත්මක වැඩ සැලැස්මක් පරිසර අමාතයාංශය සතුව පවතින බවයි.

එමෙන්ම සමස්ත ලෝකයම 2080 වන විට ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන්වලින් (CFC) තොරවීම සඳහා කටයුතු කරමින් සිටින බවත් ඇමැතිවරයා අවධාරණය කළේය.

'ඕසොන් වියන රැකගැනීමට නම් අප කළ යුත්තේ වායු ගෝලයේ අඩංගු කාබන් ප්‍රමාණය අවම කර ගැනීමයි. වත්මන් රජය සෞභාග්‍යයේ දැක්ම යටතේ 2025 වනවිට මෙරට වනගහනය සියයට 30ක් දක්වා ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. පරිසර අමාතයංශය අරඹන ලද හුස්ම දෙන තුරු රුක් රෝපණ වැඩ සටහන අනුව යමින් මේ වන විට සියලුම රාජ්‍ය හා පුද්ගලික ආයතන රුක්රෝපණ වැඩ සටහන් ආරම්භ කිරීම සතුටක්.

# ළමා ආරක්ෂණයෙන් ශ්‍රී ලංකාව පහළ මට්ටමක

## ළමා හිංසනයට තිත පදනමේ ආරම්භක සභාපතිනී වෛද්‍ය තුෂ් වික්‍රමනායක



**ශිරෝමි අබයසිංහ**

සෑම පැය දෙකකට වරක්ම අප රටේ දරුවකු ලිංගික අතවරයට ලක්වන බව නිල සංඛ්‍යාලේඛනවලින් හෙළි වන බවත්, ශ්‍රී ලංකාව ළමා ආරක්ෂණය අතින් ලොව අනාරක්ෂිතම රටවල් 10% අතරට වැටී තිබෙන බවත් ළමා හිංසනයට තිත පදනමේ ආරම්භක සභාපතිනී වෛද්‍ය තුෂ් වික්‍රමනායක, මහත්මිය පැවසුවාය.

එම මහත්මිය මේ බව සඳහන් කළේ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ පසුගියදා පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

ළමා ආරක්ෂණයට බාධා එල්ල වන, දණ්ඩ නීති සංග්‍රහය තුළ ඇති විසමතා සංශෝධනය කිරීම සඳහා ක්ෂණික පිළියම් යෙදීමටත්, ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටත් රජයේ අනිවාර්ය වගකීම ඉටු කිරීමටත් නියෝග කරමින්, ශාරීරික දඬුවම්වලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය මෑත කාලයේ ලබා දුන්, ඉතාමත් සුවිශේෂී ළමා ආරක්ෂණ නඩු තීන්දුව කෙරෙහි, ළමා හිංසනයට තිත පදනමෙහි උපදේශන කටයුතුවලින්ද අනුබලයක් ලැබී තිබෙන බව, විශේෂඥ පිළි ගැනීම බවත් ඇය සඳහන් කළාය. එලෙසින් ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් වඩාත් උද්යෝගිමත් සටහනක් තැබූ ළමා හිංසනයට තිත පදනම, 'අඳුරු උරුමය නවතමු!' වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරමින් සිය තෙවන වර්ෂ පූර්ණය සැමරූ බවත් සිහිපත් කළාය.

මෙම සංවාදයට කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල දෙපාර්තමේන්තුවේ මහාචාර්ය සරත් විජේසූරිය, නීතිඥ අචලා සෙනෙවිරත්න, සමාජ ක්‍රියාකාරිනී සහ ළමා හිංසනයට තිත පදනමේ තානාපතිනි භූමි හරේන්ද්‍රන්, තරුණ ක්‍රියාකාරිනී සහ ළමා හිංසනයට තිත පදනමේ තරුණ තානාපතිනි ෂයිනුජා ඉන්පානාදන් මෙනවිය, ළමා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියක වන හිටපු ශ්‍රී ලංකා විවාහක රූ රැජින චන්දි අළුවිහාරේ මහත්මිය සහ ශ්‍රී ලංකා වෛද්‍ය පීඨයේ, රොටරැක්ට් සමාජයේ සභාපති තනුජ කොටවලගෙදර මහත්ම මහත්මීන්ගෙන් සැදුම්ලත් විද්වත් මඬුල්ලක් සහභාගී විය.

මෙම සංවාදයේදී සාකච්ඡාවට ගැනුනු ප්‍රධාන කාරණා ලෙසින් ශාරීරික දඬුවම් සහ මානසික අපයෝජනයන්ට එරෙහිව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම වෙත ඉදිරිපත් කෙරුණු 11 හැවිරිදි ශ්‍රී ලාංකික දැරියකගේ ඓතිහාසික අභියාචනය සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට ප්‍රශංසා කිරීම මෙන්ම, ජාතික ළමා ආරක්ෂණ අර්බුදය විසඳීම සඳහා රාජයේ පාර්ශ්වයට ඇති බලපෑම සෙනෙවිරත්න මහත්මිය පැහැදිළි කළාය. දරුවන් ආරක්ෂා කර ගැනීමට සමාජයේ සාමූහික වගකීමත්, මතු පරම්පරාවට ලබා දෙන දායාදයත් මහාචාර්ය විජේසූරිය මහතා අවධාරණය කළේය.

ළමා අපයෝජනය වැළැක්වීම සහ බල ගැන්වීම සඳහා දරුවන් හට අත්‍යවශ්‍ය ලිංගික අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම අළුවිහාරේ මහත්මිය පෙන්වා දුන් අතර, ළමයා අයිතිවාසිකම් දරන්නකු ලෙසින් පිළි ගැනීමේ අවශ්‍යතාව හරේන්ද්‍රන් මහත්මිය පැහැදිලි කළාය.

'පරපුරක අභියාචනය' මැයෙන් වූ පූර්වාදර්ශී විවාද මාලාව කොටවලගෙදර මහතා හඳුන්වා දෙනු ලැබිණි. ළමා ආරක්ෂණය වෙනුවෙන් පාසල් සිසුන් සෘජුවම සහභාගී වුණු පළමු අවස්ථාව මෙයයි. මෙහිදී ජයග්‍රාහී කණ්ඩායම් සඳහා සම්මාන පිරි නැමූ අතර, මහාචාර්ය විජේසූරිය මහතා රචිත ධනාත්මක විනය ක්‍රම පිළිබඳ ග්‍රන්ථ පරිත්‍යාග කළේය. ළමා හිංසනයට තිත පදනම පිරි නැමූ සම්මාන අතරින් සුවිශේෂී සම්මානයක් ලෙසින්, අපයෝජනයට ගොදුරු වූ ළමුන් සම්බන්ධ සිද්ධි 10ක අධ්‍යයන එකතුවක් ලිවීම වෙනුවෙන් 'හොඳම කථිකයා' සඳහා ප්‍රදානයක් පිරි නැමිනි. එම අධ්‍යයන එකතුව, ළමා හිංසනයට තිත පදනම නුදුරේදී පළ කිරීමට නියමිතය.

ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රගතිශීලී වෙනස්කම් ඇති කිරීම පිණිස සිවිල් සමාජ සංවිධාන සමඟ රජය සමීපව කටයුතු කිරීමේ අවශ්‍යතාව මෙම සංවාදයේදී අවධාරණය කෙරුණු අතර, අපගේ අනාගතයේ සැබෑ හිමිකරුවන් වන දරුවන් සඳහා සමානාත්මතාව, යුක්තිය සහ බලාපොරොත්තුව සහතික කිරීමට කටයුතු කරන ලෙස, ළමා හිංසනයට තිත පදනම, සියලු පුරවැසියන්ගෙන් ඉල්ලා සිටියේය.

මේ පිළිබඳ වැඩිදුර විස්තර www.stopchildcruelty.com වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

# දියුණු වූ සෑම රටක්ම එතැනට ආවේ නිපුණතාව සහිත ශ්‍රම බළකායක් බිහි කිරීමෙන්

## විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම

**තමරසිරි විජේසේකර දෙයියන්දර සමූහ යුවන්ත නෙත්සර මුලටියන විශේෂ**



ලෝකයේ දියුණු වූ සෑම රටක්ම, ජාතියක්ම ඒ තත්ත්වයට පත්වූයේ, නිපුණතාවය සහිත ශ්‍රම බළකායක් තුළින්. තාරුණ්‍යය නිපුණතාවයෙන් සන්නද්ධ කිරීමේ වැඩසටහනට නායකත්වයක් සපයන්නේ, වෘත්තීය පුහුණු අධිකාරියෙන්. මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලනමය වැඩිමල් දරුවා තමයි මේ වෘත්තීය පුහුණු අධිකාරිය. ඒ අනුව වෘත්තීය පුහුණු අධිකාරිය මේ රටේ ශ්‍රේෂ්ඨතම නායකයෙකුගේ පීතෘත්වයෙන් බිහි වූ ආයතනයක්. ඒ නිසා විභාගය අසමත් වීම, ජීවිතය අසමත් වීම නොවන බව විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා කඹුරුපිටියේදී පැවැසීය.

ඇමැතිවරයා මෙමෙ අදහස් පළ කළේ ගමින් ගමට ජාතික වැඩසටහන යටතේ පසුගියදා කඹුරුපිටිය මැතිවරණ කොට්ඨාසයේ තරුණ තරුණියන් වෙනුවෙන් වෘත්තීය පුහුණුව පිළිබඳ දැනුවත් කිරීම හා NVQ සහතික පත් ප්‍රදානය කිරීම වෙනුවෙන් සංවිධානය කර තිබූ උත්සව අවස්ථාවකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පැවැසීය.

වර්තමාන රාජ්‍ය නායකයා වශයෙන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාටත් අවශ්‍යවෙලා තිබෙන්නේ නිපුණතාවයෙන් පිරිපුන් තාරුණ්‍යයක් බිහි කිරීමයි. කඹුරුපිටියේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මේවන විට තිබෙන්නේ පාඨමාලා 06ක් පමණයි. අපි තීරණය කළා පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලත්, පුහුල්වැල්ල නව ගොඩනැගිල්ලකුත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ලබා දෙන්න. ඒ වගේම වෙළඳපළ ඉල්ලන ආකාරයේ වෘත්තීය පුහුණු පාඨමාලා ඇති කරන්නත් අපි අවශ්‍ය පියවර ගන්නවා. රට සංවර්ධනය කරා ගෙනියන්න නම්, තරුණ පරම්පරාව නිපුණතාවයෙන් හා ජාත්‍යන්තර භාෂාවන්ගෙන් සන්නද්ධ කිරීම හැර වෙනත් විකල්පයක් නැහැ .

ලංකාවේ විදුලි කාර්මිකයන් සිටින්නේ 45,000ක් පමණයි. අපේ කාලයේ අපි NVQ 3 විදුලි කාර්මික පාඨමාලාවක් ආරම්භ කළා. එවකට විදුලිබල ඇමතිතුමිය වූ පවිත්‍රා වන්නිආරච්චි මැතිනියත් සමගින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර මේ පාඨමාලාව සඳහා යොමු වූ සියල්ලන්ම විදුලිබල මණ්ඩලයට බඳවා ගැනීමටත් කටයුතු කළා. නමුත් පසුකාලීන්ව මේ NVQ 3 හිමිකර ගත් දරුවන් පැත්තකට දාලා, ඡන්ද වලට පොස්ටර් බැනර් ගහපු කැන්වසින් ගිය පිරිසක් එම රැකියා අවස්ථාවන් ආක්‍රමණය කළා. මේ රටේ ඉන්න විදුලි කාර්මිකයන් 45,000ක් තුළින් NVQ 3 මට්ටමේ සුදුසුකම් සහිත පිරිස සිටින්නේ 5000ක් පමණයි. ලංකාවෙම NVQ 3 තිබෙන අය පමණක්ම නොවෙයි, මෙම විදුලිකාර්මික ශිල්පය හැදෑරූ සියලු දෙනාටම පෙර දැනුම් පරීක්ෂාව යටතේ 40,000 කට NVQ 3 මට්ටම දෙන්න අපි නව වැඩපිළිවෙලක් සකස් කර තිබෙනවා.

ඒ අයට ඒ තුළින් ලංකා විදුලිබල මණ්ඩලයට, විදුලි පුද්ගලික සමාගමට ඇතුළත් වෙන්න අවස්ථාවක් හිමිවෙනවා. ඉදිරියේදී ලංකාවේ කුඩා විදුලි බලාගර 7000ක් ඉදිවෙනවා. නමුත් කාර්මික ශිල්පීන් අඩුයි. ඒ නිසා රජයේ රැකියාවක් නොලැබීම ජීවිතයේ අවසානය කියලා හිතන්න එපා යැයි ද ඇමැතිවරයා වැඩිදුරටත් පැවසීය.

# "කළු ඉරිදා"වෙන් විරුද්ධ පක්ෂය වාසි ගැනීමට උත්සාහ කළා

## රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

**උපාලි කරුණාරත්න**



"කළු ඉරිදා" දිනයේදී විරුද්ධ පක්ෂයේ දේශපාලඥයන් එය ආණ්ඩු විරෝධයක් ලෙස පෙන්වා දේශපාලන වාසි ගැනීමට උත්සාහ කළ බව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවැසීය.

"කළු ඉරිදා" දිනය සංවිධානය කළේ පාස්කු ප්‍රහාරයෙන් හානියට පත් කතෝලික ජනතාවට නීතිය හා සාධාරණත්වය ඉටු කිරීම වෙනුවෙන් සටන් කරන බව පෙන්වීමට බව ද රාජ්‍ය ඇමැතිවරයා මෙහිදී ප්‍රකාශ කළේය.

එදා පාලක පක්ෂයේ සිට වර්තමානයේ විපක්ෂයේ සිටින ඇතැම් දේශපාලඥයන් වර්තමානයේ මැරිලා ඉපදුනා සේ කතා කරන බව ද ඉන්දික අනුරුද්ධ මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේ "ඔබට ගෙයක් - රටට හෙටක්" ජාතික නිවාස වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ,දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නව නිවාස 10ක් ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවට පසුගියදා (08) සහභාගි වෙමිනි.

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දාගොන්න නැගෙනහිර, හමුවලාන උතුර, කෙහෙල්ඇල්ල, පොල්හේන, දියගම්පල, පරගොඩ උතුර සහ දකුණ, කුලීගෙදර, අස්සැන්නවත්ත නැගෙනහිර සහ පින්නලන්ද ප්‍රදේශවලදී මෙම නිවාස විවෘත කිරීම් සිදුකරන ලදී.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා -

තාත්තා කතා කරලා කිව්වහම පුතාට පල්ලියට යන්න එපා බෝම්බ ගහනවා කියලා ඒ තොරතුරු දැනගෙන රෙදි පොරවගෙන නිදාගත්තු අය අද හිතනවා කළු ඉරිදාව කතෝලික ජනතාව ආණ්ඩුවට විරෝධයක් දක්වනවා කියලා. කතෝලික ජනතාව ප්‍රකාශ කරන්නේ තමන්ගේ වේදනාව. කාදිනල්තුමන් රටට ලෝකයට කියන්නේ ව්‍යසනයට පත්වූ ජනතාව වෙනුවෙන් වගකියනවා කියලා.

එම දිනයේදී සමහරුන් කළු ඇඳගෙන කොළ කොඩිත් දාගෙන සිටියා. මේ දෙක වෙනස්. හරීන්ලට ඕනේ නෑ කළු අඳින්න. හරීන්ට පුළුවන් අනුර කුමාරගෙන් අහන්න ඊබ්‍රාහිම් සමඟ කළ ගණුදෙනු මොනවද ? පක්ෂයට කොපමණ උදව් කළාද ? ඊබ්‍රාහිම්ගේ පුතා මරාගෙන මැරෙන බෝම්බයක් බැඳගෙන ගොස් මැරෙනකම් තොරතුරු මොනවාද කියා. එයට කමිටු වාර්තා ඕනේ නෑ.

බෝම්බ පුපුරවාගත් මිනිස්සු පිළිබඳව හකීම් ක්‍රියා කළේ කොහොමද?.මේ ඔක්කොම සමගි ජන බලවේගය සහ සජිත් ප්‍රේමදාස සමඟ අද ඉන්නේ එකට වාඩි වෙලා.

පාස්කු ප්‍රහාරය පිළිබඳ කොමිසම් සභා වාර්තාව පාර්ලිමේන්තුවට, කැබිනෙට්ටුවට එවලා තියෙනවා. ඉස්සර කමිටු පත්කළා මිසක් එතනින් එහාට ගියේ නෑ. පාස්කු ප්‍රහාරයේ කොමිසම් සභා වාර්තාව මහානායක ස්වාමීන් වහන්සේලාට, කාදිනල්තුමාට, පාර්ලිමේන්තුවට සහ කැබිනට් මණ්ඩලයට අද දී තිබෙනවා. සියලු දෙනාට එය අධ්‍යයනය කරන්න පුළුවන්.

පසුගිය රජය වගේ අපිට බැහැ බොරුවට අල්ලන් ගිහිල්ලා පළිගැනීම් සිදුකරන්න. පසුගිය රජය සිදුකළ පළිගැනීම් ජනතාව හොඳින් දන්නවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගෙන්, ජොන්ස්ටන් ඇමැතිවරයාගෙන්, නාමල් රාජපක්ෂ ඇමැතිවරයාගෙන් පසුගිය රජය පළිගැනීම් සිදු කළා.

# වෘත්තීය සමිතිවල ප්‍රධාන නිලතලවලින් සාධාරණ ප්‍රතිශතයක් කාන්තාවන් අනිවාර්යෙන්ම සිටිය යුතුයි

## කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා

**අනුර ප්‍රේමලාල්**



මේ රටේ වැඩ කරන ශ්‍රම බළකායෙන් 35% කාන්තාවෝ වන අතර, වතු ආර්ථිකය තුළත් විදේශ රැකියා ක්ෂේත්‍ර තුළත් කම්හල්වලත් වැඩි වශයෙන්ම සේවය කරන්නේ කාන්තාවන්. එසේම කම්කරුවාගේ සිට පරිපාලන නිලධාරියා දක්වා විවිධ තලයන්හි කාන්තාවන් සේවය කරන නමුත් මෙරට වෘත්තීය සමිති දෙස බලන විට, ඒවායේ නිලතල වලට කාන්තාවන් පත් වී නැහැ. එබැවින් වෘත්තීය සමිති විවිධ කාරණා සම්බන්ධව සාකච්ඡා කරන්න මා හමුවට පැමිණෙන අවස්ථාවල එම නියෝජිත මණ්ඩලවල පවා කාන්තා නියෝජනයක් දක්නට ලැබෙන්නේ නැහැ. එම නිසා වෘත්තීය සමිතිවල ප්‍රධාන නිලතල වලින් සාධාරණ ප්‍රතිශතයක් කාන්තාවන් අනිවාර්යෙන්ම සිටිය යුතු බවට කම්කරු වෘත්තීය සමිති ආඥා පනත වෙනස් කිරීමට කාලය එළඹ ඇති බව කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා පවසයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඉකුත් (8) කම්කරු අමාත්‍යාංශයේ පැවැති ජාත්‍යන්තර කාන්තා දින සමරු උත්සවයේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඇමැතිවරයා මෙසේද කීය.

මේ රටේ දේශපාලනයේ තවමත් කාන්තාව සිටින්නේ පිරිමියාට පිටුපසින්. පළාත් පාලන ආයතනවල 25%ක කාන්තා නියෝජනය අනිවාර්ය කළ යුතු බවට යෝජනාව ව්‍යවස්ථාවට ඇතුළත් කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. ඒ වගේම වත්මන් රජයේ යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද පාර්ලිමේන්තුවේත් පළාත් සභාවලත් අනිවාර්යෙන්ම 25% කාන්තා සහිත නියෝජනයක් තිබිය බවට යෝජනාවක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෙන එනවා. මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට විශාල ශ්‍රම දායකත්වයක් දෙන වතු කම්කරු ජනතාවට වැඩබිමක තිබිය යුතු අවම පහසුකම් එම වැඩ කරන ජනතාවට දීමටත් ඔවුන්ගේ රැකියා සුරක්ෂිත කරදීමටත් මේ වසරේ දී කම්කරු දෙපාර්තමේන්තුව විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයි.

එසේම අපේ රටට විදේශ විනිමය උපයා දෙන ප්‍රධාන සාධකයක් වන එම විදේශ රැකියාවල නියුතු කාන්තාවන් සූරා කෑමට ඉඩ දිය නැති බවත්,ඔවුන්ට ශක්තිමත් රක්ෂණ ආවරණ ලබාදිය යුතුයි. වෘත්තීය සමිතිවල පවතින පුරුෂාධිපත්‍ය අවසන් කළ යුතුයි. විශාල කාන්තාවන් ප්‍රමාණයක් සාමාජිකත්වය දරන වතු වෘත්තීය සමිතිවල ද ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් දක්නට ලැබෙන්නේ නැත.එම නිසා කාන්තාවන්ට වෘත්තීය සමිතිවල ද සාධාරණ නියෝජනයක් දීම සඳහා පවතින අණ පනත් යථාවත් කළ යුතුයි. මෙරට කම්කරු නීති හා ළමා ශ්‍රමය පිළිබඳව බාලදක්ෂිකාවන් දැනුවත් කිරීම හා බාලදක්ෂිකාවන් මගින් පරිවාර සමාජය දැනුම්වත් කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීමට අදාළව අවබෝධතා ගිවිසුමක් මෙහිදී අත්සන් කරනු ලැබීය. මෙහි විශේෂත්වය වන්නේ ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධව කටයුතු කරන බාලදක්ෂිකාවන්ට ඒ සම්බන්ධව ළමා ශ්‍රමය පිටු දැකීමේ බාලදක්ෂිකා පදක්කම පිරිනැමීමට මෙහිදී තීරණය කළ බව කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා පවසයි .එසේම සෑම සේවකයෙකු සතුව තිබිය යුතු තමන්ගේ වෘත්තීය ඉතිහාසය සටහන් කරගත යුතු රැකියා වාර්තාව නම් නව උපදෙස් පොතක් ද මෙහිදී එළිදක්වනු ලැබීය.

මෙම අවස්ථාවට කම්කරු අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ, මහතා කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහත්වරු ද, ලෝක කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත සිම්රින් සිං, බාලදක්ෂිකා කොමසාරිස් සුලාරි ජයවර්ධන මහත්මීහු ද එක් වූහ.

# නිෂ්පාදන කේන්ද්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පණිවිඩය කොරෝනා ලබා දුන්නා

## බලශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල

**උපාලි කරුණාරත්න**



නිෂ්පාදන කේන්ද්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පණිවිඩයක් කොරෝනා ලබා දුන් බව බලශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල මහතා පැවැසීය.

ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ, දේශීය කර්මාන්ත සහ කර්මාන්තකරුවන් නගා සිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ කොළඹ දිස්ත්‍රික් සමාරම්භක වැඩසටහනට පසුගියදා (07) සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සහභාගි වෙමිනි. ප්‍රධාන ආරාධිතයා ලෙසින් එම අවස්ථාවට එක් වූ සීතාවක ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති බලශක්ති ඇමැති උදය ගම්මන්පිල මහතා වැඩිදුරටත් මෙසේ පැවැසීය.

1977 ඉඳන් අපේ රටේ බිහි වුණා අලුත් සංස්කෘතියක්. පිට රට දේ සිරි සැප දේ. භාණ්ඩයක් ගත්ත ගමන් බලන්නේ "මේඩ් ඉන්" (Made in) කොහෙද කියලයි. මේඩ් ඉන් ජර්මන්, එහෙම නැත්නම් අපට නොතේරෙන අකුරු ටිකක් ගහලා තියෙනවා නම් අපිට හරිම සන්තෝෂයි. මේක අහවල් රටේ හදලා තියෙන්නේ කියලා අපි පෙන්නනවා, කියනවා. සමහර විට කෝප්පෙන් තේ එක දෙන්නෙත් මේඩ් ඉන් කියන එක පේන්න. ඕක මේ අපේ රටේ එකක් නෙවෙයි, ජපානෙ. මේක ජර්මන් මැෂිමක්. අපි හරි ආඩම්බරයෙන් කිව්වේ. ඒ ආඩම්බරය කොච්චර ඔළුවට ගැහුවා ද කියනව නම් අපි පාසල් යන කාලේ ඇමරිකානු කොඩිය සහ බ්‍රිතාන්‍ය කොඩිය එකට තියන ගමන් මල්ලක් තමයි පාසල් යන දරුවන්ගේ ගමන් මලු අතර ජනප්‍රියම ගමන් මල්ල. අපි හරි ආඩම්බරයි, අපේ ජාතික කොඩියට වඩා අමෙරිකානු ජාතික කොඩියක් අපේ පිටේ එල්ලිලා තියෙනවා දකින්න. අපිව යටකරගෙන පාගගෙන හිටිය සුද්දගෙ ජාතික කොඩිය අපි හරි ආඩම්බරයෙන් තමයි ගහගෙන හිටියෙ. ඒකට තමයි පිට රට දේ සිරි සැප දේ කියන්නෙ.

ඒ නිසා අද අපි ලොකු ආර්ථික අර්බුදයකට පත් වෙලා. 2019 වර්ෂය දී අප පිටරට බඩු විකුණලා හම්බ කරල තිබෙන්නේ ආසන්න වශයෙන් ඩොලර් බිලියන 12යි. නමුත් පිටරටින් බඩු ගෙන ඒමට අප වියදම් කරලා තිබෙනවා ඩොලර් බිලියන 20ක්. ඩොලර් බිලියන 8ක පරතරයක් තිබෙනවා. කොහොමද අප මේක පියවා ගන්නෙ. අපේ රටට සංචාරකයින් ආවා. විදේශ ආයෝජන ආවා. බුරුතු පිටින් ණයත් ගත්තා. පිටරට ඉන්න අය අපට වසරකට ඩොලර් බිලියන හයක් අටක් අතර ගණනක් එව්ව. ඒවායින් තමයි අප මේ පරතරය පියවා ගත්තෙ. ඊට අමතරව ඩොලර් බිලියන 6ක විතර ණය අපට ආපසු ගෙවන්නත් තිබෙනවා. නමුත් 2020 වසරේදී වසංගතය නිසාම පිටරට ඉන්න අයගේ රැකියා අහිමි වෙලා දස දහස් ගණනින් ලංකාවට එන්න පටන් ගත්තා. මේ වන විට ලක්ෂයකට ආසන්න පිරිසක් පැමිණ ඒ වගේම පැමිණෙන්නත් බලාපොරොත්තුවෙන් ඉන්නවා. සංචාරකයන්ගේ පැමිණීම විදේශ ආයෝජන බිංදුවට වැටුණා.

එවිට තමයි අපට මතක් වුණේ සිරිලක දේ සිරි සැප දේ කිව්වා නම් මීට වඩා හොඳයි නේද කියලා. පිටරටින් ගේන එක සීමා කරන්න ආණ්ඩු ඉතා වැදගත් ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තා. මුලින්ම තීරණය කළා අනවශ්‍ය දේවල් පිටරටින් ගේන එක නතර කරන්න. අපේ රටේ හදන්න පුළුවන් සෑම දෙයක්ම පිටරටින් ගේන එක අප සීමා කළා. අපේ රටේ නිෂ්පාදනයට අප යොමු වෙන්නට ඕනෑ. නිෂ්පාදන කේන්ද්‍රීය ආර්ථිකයක් හදන්න අපේ අය හිතන්නට පටන් ගත්තා. අපට එහෙම සිතිය යුතු යැයි බල කරන්නට කොරෝනා පැමිණ පණිවුඩයක් දුන්නා.

කොළඹ දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න, සීතාවක ප්‍රදේශීය සංවර්ධන කමිටුවේ නියෝජ්‍ය සභාපති නීතිඥ රවීන්ද්‍ර ජයසිංහ හිටපු පළාත් සභා මන්ත්‍රී සුමිත් සොයිසා සීතාවක නගර සභාවේ නගරාධිපති රණවීර කුරුකුලආරච්චි යන මහත්වරුන් සහ සීතාවක ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් ප්‍රදේශයේ නිශ්පාදන ගම්මානයන්හි කර්මාන්තකරුවන්, ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්විය.

# ඇඟලුම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ වෘත්තීය ගරුත්වය රැකීම සැමගේ වගකීමක්

## ඇඟලුම් සේවිකා නියෝජිතවරියෝ කියති



කාන්තාවගේ වටිනාකම හා වැදගත්කම කාන්තා දිනයේදී පමණක් නොව වසර පුරාම යොමු විය යුතු බැවින් පුරුෂාධිපත්‍යය මුල් කරගත් මෙරට ජන සමාජය තුළ කාන්තාවගේ භූමිකාව වඩාත් සුරක්ෂිත කිරීමට රජය මැදිහත් විය යුතු බව කාන්තා දිනය නිමිත්තෙන් පසුගියදා කොළඹ දී පැවති මාධ්‍ය හමුවට එක් වූ ඇඟලුම් ක්ෂේත්‍රයට සම්බන්ධ නියෝජිතවරියෝ කියා සිටියහ. ඒකාබද්ධ ඇඟලුම් සංසදයේ සාමාජික ශ්‍රී ලංකා ඇඟලුම් වාණිජ මණ්ඩලයේ (SLCGE Member of JAAF) ඇඟලුම් ක්ෂේත්‍රය තුළ රැකියාවේ නිරත කාන්තා පාර්ශ්ව සහභාගීත්වයෙන් මේ මාධ්‍ය හමුව පැවැත්විණි.

ඇඟලුම් ක්ෂේත්‍රයට සම්බන්ධ කාන්තාවන්ගේ ඇතැම් සිදුවීම් ඉස්මතු කරමින් සමස්ත ක්ෂේත්‍රය තුළ සිටින සෙසු කාන්තාවන් අවමානයට ලක්වන ආකාරයේ මාධ්‍ය පුවත් සංසරණය වීම, කලා කෘති හා විවිධ මාධ්‍ය තුළින් එවැනි සිදුවීම් අළලා ඇඟලුම් ක්ෂේත්‍රයට පිවිසී සිටින කාන්තාවගේ වෘත්තීය ගරුත්වය හෙළා දැකීම කනගාටුදායක කරුණක් බැවින් එම තත්ත්වය මග හරවා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙළක් කඩිනමින් සකස් විය යුතු බව මාධ්‍ය හමුවට එක්වූ කාන්තා නියෝජිතවරියන්ගේ ඉල්ලීම විය.

කාන්තා මූලික කර්මාන්ත ක්ෂේත්‍රයක් වන ඇඟලුම් කර්මාන්තය තුළ එම කර්මාන්ත හිමිකරුවන් ඔවුන්ගේ ගැටලු කෙරෙහි විශේෂ අවධානයක් දක්වන අතර, මාසික වැටුපට අමතරව, දිරි දීමනා, පැමිණීමේ දීමනා හා වෙනත් දීමනා දෙමින් ඔවුන්ගේ ආර්ථිකය ස්වයංපෝෂිත කිරීමට විශාල දායකත්වයක් ලබා දෙමින් සිටින බවත්, නොමිලේ නිල ඇඳුම්, ප්‍රවාහනය, විනෝදාස්වාද අංග, වාර්ෂික විනෝද චාරිකා නොමිලේ ආහාරපාන සපයමින් විශාල දිරියක් දෙන බවත් මාධ්‍ය හමුවට එක් වූ නියෝජිතවරියක් කියා සිටියාය.

විශේෂයෙන් කොවිඩ් වසංගත සමයේ දී දැඩි දුෂ්කරතා හමුවේ වුවද ඇඟලුම් ආයතන පරිපාලනය දැඩි පසුබෑමකට ලක්වූ සිය සේවක සේවිකාවන්ගේ එදිනෙදා ආර්ථික ගැටලු හැකි උපරිමයෙන් විසඳා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමත්, වැටුප් ගෙවීමට කටයුතු කිරීමත් කාන්තා නියෝජිතවරියෝ පැසසුමට ලක් කළහ. එම කාලය තුළ සෞඛ්‍ය අංශ විසින් පනවන ලද නීතිරෙගුලාසි අනුගමනය කරමින් සිය සේවක සේවිකාවන්ගේ සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ වැඩි අවධානය යොමු කිරීමත්, නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යෑමට අවශ්‍ය පසුබිම සකස් කරමින් ඔවුන්ගේ රැකියා සුරක්ෂිත කිරීමට කටයුතු කිරීමටත් මේ අවස්ථාවට සහභාගි වූ කාන්තා නියෝජිතවරියන්ගේ දැඩි පැසසුමට ලක් විය. එමෙන්ම කොඩ්ඩ් වයිරසය ආසාදනයට ලක්වූ සහ ඔවුන්ගේ ළඟම ආශ්‍රිතයන් බවට පත් වූ සේවක සේවිකාවන් වෙනුවෙන් නිරෝධායන මධ්‍යස්ථාන ස්ථාපිත කරමින් අමිල මෙහෙවරක් ඉටු කිරීමට බොහෝ ඇඟලුම් ආයතන පියවර ගැනීමත්, එතුළින් එම සේවක සේවිකාවන්ට මෙන්ම ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට ද විශාල සහනයක් ලැබී තිබීමත් සිහිපත් කරමින් ඊට කෘතවේදිත්වය පළ කිරීමට ඇඟලුම් සේවිකාවන් නියෝජනය කළ එම කාන්තාවෝ අමතක නොකළහ.

# කොඳුඇටපෙළ ඇදවීමේ රෝගයෙන් පීඩාවිඳින පුංචි තාරුක

**තමරසිරි විජේසේකර දෙයියන්දර සමූහ**



මාතර, බෙරලපනාතර, පට්ටිගල පන්සල වත්ත, නිවසේ ජීවත් වන පුංචි තාරුක කාලයක සිට කොඳුඇටපෙළේ රෝගී තත්ත්වයකින් පීඩා විඳින්නේය. අවුරුදු 12ක් වයසැති මේ දරුවාට වැලඳී ඇත්තේ අති දුර්ලභ රෝගයකි. කොඳුඇටපෙළ ඇදවීමේ රෝගයයි. මේ රෝගී තත්ත්වයට ඖෂධ ප්‍රතිකාර නොමැති බවත්, දරුවාගේ වර්ධනයත් සමග 2-14 වයස් පරතරය තුළ වරින් වර සැත්කම් කිහිපයකට යොමු කිරීමට සිදුවන බවත් වෛද්‍යවරුන් පවසා ඇත.

මේ සම්බන්ධයෙන් දරුවාගේ මව මෙසේ පැවැසුවාය.....

මගේ පුතාගේ වයස අවුරුදු 7 1/2 දී තමයි මේ රෝගී තත්ත්වය හඳුනා ගත්තේ. පුතාගේ වර්ධනයත් සමග කොඳුඇටපෙළ ඇදවීමත් වැඩි වුණා.

වෛද්‍යවරු කියන්නේ කොඳුඇටපෙළේ ඇද වන ස්ථානයේ විශේෂිත උපකරණ සවිකරමින් දරුවාගේ වර්ධනයත් එක්කම එම උපකරණ වෙනස් කරන්න ඕනය කියලා. 2013 - 2014 වර්ෂ වල සැත්කම් දෙකක් සිදු කළා. ආබාධිත තත්ත්වයේ ජීවත්වෙන හිරුෂාන් තාරුක 2018 වසරේ පැවති ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 173ක් ලබාගෙන සමත්වීමට දක්ෂ විය. මේ වන විට 8 වන වසර ඉගෙනුම ලබන තාරුකගේ ජීවිතය තවමත් අනතුරේය. වෛද්‍යවරුන් පවසන ආකාරයට ඔහුට තවත් සැත්කමක් සිදු කිරීමට සිදුවී ඇත. ඒ සඳහා රුපියල් ලක්ෂ 35ක මුදලක් වැයවන බව වෛද්‍ය මතය වී තිබේ.

මේ කාරණා හමුවේ තාරුකගේ මව අන්ත අසරණය. ලක්ෂ 35ක් යනු ඔවුන්ට සිහිනයක් වැනිය. එහෙත් තාරුකට ජීවිතයෙන් පරදින්නට දිය නොහැක. තාරුකට ජීවිතය ලබා දෙන්න අප ඔබ අත්වැල් බැඳ ගත යුතුය. ඒ සඳහා කළ යුත්තේ පුංචි උපකාරයකි. ඌරුබොක්ක මහජන බැංකුවේ විවෘතව තැබෙන 271200140042172 බැංකු ගිණුමට හෝ ඌරුබොක්ක හැටන් නැෂනල් බැංකුවේ විවෘත 199020047444 ගිණුම් අංක වලට හැකි පමණ මුදල් බැර කිරීම පමණි.

වැඩි විස්තර දැනගැනීම අවැසි ඔබට 0717576945/0783624315 දුරකතන අංක වලට කතා කළ හැකිය. ඔබගේ ප්‍රමාදය තාරුකගේ දිවි ගමන නතර කිරීමට හේතු විය හැකි බැවින් කළ හැකි උපකාරය කඩිනමින් කළ යුතුව ඇත .



## දවසේ රාහු කාලය

11 බ්‍රහස්පතින්දා දහවල් 01.50 සිට 03.21 දක්වා - අලුයම 01.50 සිට 03.20 දක්වා

## දින තත්ත්වය

කුම්භ රවි 27 භාග නවමි අව තෙලෙස්වක තිථිය ලත් ගුරු දින ඉර උදාව 06.19ට ඉර බැසීම 06.22ට දෙනට නැකත රාත්‍රී 09.49න් ගෙවී සියාවස නැකත ලබයි. නවමි අව තෙළෙස්වක තිථිය දහවල් 02.44න් ගෙවී අව තුදුස්වක තිථිය ලබා පවතී. ශිව යෝගය උදේ 9.26න් ගෙවී සිද්ධ යෝගය ලබයි. ගරජකරණය අලුයම 02.46න් ගෙවී වණිජකරණය ලබා එය දහවල් 02.44න් ගෙවී විෂ්ටිකරණය ලබයි. විෂ කලාව දණහිස - අමෘත කලාව කෙණ්ඩ මරු - දකුණ සුබ දිසාව නැගෙනහිර

**සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී අජිත් ධර්මසිරි**

## දවසේ කාල හෝරාව ගෙවී යන අයුරු

මාර්තු 11 බ්‍රහස්පතින්දා

**උදේ**

06.19 සිට 07.19 දක්වා - ගුරු හෝරාව
07.19 සිට 08.19 දක්වා - කුජ හෝරාව
08.19 සිට 09.19 දක්වා - රවි හෝරාව
09.19 සිට 10.19 දක්වා - සිකුරු හෝරාව
10.19 සිට 11.19 දක්වා - බුධ හෝරාව
11.19 සිට 12.19 දක්වා - සඳු හෝරාව

**සවස**

12.19 සිට 01.19 දක්වා - සෙනසුරු හෝරාව
01.19 සිට 02.19 දක්වා - ගුරු හෝරාව
02.19 සිට 03.19 දක්වා - කුජ හෝරාව
03.19 සිට 04.19 දක්වා - රවි හෝරාව
04.19 සිට 05.19 දක්වා - සිකුරු හෝරාව
05.19 සිට 06.19 දක්වා - බුධ හෝරාව

**රාත්‍රී**

06.19 සිට 07.19 දක්වා - සඳු හෝරාව
07.19 සිට 08.19 දක්වා - සෙනසුරු හෝරාව
08.19 සිට 09.19 දක්වා - ගුරු හෝරාව
09.19 සිට 10.19 දක්වා - කුජ හෝරාව
10.19 සිට 11.19 දක්වා - රවි හෝරාව
11.19 සිට 12.19 දක්වා - සිකුරු හෝරාව

**අළුයම**

12.19 සිට 01.19 දක්වා - බුධ හෝරාව
01.19 සිට 02.19 දක්වා - සඳු හෝරාව
02.19 සිට 03.19 දක්වා - සෙනසුරු හෝරාව
03.19 සිට 04.19 දක්වා - ගුරු හෝරාව
04.19 සිට 05.19 දක්වා - කුජ හෝරාව
05.19 සිට 06.19 දක්වා - රවි හෝරාව

**බබාට නමක්**

මෙදින රාත්‍රී 09.49 දක්වා දෙනට නැකත උදාව පවතින අතර එදින උපදින දරුවන්ට නම් තැබීම ග, ගි, ගු, ගේ යන අකුරුත් ඉන්පසු සියාවස නැකත උදාව පවතින නිසා ගො, ස, සි, සු යන අකුරුත් බ්‍රහස්පතින්ද හිමි අක්ෂර ත, ද, ධ, න යන අකුරු මුල්කොට නම් තැබීම සුබයි.



අද සුබසෙත

## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - රැකියා අභිවෘද්ධිය

මේෂ ලග්නයට අනුව අද දින ඔබට සිය රාජකාරි ස්ථානය වෙනුවෙන් විශාල වැඩ කොටසක් පැවරේ. ඒවා ඉටු කිරීමට මහත් පරිශ්‍රමයක් දරන්නට සිදුවන අතර, එය ප්‍රධානීන්ගේ මහත් ප්‍රසාදයට පත්වේ. ධන සම්පත් අතින් ද උසස් ප්‍රතිඵල උදාවන අතර, ගෘහ ජීවිතය සතුටුදායක වෙයි. රජයේ වගකිවයුතු නිලධාරීන්ගේ ඇස ගැටෙන ඔබට ඒ අයගේ අනුග්‍රහය ද හිමි වේ. සම්මුඛ පරීක්ෂණ ආදියෙන් සමත්වීමට ඔබට වාසනාව උදාවන අතර සිතේ සතුට පවතින දිනයකි.

### වෘෂභ ලග්නය - ආර්ථික ප්‍රතිලාභ

වෘෂභ ලග්නය හිමි ඔබට අද දින වෙහෙස මහන්සියේ තරමට ප්‍රතිඵල උදා වේ. සමීපතමයින් කීප දෙනෙකු සමග දුර බැහැරක යාමට සිදු වේ. එහිදී ඔබට කිසියම් ආර්ථික ප්‍රතිලාභයක් ද හිමි වීමට නියමිතය. ආගමික ස්ථානයක සිදු කෙරෙන ආගමික කටයුතුවලට ද සහභාගී වීමට ද ඔබට හැකි වේ. කලක් පැවති අධ්‍යාපන කටයුත්තකින් නිදහස් වීමට හැකි වේ. නව නිවසකට යාමට හා නිවස අලුත්වැඩියා කිරීමට පෙලඹෙන දිනයකි. තම අලංකාරය ගැන සිතා නව ඇඳුම් පැලඳුම් පිළිබඳව ද සිතන දිනයකි.

### මිථුන ලග්නය - වංචාකාරයකුට හසුවේ

මිථුන ලග්නයට අනුව අද දින ඔබට කිසිවකුගේ වංචා කිරීමක් නිසා ආර්ථික පාඩුවක් විය හැකිය. තම අසල්වැසියකුගේ විපත්දයී කරුණකදී මුල්වී කටයුතු කිරීමට ද සිදු වේ. තමාගේ ද තුනටිය ආශ්‍රිත උවදුරු පෙන්වන නිසා කල්පනාකාරී විය යුතුය. වාහනයක් මිලදී ගැනීමකදී ඔබ වංචාකාරී පුද්ගලයකුගේ ක්‍රියාවකට හසුවීම නිසා අසහනකාරී මානසිකත්වයකට පත්වීමට සිදු වේ. නමුත් ඔබට කලක් ඈත්ව සිටි මිතුරකුගේ ආගමනයක් නිසා යළි ජීවිතය ගොඩනගා ගැනීමට හැකිවේ.

### කටක ලග්නය - දවසේ කටයුතු ප්‍රසාදයෙන්

කටක ලග්නයට අනුව අද ඔබට ඉතා සුබ දිනයකි. චන්ද්‍රයා 07 වැන්නේ විවාහ අපේක්ෂකයින්ට විවාහවලද නව වෘත්තීය කටයුත්තකට අතගැසීම ද සිදු වේ. යහපත් මානසික තත්ත්වයෙන් දවසේ කටයුතු ප්‍රසාදයෙන් කරගෙන යාමට අවස්ථාව උදා වේ. අතහිත දෙන පිරිස ද බහුල වේ. ඔබ කිසියම් වෙළඳපළක් වැනි ස්ථානයකට ගිය විට ඔබට මුදල් පසුම්බියක් හෝ ස්වර්ණාභරණයක් අහුලා ගැනීමට ඉඩ සැලසේ. ඒ අනුව ඔබ එය යළි අයිතිකරුවා සොයා යන තත්ත්වයකට පත්වී ඔහුගේ සැනසුම උදාකරලීමට සමත්වන බව පෙනේ.

### සිංහ ලග්නය - ආගමික කටයුත්තකට මුල් තැන

සිංහ ලග්නයට අනුව අද ඔබට යටි බඩ ආශ්‍රිත රෝගී තත්ත්වයකින් පීඩාවිඳීමට සිදු වේ. බොහෝ විට කෑම අජීර්ණයක් විය හැකි නිසා කෑම බීම තෝරා බේරාගැනීමේදී සුපරීක්ෂාකාරී වන්න. ඔබට පිටරට යෝග තත්ත්වයක් උදාකර දෙන දිනයකි. දුරබැහැර ගමන් බිමන් යෙදෙන අතර නිවසට පැමිණෙන ආගන්තුකයකු වෙතින් ආර්ථික වාසියක් මෙන්ම රන්-රිදී-මුතු-මැණික් වැනි වස්තුවක උරුමකම් කීමකට හේතු වේ. ආගමික කටයුතු සඳහා ප්‍රදේශයෙන් පිටව යෑමට ඔබට අවස්ථාව උදාවේ.

### කන්‍යා ලග්නය - බුද්ධි ගෝචරව කටයුතු කරයි

කන්‍යා ලග්නයට අනුව අද දින විරුද්ධ ලිංගිකයකු නිසා අපහාස චෝදනා ලැබීමට හේතුවන නමුත් ඒ සඳහා ඔබ ඉතා බුද්ධි ගෝචරව කටයුතු කිරීම නිසා ඒවායෙන් නිදහස් වීමට හැකි වේ. තම හිතවතකු යයි කියා තමා වෙත ළංවූ පිටස්තරයකු තමාගේ කටයුතු අවුල් කිරීමට මුල්ව කටයුතු කෙරෙන තත්ත්වයක් තහවුරු කර ගැනීමට හැකි වේ. තම දූ දරුවන්ගේ කටයුතු කෙරේ වැඩි නැඹුරුවක් දක්වන අතර ඒ වෙනුවෙන් වෙහෙස වී කටයුතු කරයි. සෙසු ජයග්‍රහණ අතර ආර්ථික වාසි ද පෙන්වයි.

### තුලා ලග්නය - සතුට උතුරා යන ජයග්‍රහණ

තුලා ලග්නයට අනුව ඔබට භෞතික සම්පත් ප්‍රතිලාභ පෙන්වයි. ඒ වාහන, නිවාස, ඉඩම් යනාදී වශයෙනි. තමාට ලැබීමට තිබී අන්සතු වූ දේපළක් ඔබට හිමි වේ. ලොතරැයි ජයග්‍රහණ ද පෙන්වන නිසා ඒ පිළිබඳ උනන්දු වන්න. කොහොමින් හෝ ඔබට ගමේ, නගරයේ සිදුකරන සමාජ සේවා කටයුත්තක් නිසා සම්මානයට පවා පාත්‍ර වන දිනයකි. චන්ද්‍රයා 04 වැන්නේ හැසිරෙන අද දවස ඔබට ඉතා සුබවාදී දිනයකි. සතුට උතුරා යන අන්දමේ ජයග්‍රහණ රැසක් පෙන්වයි.

### වෘශ්චික ලග්නය - දින චර්යාව අනුන් වෙනුවෙන්

වෘශ්චික ලග්නය හිමි ඔබට අද දින ඉතා වෙහෙසකාරී කටයුතු කීපයක නිරත වීමට සිදු වේ. තම ඥාති පාර්ශ්වයේ කෙනෙකුට සිදුවන විපත්කාරී අවස්ථාවක් නිසා තමාට මුල් වී කටයුතු කිරීමට සිදු වේ. ඒ නිසාම පැරණි මතභේද දුරුකර ගැනීමට ද නව හිතවත්කම් ඇතිකර ගැනීමට ද ඔබට හැකි වේ. දේපළක් සම්බන්ධව ඔබට තිබූ ගැටලුවක් නිරාකරණය කර ගැනීමට හැකිවනු ඇත. තම දින චර්යාව තමාට වඩා අනුන් වෙනුවෙන් කැපකිරීමට සිදුවන දිනයකි.

### ධනු ලග්නය - අන්සතු ධනයක් තමාට ලැබේ

ධනු ලග්නයට අනුව ඔබට අද දින ධන සම්පතක් හිමි වන දිනයකි. විශේෂයෙන් අන්සතු ධනයක් තමාට හිමි වේ. තම හිතවත් කෙනෙකුට දී තිබූ ණය මුදලක් කාලයකට පසු යළි ඔබ අතට පත් වේ. ඒ නිසාම ඔබ අලුත් ව්‍යාපාරයකට අත ගසනු ඇත. වියදම් තත්ත්වය ඉහළ යන අතර අත්වැරදීම් නිසා මුදල් පාඩු ද සිදුවීමට ඇති ඉඩකඩ වැඩිය. උගුරේ ආසාදිත තත්ත්වයකට මුල්විය හැකි නිසා සීතල ආහාරපාන අවම කළ යුතු දිනකි.

### මකර ලග්නය - නිර්මාණශීලී බව ඉහළට

මකර ලග්නයට අනුව අද ඔබට ඉතා සතුටුදායක දිනයකි. තමා කලක් උත්සාහ ගත් ආදර සබඳතාවක් නොසිතූ මොහොතක සඵලකර ගැනීමට ඔබට හැකි වේ. විරුද්ධ ලිංගිකයින්ගේ ආකර්ෂණය දිනාගැනීමට හැකි වේ. ඔබ සමාජයේ ඉතා ඉහළින් කැපී පෙනෙන තත්ත්වයට කටයුතු සැලසේ. ඔබගේ නිර්මාණයක් සමාජයේ ආකර්ෂණීය ලෙස සැරිසැරීම නිසා කාගේත් අවදානය ඒ වෙත යොමු වේ. ආර්ථික තත්ත්වය ද සුබවාදී වන දිනයකි.

### කුම්භ ලග්නය - පාදයේ වළලුකරට උවදුරු

කුම්භ ලග්නය හිමි ඔබට අද දින කිසියම් දුෂ්කර කටයුතු රැසක නියැළීමට සිදු වේ. තමාගේ තම විකුණා කිසියම් අයකු ආර්ථික ප්‍රතිලාභ ගැනීමට යාමේදී එය ඔබගේ අතට හසුවේ. පාදයේ වළලුකර ආශ්‍රිත උවදුරු පවතී. යටිබඩ එනම් වකුගඩු, මුත්‍ර දෝෂ පවතින අයගේ එම රෝග තත්ත්වය උත්සන්න වනු ඇත. ඒ හා සම්බන්ධ ප්‍රතිකර්ම නිසි වේලාවට ගන්න. තමාට කලක් දුරස්ව සිටි අයකු තම නිවසට පැමිණීම ඉතා සතුටුදායක වන තත්ත්වයකට පත් වේ. මෙදින බොහෝ දුරුකතර ගෙවා ලබන ජයග්‍රහණයක් පිළිබඳව ද පෙනෙන්නට තිබේ.

### මීන ලග්නය - අනාගතයට නව ආයෝජන

මීන ලග්නයට අනුව අද දින ඔබට ආර්ථික වශයෙන් සුබවාදී දිනයකි. එසේම අත්හැර දමා තිබූ ව්‍යාපාරයක් යළි ආරම්භ කිරීමට ඔබට අවස්ථාව උදාවේ. ඒ සඳහා බොහෝ විශ්වාසවන්ත පිරිසක් ඔබ වටා එක්රොක් වනු ඇත. ආයතන ප්‍රධානීන් ඔබට ප්‍රසාදය පළකරන දිනයකි. තම මවු පාර්ශ්වයේ කෙනෙකු වෙතින් ලැබෙන මුදල් පරිත්‍යාගයක් අනාගතය වෙනුවෙන් යළි ආයෝජනය කිරීමට ඔබට හැකි වේ. නිවසේ උත්සවශ්‍රීයක් උසුලනු අද දවස ඔබට අනාගතය තීන්දු කරන කරුණු කීපයකට හේතු වනු ඇත.

# දැන් තිබෙන්නේ වනඅලි ගැසට්ටුව මුද්‍රණය කිරීම පමණයි

## ඇමැති චමල් රාජපක්ෂ



**මහින්ද අලුත්ගෙදර**

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ දශක ගණනාවක් පුරා වනඅලි ගැටලුවට මුහුණදෙන ජනතාව සමග තමන් ද තව දුරටත් රැඳී සිටින බව වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා පැවසීය.

වන අලි කළමනාකරණ විශේෂ රක්ෂිතයක අවශ්‍යතාව තමන් පාර්ලිමේන්තුවට පිවිසි 1989 සිටම පැවති සියලු රජයන්ට පෙන්වා දුන් බව සිහිපත් කළ ඒ මහතා නීත්‍යානුකූල ක්‍රියාවලියක් සඳහා ගතවන නීත්‍යානුකූල කාලය ඉවසා නොසිටීම තමන්ට ගැටලුවක් බවද යෝජිත වනඅලි කළමනාකරණ රක්ෂිතය වෙනුවෙන් වූ උද්ඝෝෂණ ව්‍යාපාර සහ මාරාන්තික උපවාසවල නිරත තම දිස්ත්‍රික්කයේ ජනතාව පටු දේශපාලන අරමුණු සඳහා ඉඩකඩ ලබා නොදෙනු ඇතැයි විශ්වාසය පළ කළේය.

මාසයක් ඇතුළත වනඅලි කළමනාකරණ රක්ෂිතය ගැසට් කිරීමේ පියවර ගන්නා බවට පසුගිය ජනවාරි මස 23 දින, ඒ වෙනුවෙන් මාරාන්තික උපවාසයෙහි යෙදුන ගොවීන් හමුවේ තමන් ප්‍රකාශ කොට දින 30ක් ගතවන තැන පොරොන්දු වූ පරිදිම ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත් බවත් දැන් ඉතිරිව ඇත්තේ ඊට අදාළ නීති රෙගුලාසි ක්‍රමවත්ව සකස් කර කෙටුම්පත් නීති සම්පාදක දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර අවසන් පියවර ලෙස ගැසට් පත්‍රය මුද්‍රණය කරවීම බව වාරිමාර්ග ඇමැති චමල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය.

ගැසට් පත්‍රයක් මුද්‍රණයට යැවීමේ සාමාන්‍ය ක්‍රියාදාමයට අයත් වැදගත් හා අත්‍යාවශ්‍ය පියවරයන් ගණනාවක් මේ වනවිට සාර්ථකව අවසන් කොට ඇති බවත් එහි ඉතාම වැදගත් පියවර වන්නේ අදාල ගැසට් පත්‍රයෙහි අරමුණ සහ අන්තර්ගතය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම බවත් ඒ මහතා සඳහන් කරයි. ඒ සංකීර්ණ කටයුත්ත වනජීවී හා වාරිමාර්ග අමාත්‍යාංශයන්ගේ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ලෙස 2021.02.22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සාර්ථකව අනුමත කරගත් අතර රටට නව නීති රෙගුලාසි හඳුන්වාදීමේ දී සැළකිය යුතු කාලයක් ගතවීම සාමාන්‍ය ස්වරූපය බවත් යෝජිත හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිත ගැසට් පත්‍රය සකස් කිරීමේදී ඒ ආශ්‍රිත සියලුම නීතිරීති, රෙගුලාසි මෙන්ම විවිධ දෙපාර්තමේන්තුවල මගපෙන්වීම ද සැළකිල්ලට ගතයුතු බවත් ඇමැතිවරයා අවධාරණය කරයි.

යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිතය ගැන කතා කරන භාහිර පාර්ශවයන්ට වඩාල දිස්ත්‍රික්කය තුළ මේ ගැටලුවට දශක ගණනක් පුරා මුහුණ දෙන ජනතාව සමග තමන් ද තවදුරටත් රැඳී සිටින බවත් වන අලි කළමනාකරණ විශේෂ රක්ෂිතයක අවශ්‍යතාව තමන් පාර්ලිමේන්තුවට පිවිසි 1989 සිටම පැවති සියලු රජයන්ට පෙන්වා දුන් බවද සිහිපත් කරන චමල් රාජපක්ෂ මහතා නීත්‍යානුකූල ක්‍රියාවලියක් සඳහා ගතවන නීත්‍යානුකූල කාලය ඉවසා නොසිටීම තමන්ට ගැටලුවක් බවද පෙන්වා දෙයි.

ගෙවීගිය කාලය තුළ රට පුරා පැවති බොහෝ උද්ඝෝෂණ හා උපවාස විවිධ දේශපාලන අරමුණුත් සමග බද්දව පැවති බව සිහිපත් කළ රාජපක්ෂ මහතා යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිතය වෙනුවෙන් වූ උද්ඝෝෂණ ව්‍යාපාර සහ මාරාන්තික උපවාසවල නිරත තම දිස්ත්‍රික්කයේ ජනතාව එවැනි පටු අරමුණු සඳහා ඉඩකඩ ලබා නොදෙනු ඇතැයි තමා විශ්වාස කරන බවද පැවසීය.

හම්බන්තොට යෝජිත වන අලි කළමනාකරණ රක්ෂිත යෝජනාව සහ ව්‍යාපෘතිය රාජ්‍ය නොවන කිසිදු පාර්ශවයක හෝ පුද්ගලයකු ගෙනා යෝජනාවක් නොවන අතර එය වන අලින්ගෙන් ගොවි ජනතාව දල ජනතාවගෙන් අලින්ද ඇතුළුව පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා රජය දීර්ඝ කාලයක් මුලුල්ලේ අධ්‍යයනය කරගෙන ආ යෝජනාවක් බව උද්ඝෝෂණවල යෙදෙන හා ඊට වෙනස් අරමුණුවලින් සහය දක්වන සියලු පාර්ශවයන්ට අමතකවීම පිළිබඳ සිය කනගාටුව පළ කළ වාරිමාර්ග ඇමැතිවරයා යෝජිත ගැසට් පත්‍රය මුද්‍රණය කිරීම දක්වා වූ නීතිමය හා ව්‍යවස්ථාමය ක්‍රියාදාමයට යන කාලය නොඉවසා නොසන්සුන් තත්වයක් ඇති කිරීමට උත්සාහ දැරීම ප්‍රහේළිකාවක් බවද පැවසීය.

එමෙන්ම මෙම මාරාන්තික උපවාසයෙහි යෙදෙන්නේ තම දිස්ත්‍රික්කයේ අහිංසක එහෙත් ඍජු අදහස් ඇති ගොවි ජනතාවක් වන බැවින් කිසිදු පරිභාහිර පාර්ශවක උසි ගැන්වීමකට පෙළඹවීමකට යටත් නොවී යෝජිත ගැසට් පත්‍රය ක්‍රමවත්ව මුද්‍රණය කර ගැනීම සඳහා වූ ඉදිරි පියවරයන්ට ආශිර්වාදාත්මක සහය පළ කරන ලෙසද ඉල්ලා සිටියේය.

# මුතුරාජවෙල, රැම්සා තෙත් බිම් නාමාවලියට ඇතුළත් කරනවා

## ඇමැති මහින්ද අමරවීර



**බුද්ධිකා ඉඹුලාන**

මුතුරාජවෙල තෙත් බිම් අභයභූමිය රැම්සා (Ramsar) තෙත් බිම් නාමාවලියට ඇතුළත් වන පරිදි එහි සංරක්ෂණ කටයුතු සිදු කිරීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අරමුණ බව පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා පැවසීය.

කොළඹ නගරය ලෝකයේ පළමු රැම්සා තෙත් බිම් නගරය ලෙස රැම්සා සම්මුතිය ප්‍රකාශයට පත් කළේ ජනාධිපතිතුමන් ආරක්ෂක ලේකම්වරයා ලෙස සිටියදී තෙත් බිම් සංරක්ෂණයට ගෙන ගිය වැඩපිළිවෙළ නිසා බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

මුතුරාජවෙල තෙත් අභයභූමිය සම්බන්ධව පැන නැගී ඇති ගැටලු සොයා බැලීම සඳහා පත් කර ඇති කමිටුවේ සාකච්ඡාවක් පෙරේදා (9) පස්වරුවේ පරිසර අමාත්‍යාංශයේ දී පැවැත් වූ අවස්ථාවේ ඇමැතිවරයා මේ බැව් අනාවරණය කළේය.

මුතුරාජවෙල තෙත් අභයභූමිය සංරක්ෂණ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පරිසර, වනජීවී, වනසංරක්ෂණ අමාත්‍යාංශවල පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කිරීම රජයේ අපේක්ෂාව වන අතර, මුතුරාජවෙල තෙත් බිම දැනට රැම්සා(Ramsar) තෙත් බිම් ලැයිස්තුවට අයත් නොවන බවද

ඇමැතිවරයා මෙහිදී කීවේය.

එම පිරිස් මෙම සාකච්ඡාවේ දී මුතුරාජවෙල අභයභූමියක් වශයෙන් වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවරාගෙන සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටියේය. මුතුරාජවෙල 1990 දී හෙක්ටෙයාර් 3064ක් තරම් විශාල ප්‍රදේශයක පිහිටා තිබුණත්, දැනට ඉතිරිව තිබෙන්නේ හෙක්ටෙයාර් 1200ක් තරම් ප්‍රමාණයකි. මේ නිසා දැනට විවිධ පුද්ගලයන් අත්පත් කරගෙන සිටින ඉඩම් හා මිනිසුන් පදිංචිව සිටින ස්ථානවලින් ඉවත් කිරීමේ දී ඔවුන් සඳහා විකල්ප ක්‍රියාත්මක කිරීමට සිදුවේ. ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවන අතර ඒ සඳහා වන මුදල් ප්‍රතිපාදන පරිසර හා වනජීවී අමාත්‍යාංශවලට වැය කිරීමට හැකියාවක් නැත. නමුත් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ මෙම තෙත් බිම සංරක්ෂණය කර අනාගත පරපුර සඳහා රැම්සාර් තෙත් බිමක් වශයෙන් එම නාමාවලියට ඇතුළත් කළ හැකි පරිදි සංරක්ෂණය කිරීමට කටයුතු කරන බව අමාත්‍යවරයා කීවේය.

'මුතුරාජවෙල තෙත් අභයභූමිය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කළත් එහි අයිතිය වනජීවී දෙපාර්තමේන්තුවට පවරනවා. මා පරිසර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන තෙක් මුතුරාජවෙළට හානියක් සිදු වන්නට ඉඩ දෙන්නේ නැහැ. ඒ වගකීම මා බාර ගන්නවා. නමුත් මුතුරාජවෙල රැක ගත යුතු යැයි කියමින් හඬ නැගූ පිරිස් අප ඒ සඳහා කටයුතු කරන විට ඊට විරුද්ධව කතා කරනවා. මෙය තේරුම් ගත නොහැකි තත්ත්වයක්. මුතුරාජවෙල කඩිනමින් සංරක්ෂණය නොකළහොත් වැඩි කල් යාමට මත්තෙන් දැනට තිබෙන ඉඩම් ප්‍රමාණයත් අහිමි වී අපට කරන්න කිසි දෙයක් ඉතිරි වන්නේ නැහැ.

මෙම අවස්ථාවට පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ පරිසර, වනජීවී, ගොවිජන සංරක්ෂණ, කෘෂිකර්ම, නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, වනසංරක්ෂණ ආදි සියලු වගකිව යුතු ආයතනවල නියෝජිතයන් අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් නියෝජනය කරමින් නියෝජිත පිරිසක් සහ පරිසර සංවිධානවල නියෝජිතයන් කිහිප දෙනෙක් සහභාගී වූහ.



අනුරාධපුර, වේළුවනගම සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන අනුරාධපුර දිස්ත්‍රික් පිරිවෙන් පුස්තකාල සංවර්ධන වැඩපිළිවෙළේ සිවුවැනි අදියර පසුගිය දා ඇරඹි අතර, එහිදී සදහම් සෙවණ භාවනා මධ්‍යස්ථානයේ භාවනා උපදේශක රෝහිත විජයතිලක මහතා තලාව, ශ්‍රී ඥානෝදය මහ පිරිවෙනේ පරිවෙණාධ්‍යක්ෂ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ මැණික්හින්නේ ධීරානන්ද නාහිමියන් වෙත පොත් කට්ටලයක් පිළිගැන් වූ අයුරු.

# ශ්‍රී ලංකාව - ඕමානය අතර තොරතුරු තාක්ෂණය නංවන්න එකඟතාවක්

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව හා ඕමානය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශ ප්‍රවර්ධනයට මුල් තැන ලබාදීමට එකඟතාව පළ වෙයි.

ඒ අනුව ශ්‍රී ලංකාව සහ ඕමානය තම ජාතික ප්‍රතිපත්ති රාමුවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ප්‍රධාන ප්‍රමුඛතාවය ලෙස හඳුනාගෙන තිබෙන අතර ඒ අනුව, දෙරටේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ව්‍යාපාර සැකසුම් කළමනාකරණ සමාගම්වලට සහයෝගීතාව සඳහා සහ-සම්බන්ධතා වැඩිදියුණු කළ හැකි බව ඕමානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.

මේ සඳහා තානාපති කාර්යාලය නුදුරු අනාගතයේ දී දෙරටේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ව්‍යාපාර සැකසුම් කළමනාකරණ සමාගම් අතර අන්තර් ව්‍යාපාර වෙබිනාර් රැස්වීම් සංවිධාන කරන බව එරට ශ්‍රී ලංකා තානාපති අමීර් අජ්වාඩ් මහතා පෙන්වා දෙයි.

ඕමාන් සුල්තාන් රාජ්‍යයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සමග එක්ව, ශ්‍රී ලාංකික හා ඕමාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ,ව්‍යාපාර සැකසුම් කළමනාකරණ අංශයේ නියුතු සමාගම් සම්බන්ධ කිරීමේ අරමුණින් යුතුව නොලේජ් ඔයේසිස් මස්කට් (KOM) ආයතනය සමග සහයෝගයෙන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ව්‍යාපාර සැකසුම් කළමනාකරණ අංශය පිළිබඳ හඳුන්වාදීමේ වෙබිනාර් රැස්වීමක දී තානාපතිවරයා මෙම කරුණු අනාවරණය කර තිබේ.



අභාවප්‍රාප්ත ආචාර්ය පණ්ඩිත් අමරදේව මහතාගේ බිරිය වන අභාවප්‍රාප්ත විමලා අමරදේව මහත්මියගේ දේහයට ජනතාව අවසන් බුහුමන් දක්වමින්.

ඡායාරූපය - රොෂාන් පිටිපන

## හරස් වීදිය

| 3වැනි 4වැනි හරස් වීදිය | කිලෝ එකක තොග මිල-රු. |
|---|---|
| සුදු සීනි | 1kg-104 |
| රතු සීනි | 1kg-118 |
| මයිසූර් පරිප්පු ලොකු | 1kg- 180 |
| මයිසූර් පරිප්පු මධ්‍යම | 1kg 160 |
| අර්තාපල් දේශීය | 1kg -120 |
| ඉන්දියානු | 1kg-85 |
| පාකිස්ථාන් | 1kg- 85 |
| බොම්බයි ලූනු ඉන්දියානු | 1kg-85 |
| පාකිස්ථානු | 1kg-60 |



# ‘ක්‍රිකට් ගමට’ වැඩසටහනෙන් රත්නපුරයට කොන්ක්‍රීට් විකට් 10ක්





ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ‘ක්‍රිකට් ගමට’ වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි කොන්ක්‍රීට් පුහුණු විකට් 10ක් දීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන විධායක කමිටු සාමාජික සහ රත්නපුර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ හිටපු සභාපති ගිහාන් වීරසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කරනු ලැබීය.

ඇඹිලිපිටිය, ගොඩකවෙල, රත්නපුර, කලවාන, උඩවලව, බලංගොඩ සහ ඕපනායක ප්‍රදේශ ආවරණය කරමින් මේ කොන්ක්‍රීට් විකට් ලබාදීම සිදු විය.

දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දෙන ප්‍රතිපාදන යටතේ රත්නපුර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට ලැබුණු ප්‍රතිපාදන මඟින් මේ පුහුණු විකට් සැකසීම සිදු කෙරුණු අතර, ඒ සඳහා රත්නපුර දිස්ත්‍රික් සංගමයේ හිටපු සභාපති ගිහාන් වීරසිංහ මහතාට අමතරව එම සංගමයේ ලේකම් එරංග ප්‍රසාද් මහතා ඇතුළු නිලධාරී මණ්ඩලය සමඟ පළාත් සහ දිස්ත්‍රික් පුහුණුකරුවෝ දෙදෙනා ද සහභාගි වූහ.

මේ යටතේ ඉදිකළ ඇඹිලිපිටිය ඩී. බෝධිරාජ විදුහලේ පුහුණු විකට් විවෘත කිරීම සඳහා එම පාසලේ අනුශාසක ලෙසින් කටයුතු කරනු ලබන පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමියෝ ද සහභාගි වූහ.

එහිදී අදහස් දැක්වූ මේධානන්ද හිමියෝ මේ පුහුණු විකට් දීම සම්බන්ධව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මෙන්ම රත්නපුර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට ද සිය ප්‍රශංසාව පළ කළහ.

මේ වැඩසටහන යටතේ ඩී. බෝධිරාජ විද්‍යාලය (ඇඹිලිපිටිය), රාජකීය විද්‍යාලය (ඇඹිලිපිටිය), මහවැලි ක්‍රීඩාංගණය (ඇඹිලිපිටිය), උඩවලව මහා විද්‍යාලය (උඩවලව), කුඹුරුගමුව ක්‍රිකට් සමාජය (ගොඩකවෙල), කුලරත්න මැදි මහ විදුහල (ගොඩකවෙල), චැලෙන්ජර්ස් ක්‍රීඩා සමාජය (ඕපනායක), කලවාන ජාතික පාසල (කලවාන), බටුගෙදර විද්‍යාරාජ විද්‍යාලය සහ විද්‍යාලෝක මැදි මහ විදුහල (බළන්ගොඩ) සඳහා කොන්ක්‍රීට් විකට් හිමි විය.

SPORTS sports.dinamina@lakehouse.lk

## ගමින් ගමට ක්‍රීඩා පිටි සංවර්ධනය

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව දීපව්‍යාප්තව ආරම්භ කළ ග්‍රාමීය ක්‍රීඩාංගණ 332ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ වැඩ අරඹන ලද ක්‍රීඩාංගණ කිහිපයකි මේ.



අතුරලිය ප්‍රාදේශීය සභා කොට්ඨාසයේ අගලකඩ ඉදි කෙරෙන ක්‍රීඩාංගණයේ වැඩ කටයුතු අතුරලිය ප්‍රාදේශීය සභාවේ සභාපති නිහාල් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කරුණාදාස කොඩිතුවක්කු මහතා ඇතුළු අතුරලිය ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් හා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය නිලධාරීන් සමඟ අගලකඩ ක්‍රීඩා සමාජ සාමාජිකයෝ පිරිසක් මේ අවස්ථාවට එක් වූහ.

ඡායාරූපය - අකුරැස්ස මධ්‍යම විශේෂ - විජිත සල්ගාදු



මැල්සිරිපුර සිරිපුර ප්‍රදේශයේ දිවා රාත්‍රී ක්‍රීඩා කළ හැකි වොලිබෝල් පිටියක් ඉදිකිරීමට මුල්ගල් තැබීම පාර්ලිමේන්තු මන්ත්‍රී සුමිත් උඩුකුඹුර මහතා අතින් සිදු කෙරුණු අයුරු. මේ අවස්ථාවට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති අජිත් වික්‍රමසිංහ, උප සභාපති ධර්මකීර්ති අලවත්තගේ මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

ඡායාරූපය - ඉබ්බාගමුව සමූහ කුමාරි දිසානායක



කතරගම වල්ලිමාතා ගමට ක්‍රීඩා පිටියක් ඉදිකිරීමේ කටයුතු කතරගම ප්‍රාදේශීය සභවේ සභාපති චානක අමිල් රංගන මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ විය. මේ අවස්ථාවට කතරගම ප්‍රදේශීය සභාවේ මන්ත්‍රීවරුන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

ඡායාරූපය - කතරගම සංචාරක කේ.ඩී. දේවප්‍රිය



අනුරාධපුර නාච්චාදූව අතුරුවැල්ල ක්‍රීඩා පිටියෙහි වැඩ කටයුතු පසුගියදා රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරිණි.

ඡායාරූපය - චිත්‍රාරත්න කළුආරච්චි

## ක්‍රිකට් ජය බිබිල බීඑස්සී කණ්ඩායමට



ඌව වෙල්ලස්ස විශේෂ - ඩී.එස් ගුණතිලක

බිබිල තරුණ එකමුතුව සංවිධානය කළ විජිත බේරුගොඩ අභියෝගතා කුසලානය සඳහා වූ සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ජය හිමිකර ගැනීමට බීඑස්සී ක්‍රිකට් කණ්ඩායම සමත් විය. බිබිල මහජන ක්‍රීඩාංගණයේ පැවැති තරගාවලියට බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රිකට් කණ්ඩායම් 19ක් එක්ව සිටියේය. තරගාවලියේ ජය සංකේත ප්‍රදානය රාජ්‍ය ඇමැති විජිත බේරුගොඩ මහතා අතින් සිදු කෙරිණි.

ඡායාරූපය - ඌව වෙල්ලස්ස විශේෂ

## කෑගල්ල සාන්ත මරියා විදුහලට කරාතේ පදක්කම් 13ක්

කෑගල්ල චමින්ද ජයලත්

‘ඊ’ කාතා අන්තර්ජාතික කරාතේ ශූරතාවලියේදී පදක්කම් 13ක් දිනා ගැනීමට කෑගල්ල සාන්ත මරියා විදුහල් කණ්ඩායම සමත් විය.

ඊට රන් පදක්කම් 5ක්, රිදී පදක්කම් 3ක් සහ ලෝකඩ පදක්කම් 5ක් ඇතුළත් විය.

කොරෝනා වසංගතය හේතුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වීඩියෝ කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ ජාතික විනිසුරුවන්ගේ තේරීමට යොමු කර තිබුණි.

මේ ශූරතාවලියට ස්වීඩනය, මැලේසියාව, ඉන්දියාව හා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් එක්වූ අතර, එහි ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකාවට හිමි විය. කෑගල්ල සාන්ත මරියා විද්‍යාලයේ විදුහල්පති සමන් ඉන්ද්‍රරත්න මහතා පැවසුවේ විදුහල නියෝජනය කරමින් ක්‍රීඩකයන් 14 දෙනකු මේ තරගාවලගියට ඉදිරිපත් වූ අතර ඉන් ක්‍රීඩකයන් 13 දෙනකුම පදක්කම් දිනා ගැනීම කැපී පෙනුණ බවයි.



විද්‍යාලයේ කරාතේ භාර ආචාරිනියන් ලෙස ප්‍රියන්සි ප්‍රනාන්දු හා නිලිකා ආරියදාස මහත්මීන් කටයුතු කරන අතර වෛජයන්ත ගුණරත්න පුහුණුකරු ලෙස කටයුතු කරයි.

ඡායාරූපය - කෑගල්ල චමින්ද ජයලත්

## සාන්ත අන්තෝනි විදුහලට ලකුණු 135ක ජයක්

මහනුවර ක්‍රීඩා විශේෂ - උපනන්ද ජයසුන්දර

කටුගස්තොට දී පැවැති සීමිත ඕවර ක්‍රිකට් තරගයෙන් මහනුවර සිල්වෙස්තර විදුහල පරදවා ලකුණු 135ක ජයක් අත් කර ගැනීමට කටුගස්තොට සාන්ත අන්තෝනි විදුහල සමත් විය.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් සාන්ත අන්තෝනි පිල කඩුලු 8ක් දැවී ලකුණු 258ක් රැස් කළ අතර, පිළිතුරු ලෙස සිල්වෙස්තර විදුහලට සියල්ලන් දැවී රැස් කළ හැකි වූයේ ලකුණු 123ක් පමණි.

**සා. අන්තෝනි විදුහල** - 258/8 (ඕවර 45) අසිත වන්නිනායක 70, ගිහාන් ඊබට් 48, චන්දිමාල් හේරත් 39, යසිරු ගමාරච්චි 23, දිවේශ් රාමයියා 22 (රුක්ෂාන් රසිල් 41/2, මලීෂ ද සිල්වා 45/2)

**සා. සිල්වෙස්තර විදුහල** - 123 (ඕවර 37) කවිශ්ක දිල්ශාන් 33, මලීෂ ද සිල්වා 21 (දිව්යේෂ් රාමයියා 13/2, නිම්නක ජයතිලක 22/2)



## කැටවල ලෙව්ල එකමුතු ක්‍රීඩා සමාජයට ජය

46 වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළට සමගාමීව දිගන මහවැලි ක්‍රීඩාංගණයේදී පැවැති මධ්‍යම පළාත් අන්තර් දිස්ත්‍රික් ක්‍රිකට් තරගාවලියේ කාන්තා අංශයේ පළමු ස්ථානය දිනා ගැනීමට කැටවල ලෙව්ල එකමුතු ක්‍රීඩා සමාජය සමත් විය. මේ කණ්ඩායම සුසිල් ජයසුන්දර මහතා යටතේ තරගාවලියට එක් විය.

ඡායාරූපය - ගලහ සමූහ සී.කේ. වික්‍රම

## කළුතර වොලිබෝල් පුහුණු වැඩමුළුව සාර්ථකයි

කළුතර මධ්‍යම විශේෂ

ශ්‍රී ලංකා වොලිබෝල් සංගමයේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව කළුතර දිස්ත්‍රික් වොලිබෝල් සංගමය විසින් සංවිධානය කළ කළුතර දිස්ත්‍රික් වොලිබෝල් පුහුණුකරුවන් සඳහා දෙදින පුහුණු වැඩමුළුවක් පසුගියදා බණ්ඩාරගම ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී සාර්ථකව නිමාවට පත් විණි.

කළුතර දිස්ත්‍රික්කයට අයත් පාසල් වොලිබෝල් ක්‍රීඩා පුහුණුකරුවන්, ක්‍රීඩා සංගම් හා වෙනත් ක්‍රීඩා සම්බන්ධ ආයතනවලට අයත් වොලිබෝල් පුහුණුකරුවෝ අසූවක් පමණ මේ පුහුණු වැඩමුළුවට සහභාගි වූහ.

දිවයිනේ අති දක්ෂ හා ජාතික මට්ටමේ වොලිබෝල් පුහුණුකරුවන් විසින් සිදු කළ මේ විශේෂ පුහුණුවේදී වොලිබෝල් ක්‍රීඩාවේ නවීන තාක්ෂණික උපක්‍රම, කුසලතා හා විවිධ නිපුණතා සමඟ විශාල දැනුම් හා අත්දැකීම් රාශියක් හිමි කර ගත් බවත් ඉදිරියේදී තමන් යටතේ පුහුණු වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතරින් දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් රටට දායාද කර ගැනීමට හැකියාව හා ශක්තිය ලැබුණු බවත් මේ අවස්ථාවට එක් වූ පුහුණුකරුවෝ පැවසූහ.

මේ අවස්ථාව තමන්ට දුන් කළුතර දිස්ත්‍රික් වොලිබෝල් සංගමයේ ලේකම් හා වැඩමුළුවේ ප්‍රධාන සංවිධායක, කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා ජ්‍යෙෂ්ඨ ගුරු උපදේශක කාන්තසිරි මීගමුවගේ මහතාට සිය ස්තුතිය පිරිනමන බවත් වොලිබෝල් පුහුණුකරුවෝ පැවසූහ.







දැනගෙන ගන්න

රන් මිල

| | |
|---|---|
| කැරට් 21 | -92750 |
| කැරට්22 | - 97166 |
| කැරට්24 | -106000 |

# MARKET PRICE

**පොල් සංවර්ධන අධිකාරිය විසින්**
**ප්‍රකාශිත පොල් ද්‍රව්‍ය මිල ගණන්**
**ප්‍රකාශිත දිනය 2021-03-10**

**1. පොල් මිල**
(අ) වෙළෙඳපොළ මිල ගණන් 2021.02.19-2021.02.25 (මූලාශ්‍රය - HART)

| | | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|---|
| ලොකු ප්‍රමාණය | ගෙඩියක මිල රු. | 85.00 - 90.00 | 90.00 - 120.00 |
| කුඩා ප්‍රමාණය | ගෙඩියක මිල රු. | 75.00 - 80.00 | 80.00 - 100.00 |

(ආ) පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසිය (කොළඹ) 24/09/2020
(කර්මාන්තයට යොදනු ලබන)
සාමාන්‍ය මිල ලෙලි ගසන (රු.ගෙඩි 1000ක්)
56,493.75 වි ඉදිරිපත් කළ ගෙඩි 707,125 විකුණු ගෙඩි 529,709
(ඇ) පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය පොල් වෙන්දේසිය (කුලියාපිටිය) - (2020/09/08)
සාමාන්‍ය මිල ලෙලි ගසන (රු./කි.ග්‍රෑ.01 ක් සඳහා
92-93 වි ඉදිරිපත් කළ ගෙඩි 195,481 විකුණු ගෙඩි 40,281
(ඈ) දේශීය ගොවිපළ මිල රු/ගෙඩි 1000ක් (ලෙලි නොගසන)
රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද)

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 50,000 - 60,000 | 100,000 - 105,000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 50,000 - 60,000 | 105,000 - 110,000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 55,000 - 60,000 | 100,000 - 105,000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 65,000 - 70,000 | 100,000 - 105,000 |

**2. කොප්පරා - දේශීය වෙළෙඳපොළ මිල 10/03/2021**
ඛාද්‍ය කොප්පරා (රු./කි.ග්‍රෑ.250ක්) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා (රු./කි.ග්‍රෑ.250ක්) 82,500
තෙල් සිඳින විශිෂ්ට අංක 2 කොප්පරා (රු./කි.ග්‍රෑ.250ක්) 66,250
තෙල් සිඳින සාමාන්‍ය කොප්පරා (රු./කි.ග්‍රෑ.250ක්)
කොප්පරා
පොල් සංවර්ධන අධිකාරියේ කොප්පරා වෙන්දේසිය (කොළඹ)
ඉදිරිපත් කළ කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
විකුණු කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා ඉහළ මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා වෙළෙඳපොළ මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා වෙළඳපළ මිල - (රු./කි.ග්‍රෑ. 250ක්)

**3. දිසිදි පොල්**
සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශීය) (රු./කි.ග්‍රෑ.1 ක්) 500 - 510 සා
(රු./කි.ග්‍රෑ.1 ක්) 500 - 510 සා
ශ්‍රී ලංකා - නැවතෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්)

**4. පොල් තෙල් (තොග මිල)**
දේශීය මිල (රු./මෙ.ටො.1ක්) 480,000 - 515,000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.03.04) (රු./මෙ.ටො.1ක්) 309,301

| | | |
|---|---|---|
| **5. පුන්නක්කු** | (රු./මෙ.ටො. 1ක්) | 60,000 - 75,000 වි |
| **6. ගුදිරි කොහු** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 950 - 1,250 වි |
| **7. ඔමැට් කොහු** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 3,750 - 5,000 වි |
| **8. මිශ්‍ර කොහු** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 1,400 - 1,500 වි |
| **9. බ්‍රිස්ටල් කොහු බැමි 1** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 5,000 - 7,000 වි |
| **10. බ්‍රිස්ටල් කොහු බැමි 2** | (රු/කි.ග්‍රෑ. 50ක්) | 7,500 - 8,500 වි |
| **11. පොල් ලෙලි මිල** | (18-02-2021) | |

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) |
|---|---|
| පුත්තලම | 4,500 - 5,000 |
| ගම්පහ | 4,500 - 5,000 |
| මාතර | 4,500 - 5,000 |
| කුරුණෑගල | 4,500 - 5,500 |

| | | |
|---|---|---|
| තෙතමනය 50% | වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 7.00 |
| තෙතමනය 40% - 50% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 7.50 |
| තෙතමනය 30% - 40% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 8.50 |
| තෙතමනය 20% - 30% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 9.50 |
| තෙතමනය 10% - 20% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 10.50 |
| තෙතමනය 10% | අඩු පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) | 13.00 |

**12. පොල් කටු** (රු/මෙ. ටො. 1ක්) 29,500 - 30,500 වි
**13. පොල් කටු අඟුරු** (2021-02-26 - 2021-03-04) (රු/මෙ.ටො. 1ක්) 110,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
**14. පොල් ඉරටු** (රු./මෙ.ටො. 1ක්) 43,000 - 46,000 වි

**වි - විකුණුම් මිල** **සා - සාමාන්‍ය මිල**

## ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ විදෙස් සංචාර අනුග්‍රාහකයා JAT Holdings




ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රියතම ක්‍රීඩාව වන ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියට තම දායකත්වය දීමේ උත්සාහයේ තවත් පියවරක් ලෙස, JAT Holdings සමාගම 2020/21 ක්‍රිකට් සමය වෙනුවෙන් මේ වසරේ මැයි 31 වැනිදා දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ විදේශ සංචාර සඳහා වන නිල අනුග්‍රාහකයා (Official Overseas Team Sponsor of Sri Lanka Cricket) බවට පත්වී සිටියි.

මුළුමනින්ම දේශීය සන්නාමයක් වන එම සමාගම මීට පෙර ශ්‍රී ලංකා කණ්ඩායමේ දකුණු අප්‍රිකානු සංචාරය සහ මෙරටදී එංගලන්තය සමඟ පැවැත්වුණු තරගාවලිය සඳහා ද අනුග්‍රාහකත්වය දුන් අතර, දැන් පැවැත්වෙන බටහිර ඉන්දීය කොදෙව් සංචාරය සහ ලබන අප්‍රේල් මස පැවැත්වීමට නියමිත බංගලාදේශ ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා තරග සංචාරය සඳහා ද අනුග්‍රාහකත්වය දෙනු ඇත. කොදෙව් තරග සංචාරය යටතේ විස්සයි-20 තරග 3ක්, එක්දින තරග 3ක් සහ ටෙස්ට් තරග 2ක් පැවැත්වෙනු ඇත. JAT Holdings සමාගම යනු කවදත් ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කැප වුණු ආයතනයකි. මීට පෙර පැවැති LPL තරගාවලිය, 2017 වසරේදී කෙරුණු ශ්‍රී ලංකා කණ්ඩායමේ ඕස්ට්‍රේලියා සංචාරය, බංග්ලාදේශයේ පැවති BPL තරගාවලිය ඇතුළු තවත් බොහෝ තරගාවලි සඳහා JAT Holdings සමාගම අනුග්‍රාහකත්වය දී ඇත.



## රට වටා මිල ගණන්

| | නාරාහේන්පිට ආ.ම | රත්මලාන ආ.ම | දඹුල්ල ආ.ම | මීගොඩ ආ.ම | වැලිසර ආ.ම | නුවරඑළිය ආ.ම | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|
| **පහත රට එළවළු** | **සිල්ලර මිල රු.** | | | | | | |
| වට්ටක්කා | 120 | 140 | 65-70 | | 110 | ගෝවා | 140 |
| අළු කෙසෙල් | 120 | 120 | | 70-80 | 85 | කැරට් | 140 |
| පිපිඤ්ඤා | 80 | 80 | 30-35 | | 60 | ලීක්ස් | 75 |
| වැටකොළු | 200 | 190 | 120-130 | 150-180 | | රාබු | 60 |
| බණ්ඩක්කා | 160 | 100 | | | 160 | බීට්රූට් | 70 |
| කරවිල | 240 | 180 | 110-120 | 100-90 | 110 | අර්තාපල් | 125 |
| පතෝල | 120 | 100 | | | 150 | අර්තාපල් රතු | 125 |
| මාළු මිරිස් | 300 | 300 | 200-210 | 80 | 100 | නෝකෝල් | 90 |
| බටානා | 150-160 | 140 | | | 270 | බෙල්පෙපර් රතු | 650 |
| මුරුංගා | - | - | - | | | කහ | 650 |
| එළබටු | 120 | - | 50-60 | | 80 | කොළ | 400 |
| කැකිරි | 90-100 | 80 | 50-60 | 60 | 80 | බැසිල් | 330 |
| නෝකෝල් | 160 | 130 | 60-70 | | 70 | චයිනීස් කැබේජ් | 270 |
| මඤ්ඤොක්කා | 80 | 80 | 30-35 | | 120 | රෙඩ් කැබේජ් | 450 |
| බතල | 80-90 | - | - | | | සැල්දිරි | 170 |
| දඹල | 100 | 140 | 30-40 | | 70 | කොත්ත මල්ලි කොළ | 450 |
| මැකරල් | 140 | 90 | | 90 | 90 | අයිස්බර්ග් | 450 |
| **උඩරට එළවළු** | | | | | | සලාද | 110 |
| බෝංචි | 160 | 180 | 140-150 | | 150 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 140 | | | 130 | මිංචි | 170 |
| කැරට් | 200 | 180 | | 140 | 150 | පාස්ලි | 550 |
| ලීක්ස් | 120-140 | 120 | 130-140 | 90 | 90 | රූබා | 80 |
| රාබු | 120 | 90 | | | 60 | රෝස්මරි | 700 |
| තක්කාලි | 200 | 180 | 100-110 | 70-75 | 150 | බ්‍රොකෝලි | 1000 |
| බීට්රූට් | 120 | 120 | 60-65 | 130 | - | මල්ගෝවා | 850 |
| සලාද | 300 | 200 | | | 290 | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 80 | - | 90-100 | 30 | 80 | පැචර්ලි | 150 |
| **පළතුරු** | | | | | | සුකිනි | 270 |
| අන්නාසි | 180 | 130 | 90-100 | 110 | | කහ සුකිනි | 270 |
| ඇඹුල් කෙසෙල් | 120 | 100 | 40-50 | | 110 | දිගරාබු | 140 |
| කෝලිකුට්ටු | 200 | 180 | 140-150 | 150 | 70 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 140 | 120 | 55-60 | 80 | 170 | මාළුමිරිස් | 320 |
| ඇම්බුන් | 200 | 180 | | | 90 | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | 80 | | | 100 | 140 | | |
| ගස්ලබු | 120 | 100 | | | 110 | | |
| ඇපල් (ආනයනික) | 70-80 | 200 | | | | | |
| මිදි (දේශීය) | | | | | 850 | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | | | 900 | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | | | | | |
| **මස්** | | | | | | | |
| කුකුළු මස්- අලුත් (සම රහිත) | 600 | 580 | | | | | |
| කුකුළු මස් -ශීත කළ (සම සහිත) | 400 | 410 | | | | | |
| **අනෙකුත්** | | | | | | | |
| අමු මිරිස් | 300 | 280 | 190-200 | | 110 | | |
| දෙහි | 160 | 180 | 75-80 | | 190 | | |
| අමු ඉරිඟු | 300 | 330 | 140-130 | | 180 | | |
| **සහල්** | | | | | | | |
| හාල් (පැකට් නොකළ) | | | | | | | |
| රතු නාඩු | 96 | 110 | | 98 | 106 | | |
| සුදු නාඩු | 96 | 108 | | 98 | 108 | | |
| රතු කැකුළු | 93 | 98 | | 93 | 93 | | |
| සුදු කැකුළු | 93 | 100 | | 110 | 95 | | |
| සුදු කැකුළු සම්බා | 98 | 135 | | | 120 | | |
| තම්බපු කැකුළු සම්බා | 98 | 150 | | | | | |
| කිරි සම්බා | 150-160 | 155 | | | 145 | | |

# කොළඹ කොටස් වෙළෙඳපොළ

2021. 03. 10 දින වෙළෙඳපොළ දත්ත

# MARKET PRICE

| සුරැකුම | ප්‍රමාණය | පෙර වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | විවෘත | ඉහළ | පහළ | ඊයේ වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | වෙනස (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන පුවරුව | | | | | | | |
| එයිට්කන් ස්පෙන්ස් හොටෙල්ස් හෝල්ඩිංග්ස් | 6,593 | 30.00 | 30.00 | 30.00 | 30.00 | 30.00 | 0.00 |
| අබාන්ස් | 834 | 157.25 | 157.25 | 157.25 | 157.25 | 157.25 | 0.00 |
| ඇක්සස් ඉන්ජි. ශ්‍රී ලංකා | 346,477 | 23.60 | 23.30 | 24.00 | 23.00 | 23.00 | (0.60) |
| ඒ.සී.එල්. | 180,540 | 40.20 | 41.20 | 41.20 | 38.80 | 39.90 | (0.30) |
| ඇක්මී | 117,841 | 6.40 | 6.40 | 6.80 | 6.40 | 6.70 | 0.30 |
| අගලවත්ත | 20,766 | 28.90 | 28.70 | 29.80 | 28.10 | 28.20 | (0.70) |
| ඇහොට් ප්‍රොපටීස් | 2 | 39.00 | 37.10 | 38.00 | 37.10 | 39.00 | 0.00 |
| එයිට්කන් ස්පෙන්ස් | 2,940 | 59.60 | 62.50 | 62.50 | 59.00 | 59.20 | (0.40) |
| එලයන්ස් | 1 | 50.90 | 51.90 | 51.90 | 51.90 | 50.90 | 0.00 |
| අමානා බෑන්ක් | 135,369 | 3.30 | 3.40 | 3.40 | 3.30 | 3.30 | 0.00 |
| අමායා ලෙෂර් | 770 | 17.50 | 17.80 | 17.80 | 17.30 | 17.40 | (0.10) |
| ඒෂියා ඇසෙට් | 1,901 | 6.00 | 6.30 | 6.30 | 5.90 | 6.00 | 0.00 |
| ආසිරි | 33,600 | 25.50 | 26.30 | 26.80 | 25.00 | 25.00 | (0.50) |
| ආසිරි සර්ජිකල් | 326 | 13.90 | 13.50 | 13.50 | 13.50 | 13.50 | (0.40) |
| බයිරහා ෆාම්ස් | 12,719 | 147.50 | 138.00 | 138.00 | 137.00 | 137.25 | (10.25) |
| බලන්ගොඩ | 1,430 | 12.90 | 13.00 | 13.80 | 13.00 | 13.10 | 0.20 |
| බුකිට් ඩරහා | 11 | 317.75 | 333.75 | 333.75 | 310.00 | 317.75 | 0.00 |
| කාර්ගිල්ස් | 8,340 | 238.00 | 238.00 | 239.00 | 238.00 | 238.00 | 0.00 |
| කාර්ගෝ බෝට් | 301 | 62.90 | 62.50 | 62.50 | 62.50 | 62.50 | (0.40) |
| කාර්සන්ස් | 165 | 285.00 | 275.25 | 285.00 | 270.00 | 271.50 | (13.50) |
| සී.ඩී.බී | 215 | 113.75 | 114.00 | 114.00 | 113.75 | 113.75 | 0.00 |
| සී.ඩී.බී (CDB. X0000) | 361 | 75.50 | 71.20 | 75.00 | 70.40 | 73.30 | (2.20) |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් | 136,053 | 85.10 | 88.90 | 88.90 | 85.00 | 85.30 | 0.20 |
| සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් | 28,866 | 105.00 | 109.00 | 109.00 | 103.00 | 103.75 | (1.25) |
| සෙලින්කෝ ඉන්ෂුවරන්ස් | 1,459 | 2,000.00 | 2,050.00 | 2,050.00 | 1,851.00 | 1,856.00 | (144.00) |
| සිලෝන් ගාර්ඩියන් | 908 | 120.25 | 120.25 | 120.25 | 120.00 | 120.00 | (0.25) |
| සිලෝන් ඉන්වෙස්මන්ට් | 3,919 | 63.00 | 63.00 | 63.00 | 61.20 | 61.50 | (1.50) |
| සිලෝන් ටොබැකෝ | 204 | 1,003.50 | 1,010.00 | 1,010.00 | 1,001.00 | 1,004.75 | 1.25 |
| කෙම්නෙක්ස් | 341 | 82.60 | 80.00 | 82.00 | 75.50 | 77.40 | (5.20) |
| චෙව්රෝන් | 17,045 | 94.80 | 95.00 | 95.00 | 93.00 | 93.30 | (1.50) |
| සී.අයි.සී | 526,015 | 56.00 | 57.00 | 57.00 | 54.50 | 55.00 | (1.00) |
| සී.අයි.සී (CIC. X0000) | 152,764 | 44.70 | 46.50 | 46.50 | 43.50 | 44.00 | (0.70) |
| සිට්‍රස් ලෙෂර් | 2,167 | 8.70 | 9.30 | 9.30 | 8.60 | 8.70 | 0.00 |
| කෝල්ඩ් ස්ටෝර්ස් | 590 | 626.00 | 626.00 | 626.00 | 619.00 | 619.25 | (6.75) |
| කළම්බුසිටි | 4 | 920.00 | 880.00 | 880.00 | 880.00 | 920.00 | 0.00 |
| කළම්බු ලෑන්ඩ් | 1,077 | 25.50 | 25.90 | 26.00 | 25.00 | 25.10 | (0.40) |
| කොමර්ෂල් බෑන්ක් | 150,700 | 88.10 | 88.90 | 88.90 | 85.70 | 86.10 | (2.00) |
| කොමර්ෂල් බෑන්ක් (COMB. X0000) | 41,822 | 81.50 | 81.30 | 81.60 | 79.90 | 80.00 | (1.50) |
| දන්කොටුව පෝසිලේන් | 47,397 | 11.60 | 11.60 | 11.60 | 11.00 | 11.00 | (0.60) |
| ඩී.එෆ්.සී.සී.බෑන්ක් (PLC) | 79,914 | 60.70 | 60.90 | 63.50 | 60.30 | 60.60 | (0.10) |
| ඩයලොග් | 1,674,644 | 13.00 | 13.00 | 13.10 | 13.00 | 13.00 | 0.00 |
| ඩිමෝ | 460 | 511.25 | 540.00 | 580.00 | 475.00 | 526.00 | 14.75 |
| ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් | 1,325,567 | 50.20 | 50.00 | 51.60 | 48.00 | 49.50 | (0.70) |
| ඩොක්යාඩ් | 1,149 | 76.50 | 74.00 | 79.90 | 74.00 | 74.80 | (1.70) |
| ඩොල්ෆින් හොටෙල්ස් | 60 | 24.10 | 24.00 | 24.00 | 24.00 | 24.10 | 0.00 |
| ඩර්ඩන්ස් | 9,847 | 102.50 | 102.75 | 102.75 | 102.50 | 102.50 | 0.00 |
| ඊ.බී.ක්‍රීසි | 2,251 | 33.50 | 34.50 | 34.50 | 33.00 | 33.30 | (0.20) |
| ඊස්ට් වෙස්ට් | 26,000 | 10.30 | 10.50 | 10.80 | 10.20 | 10.60 | 0.30 |
| ඊස්ටර්න් මර්චන්ට් | 5,859 | 5.10 | 5.10 | 5.30 | 5.10 | 5.20 | 0.10 |
| එක්ස්පෝ ලංකා | 1,051,151 | 46.50 | 46.80 | 47.50 | 45.50 | 46.10 | (0.40) |
| ෆෝර්ට්ලන්ඩ් | 35,823 | 13.10 | 13.80 | 13.80 | 13.00 | 13.30 | 0.20 |
| ග්‍රේන් එළිවේටර්ස් | 3,460 | 119.00 | 115.25 | 122.50 | 115.25 | 119.50 | 0.50 |
| හේකාබ් | 260,269 | 97.70 | 98.00 | 100.00 | 95.50 | 99.30 | 1.60 |
| හේලීස් | 280,226 | 60.50 | 60.10 | 61.00 | 58.50 | 59.30 | (1.20) |
| හේලීස් ෆැබ්රික් | 40,062 | 15.00 | 15.10 | 15.30 | 14.70 | 14.90 | (0.10) |
| හේලීස් ෆයිබර් | 2,299 | 49.10 | 49.00 | 49.00 | 48.50 | 48.50 | (0.60) |
| එච්.ඩී.එෆ්.සී | 2,000 | 35.90 | 36.00 | 36.00 | 36.00 | 36.00 | 0.10 |
| හේමාස් හෝල්ඩිංග් | 3,015 | 82.70 | 83.00 | 83.00 | 82.00 | 82.30 | (0.40) |
| එච්.එන්.බී. | 400,038 | 131.00 | 130.00 | 130.00 | 127.50 | 128.00 | (3.00) |
| එච්.එන්.බී. ඇෂුවරන්ස් | 2,155 | 57.00 | 58.80 | 59.00 | 58.70 | 58.90 | 1.90 |
| එච්.එන්.බී.(HNB. X0000) | 218,819 | 102.50 | 106.00 | 106.00 | 100.00 | 102.50 | 0.00 |
| හොටෙල්ස් කෝපරේෂන්ස් | 20 | 11.90 | 11.90 | 11.90 | 11.90 | 11.90 | 0.00 |
| ඉන්ඩස්ට්‍රියල් ඒ.එස්.පී.එච්. | 353,385 | 0.50 | 0.50 | 0.50 | 0.40 | 0.50 | 0.00 |
| ජනශක්ති ඉන්ෂුවරන්ස් | 76,411 | 27.60 | 32.00 | 32.00 | 29.00 | 29.00 | 1.40 |
| ජේ.කේ.එච්. | 52,173 | 150.00 | 148.00 | 150.00 | 148.00 | 148.50 | (1.50) |
| කේගෝල් | 11,416 | 103.00 | 103.25 | 103.50 | 100.00 | 100.25 | (2.75) |
| කැලණි කේබල්ස් | 66 | 114.00 | 117.50 | 117.75 | 116.00 | 114.00 | 0.00 |
| කැලණි ටයර්ස් | 36,900 | 78.80 | 78.00 | 81.50 | 76.10 | 76.90 | (1.90) |
| කැලණිවැලි | 47,432 | 40.50 | 42.10 | 42.20 | 40.50 | 41.10 | 0.60 |
| කිංන්ස්බරි | 26,525 | 6.40 | 6.10 | 6.40 | 6.10 | 6.10 | (0.30) |
| කොටගල | 12,891 | 6.00 | 6.00 | 6.20 | 5.80 | 5.90 | (0.10) |
| එල්.ඕ.එල්.සී.හෝල්ඩිංග්ස් | 73,790 | 321.25 | 329.00 | 329.00 | 310.00 | 315.75 | (5.50) |
| ලංකා ඇලුමිනියම් | 38,215 | 17.00 | 17.00 | 17.00 | 16.00 | 16.20 | (0.80) |
| ලංකා හොස්පිටල්ස් | 850 | 41.80 | 41.70 | 41.80 | 41.70 | 41.80 | 0.00 |
| ලංකා අයි.ඕ.සී | 27,642 | 20.90 | 20.50 | 21.00 | 20.10 | 20.30 | (0.60) |
| ලංකා ටයිල්ස් | 11,565 | 186.25 | 198.75 | 198.75 | 185.00 | 185.75 | (0.50) |
| ලංකා වෙන්චර්ස් | 2,715 | 48.30 | 49.00 | 49.00 | 48.50 | 48.50 | 0.20 |
| ලංකා වෝල්ටයිල් | 21,292 | 196.75 | 195.00 | 203.75 | 186.00 | 190.25 | (6.50) |
| ලාෆ් ගෑස් | 7,087 | 21.10 | 21.30 | 21.90 | 21.00 | 21.90 | 0.80 |
| ලාෆ් ගෑස් (LGL. X0000) | 5,130 | 16.30 | 16.40 | 16.40 | 15.50 | 15.70 | (0.60) |
| ලක්ෂපාන | 3,253 | 14.10 | 14.10 | 14.10 | 14.10 | 14.10 | 0.00 |
| එල්.බී.ෆිනෑන්ස් | 8,677 | 191.75 | 195.00 | 195.00 | 185.00 | 189.50 | (2.25) |
| ලයන් බෲවරි | 12 | 540.00 | 570.00 | 570.00 | 560.00 | 540.00 | 0.00 |
| එල්.එම්.එෆ් | 1,928 | 155.75 | 158.75 | 158.75 | 153.00 | 154.50 | (1.25) |
| එල්.වී.එල්.එනර්ජි | 735 | 9.70 | 9.70 | 9.70 | 9.50 | 9.50 | (0.20) |
| මල්වත්ත (MAL.X0000) | 8,333 | 7.70 | 8.00 | 8.00 | 8.00 | 8.00 | 0.30 |
| මෙල්ස්ටා කෝප් | 61,173 | 47.90 | 49.80 | 49.80 | 46.00 | 47.60 | (0.30) |
| මර්චන්ට් බෑන්ක් | 7,200 | 7.30 | 7.30 | 7.40 | 7.30 | 7.30 | 0.00 |
| මුලර්ස් | 6,201 | 1.10 | 1.10 | 1.10 | 1.00 | 1.00 | (0.10) |
| නැෂනල් ඩිවලප්මන්ට් බෑන්ක් එක්ස්.ඩී | 5,856 | 83.70 | 83.00 | 84.00 | 82.00 | 82.30 | (1.40) |
| නේෂන්ස් ට්‍රස්ට් | 61,507 | 57.20 | 57.20 | 57.90 | 55.00 | 55.40 | (1.80) |
| නවලෝක | 43,245 | 5.20 | 5.20 | 5.20 | 5.00 | 5.00 | (0.20) |
| නෙස්ලේ එක්ස්.ඩී | 12 | 1,186.00 | 1,165.25 | 1,178.75 | 1,160.00 | 1,186.00 | 0.00 |
| ඕවර්සීස් රියැලිටි | 1,110,108 | 16.00 | 16.10 | 16.10 | 15.70 | 16.00 | 0.00 |
| පෑන් ඒෂියා | 16,274 | 16.80 | 17.20 | 17.20 | 16.80 | 16.80 | 0.00 |
| පෑන් ඒෂියන් පවර් | 136,987 | 3.60 | 3.60 | 3.60 | 3.50 | 3.50 | (0.10) |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් | 12,236 | 31.00 | 31.00 | 31.00 | 30.20 | 30.90 | (0.10) |
| පීපල්ස් ලීසින් | 85,826 | 12.30 | 12.30 | 12.40 | 12.10 | 12.10 | (0.20) |
| පිරාමල් ග්ලාස් | 616,836 | 9.80 | 9.70 | 9.80 | 9.60 | 9.60 | (0.20) |
| ප්‍රින්ට්කෙයාර් පී.එල්.සී | 250 | 29.50 | 30.00 | 30.00 | 30.00 | 30.00 | 0.50 |
| ආර්.අයි.එල්.ප්‍රොපර්ටි | 34,398 | 6.70 | 6.50 | 6.80 | 6.50 | 6.50 | (0.20) |
| රෙජ්නිස් | 3,519 | 44.45 | 50.00 | 51.70 | 46.50 | 48.30 | 3.85 |
| රේණුකා ඇග්‍රි | 169,876 | 3.70 | 3.70 | 3.70 | 3.50 | 3.60 | (0.10) |
| රේණුකා සිටි හොටෙල් | 2 | 230.00 | 236.00 | 236.00 | 236.00 | 230.00 | 0.00 |
| රේණුකා ෆුඩ්ස් | 275 | 13.80 | 14.20 | 14.20 | 14.00 | 14.10 | 0.30 |
| රේණුකා ෆුඩ්ස් (COCO.X0000) | 90 | 11.20 | 11.20 | 11.20 | 11.20 | 11.20 | 0.00 |
| රේණුකා හෝල්ඩිංග්ස් | 15 | 14.90 | 15.20 | 15.20 | 15.20 | 14.90 | 0.00 |
| රේණුකා හෝල්ඩිංග් (RHL.X0000) | 17,350 | 11.20 | 11.00 | 11.70 | 11.00 | 11.00 | (0.20) |
| රිසර්ස් එනර්ජි | 126 | 24.30 | 24.80 | 24.80 | 24.00 | 24.00 | (0.30) |
| රිච්ඩ් පීරිස් | 66,745 | 16.50 | 16.50 | 16.50 | 16.10 | 16.20 | (0.30) |
| රෝයල් සෙරමික් | 34,936 | 259.75 | 255.00 | 265.00 | 251.00 | 252.50 | (7.25) |
| එස්.එම්.බී.ලීසිං | 938,301 | 0.50 | 0.50 | 0.60 | 0.40 | 0.50 | 0.00 |
| එස්.එම්.බී.ලීසිං (SEMB.X0000) | 554,484 | 0.30 | 0.40 | 0.40 | 0.30 | 0.30 | 0.00 |
| සම්පත් | 142,239 | 155.25 | 157.00 | 157.00 | 152.50 | 153.00 | (2.25) |
| සණස ඩිවලොප්මන්ට් බෑන්ක් | 3,094 | 57.00 | 56.80 | 59.80 | 56.80 | 57.00 | 0.00 |
| සෙලාන් බෑන්ක් | 6,819 | 52.70 | 52.00 | 53.50 | 51.00 | 51.20 | (1.50) |
| සෙලාන් බෑන්ක් (SEYB.X0000) | 267,992 | 45.90 | 44.10 | 46.80 | 43.00 | 44.60 | (1.30) |
| සෙලාන් ඩී.ඊ.වී.ටී.එස් | 3,350 | 16.10 | 16.00 | 16.50 | 15.80 | 16.00 | (0.10) |
| සියරා කේබල්ස් | 62,039 | 6.30 | 6.50 | 6.50 | 6.20 | 6.20 | (0.10) |
| සීගිරිය විලේජ් | 4,017 | 33.70 | 34.30 | 34.30 | 32.90 | 32.90 | (0.80) |
| සිංගර් ෆිනෑන්ස් | 21,900 | 14.00 | 14.00 | 14.30 | 13.90 | 14.30 | 0.30 |
| එස්.එල්.ටී | 3,087 | 33.10 | 33.00 | 33.80 | 32.00 | 32.90 | (0.20) |
| සන් ෂයින් හෝල්ඩිංග් | 8,578 | 79.90 | 79.80 | 79.80 | 77.50 | 77.90 | (2.00) |
| ස්විස්ටෙක් | 48,396 | 106.75 | 114.50 | 114.50 | 105.50 | 106.50 | (0.25) |
| තලවකැලේ | 8,957 | 39.20 | 39.50 | 40.90 | 39.50 | 40.40 | 1.20 |
| ටී.ජේ.ලංකා | 320,137 | 40.70 | 40.00 | 40.80 | 40.00 | 40.10 | (0.60) |
| ත්‍රී ඒකර් ෆාම්ස් | 2,246 | 203.00 | 199.75 | 205.00 | 199.75 | 203.50 | 0.50 |
| ටෝකියෝ සිමෙන්ට් | 18,468 | 70.40 | 69.50 | 70.50 | 69.30 | 69.70 | (0.70) |
| ටෝකියෝ සිමෙන්ට් (TKYO.X0000) | 26,643 | 63.40 | 64.50 | 64.50 | 62.00 | 63.10 | (0.30) |
| යූනියන් බෑන්ක්ස් | 236,897 | 11.20 | 11.50 | 11.50 | 10.80 | 10.90 | (0.30) |
| යූනියන් කෙමිකල්ස් | 2 | 720.00 | 750.00 | 750.00 | 750.00 | 720.00 | 0.00 |
| යුනිසිස්ට් | 57,214 | 7.15 | 8.30 | 8.30 | 6.60 | 7.20 | 0.05 |
| යුනයිටඩ් මෝටර්ස් | 5,216 | 61.10 | 61.00 | 61.00 | 60.00 | 60.70 | (0.40) |
| වැලිබල් | 116,344 | 7.40 | 7.50 | 7.50 | 7.40 | 7.40 | 0.00 |
| වැලිබල් ෆිනෑන්ස් | 3,611 | 111.25 | 110.00 | 110.00 | 101.00 | 105.00 | (6.25) |
| විදු ලංකා | 25,200 | 5.50 | 5.50 | 5.50 | 5.40 | 5.50 | 0.00 |
| වටවල | 4,432 | 57.00 | 56.10 | 57.30 | 56.10 | 57.30 | 0.30 |
| යෝර්ක් ආර්කේඩ් | 1 | 151.00 | 150.50 | 150.50 | 150.50 | 151.00 | 0.00 |
| සෙකන්ඩ් බෝඩ් | | | | | | | |
| අබාන්ස් ෆයිනෑන්සියල් | 10 | 26.10 | 28.00 | 28.00 | 28.00 | 26.10 | 0.00 |
| ඇම්බියෝන් කැපිටල් | 3,000 | 5.10 | 5.10 | 5.10 | 5.10 | 5.10 | 0.00 |
| ඒසියා කැපිටල් | 4,020 | 5.80 | 5.80 | 5.80 | 5.50 | 5.50 | (0.30) |
| බ්‍රවුන්ස් බීච් | 1,100 | 11.00 | 11.00 | 11.00 | 11.00 | 11.00 | 0.00 |
| කොමර්ෂල් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් | 113,336 | 6.50 | 6.30 | 6.80 | 6.00 | 6.00 | (0.50) |
| ඩිස්ටිලරීස් | 1,704 | 20.80 | 21.40 | 21.40 | 20.40 | 20.40 | (0.40) |
| ෆස්ට් කැපිටල් | 17,956 | 51.60 | 51.90 | 52.00 | 50.80 | 51.00 | (0.60) |
| හුනස්ෆෝල්ස් | 205 | 149.50 | 155.00 | 155.00 | 152.00 | 152.00 | 2.50 |
| එල්.ඕ.එල්.සී. ඩෙව් ෆිනෑන්ස් | 632 | 70.00 | 67.50 | 69.90 | 67.00 | 67.20 | (2.80) |
| එල්.ඕ.එල්.සී. ෆිනෑන්ස් | 311,016 | 6.20 | 6.40 | 6.40 | 6.00 | 6.10 | (0.10) |
| මඩොල්සීම | 2,699 | 8.80 | 8.80 | 8.90 | 8.30 | 8.40 | (0.40) |
| පීපල්ස් මර්චන්ට් (XR) | 9,435 | 7.40 | 7.20 | 7.40 | 7.20 | 7.30 | (0.10) |

| සුරැකුම | ප්‍රමාණය | පෙර වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | විවෘත | ඉහළ | පහළ | ඊයේ වසා දැමූ බර තැබූ සාමාන්‍ය පරිමාව | වෙනස (රු.) |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන පුවරුව | | | | | | | |
| පීපල්ස් මර්චන්ට් (PMBR0000) XR | 780,871 | 0.10 | 0.10 | 0.20 | 0.10 | 0.10 | 0.00 |
| සිංගර් ශ්‍රී ලංකා | 84,328 | 16.37 | 17.10 | 18.00 | 16.40 | 16.80 | 0.43 |
| දිරිසවි බෝඩ් | | | | | | | |
| ඇග්ස්ටාර් පී.එල්.සී. | 10,512 | 7.20 | 7.40 | 7.40 | 7.00 | 7.00 | (0.20) |
| ඇලුමෙක්ස් පී.එල්.සී. | 93,519 | 10.80 | 11.00 | 11.00 | 10.50 | 10.70 | (0.10) |
| අමානා තකාෆුල් | 12,161 | 7.50 | 7.60 | 7.70 | 7.50 | 7.50 | 0.00 |
| ඇම්බියොන් හෝල්ඩිංග්ස් | 1,225 | 17.80 | 17.60 | 17.60 | 17.50 | 17.50 | (0.30) |
| ආර්පිකෝ ඉන්ෂුවරන්ස් | 28 | 23.80 | 23.80 | 23.80 | 23.80 | 23.80 | 0.00 |
| ඒසියා සියාකා | 65,025 | 2.60 | 2.60 | 2.60 | 2.60 | 2.60 | 0.00 |
| බේරුවල රෙසෝට්ස් | 275 | 0.90 | 0.90 | 0.90 | 0.90 | 0.90 | 0.00 |
| බෝගල ග්‍රැෆයිට් | 1,511 | 26.00 | 25.10 | 25.80 | 24.00 | 24.90 | (1.10) |
| බොගවන්තලාව | 39,626 | 11.80 | 11.90 | 13.00 | 11.80 | 11.80 | 0.00 |
| බී.පී.පී.එල්. හෝල්ඩිංග්ස් | 10 | 13.80 | 14.00 | 14.00 | 14.00 | 13.80 | 0.00 |
| බ්‍රවුන්ස් | 3,410 | 168.75 | 179.00 | 179.00 | 166.75 | 170.75 | 2.00 |
| බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට් | 13,197,072 | 5.50 | 5.50 | 5.70 | 5.30 | 5.40 | (0.10) |
| සී.ටී. ලෑන්ඩ් | 555 | 29.60 | 27.90 | 29.30 | 27.40 | 28.30 | (1.30) |
| සී.ඩබ්ලිව්.මැකී | 13,738 | 43.30 | 43.10 | 43.20 | 43.10 | 43.10 | (0.20) |
| සිලෝන් බෙවරේජ් | 5 | 779.75 | 758.00 | 758.00 | 758.00 | 779.75 | 0.00 |
| සිලෝන් ටී බ්‍රෝකර්ස් | 57,801 | 3.30 | 3.40 | 3.40 | 3.20 | 3.20 | (0.10) |
| සී.එෆ්.අයි. | 3,666 | 66.40 | 72.70 | 72.70 | 64.20 | 66.50 | 0.10 |
| සිට්‍රස් වස්කඩුව | 26,670 | 3.20 | 3.10 | 3.30 | 3.10 | 3.10 | (0.10) |
| කොමර්ෂල් ක්‍රෙඩිට් | 2,327 | 22.80 | 23.50 | 23.50 | 21.40 | 21.60 | (1.20) |
| ඩිල්මා සිලෝන් | 2 | 650.00 | 650.00 | 688.25 | 650.00 | 650.00 | 0.00 |
| ඊ-චැනලින් | 6,161 | 5.70 | 5.70 | 5.80 | 5.70 | 5.70 | 0.00 |
| ඊඩන් හොටෙල් ලංකා | 8,201 | 10.50 | 10.70 | 10.70 | 10.50 | 10.50 | 0.00 |
| ඇල්පිටිය | 53,495 | 43.20 | 44.90 | 45.00 | 42.80 | 44.70 | 1.50 |
| ෆෝට්‍රස් රෙසෝට්ස් | 110 | 10.60 | 11.30 | 11.30 | 10.20 | 10.20 | (0.40) |
| ගලධාරි | 6,790 | 8.40 | 8.50 | 8.50 | 8.10 | 8.10 | (0.30) |
| ගාඩියන් කැපිටල් | 846 | 29.70 | 28.50 | 29.40 | 27.70 | 28.10 | (1.60) |
| හැටන් | 2,100 | 8.60 | 8.50 | 8.50 | 8.50 | 8.50 | (0.10) |
| එච්.එන්.බී. ෆිනෑන්ස් | 705 | 8.30 | 8.10 | 8.30 | 8.00 | 8.00 | (0.30) |
| එච්.එන්.බී. ෆිනෑන්ස් (HNBF-X0000) | 7 | 7.20 | 7.60 | 7.60 | 6.90 | 7.20 | 0.00 |
| එච්.වී.ඒ. ෆුඩ්ස් | 15,700 | 5.10 | 5.10 | 5.10 | 4.90 | 4.90 | (0.20) |
| ජෝන් කීල්ස් | 137 | 73.60 | 76.70 | 76.70 | 71.00 | 76.50 | 2.90 |
| කීල්ස් ෆුඩ්ස් | 1 | 175.00 | 172.00 | 172.00 | 172.00 | 175.00 | 0.00 |
| කීල්ස් හොටෙල්ස් | 21,277 | 10.20 | 10.20 | 10.20 | 10.00 | 10.00 | (0.20) |
| ලංකා සෙරමික් | 92 | 114.50 | 115.25 | 116.50 | 115.25 | 114.50 | 0.00 |
| ලාෆ්ස් පවර් | 400 | 9.10 | 9.20 | 9.20 | 9.10 | 9.10 | 0.00 |
| ලාෆ්ස් පවර් (LPL-X0000) | 18,847 | 6.70 | 6.30 | 6.60 | 6.20 | 6.30 | (0.40) |
| ලෝටස් හයිඩ්‍රෝ | 733,260 | 9.40 | 11.10 | 11.70 | 11.00 | 11.70 | 2.30 |
| මහවැලි රීච් | 10 | 14.00 | 15.50 | 15.50 | 15.50 | 14.00 | 0.00 |
| මාරවිල රෙසෝට්ස් | 100,000 | 2.00 | 1.90 | 1.90 | 1.90 | 1.90 | (0.10) |
| මස්කෙලිය | 277 | 10.90 | 11.50 | 11.50 | 10.50 | 11.40 | 0.50 |
| මිලේනියම් හවුස් | 1,701 | 5.90 | 6.00 | 6.00 | 6.00 | 6.00 | 0.10 |
| ඕනාලි | 755 | 30.20 | 30.20 | 30.20 | 30.00 | 30.00 | (0.20) |
| ඔරියන්ට් ෆිනෑන්ස් | 39,132 | 15.80 | 13.80 | 14.60 | 13.50 | 14.40 | (1.40) |
| පෙගාසස් හොටෙල්ස් | 200 | 30.70 | 30.70 | 30.70 | 29.00 | 30.20 | (0.50) |
| ප්‍රයිම් ෆිනෑන්ස් | 24,590 | 12.70 | 13.30 | 13.30 | 13.00 | 13.20 | 0.50 |
| රයිගම් සෝල්ටන්ස් | 16,807 | 5.50 | 5.50 | 5.50 | 5.20 | 5.30 | (0.20) |
| රම්බොඩ පෝල්ස් | 530 | 17.80 | 18.00 | 18.00 | 17.00 | 17.20 | (0.60) |
| රේණුකා කැපිටල් | 24,133 | 6.50 | 6.50 | 6.50 | 6.20 | 6.50 | 0.00 |
| රිච්ඩ් පීරිස් එක්ස්පෝර්ට් | 977 | 349.25 | 354.75 | 354.75 | 345.00 | 347.00 | (2.25) |
| රෝයල් ෆාම්ස් | 228 | 15.00 | 15.00 | 15.00 | 14.60 | 14.70 | (0.30) |
| සෙරන්ඩිබ් ඉංජිනියරින් ගෲප් | 100 | 6.10 | 6.20 | 6.20 | 6.20 | 6.20 | 0.10 |
| සෙරන්ඩිබ් හොටෙල්ස් | 10 | 15.60 | 15.60 | 15.60 | 15.60 | 15.60 | 0.00 |
| සෙරන්ඩිබ් හොටෙල්ස් (SHOT.X0000) | 72 | 9.10 | 9.50 | 9.50 | 9.50 | 9.10 | 0.00 |
| සිංගර් ඉන්ඩස්ට්‍රීස් | 1,025 | 46.00 | 46.50 | 49.90 | 46.50 | 47.00 | 1.00 |
| සිංහ හොස්පිටල්ස් | 81,509 | 2.10 | 2.10 | 2.10 | 2.00 | 2.00 | (0.10) |
| සිංහපුත්‍ර ෆිනෑන්ස් (SFLP 0000) | 502 | 3.90 | 4.00 | 4.00 | 3.70 | 3.90 | 0.00 |
| සොෆ්ට්ලොජික් | 2,350 | 11.90 | 12.00 | 12.00 | 11.70 | 11.80 | (0.10) |
| සොෆ්ට්ලොජික් කැපිටල් | 214,929 | 3.80 | 3.80 | 3.90 | 3.80 | 3.90 | 0.10 |
| සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් | 1,010 | 10.10 | 10.00 | 10.10 | 10.00 | 10.00 | (0.10) |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 668,397 | 30.00 | 33.00 | 33.00 | 31.60 | 31.90 | 1.90 |
| තල් ලංකා | 200 | 12.10 | 12.50 | 12.60 | 12.50 | 12.60 | 0.50 |
| ට්‍රාන්ස්ඒෂියා | 150 | 55.50 | 57.30 | 57.30 | 55.00 | 55.00 | (0.50) |
| යූනියන් ඇෂුවරන්ස් | 764 | 308.50 | 309.75 | 310.00 | 300.25 | 309.25 | 0.75 |
| වැලිබල් වන් එක්ස් ඩී | 481,325 | 53.10 | 52.90 | 53.70 | 50.50 | 51.20 | (1.90) |
| වොච් ලිස්ට් | | | | | | | |
| ඇනිලානා හොටෙල්ස් | 993 | 1.10 | 1.10 | 1.10 | 1.10 | 1.10 | 0.00 |
| බිම්පුත් ෆිනෑන්ස් | 2,100 | 7.30 | 7.30 | 7.30 | 7.30 | 7.30 | 0.00 |
| බ්ලූඩයමන්ඩ්ස් | 12,260 | 0.70 | 0.70 | 0.70 | 0.60 | 0.60 | (0.10) |
| බ්ලූඩයමන්ඩ්ස් (Blue-X0000) | 129,082 | 0.30 | 0.30 | 0.40 | 0.30 | 0.30 | 0.00 |
| සිලෝන් ප්‍රින්ටර්ස් | 60 | 51.80 | 50.10 | 51.00 | 50.10 | 51.80 | 0.00 |
| ලංකෙම් ඩිවලොප්මන්ට් | 150,695 | 3.50 | 3.40 | 3.50 | 3.30 | 3.40 | (0.10) |
| මැක්වුඩ්ස් එනර්ජි | 25,660 | 2.70 | 2.70 | 2.70 | 2.60 | 2.70 | 0.00 |
| මල්ටි ෆිනෑන්ස් | 10,000 | 7.40 | 7.00 | 7.00 | 7.00 | 7.00 | (0.40) |
| නේෂන් ලංකා | 72,552 | 0.70 | 0.80 | 0.80 | 0.70 | 0.80 | 0.10 |
| රේඩියන්ට් ජෙම්ස් | 620 | 29.40 | 27.60 | 27.60 | 27.50 | 27.50 | (1.90) |
| සිංහපුත්‍ර ෆිනෑන්ස් | 4,989 | 8.00 | 7.90 | 7.90 | 7.90 | 7.90 | (0.10) |
| ටෙස් ඇග්‍රෝ | 14,534 | 0.50 | 0.60 | 0.60 | 0.50 | 0.50 | 0.00 |
| ටෙස් ඇග්‍රෝ (Tess-X0000) | 2,320 | 0.50 | 0.50 | 0.50 | 0.50 | 0.50 | 0.00 |

**වෙළෙඳපොළ දත්ත**

| කොටස් සම්බන්ධ දත්ත | අද දින | කලින් දින |
|---|---|---|
| පිරිවැටුම් වටිනාකම (රු.) | 655,814,617.85 | 2,779,945,311.00 |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | 31,432,178 | 143,888,071 |
| විකුණුම්කරුවන් (ගණන) | 10,548 | 26,257 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.) | 3,154,146,130,544.25 | 3,190,971,484,975.05 |
| **ආණ්ඩුවේ සුරැකුම්** | **අද දින** | **කලින් දින** |
| පිරිවැටුම් වටිනාකම (රු.) | - | - |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | - | - |
| විකුණුම්කරුවන් (ගණන) | - | - |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.) | - | - |
| **ණය ප්‍රමාණය** | **අද දින** | **කලින් දින** |
| | | 3- මාර්තු -21 |
| පිරිවැටුම් වටිනාකම (රු.) | 3,419,450.03 | 26,012,805.00 |
| පිරිවැටුම් ප්‍රමාණය (ගණන) | 32,000 | 255,000 |
| විකුණුම්කරුවන් (ගණන) | 11 | 1 |
| **කොටස් දර්ශකය** | **අද දින** | **කලින් දින** |
| මිල දර්ශකය | | |
| සීඑස්ඊ සියලු කොටස් දර්ශකය | 7,212.66 | 7,296.88 |
| එස් ඇන්ඩ් පී එස්එල් 20 දර්ශකය | 2,867.82 | 2,909.98 |
BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina
Daily News
Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT
App Store
Google play
Windows Store
LAKE HOUSE

2021 මාර්තු 11 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



ධාතු ගර්භයෙන් හමු වූ බුදු පිළිමයක්



යක්ෂ දමනය සිතුවමක්..



මහියංගණ චෛත්‍යය පිළිසකර කිරීමට පෙර..

# යක්ෂ දමනයෙන් පසු මියුගුණ පුදබිම

**මහියංගණය යනු පාළි වචනයකි. අතීතයේ එය හඳුන්වනු ලැබුවේ බිම්තැන්න යනුවෙනි. මහි යනු මහ පොළොවය. අංගණ යනු තැනිතලා පෙදෙසය. එනමුත් අත්තනගලු වංශ කතුවරයා බුද්ධ පාරිභෝගික හෙයින් දෙව් බඹුන් (සුමන දෙවි) ආදීහු මහිත වූ හෙවත් පූජිත වූ හෙයින් මහියංගණ වූ බව සඳහන් කරයි.**

ජන වහරේදී මහියංගණ චෛත්‍යය 'මියුගුණ සෑය' විය. එය සිංහල ථූප වංශය, නිකාය සංග්‍රහය සහ ධාතු වංශය යන කෘතිවල ද බහුලව යොදා ගෙන තිබේ.

ක්‍රිස්තු වර්ෂ 952-954 දෙවන උදය රජුගේ බදුලු සෙල් ලිපියේ "වත් වත් හිමියන් වහන්සේ මියු ගුණ මහ වෙහෙර වැඩි කලැ..." යනුවෙන් එම වචනය සඳහන් කර තිබේ.

බුදුන් වහන්සේ තෙවරක් ලක්බිමට වැඩි බව මහාවංශයෙහි දැක්වෙයි. ඉන් මුල් අවස්ථාව මහියංගණයටය.

"උතුරු කුරු දිවයිනෙන් පිණ්ඩපාතය ගෙනවුත් අනවතප්ත නම් විල සමීපයෙහි වළඳා තෙමේ, සවස් වේලෙහි සම්‍යක් සම්බෝධියෙන් නව වැනි මස දුරුතු පුර පසළොස්වක්හි ලංකාද්වීපය ශුද්ධ කරනු පිණිස ලක්දිවට වැඩම කළ සේක. සර්වඥයන් වහන්සේ විසින් ලංකා තොමෝ සසුන් බබළන තැනෙකැයි ද යකුන් විසින් පිරුණු ලක්දිව යක්ෂයෝ බැහැර කළ යුතුයැයි ද දක්නා ලදි. ලංකාද්වීපය මධ්‍යයෙහි මනෝරම්‍ය වූ ගං ඉවුරෙහි තුන් යොදුන් දිගු එක් යොදුන් පුළුල් වූ රම්‍ය වූ මහානාගවන නම් උයනෙහි යක්ෂයන්ගේ යුද්ධ භූමියෙහි ලක්දිව් වැසි යකුන්ගේ මහා නිශාචර සමාගමය ප්‍රසිද්ධම ය.

ඒ මහා යක්ෂ සමාගමයට පැමිණි සර්වඥ තෙම එහි සමාගම මැද ඔවුන්ගේ හිස් මතුයෙහි මහියංගණු තූපයාගේ ස්ථානයෙහි අහස් කුස වැඩ සිටි සේක. ඔවුන්ට බියජනක වූ වර්ෂා වාතාන්ධකාරාදිය මැවූ සේක. බියෙන් පෙළුණා වූ යක්ෂයෝ නිර්භය වූ තථාගතයන් වහන්සේ ගෙන් අභය ඉල්ලූහ."

*(මහාවංශයේ පළමු පරිච්ඡේදය 18-25 ගාථා)*

මේ අනුව බුදුන් වහන්සේ ලක්දිවට මුල්වරට වැඩම කර මේ වසරේ ඉකුත් දුරුතු පසළොස්වකදාට වසර 2609 ක් සපිරුණි.

එදා බුදුන් වහන්සේගෙන් බණ අසා තිසරණ ගත වූ පළමු ලාංකික පිරිස බිහි වූයේ ද පළමුවෙන් තිසරණ සරණ ගිය පුද්ගලයා සුමන සමන් (දෙවියන්) බව ද සඳහන්ය. සුමන සමන් දෙවියන්ගේ ඉල්ලීම මත බුදුන් වහන්සේ දුන් කේශ ධාතු මෙහි නිදන් කොට ඇති බැවින් ස්තූප නිර්මාණයේ මුල් සාධකය එළිදක්වන ස්ථානය ලෙසින් ද මහියංගණය වැදගත් වෙයි.

> "එකොළොස් වැනි සියවසේ චෝල ආක්‍රමණයෙන් වැනසුණු වෙහෙර විහාර අතර මියුගුණ සෑය ද විය. ලක්දිව බලය යළි සිංහලයන් පවරා ගත් පසු ප්‍රතිසංස්කරණය කිරීමේදී ප්‍රමුඛතාව දීමෙන් වංශ කතා කියන පරිදි මහියංගණ චෛත්‍යය ඉක්මනින්ම මහා විජයබාහු රජු යටතේ පිළිසකර කිරීමත් අනුව මෙම ධාතු ගර්භය ඒ අවස්ථාවේ ස්ථාපිත වූවක් බව පිළිගත හැකි වේ."

සමන් දෙවියන් විසින් ඉඳුනිල් මැණිකෙන් සත් රියන් උස් ස්තූපයක් එම ස්ථානයේ කරවන ලද බැව් මහා වංශය දක්වයි. ධාතු වංශය ද එම කරුණ සනාථ කරන නමුදු රාජාවලිය එය සඳහන් කරන්නෙ රනින් කළ තූපයක කේෂ ධාතු නිධන් කළ බවය.


සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සරභූ රහතන් වහන්සේ බුදුන් වහන්සේගේ ග්‍රීවා ධාතුව රැගෙන විත් මහියංගණ දාගැබේ නිදන් කොට දොළොස් රියන් උසට මේදෝවර්ණ පාෂාණයෙන් දාගැබ කරවන ලද බව ද සඳහන් වේ.

දෙවන පෑතිස් රජුගේ සහෝදර උද්ධචූලාභය කුමරු මහියංගණ ප්‍රදේශය පාලනය කළ අවදියේදී මහියංගණ දාගැබ දෙතිස් රියනක් උසට බඳවන ලදී. ගැමුණු කුමරු රුහුණේ සිට පැමිණ මහියංගණයේ කඳවුරු බැඳ සිටි අවස්ථාවේ මේ දාගැබ සූසැට හෝ අසූ රියන් කොට බඳවන ලද බවත් සඳහන් වේ.

අනුරාධපුර රජ කළ වෝහාරික තිස්ස රජු (ක්‍රි.ව.210-232) මහියංගණ සෑයට ඡත්‍රයක් සවි කළ බවත්, දෙවැනි සේන (ක්‍රි.ව.839-874) සහ සිවුවැනි කාශ්‍යප (ක්‍රි.ව.885-912) මෙහි වූ විහාරයට ගම්වර පිදූ බවත් කියැවේ. පොලොන්නරුවේ රජ කළ පළමුවැනි විජයබාහු රජු ද (1056-1111) මියුගුණ සෑය ප්‍රතිසංස්කරණය කර ඇතැයි 1951 දී මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා කළ පර්යේෂණ කැණීමකින් සොයා ගෙන තිබිණ.

කෝට්ටේ සවැනි පැරකුම්බා රජු (ක්‍රි.ව.1402-1467) සෑයේ කැඩුණු බිඳුණු තැන් පිළිසකර කර තිබේ. දෙවැනි රාජසිංහ රජු උපන්නේ ද මහියංගණයේ විල්ලුපිටියේ බව සැලකේ.





ධාතු ගර්භයේ තිබූ ලෝකධ මූර්තියක් සහ විෂ්ණු, ශිව හා බුද්ධත්වය නිරූපිත සිතුවම්

දෙවැනි විමලධර්මසූරිය රජ සමයේ (ක්‍රි.ව.1687-1707) ලන්දේසීන් මියුගුණ සෑය කොල්ල කා විශාල වස්තූන් රැසක් රැගෙන ගිය බව සඳහන් වේ.

19 වැනි සියවසේදී ඉංග්‍රීසි ජාතික එමර්සන් ටෙනන්ට් මෙම ස්ථානයට එන විට මියුගුණ සෑය කඩා වැටී තිබූ බවත් ඒ වන විට එහි උස අඩි 100 ක් පමණ වූ බවත් වාර්තා කර ඇත. 1851 දී ඉද්දල්ගොඩ ධම්මපාල හිමියන් මෙහි වැඩම කර 1871 දී යළි ප්‍රතිසංස්කරණ අරඹා තිබේ. 1890 දී එහි කොත පලඳවා ප්‍රකෘති කළ නමුත් 1922 වන විට යළිත් ගරා වැටී තිබේ.

1922 දී නැවතත් අඹගස්වැවේ රතනජෝති හිමියන්ගේ මූලිකත්වයෙන් සෑයේ පිළිසකර කිරීම් අරඹා ඇත. 1949 දී මහියංගණ විහාර වර්ධන සමිතියේ මූලිකත්වයෙන් පිළිසකර කිරීමේ වැඩ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමඟ අරඹා තිබේ.

## ධාතු ගර්භය සහ සිතුවම්

1951 ජනවාරි 03 දා පුරාවිද්‍යාඥ සෙනරත් පරණවිතාන මහතාගේ අධීක්ෂණයෙන් මියුගුණ සෑයේ ධාතු ගර්භය විවෘත කෙරිණි. ප්‍රථමයෙන් ඉවත් කළ එක් ගල් කැබැල්ලකින් පමණක් හටගත් විවරයෙන් ඉර එළිය ගැබ තුළට වැටීම නිසා පැරණි ධාතු ගර්භයේ වස්තු නිදන් කර තිබූ ආකාරය දැක ගන්නට ලැබිණ.

ධාතු ගර්භයේ බිත්ති මත මුල්වරට සිතුවම් දැක ගත හැකි විය. බදාම කැබලිවලට පත්ව තිබිණි. ධාතු ගර්භය එකළොස් වැනි සියවසට අයත් යැයි සැලකිණි. එහි පැරණිතම සිතුවම් පොළොන්නරුව යුගයට අයත් විය. එහි තැන්පත් කරන ලද පූජා භාණ්ඩ ඒ ආකාරයෙන්ම නොවෙනස්ව පැවතිණි.

ධාතු ගර්භය අඩි හතරේ හතරැස් කොටුවක් ලෙස නිම කර තිබිණි. එහි උස අඩි 3 යි අඟල් 9 ක් වූ අතර ප්‍රධාන දිසාවකට කුහරයක් විය. ධාතු ගර්භය හරි මැද ගැලවිය හැකි පියනක් සහිත ගල් පෙට්ටියක් විය. එය සිවු කොනේ එය ආරක්ෂා කිරීමට මෙන් ලෝකඩින් තැනූ අශ්වාරෝහක පිළිම සතරක් විය.

සෑම කුහරයක් තුළම බුදුපිළිම සහ හක්ගෙඩි තැන්පත් කර තිබිණි. මීට අමතරව ආභරණ, කාසි, මැණික් ගල් ඇතුළු වටිනා භාණ්ඩ රැසක් දක්නට ලැබිණි.

ගල්පෙට්ටිය තුළ සධාතුක කරඬු දෙකක් විය. ඉන් එක් ධාතු කරඬුවක් ස්තූපයක හැඩය ගත් අතර ඊට රන් ඡත්‍රයක් ද තිබිණි. අනෙක කුඩා කරඬුවකි. කුහරයක තැන්පත් කර ඇති එක් හිඳි බුදු පිළිමයක පිටුපස ඵලකයක ඉන්දියාවේ පාල යුගයට අයත් නාගරී අකුරින් ලියූ බෞද්ධ ධර්ම පාඨයක් නෙළා තිබෙනු දක්නට හැකි විය. එම පිළිමය ඊසාන දිග ඉන්දියාවෙන් ගෙනෙන ලද්දක් බව විශ්වාස කෙරේ.

එලෙසම තවත් කුහරයක් තිබූ බුදුපිළිමයක් ඉන්දියාවේ අමරාවතී කිරිගරුඬ පාෂාණයෙන් නෙළන ලද්දකි. මධ්‍යකාලීන යුගයට අයත් 'රන්අක' කාසියක් මෙතුළ විය. එබැවින් මෙම ධාතු ගර්භය ක්‍රි.ව. 9 සහ 11 අතරතුර ස්ථාපිත කරවූවක් ලෙස සැලකේ.

බුදුපිළිම, ධාතු කරඬු, ලෝහමය පහන්, තඹ කලස්, තුන් පා දරඬු මත කැපූ සංඛ, පැරැණි කාසි, ආභරණ සහ මැණික් යනාදිය මෙරට පැරණි නිමවුම් ක්ෂේත්‍රයේ තාක්ෂණික පාර්ශ්වය කෙබඳු දැයි හෙළි කරන්නකි.

මහියංගණ ධාතු ගර්භය වටාම බිතු සිතුවම් ඇඳ ඇතැයි අනුමාන කෙරේ. එහෙත් ඉන් ශේෂව තිබුණේ ඉන් කිහිපයකි. ශේෂ සිතුවම් අතර බෝ මැඩ වැඩ හිඳින බුදු රුවකි. එම බුදු රුවට දකුණුපසින් වැඩුණු රැවුළකින් යුතු ඍෂිවරයකුයැයි අනුමාන කෙරෙන පුද්ගලයෙකි. දේව සමූහයා දක්වන දර්ශනයක් ද එහි තිබිණි. ත්‍රිශූලයක් දරන ශිව ද සිය අත් සතරින් මල් වට්ටියක් ගත් විෂ්ණු ද මේ සිතුවම් අතරින් පැහැදිලිව හඳුනාගත හැකිය.

හිස මුඩු කළ සිවුරක්යැයි සිතිය හැකි වස්ත්‍රයක් සිරුර දවටා ගත් පිරිසක් ද පසෙකින් නිරූපිතය. මෙම පිරිසට ඉහළින් කඩු අතින් ගත් යම රජුගේ අනුගාමිකයන්යැයි අනුමාන කළ හැකි පිරිසකගේ සිතුවමකි.

කහ, තැඹිලි, දුඹුරු සහ සුදු වර්ණවලින් ඇඳ ඇති මේ සිතුවම් සියුම් රේඛාවලින් යුක්තය. එබැවින් මේ සිතුවම් එකළොස් වැනි සියවස්වලට අයත් බැව් සැලකේ.

බදාම කැබලි එකතු කර සංරක්ෂණය කළ විට චිත්‍ර ඛණ්ඩ 13 ක් පමණ ආරක්ෂා කර ගැනීමට හැකි වී තිබේ. ඒ අතරින් මාර පරාජය, බුද්ධත්වයට පත් වීම, දෙව් බඹුන් බුදුන් වැඳීමට පැමිණි අයුරු හඳුනාගත හැකිය.

චිත්‍ර ඛණ්ඩ අතරින් විශාලතම චිත්‍රය දිගින් අඩි 1 යි අඟල් 4 ක් පළලින් අඩි 1 යි අඟල් එක හමාරකි. බෝ මැඩ බුදුන් වැඩ සිටින අයුරු එමඟින් දැක්වෙයි.

එකොළොස් වැනි සියවසේ චෝල ආක්‍රමණයෙන් වැනසුණු වෙහෙර විහාර අතර මියුගුණ සෑය ද විය. ලක්දිව බලය යළි සිංහලයන් පවරා ගත් පසු ප්‍රතිසංස්කරණය කිරීමේදී ප්‍රමුඛතාව දීමෙන් වංශ කතා කියන පරිදි මහියංගණ චෛත්‍යය ඉක්මනින්ම මහා විජයබාහු රජු යටතේ පිළිසකර කිරීමත් අනුව මෙම ධාතු ගර්භය ඒ අවස්ථාවේ ස්ථාපිත වූවක් බව පිළිගත හැකි වේ.

මෙරට ඉතිහාසයේ සුවිශේෂ කඩඉම් ගණනාවකට සම්බන්ධ මේ බොදු පුදබිම සියවස් ගණනාවක් තිස්සේ රජුන් ඇතුළු බොදු සිත් සතන් සනහාලු අතර පෞරාණිකත්වයෙන් දේශීය අනන්‍යතාව තහවුරු කරනු ලබන දේශීය සංස්කෘතියේ මුදුන්මල්කඩක් ලෙසින් සැලකීම නිවැරැදිය.


බන්ධුල ගුණරත්න



# පුරාණ ලක්දිව පෙතිකඩ සිතුවම්

පුරාණ ලක්දිව සිත්තරුන් බිත්ති මත පමණක් නොව රෙදි මත ද සිතුවම් ඇඳි තාක්ෂණය දැන සිටි බවට සාධක ඇත. ඒ අනුව මෙහිදී එම රෙදි මත ඇඳි සිතුවම් තාක්ෂණය පිළිබඳව සොයා බැලේ.

ලක්දිව සිතුවම් කලාවේ ආරම්භය ආදි මානව යුගය දක්වා දිවෙන බව දැනට හමුවී ඇති ප්‍රාථමික ගුහා සිතුවම් අනුව පෙනී යයි. එසේ ඇරඹෙන්නාවූ මෙරට සිතුවම් කලාව අනුරාධපුර යුගය හා පොලොන්නරු යුගය තුළ දී සම්භාව්‍ය කලාවක් ලෙස වර්ධනය වී දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල හා කෝට්ටේ යන අවධීන්වලදී යම් පසුබෑමකට ලක්වන බව හඳුනාගත හැකිය. නැවතත් මහනුවර යුගයේ දී ධර්මදේශිත විහාරාශ්‍රිත කලාවක් ලෙස වර්ධනය වූ මෙරට සිතුවම් කලාවේ තාක්ෂණික පාර්ශ්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදී බොහෝ විට කථිකාවට ලක්වූයේ බිත්ති මත අඳින ලද සිතුවම් කලාව බව පෙනේ. නමුත් පුරාණ ලක්දිව සිත්තරුන් බිත්ති මත පමණක් නොව රෙදි මත ද සිතුවම් ඇඳි තාක්ෂණය දැන සිටි බවට සාධක ඇත. ඒ අනුව මෙහිදී එම රෙදි මත ඇඳි සිතුවම් තාක්ෂණය පිළිබඳව සොයා බැලේ.

ඝන කපු රෙදි කඩක අඳින ලද විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත විය හැකි චිත්‍රවලට පෙතිකඩ සිතුවම් යැයි කියනු ලැබේ. (සෝමතිලක 1997:7) අනුරාධපුර අවධියේ දී මෙරට දියුණු සිතුවම් තාක්ෂණයක් පැවැති බවට සාධක එම අවධියෙන් දැනට ශේෂවී ඇති සිතුවම් කොටස් තුළින් මනාව තහවුරු වේ. පුරාවිද්‍යාත්මක සාධක නොමැති වුවද ක්‍රි.පූ.2 සියවසේ දී රෙදි මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමයක් පැවැති බව මහාවංශයේ ලෝවාමහාපාය ඉදිකිරීම පිළිබඳව සඳහන් විස්තරය මඟින් තහවුරු වේ.

එහිදී රහතන් වහන්සේලා අටනමක් දෙව්ලොවට ගොස් රත්හිරියල් උපයෝගී කරගෙන රෙදිකඩක සැලසුමක් ඇඳගෙනවිත් තිබේ. මෙහි අතිශයෝක්තිය පිළිබඳව ගැටලු පැවතිය ද එම කාලවකවානුව වන විට රෙදි මත සිතුවම් නිර්මාණය කිරීමේ තාක්ෂණය මෙරට චිත්‍ර ශිල්පීන් දැන සිටි බවට ඉන් අනුමාන කළ හැකිය. (මහාවංශය 2004.27.10) එසේම රුවන්වැලිසෑය නිර්මාණයේ දී ද වැඩ අවසන් නොකළ සෑයේ කොටස් රෙදිවලින් ආවරණය කර සිතුවම් කළ බව මහාවංශයේ සඳහන් වේ.

"ඒ කුමර තම බෑයා දුර්වල බැවින් සන්නාලියන් ලවා සුදු පිළියෙන් සැට්ටයක් කරවා ඒ සැට්ටයෙන් සෑය වස්වා සිත්තරුන් ලවා එහි පිළිකඩ ද, පූර්ණ ඝට පංක්තීන්ද, පසඟුල් පංක්තිය ද මනා කොට කරවීය." (මහාවංශය 2004.32.2,3,4)

මේ තුළින් පැහැදිලි වන්නේ එකල රෙදි මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමයක් මෙරට සිත්තරුන් ප්‍රගුණ කර සිටි බවය. තව ද මේ යුගයේ පෙතිකඩ සිතුවම් නිර්මාණ තාක්ෂණය දියුණුව පැවති බවට සාධක ඓතිහාසික වාර්තාවලින් ලැබේ. චීන ජාතක ෆාහියන් භික්ෂුවගේ වාර්තාවේ සඳහන් කෙරෙන තොරතුරුවලදී ක්‍රි.ව. 5 සියවසේ මුල් භාගයේ දී අභයගිරි විහාරය හා සම්බන්ධිත දන්ත ධාතු ප්‍රදර්ශනයේදී මඟ දෙපස තබා තිබුණු රෙදිවල අඳින ලද ජාතක කතා, චිත්‍ර පුවරු ගණනාවක්ම උන්වහන්සේ දැක තිබේ. (බලගල්ලේ 2006:96 / ද සිල්වා 2008 :105) නමුත් රෙදි ඉතා ඉක්මනින් දිරා පත්වන බැවින් මෙම යුගයේ රෙදි මත ඇඳි සිතුවම් පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක නොලැබේ.

පොලොන්නරු යුගයේ දී ගඩොල් බිත්ති හා ගල් පර්වතවල පමණක් නොව අනුරාධපුර යුගයෙන් ඇරඹුණු පෙතිකඩ චිත්‍ර සම්ප්‍රදාය ද එනම් එම තාක්ෂණය ද පැවැති බවට සාහිත්‍ය මූලාශ්‍ර තුළින් සාධක ලැබේ. ලීලාවතී රැජිනගේ (1197- 1200) ප්‍රථම කාලයේ ලියවුනැයි සැලකෙන සසඳාවතෙහි කවියා මෙසේ සඳහන් කර තිබේ.

"මෙදා බැඳ අලෙව් - පටැ වැටි සනෙව් දක්වා

විසිතුරු රඟ තවර මෙන් - පිළිමෙහි විතර (සසඳාවත 1954: පද්‍ය 17, පිටු 20)

සිතියම් කරන පටෙහි තෙල්ලෙන් කටු සටහන් කරනු වැන්නැ පසුවද විස්තර කථාව විදහා පෑම නානා වර්ණයන් තවරා සිතුවම් සම්පූර්ණ කරනු වැන්න" මෙහි අරුත වේ. එසේම බුත්සරණෙහි එන විස්තර අනුව ද මෙකල පෙතිකඩ සිතුවම් තාක්ෂණය පැවැති බවට සාධක ලැබේ.

දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල හා කෝට්ටේ යන සංක්‍රාන්තික අවධියේදී ද පෙතිකඩ සිතුවම් සම්ප්‍රදාය අඛණ්ඩව පැවැති බවට සාහිත්‍ය මූලාශ්‍රවලින් සාධක ලැබේ. සද්ධර්මරත්නාවලියේ දැක්වෙන්නේ " සිත්තම් කොට හකුළුවා තැබූ පෙත්තක් විදහාපාන කලක් පරිද්දෙන්" (සද්ධර්මරත්නාවලිය 1930 : 299) ලෙසය.

පෙතිකඩ සිතුවම් කලාව සඳහා දීර්ඝ ඉතිහාසයක් ඇති බව මෙන්ම මහනුවර යුගයේ දී එය ඉතා ප්‍රචලිත වූ බවට බොහෝ තොරතුරු තිබේ.

නුවර යුගයේ පෙතිකඩ සිතුවම් නිර්මාණයේ දී තලය වශයෙන් භාවිත කරන ලද්දේ රෙදි එනම් වස්ත්‍ර වන අතර එහිදී වාටි සහිත රෙදි භාවිත කර තිබේ. පෙතිකඩ සිතුවම් බිතුසිතුවම් මෙන් එක් ස්ථානයක රඳා නොපවතින අතර එම නිසා ඒ පිලිබඳව විශේෂ සැලකිල්ලක් දැක්වීමට සිදුවී තිබේ. බොහෝවිට මෙම සිතුවම් ප්‍රදර්ශනයෙන් පසුව හකුලා තබන අතර නිතර නිතර දිගහැරීමෙන් හා හැකිළීමෙන් සිතුවමට හානි වීමේ ඉඩකඩ වැඩිය. එම නිසා වර්ණවල පදම හා උපකරණ සැලකිල්ලෙන් භාවිත කරන්නට ඇත. වර්ණය වඩාත් ඝනකම වුවහොත් පතුරු වශයෙන් ගැලවී යාහැකි අතර තුනී වුවහොත් අදාළ රෙද්දේ වර්ණ නිසි ලෙස තහවුරු නොවේ. එනම් රෙදිකඩට සායම් උරාගැනීම නිසා බලාපොරොත්තු වූ වර්ණය නොලැබී යාහැකිය. තවද මැලියම් වැඩිවීමෙන් ද වර්ණ කොටස් ඉරි තලනු ලැබේ. මෙම නිසා පෙතිකඩ සිතුවම් නිර්මාණයේ දී ගුරුහරුකම් ලැබීම වැදගත් කොට සැලකූ අතර වැඩි ප්‍රමාණයක් සිතුවම් ඇඳ ඇත්තේ දිවුල් ලාටු මිශ්‍ර වර්ණයෙනි. පෙතිකඩ සිතුවම් දිගහැරීම හා හැකිලීම පහසුවීමට මෙන්ම එල්ලා තැබීමේ පහසුවීම සඳහා එහි ඉහළින් හා පහළින් රවුම් පොලු දෙකක් සවිකර ඇත. (චාර්ල්ස් 2001:38, 39)

ප්‍රමාණයෙන් අඩි 50 – 60 දිග පෙතිකඩ ද දැකගත හැකි බව චාර්ල්ස් මහතා සඳහන් කරයි. මෙම සිතුවම්කරණයේදී ද බිතුසිතුවම් සඳහා යොදාගත් වර්ණම යොදාගෙන තිබෙන අතර සුළු වශයෙන් වෙනස්කම් ද තිබී ඇත. පෙතිකඩ සිතුවම් නිර්මාණ තාක්ෂණය පියවර හතරක් යටතේ සිදු වී තිබේ.

රෙද්ද සේදීම (ධෟත), බත් ආලේප කිරීම (ඝට්ටිත), වර්ණයෙන් රූප ඇඳීම (ලංඡ්ජිත) සහ උචිත වර්ණයෙන් රූප පාට කිරීම (රඤ්ජිත), (පීරිස් 2001.27) යනුවෙනි.

මේ අනුව පළමුව ඉරටවාටිය සහිත රෙද්ද ගෙන අහුලී හා වෙනිවැල්ගැට තැම්බූ වතුරින් සෝදාගෙන ඇති අතර බත් ආලේප කිරීමේ දී කැඳ වතුර මිශ්‍ර කර සාදාගත් මකුළු සුදුපාට රෙද්ද පුරා ගල්වා තිබේ. මෙසේ දින කීපයක් රෙද්ද වේලාගැනීමෙන් පසුව වර්ණ භාවිතා කර මූලික රේඛා ඇඳ ගෙන දැහිගුලෙන් රූප ලකුණු කර ඇත.

එම වර්ණය සාදාගෙන ඇත්තේ, පතඟි කලං 3යි, කොරකහ ලී කලං 3යි, ගම්මාලු ලී කලං 3යි, රත්මල් කලං 3යි, යන ද්‍රව්‍ය එකට ගෙන තලා, හතර එකට සිඳුවා එයට අරක්කු යොදා නැවත සිඳුවාගෙන පසුව එයට බිත්තර සුදුමදය හා දිවුල් මැලියම් යොදා මිශ්‍ර කොටගෙනය. (චාර්ල්ස් 1990:85) මෙසේ මූලික රේඛා ඇඳ ගැනීමෙන් පසු සෙසු වර්ණ යොදා සිතුවම් නිමකර ඇත. පෙතිකඩ සිතුවම් නිර්මාණ තාක්ෂණය උඩරට සිත්තරුන් අතර ව්‍යාප්තව පැවතිය ද පහතරට සිත්තරුන් ඒ සඳහා යොමු වූ බවක් නොපෙනේ.

නූතන අවධියේදී ද රෙදි මත සිතුවම් නිර්මාණය කරන තාක්ෂණය හොඳින් ප්‍රචලිතව පවතින බව අපට හඳුනාගත හැකිය. විශේෂයෙන්ම තොරණ සිතුවම් නිර්මාණයේ දී සිත්තරුන් ඒ සඳහා යොදාගනු ලබන්නේ රෙදිය. ඊට අමතරව ධජපතාක, වස්ත්‍රාභරණ, වේදිකා අලංකරණ, ප්‍රචාරක දැන්වීම් කටයුතු සඳහා නූතනයේදී රෙදි මත අඳින ලද සිතුවම් භාවිතා කරනු ලබයි.

උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
රත්නපුර

පූජාවලි විමසුම – 15

# පන්සිල් රැක ලැබිය හැකි තවුස් දම් අටක්

*පසුගිය ලිපියෙන් අප විචාරයට ලක් කළේ පූජාවලියේ ආ පංචායුධ ජාතකයයි. උපාය දත් අය අපායට නොයන බවට ඇති ජනප්‍රවාදය තේමා කර ගනිමින් කළ මෙම විග්‍රහය ලොකු කුඩා හැමටම ස්ථානෝචිත ප්‍රඥාවෙන් ජීවත් වීමට මග පෙන්වීමකි. අද ලිපියෙන් අප සාකච්ඡා කරන්නේ හයවැනි පරිච්ඡේදයේ එන තවත් වැදගත් කරුණක් වෙතටය. එනම් හොඳින් පන්සිල් ආරක්ෂා කිරීමෙන් පංචාභිඥාලාභී තාපස දිවියකට පත් විය හැකි ආකාරය ගැන කියන පූජාවලී විවරණය වෙතටයි.*

**කතුවරයා මෙය අරඹන්නේ මෙසේය, "තවද, කණ්හ ජාතකයෙහි අසූ කෙළක් පමණ ධන ඇති බ්‍රාහ්මණ මහාසාර සැපත් හැර වල් ගොස් අට විධ වූ තපස් අතුරෙන් දන්තලුයයක නම් වූ සවන තපස් කොට මුද්ධ ගසක් මුල සිද වාසය කරන දැය" යනුවෙනි. තාපස දිවිය ආදිකාලීන සමාජවල අනිවාර්ය අංගයක්ව පැවති අයුරු ඉතා පැහැදිලිය.**

බ්‍රාහ්මණයෝ සමාජය කොටස්වලට බෙදා දැක්වූවා සේම ජීවිතය ද කොටස්වලට බෙදා දැක්වූහ. වර්ණාශ්‍රම ධර්ම ලෙසින් දැක්වූ මෙම බෙදීම නම් බ්‍රහ්මචාරී ගෘහස්ත වානප්‍රස්ථ සහ සන්‍යාසී නම් විය. ආර්යයන්ගේ ළමා කාලය පූන නූල පැළඳවීමෙන් අවසන් කෙරෙන අතර බ්‍රහ්මචාරී අවස්ථාවෙහි සිප්සතර හැදෑරීම් කළ යුතු විය. විවාහ වී ගත කරන ජීවිතය ගෘහස්ත නම් වේ. වානප්‍රස්ථ අවස්ථාව යනු ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන සතර කාරණා ප්‍රගුණ කරමින් ගත කළ යුතු කාලයයි. එම අවස්ථා ප්‍රගුණ කිරීමෙන් පසු වියපත් බවට පත් වන අතර එවිට සියලු දෙනා සන්න්‍යාසී හෙවත් වනගත වීම අනිවාර්ය විය.

ලෞකික දේවල් පිළිබද ආශාවන් බැහැර කොට මූලික අවශ්‍යතා පමණක් සපුරා ගනිමින් වනයෙහි ගත කළ මෙම

දිවිය තාපස දිවියකට සමානත්වයක් දැරීය. බුද්ධකාලීනව මෙවැනි තාපස සම්ප්‍රදායයන් පතා ජනප්‍රිය වී පැවතුණි.

අසිත තාපසයාගේ කථාව මීට හොඳම නිදසුනයි. ඔහු සුදොවුන් රජුගේ ගුරුවරයකු වූ බවත් බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මාහිමියෝ තම බුද්ධ චරිතය පොතෙහි මෙසේ දක්වති.

ශුද්ධෝදන රජතුමා ළපැටි වියෙහිදි සිප්සතර උගත්තේ එවකට සිංහ හනු රජුට පුරෝහිතව සිටි අසිත දේවල නම් බමුණු පඬිවරයාගෙනි. රජු කලුරිය කළ පසු හේ තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යාන වඩා පංචාභිඥා හා අෂ්ට සමාපත්තීන් ඉපිදවීය.

මේ අනුව බුද්ධකාලීන තවුස් දිවිය බ්‍රාහ්මණයන් විසින් පනවන ලද සන්‍යාසි දිවියට වඩා වැදගත් ප්‍රභූ

තත්ත්වයක පැවති බව පැහැදිලිය. සිදුහත් බෝසතාණෝ ද අභිනිෂ්ක්‍රමණය කොට පිවිසෙන්නේ තවුස් දිවියකටය. තවුසන් කසාවත දැරූ බවත් පැන් කෙණ්ඩිය අතදරා සිටි බවත් දැක්වෙයි. පූජාවලී හිමියන් මෙහි විවරණය කරන්නේ එවැනි තවුස් දම් අටක් පැවති බවයි.

අටවිධ වූ තපස් නම් කවර යත්, සපුත්කදාරකය, උවරීකය, සම්පත්තකාලකය, අනග්ගිපක්කිකය, අසම්මුට්ඨිකය, දන්තලුය්‍යකය, පවත්තඵලකය, වණ්ටමුත්තකය යන මේ අටතපස් නම්.

මෙම අට තපස් කවරේද යන්න පූජාවලී හිමියෝ පහදති. ඒ අනුව සපුත්තදාරකය යනු සමහර කෙනෙක් අඹුදරුවන් කෙරෙහි ආශාවෙන් ඔවුන් හැරපිය නොහී ඔවුන් සමගම කෘෂි වණික් ආදී නිරවද්‍ය කර්මාන්තයෙන් දවස් යවන එහෙත් තාපස වෙස් ගෙන ගෘහස්ථ වාසයෙහි යෙදෙන තාපසයෝය.

මොවුන් ද තත්කාලීන ආගමික කොට්ඨාසයක් ලෙස පිළිගන්නා ලද අතර විවිධ ආගමික කාර්යයන්හි නිරතව සිටි බවට ද තොරතුරු හමු වෙයි. සමහර කෙනෙක් වනගත නොවී නගර දොරටුවේ පන්සලක් කරවා එහි සිටිමින් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය කුලවල හා සිටුවරුන්ගේ දරුවන්ට අකුරු කරවමින් රන් රිදී මසු කහවණු නොපිළිගෙන උදු, මුං, තලතෙල්, සහල් ආදිය පිළිගෙන තවුසන් ලෙස පෙනී සිටි අය උවරීකය යන නම් විය.

මේ තවුසන් අධ්‍යයන, අධ්‍යාපන කාර්යයෙහි නියැළීමත් ගෘහස්ත ජීවිතවලින් බැහැරව පන්සල් ජීවිත ගත කළ හෙයින් ඔවුන්ගේ තපස මුල් තපසට වඩා උසස් වූ බව පූජාවලී හිමියෝ කියති.

තවත් සමහර කෙනෙක් තවුස් වෙස් ගෙන කිසිදු බැඳීමකින් තොරව ගමට වැද ආහාර සොයා ගෙන ලද දෙයකින් යැපෙමින් ඉතා සරල ජීවිතයක් ගත කළ තවුස් දිවිය සමපත්තකාලක නම් විය. මෙම තාපසයන් දෙවන තාපස කණ්ඩායමට වඩා උසස් වූ බව පූජාවලී තෙරුන්ගේ මතයයි.

තවත් සමහර කෙනෙක් ගින්නේ සකසා ගත් ආහාර පිළිකෙව් කොට වනයෙහි වන මුල් ඵලාඵල පමණක් අනුභව කොට තවුස්දම් රැකි පිරිස අනග්ගිපක්කික නම් විය. මේ තවුසන් තෙවන තවුසන්ට වඩා උසස් වූ බව දැක්විණ.

තවත් සමහර වීරපුරුෂ කෙනෙක් කිසියම් ආයුධයක් අතින් ගෙන වනයට ඇවිදිමින් දුටු යම් ගසෙකින් පොතු මුල් ආදිය පමණක් තළා ගෙන ඉතා සරල ආහාරයක් ගෙන භාවනාවෙන් තවුස් දම් පිරූ අතර ඔවුන් අසම්මුට්ඨිකයෝ නමින් හැඳින්වූහ. එය සිව්වන තපස් කණ්ඩායමට වඩා උසස් විය. තවත් පිරිසක් වනගතව දුටු යම් ගසෙකින් පොතුමුල් ආදිය දතින් ගලවා කමින් උපෝෂථාංග සීලයෙහි යෙදෙමින් බ්‍රහ්ම විහාර භාවනාවෙහි යෙදුණු අතර ඔවුහු දන්තලුය්‍යක තාපසවරු වූහ. එම තවුසන් පෙර කී පස්වන තවුසන්ට වඩා උසස් වීය. තවත් පිරිසක් එක් විලක හෝ වන ලැහැබක වසමින් එහි මල් කොළ දලු අනුභව කරමින් නිත්‍ය ශීලය ආරක්ෂා කරමින් බ්‍රහ්මචර්යා තවුස් දිවියක් ගෙවන අය පවත්තඵලකයන් නමින් හැඳින්විණ. ඔවුන් පෙරකී තවුසන්ට වඩා උසස් විය.

සමහර වීර පුරුෂ කෙනෙක් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වනගතව රුක්ඛ මූලිකව වසමින් තමන්ගේ අත්සීමාවට වැටෙන මල් ඵල කොළ ආදිය පමණක් කමින් තවුස් දම් පිරූ කොටස වණ්ටමුත්තක නම් විය. ඔවුන්ගේ තපස අන් සියලුම තවුස් ජීවිතවලට වඩා උසස් විය.



මේ සියල්ල ලබනුයේ කෙසේද යන්න පූජාවලී හිමියෝ මෙසේ දක්වති. මොහු අටදෙනම පඤ්චශීලය රක්ෂා කොට පඤ්චාභිඥා අෂ්ට සමාපත්තිලාභී වෙත්මය. ගුණයෙන් වනාහී ක්‍රම ක්‍රමයෙන් ම උත්තමහයි දතයුතු. මේ අනුව පූජාවලී කතුවරයාණන් මෙවැනි තවුස් ජීවිත පිළිබඳ විමසුමක් ඉදිරිපත් කෙරුණේ හුදෙක් එදා දඹදෙණි යුගවල විසූ විවිධාකාර ආගමික කණ්ඩායම් සඳහා නිසි මග පෙන්වීමක් සඳහාය. එපමණක් නොව මෙය නූතන පිරිහී ගිය ඇතැම් පූජ්‍ය පූජක සියලු දෙනාටමත් බෙහෙවින් අදාළ වෙයි.

මහාචාර්ය අගලකඩ සිරිසුමන හිමි
සිංහල අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

# උඩරට සුරැකි බලන කොටුව






ශ්‍රී ලංකාව යනු අතීතයේ සිටම විවිධ වූ විදෙස් ආක්‍රමණයන්ට වරින් වර මුහුණ දුන් රටකි. ඉපැරණි සේද මාවතේ මධ්‍යගතව පිහිටීම මෙන්ම ඉන්දියන් සාගරය මධ්‍යයේ ශ්‍රී ලංකාව පිහිටීම මේ ආක්‍රමණයන්ට මූලික හේතුවක් විය.

අතීතයේ බොහෝ ආක්‍රමණ එල්ලවූයේ අසල්වැසි ඉන්දියාවෙනි. එහෙත් පසුකාලීනව කුළුබඩු සොයා ඉන්දියානු කලාපයට පැමිණි බටහිර ජාතීන්ගේ ආක්‍රමණවලට ද ශ්‍රී ලංකාව යටත් විය. මෙරට මුහුදු බඩ පළාත් මුලින්ම යටත් වූයේ 1505 දී පෘතුගීසින්ටය. පසුව ලන්දේසීන් ද 1796 වර්ෂයේ දී මෙරට මුහුදු බඩ පාලනය ඉංග්‍රීසිහු ද සියතට ගත්හ.

රටේ මුහුදු බඩ පළාත් මෙලෙස එක් එක් ආක්‍රමණිකයන් අතට පත්වෙද්දී සෙංකඩගල, නැතහොත් උඩරට රාජධානිය සිය ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින් පැවතිණ. එහි ස්වාධීනත්වය අවසන් වූයේ 1818 මාර්තු 2 වැනි දින මඟුල් මඩුවේ දී ඉංග්‍රීසීන් හා උඩරට ප්‍රභූන් අතර අත්සන් කෙරුණු උඩරට ගිවිසුමෙන් පසුවය.

මුහුදු බඩ පළාත් අල්ලා ගත් ආක්‍රමණිකයෝ සිය පාලනයේ හස්තයට උඩරට රාජධානිය යටත් කර ගැනීමටද නිරන්තර උත්සාහයක නිරත වූහ. එහෙත් එය පහසු කාර්යයක් නොවීය. සැබැවින්ම කිසිදු විදෙස් ජාතියකට උඩරට, යුද්ධයෙන් අල්ලා ගැනීමට හැකි වූයේ නැත.

උඩරට පාලනය කළ රජවරුන්ගේ හා ප්‍රභූන්ගේ උපක්‍රමශීලීත්වය මෙන්ම රාජධානියේ පිහිටීම ද මේ ආරක්ෂාවට ප්‍රධාන හේතුවක් විය. සොබාදහම විසින් වන දුර්ග, ගිරි දුර්ග, හා ජල දුර්ගයන්ගෙන් උඩරට රාජධානියට ආරක්ෂාව සලසා තිබුණි. රාජධානිය සඳහා ප්‍රවේශ විය යුතුව තිබුණේ කපොලු හරහාය. මෙම කපොලුවල ආරක්ෂාව තර කිරීමට උඩරට රජවරු පියවර ගෙන තිබුණි. මෙහිදි වඩා වැදගත් කපොල්ල වූයේ බලන කපොල්ලයි.

ඉංග්‍රීසීන් විසින් දුම්රිය හා මහා මාර්ග ඉදිකිරීමට පෙර කොළඹ සිට මහනුවර දක්වා වූ මාර්ගය වුයේ හංවැල්ල, අවිස්සාවේල්ල, බුලත්කොහුපිටිය, අලුත්නුවර, ගනේතැන්න, හා බලන හරහාය. පසුව ඉදිකෙරුණු මහා මාර්ගය හා දුම්රිය මාර්ගය වැටී ඇත්තේ ද බලන ආසන්නයෙනි.

මහනුවර යටිනුවර ප්‍රදේශයේ කඩුගන්නාව පොත්තපිටිය මාර්ගයේ කිලෝමීටර් පහක් පමණ ගිය පසු හමුවන වෙරළුගොල්ල නම් ග්‍රාමයේ උස් කඳු මුදුනක පිහිටි බිම් කඩක් අතීතයේ උඩරට රාජධානිය පර සතුරු ආක්‍රමණවලින් රැක ගන්නට විසල් මෙහෙයක් ඉටුකර තිබේ. අලගල්ල කඳු වැටියේ දකුණු දෙසට වන්නට පිහිටි කඳු ගැටයක් මත පිහිටි බලන කපොල්ල ලෙස ප්‍රසිද්ධ මෙම ස්ථානය අතීත උඩරට රාජධානියේ ප්‍රධාන පිවිසුම් ස්ථානයකි.

අහස අරා නැඟි අලගල්ල කඳු වැටියට දකුණු දෙසින් පිහිටි මෙම බලන කපොල්ලේ ප්‍රධාන අරක්ෂක කොටුව ඉදිකර ඇත්තේ එවක උඩරට රාජධානියේ සිටි ප්‍රභූවරයකු වූ අමුණුපුර මුඳලිඳු නම් පුද්ගලයෙකු විසින් යැයි සඳහන් වේ.

ගිරි දුර්ග, වන දුර්ග, හා ජල දුර්ග යන සියලු ආරක්ෂිත ක්‍රමවේදයන්ගෙන් සමන්විත බලන කොටුව සඳහා පළමුවන විමලධර්මසූරිය රජුගෙන් විසල් අනුග්‍රහයක් හිමිව ඇත්තේ රාජ්‍යයේ ආරක්ෂාව වෙනුවෙන් එය අතිශය වැදගත් වූ නිසාය.

පහතරට කොළඹ ප්‍රදේශයේ සිට පැමිණෙන පුද්ගලයන් අතීතයේ දී උඩරට රාජධානිය වෙත පිවිසිය යුතු වූයේ මෙම මුරපොල හරහාය. ඒ අනුව පැරණි උඩරට රාජධානියේ වඩා කාර්යබහුලම කඩවත වී ඇත්තේ ද බලන කොටුව හා කපොල්ලයි. මෙමගින් රාජධානියට පිවිසුම් සිදුවුවත් මෙය ප්‍රමුඛ ලෙසින්ම පැවතියේ ආරක්ෂිත මුර කපොල්ලක් ලෙසිනි. සිය රාජධානිය වෙනුවෙන් ඔත්තු බැලීම මෙහි ප්‍රධාන රජකාරිය විය. ඒ අනුව උඩරට රාජධානියේ ආරක්ෂාව හා ස්වාධිපත්‍ය වෙනුවෙන් මෙම ස්ථානයෙන් ඉටුව ඇත්තේ විසල් කාර්යයකි.

දිගින් දිගටම උඩරට රාජධානිය සිය ස්වාධීනත්වය පෙර ලෙසම ආරක්ෂා කර ගැනීමේ දී විශාලතම සේවයක් සපයනු ලැබුවේ මෙම බලන කොටුවය. කොළඹ සිටි විදෙස් ආක්‍රමණිකයින් උඩරට රාජධානිය වෙත පැමිණෙන්නේ නම් ඒ සඳහා ඇති එකම මාර්ගය වැටී තිබුණේ බලන හරහාය. මේ නිසාම උඩරට පාලකයන් කළේ බලන කොටුවේ ආරක්ෂාව තර කිරීමය.

භූමියේ පිහිටීමත් සමගින් බලන කොටුව යනු සුවිශාලව ඉදි කළ බළකොටුවක් නොවීය. එහෙත් එය ශක්තිමත්ව ඉදිකිරීමට උඩරට රජුන් පියවර ගෙන තිබුණි.

බලන කොටුව ගල්කුළක් මත සමචතුරශ්‍රාකාරව ඉදිකර ඇති සිවුකොන මුර අට්ටාල තිබූ බවට ද සාක්ෂි හමුවේ. එම අට්ටාලවල සිට අතීත උඩරට සෙබළුන් සිය රාජධානියේ ආරක්ෂාව වෙනුවෙන් ඔත්තු බැලූහ.

මෙහි සිට බලන විට සතර කෝරළයේ කඳු පන්ති අතර වන බතලේගල, දෙවනගල මෙන්ම ඌරාගල ද හොඳින් දැක ගත හැකිවා සේම පහතරටට අයත් විසල් ප්‍රදේශයක් ද දැක ගත හැකිය.

මෙම දර්ශනය අද එහි යන්නෙකුගේ නෙතට මනරම් වෙනවා


කොටුවේ පියගැට පෙළක්

මෙන්ම අතීත උඩරට සෙබළාට සිය රාජධානියේ ආරක්ෂාව තහවුරු කරන්නට විසල් මෙහෙයක් ඉටු කර ඇත.

අතීතයේ දී මෙහි ගිමන් මාලිගයක් තිබී ඇති අතර එය රජු මෙහි පැමිණි විට ගිමන් නිවා ගැනීමට යොදාගෙන තිබේ.

අද වන විට මෙය සම්පූර්ණයෙන්ම විනාශ වී ඇත. ඉතිහාසයේ සඳහන් පරිදි පළමුවන විමලධර්මසූරිය රජු මෙහි රහසිගතව සැඟව සිට ද ඇත. රහස් උමං මාර්ග හා අවි ගබඩා මෙම බිම ආශ්‍රිතව ඇති බවට ද සඳහන් වේ.

මුහුදු මට්ටමේ සිට අඩි 2000 ක් පමණ උසකින් පිහිටි බලන කොටුව ආසන්නයෙන් අතීතයේ දී සතර කෝරළයට අයත් වූ ගල්බඩ කෝරලයේ සීමාව ද පිහිටා තිබී ඇත.

මෙම ස්ථානයේ පළමුවරට සටනක් පිළිබඳව වාර්තාවන්නේ පළමුවන විමලධර්මසූරිය රජුගේ දන්තුරේ සටනට සමගාමීවය. පෘතුගීසින්ට එරෙහිව සිදු වූ මෙම සටනේදී සියලු පෘතුගීසී සෙබළුන් මිය ගිය බවට වාර්තා වේ.

පෘතුගීසි ලේඛකයකුම දක්වා ඇති පරිදි එම සටනේ දී උඩරට සෙබළ බළ මුළු තුරු හා ගල් අතර සැඟව ඊතල හා වෙඩි ප්‍රහාර


බලන කොටු බැම්මේ අවශේෂ

සතුරු හමුදා වෙත එල්ල කර තිබේ. පසුව පරාද වී පසුබැස යන හමුදාවේ ගමන් මග අහුරන්නට මාර්ග හරස් කර විසල් ගස් කපා දමා ඇත. උඩරට ආක්‍රමණය සඳහා පැමිණි සියලු පෘතුගීසි සෙබළුන්ට සිදුවූයේ සිය දිවියෙන් වන්දි ගෙවීමටය. බලන කොටුව හේතුවෙන්ම පෘතුගීසින්ටත් ලන්දේසීන්ටත් උඩරට ආක්‍රමණය කර අල්ලා ගත නොහැකි විය.

කෙසේ වුවද 1815 අත්සන් කළ උඩරට ගිවිසුමත් සමගින් උඩරට පාලනය ඉංග්‍රීසින්ගේ පාලනයට නතු විය. ඒ හේතුවෙන් බලන කොටුවට තිබු වැදගත්කම ද ක්‍රමයෙන් හීන වී අභෝසී වී ගියේය. පසුව එය තුරුලතා අතර සැඟව ගියේය.

අද වන විට මෙහි ඉතිරිව ඇත්තේ එහි පාදමේ නටබුන් පමණි. ඒ අනුව එහි කොටු පවුරේ කොටසක් හා පියගැට පෙළ දැකිය හැකිය. මෙහි ඉදිකිරීම්වලදී එහි බිත්ති ඝනකමව ශක්තිමත්ව ඉදි කර තිබීම විශේෂත්වයකි. මෙහි බිත්තිවලින් එක් කොටසක් ඉදිව ඇත්තේ ගල්කුළ මතය. එලෙසම ජල බැස්ම උදෙසා ඉදිකරන ලද කානු පද්ධතියක් ද දැක ගත හැකිය.

වර්තමානයේ දී මෙහි භාරකාරත්වය දරනුයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවය. අතීතයේ දී උඩරට සෙබළුන්ගේ මෙන්ම උඩරටට පිවිසෙන්නට පැමිණි විවිධ වූ පුද්ගලයින්ගෙන් පිරි ඉතිරි නිරන්තර කාර්යබහුල වූ බලන කොටුව තුළ අද ඇත්තේ දැඩි නිහඬතාවයකි. ඉඳහිට පැමිණෙන සංචාරකයකුගෙන් ඒ නිහැඬියාව බිඳී යන්නේය. නැතිනම් එහි නිහඬතාවය බිඳ දමන්නේ තුරුපත් මඳ නලට සැලෙන හඬට හෝ වඳුරකුගේ හෝ රිළවකුගේ නදට පමණි.


කොටුවේ එක් අන්තයක්

මෙරට අවසන් රාජධානියේ ආරක්ෂාව උදෙසා විසල් මෙහෙයක් ඉටුකළ ඒ බිම් කඩ අද ද අතීතයේ බොහෝ දේ සඟවා ගනිමින් නිහඬව බලා සිටියි.

නයනකේෂි විජේකෝන්

# කිසාගෝතමියගේ මුතුහර තැන්පත් කළ බුදුමුත්තාව


විහාරයේ ඉපැරණි බෝ මැඩ

අතීතයේ සිට වර්තමානය දක්වා දිවෙන රාජමහා විහාර සම්ප්‍රදායේ එක්තරා සුවිශේෂී අංගයක් වශයෙන් ටැම්පිට විහාර ආකෘතිය හැඳින්විය හැකිය. මෙම ටැම්පිට විහාර සම්ප්‍රදාය ලංකාවට පමණක් නොව සමස්ත බෞද්ධ රාජ්‍යයන්වලටම පොදු වූත්, ලංකාවට විශේෂ වූත්, බොදුනුවන්ගේ වටිනා වන්දනාවට පාත්‍ර වන පූජනීය ස්ථානයකි.

මෙසේ ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන ආකාරයට පවත්නා ටැම්පිට විහාර අතරින් නිකවැරටිය බුදුමුත්තාව ටැම්පිට විහාරයට අතීතයේ පටන්ම හිමිවන්නේ ඉතාමත් සුවිශේෂ ස්ථානයකි.

කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් හා ආණමඩුව දිස්ත්‍රික්කයෙන් වට වූ නිකවැරටිය මාගුල්ඹතොට කෝරලේ ඓතිහාසික පුරාවිද්‍යා වටිනාකම් රැසකින් සමන්විත පූජනීය ස්ථානයක් ලෙස බුදුමුත්තාව රජමහා විහාරස්ථානය හැඳින්විය හැකිය. බුදුමුත්තාව ටැම්පිට විහාරය සහිත භූමිය 1960 අගෝස්තු මස 12 වැනි දින අංක 14708 දරන ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යා රක්ෂිත භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබේ. ආචාර්ය එඩ්වඩ් මුලර්, එච්. සී. පී. බෙල්, ඒ එම්. හෝකාඩ් හා මහාචාර්ය සෙනරත් පරණවිතාන යන මෙරට අග්‍රගණ්‍ය පුරාවිද්‍යා කොමසාරිස්වරුන්ගේ අවධානයට යොමු විය.

මෙකී පුරාණ බුදුමුත්තාව ඓතිහාසික රජමහා විහාරස්ථානයට බුදුමුත්තාව යන නම ලැබීමට හේතුවීම පිළිබඳව ඇත්තේ එකිනෙක පරස්පර අදහස්ය. ඒ පිළිබඳ විවිධ මතවාදයන් පැවතිය ද වර්තමානය වනවිට පුරාවිද්‍යා සහ ඓතිහාසික කරුණු පිරික්සා ප්‍රධාන මතවාදයන් දෙකකට අවකාශ ලබා දී තිබේ.

සිදුහත් කුමරුට නිබ්බුත පද කී කිසාගෝතමියට දුන් මුතුහර ලංකාවට රැගෙන ආ දණ්ඩ ශාක්‍ය සහ තෘණ ශාක්‍ය යන කුමාරවරුන් දෙදෙනා එම මුතුහර තැන්පත් කොට තැබූ ස්ථානය (ස්තූපය) "මුදු මුතු වෙහෙර" යනුවෙන් භාවිතයට ආ බව පළමු මතයෙන් කියවේ. මෙකී බුදු මුතු වෙහෙර උච්චාරණයේ පහසුව තකා පසුකාලීනව "බුදුමුත්තා වෙහෙර" යනුවෙන් නම් වූ බව දක්නට ලැබේ. මෙකී පළමු මතය සනාථ කරමින් ශ්‍රී ලංකා කඩයිම් සංග්‍රහයේ "අපි බුදුන්ගේ මුක්තා ධාතුන් වහන්සේ පිහිටු දාගැබට වැඳ පුදා ස්වර්ග ලෝක සැප සිද්ධ කළ මැනවිය" යන පාඨයෙන් තහවුරු වෙයි.

මෙකී පළමු මතයට හාත්පසින්ම වෙනස් මතයක් දරන මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා ප්‍රකාශ කරන්නේ "බදුවලින් මුක්ත වූ ප්‍රදේශය" යන අරුත් පිළිබිඹු වන නිසා බුදුමුත්තාව නම් නම යෙදුණු බවයි. කෙසේ නමුත් මෙම ඓතිහාසික පුරාවිද්‍යා භූමිය අනුරාධපුරය, පොලොන්නරුව සහ මහනුවර යුගයන්ට ද නෑකම් කියන පුරාවස්තු රැසකින් සමන්විතය. දැනට බුදුමුත්තාව රජමහා විහාරයේ ශේෂව පවතින ටැම්පිට විහාරය මහනුවර යුගයේ ඉදිකරන ලද්දක් බවට සාධක පවතී.

මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ සැලසුමට අනුව ඉදිකර ඇති මෙම දෙමහල් ගොඩනැගිල්ල ඉතා දුර්ලභ ගණයේ එකක් සේ සැලකෙන්නේ මෙවැනි ටැම්පිට විහාර ආකෘති ලංකාවට විරල වූ නිසාය. බුදුමුත්තාව ටැම්පිට විහාර මන්දිරයේ උඩුමහලේ ඇති බිතු සිතුවම් දැනට දුර්වර්ණ වී පැවතියත් එකී බිතුසිතුවම් යථා තත්ත්වයට පත්කිරීමට පුරාවිද්‍යාඥයෝ උත්සාහ ගනිමින් සිටිති.

මෙම ගොඩනැගිල්ලේ වහලයට යොදා ඇත්තේ පෙති උළුය. පොලොන්නරු යුගයට අයත් ශිව කෝවිලක් ද මෙම විහාර භූමියේ දී දැකගත හැකිය. මෙම විහාර භූමියේ දක්නට ඇති පැරණි සංඝාවාසය පුරාවිද්‍යාත්මක සහ වාස්තු විද්‍යාත්මක වටිනාකම් රැසකින් යුතු ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල තුළ වර්ෂා කාලයට උණුසුම් ගතියක් ද, උණුසුම් කාලයට සිසිල් ගතියක් ද දැනෙන බවක් විහාරවාසී භික්ෂුන් වහන්සේ ප්‍රකාශ කරති.


බුදුමුත්තාව විහාරය

එසේම මෙහි ඉදිරිපස සහ පසුපස යොදා ඇති යෝධ දැව දොරවල් පිටින් අගුලු දැමිය නොහැකිය. එම දොරවල් දෙකම සාදා ඇත්තේ ඇතුළතින් පමණක් අගුල් දැමිය හැකි ලෙසටය. මෙවැනි දොරවල් යොදමින් සංඝාවාසය සුරක්ෂිත කොට ඇත්තේ සංඝාවාසය තුළ සෑමවිටම කිසිවකු සිටින බව හැඟ වීමට බැව් විහාරාධිපති භික්ෂුන් වහන්සේගේ මතයයි.

බුදුමුත්තාව රාජමහා විහාරස්ථානයේ ද්‍රවිඩ සහ පල්ලව අක්ෂරවලින් ලියැවුණු ලේඛන තුනක් දක්නට ලැබේ. ඉන් දෙකක් පැරණි ටැම්පිට විහාර මන්දිරයේ ගල් කුලුනු දෙකක සටහන් වී ඇත. එම ලිපි දෙක මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසින් කියවා අර්ථ නිරූපණය කර තිබේ.

මෙය ජයබාහු රජුට අටවන වර්ෂයේදී වීරබාහුගේ නිලධාරීන් විසින් පිහිටුවනු ලැබුවක් ලෙස සැලකේ. දෙවන ටැම් ලිපිය ද ජයබාහු රජුගේ අටවැනි වර්ෂයේදී පිහිටුවනු ලැබූවකි. වීර පෙරුමාල් නමැත්තාගේ භාර්යාව වූත්, කුලතුංග නම් චෝල රජුගේ දියණිය වූත් කුමරිය විසින් මහා ගල්ලක නමැති වික්‍රමශීලා මේඝ පුරවරයේ පිහිටි ඊශ්වර දේවාලයකට කළ පරිත්‍යාගයක් පිළිබඳව එමඟින් තොරතුරු අනාවරණය වෙයි.

මෙහි දක්නට ලැබෙන තුන් වෙනි ලේඛන පුවරු ලිපියකි. එහි එක්තරා වෙළෙඳ සමාගමක් පිළිබඳව තොරතුරු අඩංගු වන බවත් එය පොළොන්නරු යුගයට අයත් එකක් බවත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ද්‍රවිඩ භාෂාව පිළිබඳව මහාචාර්යවරයකු වන ඒ. වේලුපිල්ලෙයි මහතා ප්‍රකාශ කර තිබේ.

ක්‍රි.ව. (1763-1764) ට අයත් කාලය තුළ ලබා දුන් තඹ සන්නසක් ද විහාරස්ථානය සතුව පවතී. සත්කෝරළ දිසාවේ මාගුල්ඹතෝට කෝරලය මැද පත්තුවේ මෙම විහාරය පිහිටා ඇති බවත් කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස මෙම විහාරස්ථානයේ වල් බිහි වී ජරාවාසව තිබී රජතුමාගේ අනුග්‍රහය මත නැවත පිළිසකර කරන ලද බවත් එම සන්නසේ සඳහන් වේ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් මෙම විහාරස්ථානයට පරිත්‍යාග කරන ලද පුස්කොල විශාල සංඛ්‍යාවක් සංඝාවාස අල්මාරි දෙකක සුරක්ෂිතව තැන්පත් කර ඇති බවක් දක්නට ලැබේ. එසේම කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ බිසවක විසින් විහාරයට පරිත්‍යාග කළ සැවැන්දරා මුල් යොදා සකස් කළ විජිණිපතක් ද මෙහි දක්නට ලැබේ. විහාරාධිපති හිමියන් පවසන ආකාරයට වර්ෂ 1758 දී "මිදෙල්ලව කෝරාල" නමැති කිවිවරයකු ලියා ඇති "තිසර සංදේශය" කෘතියෙහි බුදුමුත්තාව රජමහා විහාරය පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් සඳහන්ව පවතී.

තිසර සංදේශ කතුවරයා හුදී ජනයාගේ නෙත් සිත් බුදුමුත්තාව විහාරය කෙරෙහි ඇද බැඳ තබා ගැනීමට සිය තෙලි තුඩ ක්‍රියාත්මක කරනු ලබන්නේ පහත සඳහන් ආකාරයෙනි.

"සතර වටිය වලු කරටිය නිම් — වාන
නෙලු කැටිය සෙත කරටිය දම් — මාන
සොඳුරු සිතිය නම් දැවටිය දම් — මාන
මිතුර දුටිය නිකවැරටිය ගම් — මාන

දැනගත්තා පෙර ලෙස ගණිතය — මෙවරේ
පැනගත්තා සත් විසි නැකතම — නොහැරේ
අරගත්තා පරසිදු නැකතම — අනුරේ
බුදුමුත්තා වෙහෙරට වැඳපන් — මිතුරේ"

දීර්ඝ ඉතිහාසයක් තිබෙන බුදුමුත්තාව රාජමහා විහාරයේ භික්ෂු පරපුර පිළිබඳව දැන ගත හැකි සාක්ෂි පවතින්නේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස පටන්ය. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමියන්ගේ මූලිකත්වයෙන් උපසම්පදාව පිහිටුවීමට පෙර මෙහි ලෞකික ජීවිතයට හුරු වූ ගණින්නාන්සේලා නමින් හැඳින් වූ සාමණේරවරුන් වාසය කළ බව ද කියවේ. එයින් පසුව උපසම්පදා භික්ෂූන් වහන්සේලා අට දෙනෙක් ප්‍රථම වරට වන්නි හත්පත්තුවේ කයිකාවල රජමහා විහාරයට වැඩි බවත් එයින් දෙනමක් මෙම බුදුමුත්තාව රාජමහා විහාරයට පැමිණ මෙහි භික්ෂු පරපුර ආරම්භ කළ බවත් මුඛ පරම්පරාගතව කියැවේ.

වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගේ ශිෂ්‍ය දරම්ටිපොල සිරිධම්ම රක්ඛිත නායක හාමුදුරුවන්ගේ පරපුරට මෙම පිරිස අයත් වන බව පැවසේ.

බුදුමුත්තාවට කයිකාවල සිට වැඩම කළ භික්ෂුන් වහන්සේලා දෙනමගේ නම් දන්නා කෙනකු සොයා ගැනීමට නොමැත. බුදුමුත්තාවට පැමිණි එම දෙනම මෙහි වැඩ වෙසෙමින් වන්නි හත්පත්තුවේ විහාරස්ථාන 18 ක් ද, දේවමැද හත්පත්තුවේ විහාරස්ථාන 14 ක් ද යනුවෙන් විහාරස්ථාන 32 ක් ආරම්භ කොට ඒවායේ මූලස්ථානය ලෙස මෙම විහාරය පවත්වාගෙන ගිය බව කියැවේ. වර්තමානයේ දී එම විහාරස්ථානවලින් කීපයක් හැරෙන්නට අනෙක් ඒවා නිශ්චිතවම හඳුනාගත නොහැකිය.

කෙසේ වුවද වර්තමානය වනවිට නිකවැරටිය බුදුමුත්තාව රාජමහා විහාරස්ථානයේ විහාරාධිපතිත්වය දොඹගොල්ලේ ධම්මාරාම හිමියන් විසින් උසුලමින් විහාරස්ථානයේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කරති. මේ අනුව නිකවැරටිය බුදුමුත්තාව රාජමහා විහාරස්ථානයේ පවත්නා ටැම්පිට විහාරය ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා වාස්තු විද්‍යාත්මක වටිනාකම් රැසකින් සමන්විත ශ්‍රී ලාංකික බෞද්ධ උරුමයක් බව පැවසීම යුක්ති යුක්තිය.

ප්‍රසන්න ජයන්ත කුමාර



පැරණි දළදා කරඬුවක්

I වන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව.1592 - 1604) විසින් දෙල්ගමු විහාරයේ වැඩ සිටි දළදා වහන්සේ මහනුවරට වඩම්මවා එහි දළදා මැඳුරක් කරවා එහි තැන්පත් කිරීමත් සමඟ සිංහලයේ රාජ්‍යත්ව උරුමය කන්ද උඩරට රාජධානියට ලැබුණා සේම දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ පරම වගකීම ද උඩරට රාජධානියට ලැබුණු ආකාරය හඳුනාගත හැකිය. ඒ අනුව වර්තමානය තෙක් දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ වගකීම උඩරට රාජධානියට උරුමව පවතී. උඩරට රාජධානි සමයේ සහ ලක්දිව ඉංග්‍රීසින්ගේ යටත් විජිතයක් බවට පත් වීමෙන් අනතුරුව දළදා වහන්සේ සම්බන්ධයෙන් සිදු කරන ලද පූජෝපහාරයන්ගේ ඉතිහාසය පිළිබඳව කෙටියෙන් විමසා බැලීම මෙම ලිපියෙන් සිදු කෙරේ.

# උඩරට රජ සමයේ දළදා පූජෝපහාර

**මහනුවර රාජධානියට දළදා වහන්සේ වඩම්මවා එහි පළමු දළදා මැඳුර ඉදි කිරීමේ ගෞරවය හිමි වන්නේ I වැනි විමලධර්මසූරිය රජුටය. එම රජු විසින් ඉදි කරන ලද දළදා මැඳුර පිළිබඳව මහා වංශයේ මෙලෙස විස්තර කොට ඇත.**

"... නරශ්‍රේෂ්ඨ තෙමේ සර්වඥ දංෂ්ට්‍රා ධාතු තොමෝ කොතැන ද? යි විචාරා දෙල්ගමුවෙහෙර යයි අසා අතිශයින් ප්‍රසන්න සිත් ඇත්තේ සපරගමු රට දෙල්ගමුවෙහි වඩන ලද දන්ත ධාතුය වඩා ගෙන්වා ගෙන තමන්ගේ යහපත් වූ පුරයෙහි දවසක් දවසක් පාසා වඳිනට ද වත් පිළිවෙත් කරන්නට ද ඒ පණ්ඩිත වූ රජ තෙමෙ සමීපයෙහි යහපත් උතුම් වූ භූමි භාගයෙක් හි සිත්කලු වූ දෙමහල් දා ගෙයක් කරවා එහි දළදාව තබා නිරන්තරාදර ඇත්තේ පූජා කළේය...."

එහෙත් පසුකාලීන පරසතුරු ආක්‍රමණ හේතුවෙන් මෙම දළදා මැඳුර විනාශ වූ අතර එම භූමියේම පසුකාලීන රජවරුන් නව දළදා මැඳුර ඉදි කරන ආකාරය හඳුනාගත හැකිය.

I වැනි විමලධර්මසූරිය රජුගෙන් පසු රජ පැමිණි සෙනරත් රජු ද (ක්‍රි.ව. 1604-1635) දළදා වහන්සේ ආරක්ෂා කිරීම සඳහා දිවි හිමියෙන් කටයුතු කළ බව සඳහන්ය. සෙනරත් රාජ්‍ය සමයේ පෘතුගීසි ආක්‍රමණ එල්ල වූ විට ආරක්ෂාව සඳහා දළදා වහන්සේ මැද මහනුවර ප්‍රදේශයේ වූ දළදා මැඳුරකට වැඩම කර වූ බවත් පෘතුගීසින් හා සිදු වූ යුද ගැටුම්වලින් පසු දළදා වහන්සේ නැවත මහනුවර දළදා මැඳුර වෙත වැඩම කර වූ බවත් දළදා ඉතිහාසයේ සඳහන් වේ. ඒ අනුව සෙනරත් රජු පෘතුගීසින් සමඟ කළ රන්දෙනිවල සටන (ක්‍රි.ව. 1617) අවස්ථාවේ දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා කටයුතු කළ ආකාරය මහා වංශයේ මෙලෙස විස්තර කොට ඇත්තේ,

"... එකල වන පර්වත නදී දුර්ගස්ථාන ඇත පන්සිය ආදී රට ද දන්ත ධාතු ස්වාමීන් ගෙන්වා නිර්භය ස්ථානයන්හි පිහිටුවා ධාතු රක්ෂාවෙහි නියුක්තයන් ද එහි වස්වා පූජාවිධිය පවත්වමින් දන්තධාතු ස්වාමීන් මොනවට රැක...." වශයෙනි. එයින් පෙනී යන්නේ උඩරට රජවරු දළදා වහන්සේ ආරක්ෂා කිරීම සඳහා දැඩි කැපවීමෙන් කටයුතු කළ බවය.

මින් පසු රජ පැමිණි මහනුවර රාජධානියේ ප්‍රබලතම පාලකයා වන II වැනි රාජසිංහ (ක්‍රි.ව. 1635-1687) රජු ද දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා කටයුතු කර ඇත. එම රජු දෙමහල් නව දළදා මැඳුරක් කර වූ බව සඳහන් වේ. මෙම රාජ්‍ය සමයේ ලක්දිව සිරකරුවකු වශයෙන් ජීවත් වූ ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස් රචිත 'An Historical Relation of the Ceylon' කෘතියේ එම සමයේ දළදා වහන්සේ හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර සම්බන්ධයෙන් තොරතුරු හඳුනාගත හැකිය.

මෙම වාර්තාව තුළ රාජ්‍ය අනුග්‍රහය සහිතව පවත්වන ලද මහනුවර ඇසළ පෙරහර මංගල්‍යය ගැන විස්තර කොට ඇත. මෙම පෙරහර දෙවියන් උදෙසා පැවැත් වූ පෙරහරක් මිස දළදා වහන්සේ උදෙසා පැවැත් වූ පෙරහරක් නොවීය. මහනුවර දළදා පෙරහරේ ආරම්භය කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍යයේදී සිදු වන බැවින් දළදා පෙරහරේ ස්වරූපය විස්තර කිරීමට නොක්ස්ගේ වාර්තාව යොදා ගැනීම සාවද්‍ය බව පෙනේ.

ඉන් පසුව රජ පැමිණි II වැනි විමලධර්මසූරිය (ක්‍රි.ව.1687-1707) රජු දළදා වහන්සේ උදෙසා නව තෙමහල් දළදා මැඳුරක් කර වූ බවත් දළදා වහන්සේ වඩා හිඳුවීම සඳහා රිදී විසිපන් දහසක් වියදම් කොට නවරත්නයෙන් සැරසූ රන් ආලේපිත කරඬුවක් පූජා කළ බවත් දළදා ඉතිහාසයේ සඳහන් වේ. මෙලෙස විමලධර්මසූරිය රජු පූජා කළ කරඬුව වර්තමාන දළදා වහන්සේ වැඩ වසන කරඬු හතෙන් පිටතින් දැකිය හැකි විශාල කරඬුවයි.

මින් අනතුරුව රජ පැමිණි මෙරට අවසන් සිංහල රජු වශයෙන් සැලකෙන ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව. 1707-1739) ද දළදා වහන්සේ උදෙසා පුද පූජාවන් රැසක් පැවැත් වූ බව සඳහන් වේ. එම රජු විසින් ඒ වනවිට ජරාවාස වෙමින් පැවති දළදා මැඳුර වෙනුවට දෙමහල් නව දළදා මැඳුරක් කරවා ඇත. වර්තමානයේ දළදා වහන්සේ වැඩ වසන්නේ එම දළදා මැඳුරේය. එම දළදා මැඳුරේ ස්වරූපය සම්බන්ධයෙන් මහා වංශය කර ඇති සඳහන මෙසේය.

"…. පියරජාණන් විසින් ධන්තධාතුන් වහන්සේ උදෙසා මහනුවර කරවන ලද මන්දිරය ජීර්ණ වූවා දැක කම්පිත වූ සිත් ඇති ඒ නරේන්ද්‍ර තෙම දෙමහල් උතුම් ශුභ ප්‍රාසාදයක් කරවන්නේ නානාවිධ චිත්‍ර කර්මයෙන් බබළන ද්වාරයෙන් යුක්ත කොට කලධෞත පර්වතයක් මෙන් සුණුවමින් බැබළුම් ඇති කොට පලයෙන අලංකෘත කොට මාලකද්වයෙහි භිත්ති (මතුයෙහි) හි විදුර ජාතකය ගුත්තිල උම්මග්ග ජාතකය දධිවාහන මහා කණහ සුතනු ජාතකය ඡද්දන්ත ධම්මධ්වජ ධම්මපාල ජාතකය මහාජනක ජාතකය පදමානවක ධම්ම සොණ්ඩි මහානාරද කස්සප ජාතකය මහපදුම තේලපත්ත චුල්ලපදුම ජාතකය සත්තුභත්ත අන්ධභූත චම්පෙය්‍ය සස ජාතකය ද සීලව ජාතකය හා එසේම මුණ්ඩබ්බ ජාතකය ද වෙස්සන්තර ජාතකය යන මේ ජාතක දෙතිස විචිත්‍ර වූ සිත්තමින් මොනවට කරවා නරේන්ද්‍ර තෙමේ අප්‍රමාණ පුණ්‍යස්කන්ධයක් රැස් කළේයි...."

ඒ අනුව අලංකාරවත් ලෙස ජාතක කතා සිතුවම් කොට දළදා මැඳුර නිර්මාණය කළ බව එම විස්තරයෙන් පෙනේ. මෙම සිතුවම් මත පසුකාලීනව නැවත සිතුවම් ඇඳීම නිසා පැරණි සිතුවම් අභාවයට ගොස් ඇත. එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් දළදා මාලිගයට බෝම්බ ප්‍රහාරයක් කළ අවස්ථාවේ මාලිගාව ඇතුළත සිතුවම් තට්ටු කිහිපයක් ගැලවී ගිය පසු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රාජ්‍ය කාලයේදී අඳින ලද සිතුවම් හමු වී ඇත. එමෙන්ම මෙම රජු රාජකීය කවිකාර මඬුව දළදා වහන්සේට පූජා කොට ඇත. තවද මෙම රජුගේ උපදෙස් පරිදි එතෙක් දෙවිවරු උදෙසා පැවැත් වූ කාර්තික මංගල්‍යය දළදා වහන්සේ උදෙසා ද පවත්වනු ලැබීය. එලෙස ආරම්භ වූ කාර්තික මංගල්‍යය ද දළදා වහන්සේ උදෙසා පවත්වනු ලබන වාර්ෂික සතර මංගල්‍යයන්වලින් එකක් බවට පත්ව වර්තමානය වන විටත් ක්‍රියාත්මක වේ.

ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු ශ්‍රී ලාංකේය රාජ්‍යත්වයේ උරුමය නායක්කාර රාජවංශය වෙත මාරු වූ අතර එම රාජවංශය හින්දු ආගම අදහනු ලැබූ පිරිසක් වූවත් රජ බව ලබා ගැනීමේ දී බුදුදහම වැලඳගෙන ඇත. මෙම රජවරුන් දළදා වහන්සේට කළ යුතු පූජා චාරිත්‍ර නොපිරිහෙළා ඉටු කර ඇති අතර දළදා පුද සිරිත් සඳහා හින්දු ආභාසයෙන් ද ඇතැම් සිරිත් එකතු කරගෙන තිබේ. නායක්කර් වංශයේ පළමු උඩරට රජු වූ ශ්‍රී විජය රාජසිංහ (ක්‍රි.ව.1739-1747) රජු විසින් දළදා ප්‍රදර්ශනයක් පැවැත් වූ බව සඳහන්ව ඇත. අනතුරුව රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද (ක්‍රි.ව.1747-1782) දළදා වහන්සේ උදෙසා කළ යුතු පූජෝපහාරයන් නොපිරිහෙළා ඉටු කොට ඇත. දළදා ඉතිහාසය පිළිබඳව විමසන විට කීර්ති ශ්‍රී රාජසිංහ සමය අතිශයින් වැදගත් සමයක් වශයෙන් සැලකිය හැකිය. ඊට හේතු වන්නේ මහනුවර දළදා පෙරහරේ ආරම්භය මෙම සමයේ සිදු වූ බැවිනි.

ඒ වන විට පරිහානියට ලක්ව පැවති උපසම්පදා විනය කර්මය නඟාසිටුවීම සඳහා රජු කටයුතු කොට ඇත. නැවත උපසම්පදාව පිහිටුවීමේ අරමුණ ඇතිව රජු ලන්දේසින් සමඟ ගිවිසුමක් ඇති කරගෙන ඔවුන්ගෙන් නෞකාවක් ලබාගෙන ක්‍රි.ව.1750 දී සියමෙහි (තායිලන්තයේ) බොරොම්කොට් රජු වෙත විල්බාගෙදර රාල ප්‍රමුඛ තානාපතීන් පස්දෙනකු හා



19 සියවසේ දළදා මැඳුරේ දසුනක්

තවත් හැට දෙනකුගේ දූත පිරිසක් යවනු ලැබීය. එයට ප්‍රතිචාර වශයෙන් උපාලි තෙරුන් උපසම්පදාව රැගෙන මෙරටට පැමිණි අතර 1753.07.20 වැනි දින වැලිවිට සරණංකර හිමි ප්‍රමුඛ මල්වතු හා අස්ගිරි විහාර දෙකෙහි සාමණේරවරු හයනමක් උපසම්පදා කරනු ලැබූහ. ඒ සමඟ මෙරට සියම් මහා නිකායේ ආරම්භය සිදු විය. උපසම්පදාව පිහිටුවීමෙන් පසු උපාලි තෙරුන්ගේ සහ සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි එතෙක් මහනුවර දෙවිවරුන් උදෙසා පැවැත් වූ ඇසළ පෙරහර මංගල්‍යය දළදා පෙරහර බවට පරිවර්තනය වන ආකාරයක් හඳුනාගත හැකිය.

> ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් පසු ශ්‍රී ලාංකේය රාජ්‍යත්වයේ උරුමය නායක්කාර රාජවංශය වෙත මාරු වූ අතර එම රාජවංශය හින්දු ආගම අදහනු ලැබූ පිරිසක් වූවත් රජ බව ලබා ගැනීමේ දී බුදුදහම වැලඳගෙන ඇත. මෙම රජවරුන් දළදා වහන්සේට කළ යුතු පූජා චාරිත්‍ර නොපිරිහෙළා ඉටු කර ඇති අතර දළදා පුද සිරිත් සඳහා හින්දු ආභාසයෙන් ද ඇතැම් සිරිත් එකතු කරගෙන තිබේ.

එතෙක් පැවති නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන දේවාල පෙරහරට ඉදිරියෙන් දළදා පෙරහර එකතු කළ අතර වර්තමානය තෙක් පවත්වන දළදා පෙරහරේ ආරම්භය මෙම රාජ්‍ය සමයේ සිදු වී ඇත. ක්‍රි.ව.1753 දී ආරම්භ වූ මහනුවර දළදා පෙරහර මංගල්‍යයට ඉංග්‍රීසි සමයේදී යම් යම් බාධාකාරී තත්ත්වයන් ඇති වුවත් වර්තමානය තෙක් අඛණ්ඩව එම පෙරහර මංගල්‍යය පවත්වාගෙන එනු ලබයි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දළදා වහන්සේ සම්බන්ධයෙන් අතිශය ගෞරවයෙන් කටයුතු කළ බව පෙනේ. රජු සිය රැවුළ කපා මුස්නාවක් වශයෙන් දළදා වහන්සේට පූජා කොට ඇත. දළදා තේවාව සඳහා දෙවන ගිලන්පස පූජාව එකතු වූයේ ද මෙම රජුගේ උපදෙස් පරිදිය. එමෙන්ම රජු දළදා මාලිගය ප්‍රතිසංස්කරණය කළ බව ද සුළු රාජාවලියේ මෙසේ සඳහන් වේ.

"…. එම උපාලි ස්ථවිර ප්‍රමුඛ මහ සංඝයාට හා අමාත්‍යවරුන්ට ද දළදා සාමින් දක්වා චිත්ත නන්දනය කරවීමෙන් හා අපගේ අදෘෂ්ට මිත්‍ර වූ ධාර්මික මහරජාණන් ද මෙම දළදා සාමින් කෙරෙහි අතිශයින් ප්‍රසන්න කරවමි සිතා දළදා ලාංඡනය ද විදත්පී ප්‍රමාණ වෛදූර්ය මාණික්‍යයෙන් බුද්ධ රූපයක් ද දක්ෂිණාවෘත සංඛ්‍ය ද මාහැඟි වූ රාජාභරණය ද පඬුරු පිණිස යවා තම රාජ භවනට නුදුරුව රන්කොත් නැඟු දෙමහල් මන්දිරයක් සේ කරවා එහි දළදා සාමින් වඩා නොවෙක් පුද සිරිත් පැවැත්වීමෙන් ද,..." වශයෙනි.

ඒ අනුව නායක්කාර් වංශිකයකු වූවත් කීර්ති ශ්‍රී රාජසිංහ රජු දළදා වහන්සේ කෙරෙහි බැතිමත් සිතින් කටයුතු කළ බව පෙනේ. කෝට්ටේ රාජධානි අවදියෙන් පසු පරිහානියට ගිය දළදා පෙරහර මංගල්‍ය නැවත ඇරඹීම මෙම රාජ්‍ය සමයේ සිදු වූ වැදගත් කටයුත්තක් වශයෙන් දැක්විය හැකිය.

මින් අනතුරුව රජ පැමිණි රාජාධිරාජසිංහ



හේමමාලා-දන්ත කුමරු දළදාව රැගෙන එන අයුරු දක්වන සිතුවමක්

(ක්‍රි.ව.1782-1798) රාජ්‍ය සමයේ දී ද දළදා වහන්සේ සම්බන්ධයෙන් සිදු කළ යුතු පුද සත්කාර නොකඩවා එලෙසින්ම පවත්වාගෙන ගොස් ඇත. ඒ බව ක්‍රි.ව.1818 දී පමණ රචනා වූ දාඨාවංස ප්‍රදීපය (දාඨාගොත් ප්‍රදීපයේ) නම් පුස්කොළ පොතෙහි මෙලෙස සඳහන්ව ඇත.

වැඩ වසනා සමයෙහි එ රද සුර පුර - වැඩි දෙවුනා ලක රජ පැමිණි ගරු තර දෙතැති මනි රාජාධිරාජසිංහ පව ර - පිදි එ මෙනා දළදා පූජා නො හැර එම රජු දළදා පූජාවන් අත් නොහැර පැවැත් වූ බව සඳහන් වේ. මහාවංශයේ දැක්වෙන ආකාරයට පහන් ලක්ෂයක් දල්වා දළදා වහන්සේ විෂයෙහි පූජාවන් පවත්වා ඇත. එමෙන්ම රජුගේ අගබිසව දළදා වහන්සේට පූජා කරන ලද රිදී පහනක් ශ්‍රී දළදා කෞතුකාගාරයේ දී අද දැක ගත හැකිය.

මින් පසු රජ පැමිණි උඩරට රාජධානියේ සේම ශ්‍රී ලංකාවේ අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රි.ව.1798-1815) රජු ද දළදා පූජාවන් නොපිරිහෙළා ඉටු කර ඇති බව සඳහන් වේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනට උරුමකම් කී වහාම දළදා වහන්සේ උදෙසා මිණිමුතු සහ ගම් බිම් කෙත් වතු පිදූ බව සඳහන් වේ.

එමෙන්ම දළදා මන්දිරය අභ්‍යන්තරයේ ඇති කුඩා ස්තූපය ඉදි කරන ලද්දේ ද මෙම රජු විසිනි. එම ස්තූපයේ පාත්‍රා ධාතුව තැන්පත් කළ බවට විශ්වාසයක් පවතින අතර තවත් විශ්වාසයක් වනුයේ දළදා වහන්සේ උදෙසා පූජා කරන ලද වටිනා භාණ්ඩ එම ස්තූපයේ තැන්පත් කර ඇති බවයි.

එමෙන්ම එතෙක් දළදා පෙරහරට දළදා වහන්සේ වැඩම කරන ලද නමුත් දළදා වහන්සේ වැඩම වීම දළදා වහන්සේගේ ආරක්ෂාවට තර්ජනයක්යැයි සිතූ රජු ඒ වෙනුවට සර්වඥ ධාතු තැන්පත් කරන ලද කුඩා පෙරහර කරඬුවක් පූජා කර ඇත. එම කරඬුව පෙරහර කරඬුව වශයෙන් හඳුන්වනු ලබන අතර වර්තමාන දළදා පෙරහරේ වැඩම කරවන්නේ ද එම කරඬුවයි. පෙරහර කරඬුව වැඩම කරවීම සඳහා රන් ආලේපිත රන් සිවි ගෙයක් ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජු පූජා කළ අතර සිවි මහා දේවාලයන්හි දේව ආභරණ වැඩම වීම සඳහා ද රන් සිවිගෙවල් හතරක් පූජා කොට දළදා පෙරහරේ අලංකාරය වර්ධනය කිරීමට කටයුතු කර තිබේ.

එමෙන්ම වර්තමානය තෙක් දළදා පෙරහරේ රාජකාරි කටයුතු කරන රාජකාරි පරම්පරාවන් නම් කරන ලද්දේ ද මෙම රජුය. දළදා මැඳුර වටා දිය අගල සහ වලාකුළු බැම්ම ඉදි කරමින් ආරක්ෂාව හා අලංකාරය තහවුරු කළ රජු රජ මාලිගයේ අංගයක් ලෙස ඉදි කළ පත්තිරිප්පුව හා මහනුවර නගරයේ අලංකාරය සඳහා ඉදි කළ කිරි මුහුද ද දළදා මැඳුරෙහි අලංකාරය සහ අභිමානය වර්ධනය කිරීමට හේතු විය.

1802 වර්ෂයේ බ්‍රිතාන්‍යයන් උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ දිවි දෙවැනි කොට දළදා වහන්සේ ආරක්ෂා කිරීමට කටයුතු කළ රජු දළදා වහන්සේ කිතුල්පේ ගමටත් අනතුරුව මැදගම ගල්ලෙන් විහාරයටත්, හඟුරන්කෙත විහාරයටත් අනතුරුව අත්තනගල්ලටත්, මැදපිටියටත්, කුණ්ඩසාලටත් රහසිගතව වැඩම කරවීමට කටයුතු කළ බව සුළු රාජාවලියේ සඳහන් වේ.

ක්‍රි.ව.1815 ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දළදා වහන්සේ ආරක්ෂාකාරී ලෙස අටබාගේ කරා වැඩම කරවීමට රජු කටයුතු කොට ඇත. ඒ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ අවසන් රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසින්ට යටත් වන තෙක්ම දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහා කටයුතු කළ බවයි.

ඒ අනුව ක්‍රි.ව.1815.03.02 දින මහනුවර මඟුල් මඩුවේදී උඩරට ගිවිසුම අත්සන් කිරීමත් සමඟ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් (ක්‍රි.ව.1815-1948) බවට පත් වූ අතර එම යටත්විජිත අවදියේ දළදා වහන්සේගේ ආරක්ෂාව සඳහාත් පුද පූජා අඛණ්ඩව පැවැත්වීමට උඩරට සිංහල ජනතාව දිවි හිමියෙන් කටයුතු කළ ආකාරය හඳුනාගත හැකිය. උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන් යටත් කරගත්ත ද දළදා වහන්සේ ඔවුන් සතු නොවීම නිසා ජනතාව ඔවුන් රටේ පාලකයන් වශයෙන් පිළිගැනීමට අකමැති විය. එබැවින් ඉංග්‍රීසින්ට දළදා වහන්සේ ලබා ගැනීමට අවශ්‍ය වූ අතර අටබාගේ ප්‍රදේශයේ සඟවා ඇති බව දැනගත් ජෝන් ඩොයිලි විසින් භික්ෂූන්ගේ උපකාර සහිතව දළදාව හිඳගල විහාරයට වැඩමවා අනතුරුව මහා පෙරහරකින් මහනුවරට වඩම්මවාගෙන අවුත් දළදා මැඳුරේ තැන්පත් කිරීමට කටයුතු කරනු ලැබීය.

මෙලෙස විශාල පෙරහරක් පවත්වන ලද්දේ දළදා වහන්සේගේ භාරකාරිත්වය තමන් සතු බව පෙන්වමින් උඩරට ජනතාවගේ සහාය ගැනීම සඳහාය. මෙම පෙරහරෙහි රජු ගමන් ගන්නා ස්ථානයේ ඉංග්‍රීසින්ට උඩරට යටත් කර ගැනීම සඳහා සහාය දුන් ඇහැලේපොල නිලමේ ගමන් කළ බව පැවසේ.

මෙලෙස ඉංගීසින් උඩරට යටත් කර ගත් නමුත් ඔවුන්ට එරෙහිව ක්‍රි.ව.1818 දී ඌව වෙල්ලස්ස නිදහස් අරගලය ඇති වූ අවස්ථාවේ වාරියපොල ශ්‍රී සුමංගල හිමිගේ මූලිකත්වයෙන් දළදා වහන්සේ මොණරවිල කැප්පෙටිපොළ අධිකාරම්ට හිමිවීම නිසා ජනතා සහාය නිදහස් අරගලයට පූර්ණ වශයෙන් ලැබිණි. එබැවින් එය මැඩලීමට ද ඉංග්‍රීසින්ට දැඩි පරිශ්‍රමයක් දැරීමට ද සිදු විය. නමුත් ඉංගීසින් නිදහස් අරගලය මැඬලා දළදා වහන්සේ ලබා ගෙන නැවත මහනුවර දළදා මැඳුරේ තැන්පත් කරනු ලැබීය. මෙලෙස දළදාව නැවත ඉංග්‍රීසි භාරයට ලක් වීමෙන් පසු වාර්ෂිකව පැවැත් වූ දළදා පෙරහර නවතා දැමීමට ඉංග්‍රීසින් කටයුතු කළේය.

එලෙස දළදා පෙරහර නැවැත්වීමත් සමඟ රට පුරා දුර්භික්ෂයක් පැතිර ගිය බැවින් ඉංග්‍රීසි ආණ්ඩුවේ පූර්ණ අනුග්‍රහය සහිතව එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා විසින් දළදා පෙරහර ක්‍රි.ව.1828.05.29 දින යළි අරඹන ලදි. එම පෙරහර අවසානයේ මහ වැසි ඇද වැටුණු බව ඉංග්‍රීසි වාර්තාවල පවා සඳහන් වන අතර කිරි මුහුද පිටාර ගැලීම නිසා මහනුවර නගරය ද ජලයෙන් යට වූ බව සඳහන් වේ.

මෙය දළදා වතුර වශයෙන් ජන ව්‍යවහාරයේ පවතී. ක්‍රි.ව.1848 මාතලේ නිදහස් අරගලය ඇති වූ අවස්ථාවේ නැවත දළදාව අරගලකරුවන් අතට පත් වුව හොත් එය මැඩලීම අපහසුවන බව දැන ගත් ඉංග්‍රීසිහු දළදා වහන්සේගේ ආරක්ෂාව තර කළහ. මේ ඉංග්‍රීසි පාලන සමයේ දී දළදා චාරිත්‍ර එලෙසින්ම පවත්වාගෙන යෑමට කටයුතු කළ අතර දළදා වහන්සේගේ භාරකාරිත්වය මල්වතු අස්ගිරි උභය මහා විහාරයන්ට හා දියවඩන නිලමේ වෙත භාර කිරීමට ක්‍රි.ව. 1853 දී ඉංග්‍රීසින්ට සිදු විය.

ක්‍රි.ව.04 වැනි සියවසේ කීර්ති ශ්‍රී මේඝවර්ණ රාජ්‍ය සමයේ දළදා වහන්සේ මෙරටට උරුම වූ දා පටන් ශ්‍රී ලාංකේය රාජ්‍යත්වයේ සංකේතය බවට පත්ව ගෞරව බුහුමානයට ලක් වී ඇත. වර්තමානය වන විට රාජාණ්ඩු ක්‍රමය පරිහානියට පත්ව ඇති නමුත් ශ්‍රී ලාංකේය රාජ්‍යත්වය හා දළදා වහන්සේ අතර පැවැති අන්‍යෝන්‍ය සම්බන්ධය නොවෙනස්ව පවතී.

සංජය විජේකෝන්

කටාරම
සංස්කරණය
බන්ධුල ගුණරත්න
'කටාරම', දිනමිණ -ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
katarama@lakehouse.lk

2021 මාර්තු 11 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.